



# වාර්ෂික වාර්තාව
# 2015



THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව

# 2015

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව

**Annual Report 2015**

**ISSN : 1012 - 3954**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**


| | |
|---|---|
| ප්‍රකාශනය | : ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය |
| පිටු සැකසුම | : වි පී රණවකගේ |
| කවර නිර්මාණය | : එම් ඒ විජේරත්න හා වි පී රණවකගේ |
| ඡායාරූප | : කේ ජී ආර් නිරෝෂන් |
| මුද්‍රණය | : වයි එන් ප්‍රින්ට් ග්‍රැෆික් (පෞද්) සමාගම |


**Cover**



**පහත රට සම්ප්‍රදායික කළු තේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කල හැකි අවහිරතා ස්වයංක්‍රීයව මග හරවන හලන යන්ත්‍රය**

# CONTENTS


| | |
|---|---|
| ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය | 4 |
| දැක්ම හා මෙහෙවර | 4 |
| ආයතනික ව්‍යුහය | 5 |
| කළමණාකරණ මණ්ඩලය | 6 |
| උපදේශක කමිටු | 9 |
| තේ පර්යේෂණායතනයේ සභාපති තුමාගේ සමාලෝචනය | 13 |
| තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තුමාගේ සමාලෝචනය | 15 |
| තේ පර්යේෂණ ආයතන කාර්ය මණ්ඩලය | 27 |
| පර්යේෂණ කඩඉම් | 40 |
| භෝග වැඩි දියුණු කිරීම | 40 |
| භූමි ඵලදාව වැඩි දියුණු කිරීම සහ භෝග පාලනය | 48 |
| භෝග ආරක්ෂණය | 62 |
| දේශගුණික විපර්යාස වල බලපෑම ඇගයීම | 70 |
| තේ වගාවේ ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රීකරණය | 73 |
| තේ තවාන් තාක්ෂණය සහ කළමනාකරණය | 76 |
| තේ සැකසුම් තාක්‍ෂණය හා නිමි තේ වල තත්ත්වය වැඩි දියුණු කිරීම | 80 |
| සමාජ ආර්ථික හා සම්පත් සැලසුම්කරණය | 84 |
| සේවා ලාභීන් සඳහා සේවාවන් | 88 |
| ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 106 |
| සම්මාන. ප්‍රදාන, ප්‍රකාශන විශේෂ ඉදිරිපත් කිරීම් සහ අධ්‍යාපන වැඩ සටහන් | 128 |
| තේ පර්යේෂණායතනයේ වතු | 148 |
| ශාන්ත කූම්බ්ස් වත්ත | 148 |
| ශාන්ත ජෝකිම් වත්ත | 152 |
| පරිපාලන සහ මූල්‍ය | 156 |
| විශේෂ කඩඉම් | 156 |
| මානව සම්පත් සංවර්ධනය හා කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම | 156 |
| යටිතල පහසුකම් දියුණු කිරීම සහ පවත්වාගෙන යාම | 157 |
| මූල්‍ය කාර්ය සාධනය | 160 |
| විගණකාධිපති වාර්තාව | 166 |

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

වෘත්තීමය තේ පර්යේෂණ මගින් ශ්‍රී ලංකා තේ වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායක සභාවේ සම්මත වූ පනතේ ප්‍රකාරව 1925 දී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය පිහිටුවන ලදි. වැවිලි කරුවන්ගේ සංගමයේ ශාඛාවක් ලෙස ඇරඹුනු මෙම ආයතනය ක්‍රමික වෙනස්කම් වලට ලක්වී මේ වන විට ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය යටතේ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.


## ආයතනයේ දැක්ම

තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨතමයා වෙමින් ශ්‍රී ලංකා තේ නාමයට තරගකාරී මිලක් ලබා දෙමින් ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදනය බවට පත්කිරීම උදෙසා වන තාක්ෂණ උපදෙස් ලබා දීමයි.


## ආයතනයේ මෙහෙවර

තේ නිෂ්පාදනයේ ඵලදායිතාව සහ ගුණාත්මය වඩාත් ලාභදායී ලෙස ඉහළ නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය වැඩි දියුණු කිරීම, හඳුන්වා දීම සහ ව්‍යාප්ත කිරීම තේ පර්යේෂණායතනයේ ප්‍රධාන මෙහෙවර වේ.





# ආයතනික ව්‍යුහය



සභාපති තේ පර්යේෂණ මණ්ඩලය
අභ්‍යයන්තර විගණන අංශය
පර්යේෂණ සඳහා වන උපදේශක කමිටුව
උපදෙස් හා ව්‍යාප්ති සහ තේ ප ආ වතු පිළිබඳ උපදේශක කමිටුව
විගණන හා කළමණාකරණ කමිටුව
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
පර්යේෂණ
ශෂ්‍ය විද්‍යා අංශය සහ
ශාක කායික විද්‍යා අංශය
ශාක අභිජනන අංශය
පාංශු සහ ශාක පෝෂණ අංශය
කීට විද්‍යා/ වටපණු විද්‍යා අංශය
ශාක ව්‍යාධිවේදී අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ තේ සැකසුම් තාක්ෂණය
තේ සැකසුම් තාක්ෂණ අංශය
ජෛව රසායන අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ව්‍යාප්ති)
උපදෙස් හා ව්‍යාප්ති අංශය
ප්‍රකාශන අංශය
පුස්තකාලය
ප්‍රාදේශීය මධ්‍යස්ථාන
තොරතුරු තාක්ෂණ ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(පරිපාලන)
පරිපාලන අංශය
පුවාහන ඒකකය
මිලදී ගැනීම් ඒකකය
ඉංජිනේරු අංශය
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
මූල්‍ය අංශය
තේ ප ආ වතු
කෘෂි ආර්ථික විද්‍යා අංශය
ජෛවමිතික ඒකකය

# කළමණාකරණ මණ්ඩලය


1993 අංක 52 දරණ තේ පර්යේෂණ මණ්ඩල පනත ප්‍රකාරව 1993 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවන ලදි. කැබිනට් මණ්ඩල අනුමැතිය සහිත 2006 අංක 43 දරණ පනත මගින් 2007 වසරේදී තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කරන ලදි.

තේ වගාව සහ පිරිසැකසුම් ආශ්‍රිත පර්යේෂණ වල නියැලීම සහ දිරිමත් කිරීම. ඒ සඳහා පහසුකම් සැපයීම හා සහයෝගය ලබා දීම ආදී කටයුතු වල නියැලීම තේ පර්යේෂණ මණ්ඩලයේ මූලික කාර්ය භාරයන් වේ.

**තේ පර්යේෂණ මණ්ඩලයේ විශේෂිත කාර්යභාරයන්**

- තේ වගාවේ රෝග සහ පළිබෝධ වැලැක්වීම සහ මර්ධනය. නිමි තේ වල ගුණාත්මය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණය ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියළු ගැටළු සහ කරුණු පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම.
- තේ කර්මාන්තයේ ආර්ථික ශක්‍යතාවයන් සහ ගැටළු සම්බන්දයෙන් මෙන්ම අනාගත ප්‍රවනතා පිලිබඳව පර්යේෂණ මෙහෙයවීම සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම
- ශ්‍රී ලංකාව තුල සහ විදේශයන්හි පර්යේෂණායතන සමග සබඳතා ගොඩ නගා ගැනීම සහ පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පර්යේෂණ ආයතන සමග සහයෝගී අධ්‍යයන වැඩ සටහන් සම්මන්ත්‍රණ සහ සමුළු ආදිය පැවැත්වීම.


## තේ පර්යේෂණ මණ්ඩල සාමාජිකයන් (2015 ඔක්තෝබර් මස දක්වා)



**මහාචාර්ය සරත් පී ඉලංගතිලක**
මහතා
සභාපති තේ පර්යේෂණ මණ්ඩලය
(06.10.2015 දක්වා)




**ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා**
අධ්‍යක්ෂ
තේ පර්යේෂණායතනය



**ආචාර්ය ඩී වී සිවරත්නම් මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
වටවල වැවිලි සමාගම
(28.05.2015 දක්වා)




**ඩී එච් එන් පුල්ලෙපෙරුම මිය**
අධ්‍යක්ෂ
කළමණාකාර සේවා දෙපාර්තුමේන්තුව




**ජේ එම් බී ජේ බණ්ඩාර මහතා**
සභාපති කුඩා තේ වතු හිමියන්ගේ
සම්මේලනය



**කේ එන් විජේකීර්ති මහතා**
නියෝජ්‍ය ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යංශය



**ගිහාන් ඩී ලිවේරා මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
තේ කම්හල් හිමියන්ගේ සංගමය
(06.10.2015 දක්වා)



**ආචාර්ය ඩී එස් ඒ සමරවීර මහතා**
නිරීක්ෂණ සමාජික විද්‍යාඥ



**ආචාර්ය කීර්ති මොහොට්ටි මහතා**
තේ පර්යේෂණ ආයතනයේ
කැදවුම්කරු ලේකම්



**රොෂාන් රාජදුරෙයි මහතා**
නියෝජිත වැවිලිකරුවන්ගේ සංගමය
(සිට 3.7.2015)

**දීප්ති අබේවික්‍රම**
සභාපති කුඩා තේ වතු හිමියන්ගේ සමිති සම්මේලනය
(25.12.2015 සිට 6.10.2015 දක්වා)

**රසෙල් තෙන්නකෝන්**
ලේකම් වැවිලි සම්මේලනය
(25.12.2015 සිට 6.10.2015 දක්වා)

**ලෙස්ලි දේවේන්ද්‍ර මහතා**
නියෝජිත ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
(25.12.2015 සිට 6.10.2015 දක්වා)

# උපදේශක කමිටු

**පර්යේෂණ හා උපදේශන කමිටුවේ සාමාජිකයින්**

- ආචාර්ය ඩී.එස්.ජ් සමරවීර (කමිටු සභාපති)
  මත්තේගොඩ නිවාස සංකීර්ණය මත්තේගොඩ

- ආචාර්ය එස්.එස්.බී.ඩී.ජී ජයවර්ධන (2015 ජනවාරි 19 දක්වා)
  සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය එස්.ජී ඉලංගන්තිලක (2015 පෙබරවාරි මස සිට ඔක්තෝම්බර් දක්වා)
  සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය එම්. එම්. ජේ. පී ගවරම්මාන (2015 නොවැම්බර් සිට)
  සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය අයි සරත්.බී අබේසිංහ
  අධ්‍යක්ෂ - තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය ඩී.වී සිවරත්නම් (2015 මැයි දක්වා)
  ප්‍රධාන විධායක නිළධාරි වටවල වැවිලි සමාගම

- මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ජේ. එම්. ද කොස්තා
  භෝග විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂි විද්‍යා පීඨය පේරාදෙනිය විශ්ව විද්‍යාලය
  පේරාදෙනිය

- එස්. කේ. එල් ඔබේසේකර
  අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිළධාරි බලංගොඩ හා මඩුල්සිම වැවිලි සමාගම
  තැ පෙ අංක 6 ෆාම් ගාඩ්න් වත්ත රත්නපුර,

- එන්. බී. එච් පිලපිටිය
  නව විතානකන්ද වත්ත දෙල්වල උප තැපැල් කාර්යාලය රත්නපුර 70046

- එල්.ජේ පීරිස් මයා
  කළමනාකාර අධ්‍යක්ෂ - හේලිස් ඉන්ජිනියරින් පුද්.සමාගම

- ඉන්ජිනේරු ජේ.කැලිස්ටස් ඊ අලස්
  ඉන්ජිනේරු ආයතනය

- එච්.ඩි හේමරත්න
  උපදේශක - කොළඹ තේ අලෙවිකරුවන්ගේ සංගමය

- ආචාර්ය කේ.එස්. පී අමරතුංග
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කෘෂි ඉන්ජිනේරු දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය

- රොෂාන් රාජදුරෙයි මයා
  කළමනාකාර අධ්‍යක්ෂ - කැළණිවැලි  වැවිලි සමාගම

- ජී.ඩී.වී. පෙරේරා මයා
  අධ්‍යක්ෂ - ලංකෙම් තේ හා රබර් වැවිලි සමාගම

- එල්.පී ජයසිංහ මයා
  අධ්‍යක්ෂ - ජියෝටෙක් සමාගම

- ආචාර්ය එම්.එම්.නුගලියද්ද මිය

- ආචාර්ය එල්.එස්.කේ හෙට්ටිආරච්චි (සම්බන්ධිකරණ ලේකම්)
  අතිරේක අධ්‍යක්ෂ - තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය කේ. එම් මොහොට්ටි
  නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)තේ පර්යේෂණායතනයතලවාකැලේ

**වතු හා උපදේශන සේවා කමිටු සාමාජිකයින්**

- ආචාර්ය ඩී.වී සිවරත්නම් (2015  අප්‍රේල් දක්වා)
  ප්‍රධාන විධායක නිළධාරි - වටවල වැවිලි සමාගම

- රොෂාන් රාජදුරෙයි මයා (2015 අගෝස්තු මස සිට) (කමිටු සභාපති)
  කළමනාකාර අධ්‍යක්ෂ, කැළණිවැලි වැවිලි සමාගම

- ආචාර්ය එස්.ජී ඉලංගන්තිලක (2015 අගෝස්තු දක්වා )
  සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය එම්.එම්.ජේ.පී.ගවරම්මාන    (2015 නොවැම්බර් සිට)
  සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය අයි.සරත්.බී අබේසිංහ
  අධ්‍යක්ෂ - තේ පර්යේෂණායතනය  තලවාකැලේ

- ආචාර්ය එල්.එස්.කේ හෙට්ටිආරච්චි
  අතිරේක අධ්‍යක්ෂ - තේ පර්යේෂණායතනය තලවාකැලේ

- ආචාර්ය ඩී.එස් .ඒ සමරවීර

- විරේන් රුබේරු මයා
  ප්‍රධාන විධායක නිළධාරි - කහවත්ත වැවිලි පුද්.සමාගම

- ඒ.එල් ඩබ්ලිව්.ගුණවර්ධන මයා
  විධායක අධ්‍යක්ෂ - ඇල්පිටිය වැවිලි සමාගම

- කමල් පුංචිහේවා මයා
  ප්‍රධාන විධායක නිළධාරි - ආගරපතන වැවිලි සමාගම

- මහාචාර්ය ඩබ්ලිව්.ඒ .ඩී.පී වනිගසුන්දර
  කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය පේරාදෙණිය

- සී.ජේ.අයි.ටී ප්‍රනාන්දු මයා
  සාමාන්‍යාධිකාරි - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

- එන්.රත්නායක මයා
  සභාපති - සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සම්මේලනය

- ආර්.එස්.විජේසේකර මයා
  අධ්‍යක්ෂ(ව්‍යාප්ති හා පුහුණු) කෘෂකර්ම දෙපාර්තමේන්තුව

- ගිහාන් ද ලිවේරා මයා (2015 අගෝස්තු දක්වා)
  ප්‍රධාන විධායක නිළධාරි - ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

- ආචාර්ය වී.එස් සිධාකරන්
  (සම්බන්ධීකරණ ලේකම්) ප්‍රධාන උපදෙස් නිළධාරි තේ පර්යේෂණායතනය
  තලවාකැලේ

**විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්**

- ඩී.එච්.එස්.පුල්ලේපෙරුම  මිය (කමිටු සභාපති)
  අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

- ජේ එම්.බී,ජේ බණ්ඩාර මයා
  සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සම්මේලනය

- කේ.එස්.විජේකීර්ති
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

- ගිහාන් ද ලිවේරා මයා
  ප්‍රධාන විධායක නිළධාරි ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

- කේ.පී රණසිංහ මයා (සම්බන්ධීකරණ ලේකම්)
  අභ්‍යන්තර විගණක - තේ පර්යේෂණායතනය තලවාකැලේ

- සී.එම්.එස් ඇන්තනී මිය සාමාජික (නිරීක්ෂක)
  විගණන අධිකාරි - විගණකාධිපති දෙපාර්තමේන්තුව

# සභාපතිතුමාගේ වාර්තාව, තේ පර්යේෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව -2015 මා ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි. වර්ෂය ආරම්භ වීමත් සමග නව රජය බලයට පත්වී 2015 නොවැම්බර් මස දෙවන දින අලුතින් පත් කරන ලද තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස මම වැඩ භාරගතිමි. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයට ලබාදුන් උපදෙස් හා මග පෙන්වීම වෙනුවෙන් පසුගිය ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ආචාර්ය සරත් ඉලංගන්තිලක මහතාටත් අනෙකුත් සියලුම මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ටත් මම ස්තූතිය ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි.

2015 වසරේදී දිගින් දිගටම තේ මිල පහත වැටීමත් නිෂ්පාදන මිල ඉහළ යාමත් නිසා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය විවිධ අභියෝග රැසකට මුහුණ පෑවේය. තේ මිලදී ගන්නා රට වලට බලපෑ බාහිර සාධක මිල පහළ වැටීමට හේතු විය. අදාල වර්ෂය තුළ තේ නිෂ්පාදනය ද සුළු ප්‍රමාණයකින් පහත වැටිණි. මීට අමතරව ග්ලයිපෝසේට් වල්නාශකය තහනම් කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය හමුවේ වල්පැල පාලනය සඳහා වැය වන වියදමද ඉහළ ගියේය. ශ්‍රම හිගතාවයට සහ ඵලදායිතාවයට අදාල ගැටළුසහගත තත්වයන් තේ කර්මාන්තය තුළ තවදුරටත් පැවැතුණි.

මෙම තත්වයන් හමුවේ ඒවාට වඩාත් සුදුසු විද්‍යාත්මක හා තාක්‍ෂණික නිර්දේශ ලබා දීමේදී තේ පර්යේෂණායතනයටද විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදුවිය. එබැවින් කුඩා තේ වතු සහ මහ වතු අංශ මුහුණ දුන් එම අභියෝග ජය ගැනීම සඳහා සුදුසු තාක්‍ෂණික ක්‍රමවේද සොයා ගනු පිණිස අවශ්‍ය මගපෙන්වීම තේ පර්යේෂණ මණ්ඩලය විසින් ලබා දෙන ලදි.

නව තේ පර්යේෂණායතන මණ්ඩලය පත් වු විගස තේ කර්මාන්තයට අවශ්‍ය සේවාවන් ඉතා හොඳ මට්ටමින් ලබාදීම සඳහා තේ පර්යේෂණ ආයතනය සතු හැකියාවත් (ශක්තියත්) පවතින අඩුපාඩු පිළිබඳවත් මුලින්ම අධ්‍යයනය කරන ලදි. ඒ අනුව තේ පර්යේෂණායතනය තේ කර්මාන්තය තුළ පවතින ඉතා ඉහළ වටිනාකමකින් යුතු ආයතනයක් බවත් තේ කර්මාන්තයට සේවා සැපයීම පිණිස තේ පර්යේෂණායතනය සතුව මනා හැකියාවක් පවතින බවත් අවබෝධ කරගන්නා ලදි. පවතින අඩුපාඩු මගහැර ගැනීම පිණිස යටිතල පහසුකම් (මාර්ග සහ ගොඩනැගිලි) සහ වාහන සංචිතය වැඩිදියුණු කිරීමල සේවක පුරප්පාඩු පිරවීම සේවක මණ්ඩලය ආයතනය තුළ රඳවා ගැනීම සහ රාජ්‍ය සහ පුද්ගලික සබඳතා තුළින් ආදායම් ඉපයීම සඳහා විශේෂිත සේවාවක් ලබා දී ආයතනයට ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වල පවතින හිගය මගහරවා ගැනීම ආදී කරුණු පිළිබඳව තේ පර්යේෂණ මණ්ඩලයේ විශේෂ අවධානය යොමු විය.



**Dr M M J P Gawarammana**
*Chairman,*
*Tea Research Board,*
*Tea Research Institute,*
*Talawakelle*

ඉලෙක්ට්‍රෝනික පද්ධති භාවිතා කොට තේ පිරිසැකසුම් තාක්ෂණය වැඩිදියුණු කිරීම හා තේ සහ ශරීර සෞඛ්‍යය සම්බන්ධ පර්යේෂණ පිළිබඳව තවදුරටත් පර්යේෂණ පැවැත්වීමේ වැදගත්කම අවධාරණය කරන ලදි.

පර්යේෂණ කරගෙන යාම පිණිස වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කරනු වස් විද්‍යාඥයින්ගේ හා සේවක මණ්ඩලයේ විශිෂ්ට දායකත්වයන් ඇගැයීම් පිණිස ක්‍රමවේදයක් සකස් කිරීමටත් විදේශිය ආයතන සහ දේශීය විශ්ව විද්‍යාල වල සිටින විශේෂඥයින් සමග තේ පර්යේෂණායතනය සතු අන්තර් සබඳතා ශක්තිමත් කිරීමටත් කටයුතු කරන ලදි. තේ පර්යේෂණායතනය සතු තේ වතු දෙකට ආර්ථිකව ලාභදායි වන ආකෘති හඳුන්වා දෙමින් ඒවායේ චිරස්තායි බව පවත්වා ගැනීමේ අවශ්‍යතාව තේ පර්යේෂණ මණ්ඩලය ඉස්මතු කර පෙන්වාදෙන ලදි.

පර්යේෂණ කටයුතු පිළිබඳවත් තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීම පිළිබඳවත් ශා/කුම්බිස් හා ශා/ජෝකිම් වතු කළමනාකරණය සම්බන්ධවත් ආයතනයේ පරිපාලන සහ මුදල් අංශද විසණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණයට ලක්විය. තීරණ ගැනීමේදී තේ පර්යේෂණ මණ්ඩලයට අවශ්‍ය මගපෙන්වීම පර්යේෂණ උපදේශන කමිටුව හා වතු සහ උපදෙස් සේවා පිළිබඳ උපදේශන කමිටුව මගින් තවදුරටත් ලබා දෙන ලදි.

අධ්‍යක්ෂ තුමාගේ හා කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීමත් තේ පර්යේෂණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් සහයෝගයත් තේ පර්යේෂණ මණ්ඩලය වෙනුවෙන් මම අගය කරමි.

තේ පර්යේෂණ මණ්ඩලයට ලබාදුන් මගපෙන්වීම පිළිබඳව ගරු අමාත්‍ය තුමාටත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තුමාට හා කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පිරිනැමීමට කැමැත්තෙමි.

සභාපති ලෙස තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී මා හට ලබා දුන් මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් තේ පර්යේෂණ මණ්ඩලයේ සියළුම සාමාජික මහත්ම මහත්මින්ට ද මම කෘතඥ වෙමි.



වෛද්‍ය එම්. එම්.ජේ. පී. ගවරම්මාන
සභාපති
තේ පර්යේෂණ මණ්ඩලය

## අධ්‍යක්ෂතුමාගේ වාර්තාව

මහාචාර්ය සරත් ඉලංගන්තිලක මහතා 2015 පෙබරවාරි 10 වන දින තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස වැඩ භාරගත් අතර ආචාර්ය එච්.එම්.ජේ.පී.ගවරම්මාන මහතා නොවැම්බර් මස 2 වන දින තේ තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස පත්විය.

2015 දෙසැම්බර් 02 වන දින වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා තේ පර්යේෂණායතනයේ නිරීක්ෂණ චාරිකාවක යෙදුනි. සීමිත පහසුකම් යටතේ වුවත් තේ පර්යේෂණායතනය විසින් ඉටුකර ඇති සේවාවන් ගරු ඇමති තුමන්ගේ ඇගයීමට ලක් වූ අතර ආයතන සේවකයින්ගේ පවතින වේතන ගැටලු භාණ්ඩාගාර ලේකම් තුමා හමුවට ගෙන යාමට එකඟ විය. එවගේම ආසියානු සංවර්ධන බැංකු හෝ ලෝක බැංකු ආධාර ලබා ගනු පිණිස ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම පිළිබඳව වාර්තාවක් සකස් කර ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. ග්ලයිෆෝසෙට් වල්නාශකය තහනම් කිරීම නිසා තේ වතු අංශයට සිදු වී ඇති බලපෑම පිළිබඳවද එතුමන් විශේෂ අවධානය යොමු කරන ලදි. වෙනත් ආදේශකයන් නොපවතින වකවානුවක ග්ලයි-ෆෝසෙට් වල්නාශකයේ අවශ්‍යතාව තේ පර්යේෂණායතනය විසින් අවධාරණය කරන ලදුව, ඒ පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා කරනු වස් එහි අවශ්‍යතාව ඇතුලත් සවිස්තර වාර්තාවක් සකස් කර ලබා දෙන ලෙසද ඉල්ලා සිටින ලදිග තේ වලට අගය එකතු කිරීම පිළිබඳ පර්යේෂණ කඩිනම් කිරීමේ වැදගත්කම ගරු අමාත්‍ය තුමා විසින් අවධාරණය කරන ලදි.

වැවිලි කර්මාන්ත අමාත්‍යංශ ලේකම්තුමන් හා එහි ජ්‍යෙෂ්ඨ නිළධාරීන් 2015 නොවැම්බර් 06 වන දින තේ පර්යේෂණායතනයේ නිරීක්ෂණ චාරිකාවක යෙදුන. පැවති සාකච්ඡාවේදී අධ්‍යක්ෂතුමා විසින් තේ පර්යේෂණ පිළිබඳවත්, තේ පර්යේෂණායතනයේ තේ වතු දෙක පිළිබඳව හා තේ පර්යේෂණායතනයේ පවතින අඩුපාඩු පිළිබඳවත් ඉදිරිපත් කිරීමත් සිදු කරන ලදි. එහිදී කුඩා තේ වතු අංශය තුල යන්ත්‍රෝපකරණ ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමා උපදෙස් දෙන ලදි. එවගේම දැනට භාවිත වන මිශ්‍රණ හා සැසඳීමේදි හඳුන්වා දී තිබෙන නව පොහොර මිශ්‍රණ වලින් ලැබෙන අමතර වාසි පිළිබඳවද වාර්තාවක්ද ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. කුඩා තේ වතු අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම පිණිස විස්තරාත්මක සමීක්ෂණයක් සිදු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදි තේ පර්යේෂණායතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එක්ව කටයුතු කරන ව්‍යාපෘතියක් ලෙස කුඩා තේ වතු අංශය වෙත ලබා දෙන ව්‍යාප්ති සේවා විධිමත් කිරීමටද යෝජනා විය. ශාන්ත ජෝකිම් වත්තේ මුදල් තත්වය හා කාර්යය සාධනය පිළිබඳවද අවධානය යොමු කරන ලදි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව සමිති ජාලය හරහා දලු ලබාගැනීම පිණිස රාජ්‍ය හා පුද්ගලික සහයෝගීතාවක් ඇති කර ගනු වස් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම ආදී කරුණු පිළිබඳව සහ කාර්ය ප්‍රාග්ධනය (working capital) පවත්වා ගැනීමේ වැදගත්කමද ඇතුලත්ව වාර්ථාවන් සකස් කිරීමට උපදෙස් ලබාදෙන ලදි. මේ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් හෝ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීමේ හැකියාව පිළිබඳවද අවධානය යොමු කරන ලදි.

තේ පර්යේෂණායතනය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව කුඩා තේ වතු හිමියන්ට ලබාදෙන පොහොර මිශ්‍රණවල ප්‍රමිතිය පිලිබද සොයා බැලීමක් රජයේ දින 100 වැඩසටහන යටතේ දියත් කරන ලදී. ජ්‍යෙෂ්ඨ තේ පරික්‍ෂක කොට්ඨාශ 26 කින් ලබාගත් පොහොර සාම්පල 520 ක් තේ පර්යේෂණ විද්‍යාගාර තුළ විශ්ලේෂණය කරන ලදි. මීට අමතරව තේ පර්යේෂණායතනය දියත් කළ 2015 නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වසර යන වැඩසටහන යටතේ නිවැරදි පොහොර භාවිතය හා පාංශු පෝෂණය වැඩිදියුණු කිරීම පිළිබඳව දැනුවත්කිරීම් පෙළක් සිදු කරන ලදි.



***Dr. I S B Abeysinghe***
*B Sc (Peradeniya, Sri Lanka)*
*Ph D (Sheffield, UK)*

2015 අගෝස්තු 11 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිළධාරීන් හා එක්ව රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ කලවාන හා ගල්ලෑල්ල යන ප්‍රදේශ වල පදුරු දුර්වල වී මැරීයාමේ තත්වය පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදි. මෙම තත්වයට ගොදුරු වූ ඉඩම් වල පාළු සිටුවීමට හා නැවත සිටුවීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන කුඩා තේ ඉඩම් හිමියන්ට ලබා දීම පිණිස අවශ්‍ය මුදල් 2016 වර්ෂයේ අයවැය ලේඛනයට ඉදිරිපත් කිරීම පිණිස වාර්තාවක් සකස් කිරීමට තීරණය විය. ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණායතනය එක්ව ඒකාබද්ධ වාර්තාවක් සකස් කර වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි. තත්වයෙන් උසස් තේ පැළ ලබා ගැනීමට හැකි වන පරිදි තවාන් පැළ වල තත්වය සහතික කිරීමේ වැඩ පිළිවෙල, වටපණු නාශක සුලභ කිරීම අදාල ප්‍රදේශ වල පාංශු ආම්ලිකතාව ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම, වගා ආදර්ශන ඇති කිරීම සහ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට යෝජනා විය.

තේ, පොල්, රබර් හා උක් පර්යේෂණායතනය එක්ව සකස් කරන ලද වැටුප් වැඩි කිරීම පිලීබඳ වාර්තාව වැවිලි කර්මාන්ත ඇමතිතුමන් හා ලේකම්තුමා හමුවේ සාකච්ඡා කරන ලදි. ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමන් එම වාර්තාව කෙරේ ධනාත්මක ප්‍රතිචාරයක් දක්වන ලද අතර එහි කරුණු හොඳින් ඉස්මතු කර වැටුප් කොමිසමට හා කලමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා අදාල අනෙක් පර්යේෂණ ආයතන සමඟ සාකච්ඡාවක් කැඳවන ලෙස අමාත්‍යංශයට උපදෙස් ලබා දෙන ලදි.

**පර්යේෂණ උපදෙස් හා ව්‍යාප්ති කටයුතු**

කීට විද්‍යා හා වටපණු වේදී අංශයේ පර්යේෂණ කටයුතු 2015 පෙබරවාරි 05 වන දින ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) මහාචාර්ය රොහාන් රාජපක්ෂ (රුහුණු විශ්වවිද්‍යාලය) සහ ආචාර්ය පී.ඒ.ඩබ්. විජේසේකර යන විද්වතුන්ගෙන් සැදුම්ලත් විද්‍යාත්මක උපදේශන කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

ශාක අභිජනන අංශයේ පර්යේෂණ කටයුතු 2015 මාර්තු 19 වන දින ආචාර්ය කේ. ගුණසේකර (COSTI) ආචාර්ය ලලිත් පෙරේරා (පොල් පර්යේෂණායතනය) සහ ආචාර්ය එස්. අබේසිරිවර්ධන (CIC) යන විද්වතුන්ගෙන් සැඳුම්ලත් විද්‍යාත්මක උපදේශන කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

ශාක ව්‍යාධි විද්‍යා අංශයේ පර්යේෂණ කටයුතු 2015 ජූලි 02 වන දින මහාචාර්ය එන්.කේ.බී. අධිකාරම් (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) සහ ආචාර්ය ආර්.එන්. අත්තනායක (කැළණිය විශ්වවිද්‍යාලය) යන විද්වතුන්ගෙන් සැදුම්ලත් විද්‍යාත්මක උපදේශන කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

කෘෂි ආර්ථිකවිද්‍යා අංශයේ පර්යේෂණ කටයුතු 2015 ජූලි 20 වන දින මහාචාර්ය ජේ. වීරහේවා (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) සහ මහාචාර්ය වයි.එම්.වික්‍රමසිංහ (රජරට විශ්වවිද්‍යාලය) යන විද්වතුන්ගෙන් සැදුම්ලත් විද්‍යාත්මක උපදේශන කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

ජෛව රසායන අංශයේ පර්යේෂණ කටයුතු මහාචාර්ය බී.එම්.ආර්.බණ්ඩාර (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) සහ ආචාර්ය ඒ. ලියනගේ යන විද්වතුන්ගෙන් සැදුම්ලත් විද්‍යාත්මක උපදේශන කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

තේ සැකසුම් තාක්ෂණ අංශයේ පර්යේෂණ කටයුතු ආචාර්ය ඩී.එස්.ඒ. සමරවීර, ආචර්ය එස්. අමරතුංග සහ පී. ජයසිංහ යන විද්වතුන්ගෙන් සැඳුම්ලත් විද්‍යාත්මක උපදේශණ කමිටුවේ අධීක්ෂණයට ලක්විය.

2016 අයවැය වාර්තාවට ඇතුළත් කිරීම පිණිස පහත සඳහන් පර්යේෂණ හා සංවර්ධන පිළිබඳ යෝජනා වැවිලි කර්මාන්ත අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලදි.

1. පරිසර වෙනස්වීම් වලට තේ ශාකය දක්වන ප්‍රතිචාර පිළිබඳ අධ්‍යයනය (රු.මිලියන 34.45)

2. වැඩිදියුණු කළ තේ ප්‍රභේද හා බීජ තේ වල තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය තේ වගාකරුවන්ට ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කිරීම (රු.මිලියන 86)

3. කඳ විදින ගුල්ලා මර්ධනය කිරීම සඳහා ජෛව රසායන ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම. (රු. මිලියන 17.56)

4. තේ පර්යේෂණායතනයේ විද්‍යාගාර හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. (රු.මිලියන 1173)

5. තේ පර්යේෂණායතනය සතු ශාන්ත කුම්බ්ස් හා ශාන්ත ජෝකිම් වතු / කර්මාන්ත ශාලා ආදර්ශ වතු හා කර්මාන්ත ශාලා ලෙස වැඩිදියුණු කිරීමග (රු. මිලියන 204.36) ඉහත සඳහන් ව්‍යාපෘති යෝජනා වැවිලි කර්මාන්ත අමාත්‍යංශය විසින් නිර්දේශ කර මහා භාණ්ඩාගාරයට යවා ඇත.

**සම්මාන හා පිළිගැනීම්.**

ආචාර්ය අයි.එස්.බි. අබේසිංහ මහතා ඇල්කඩුව වතු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්විය.

ආචාර්ය අයි.එස්.බි. අබේසිංහ මහතා කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්විය.

ලෝක විද්‍යා සම්මේලනය විසින් ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පැවැත්වූ අන්තර්ජාතික විද්‍යා සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය පර්යේෂණ හා අනාගත සංවර්ධන කටයුතු පිළිබඳව දේශනයක් පැවැත්වීමට අයි.එස්.බි. අබේසිංහ මහතාට ආරාධනා කරන ලදි.

ආචාර්ය අයි.එස්.බි. අබේසිංහ හා ආචාර්ය කේ.එම්.මෙවන් යන මහත්වරුන් විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මාන ලැබීය.

ආචාර්ය කේ.එම්. මොහොට්ටි මහතා විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ ඇගයීමට ලක්විය.

වරලත් සණකාධිකාරීන්ගේ වාර්ෂික වාර්තා සඳහා සම්මාන පිරිනමන තරගයේ විනිශ්චය මණ්ඩලයට ආචාර්ය අයි.එස්.බි. අබේසිංහ මහතාට ආරාධනා කරන ලදි.

ආචාර්ය කේ.මොහොට්ටි, ජේ.ඩී.කොට්ටවආරච්චි, සහ කේ.කේ.රණවීර යන මහත්වරුන් විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ ඇගයීමට ලක්විය.

ආචාර්ය කේ.එම්. මෙවන් මහතා විසින් ලියන ලද පර්යේෂණ පත්‍රිකාව ඉන්දුනීසියාවේ පැවති ආහාර කෘෂිකර්ම හා ස්වභාවික සම්පත් පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදි.

ආචාර්ය කේ.එම්. මෙවන් මහතා විසින් ලියන ලද පර්යේෂණ පත්‍රිකාව තේ සංස්කෘතිය, නිර්මාණශීලීත්වය හා විද්‍යාව පිළිබඳව තායිවානයේදී 2015 ඔක්තෝම්බර් 8 - 9 දෙදින තුල පැවති සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලදි.

ආචාර්ය කේ.එම්.මොහොට්ටි සහ එමග කේ.කේ. රණවීර යන මහත්වරුන් 2012 - 2013 කාලය තුලදී පල කරන ලද පත්‍රිකා වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ ඇගයීමට ලක්විය.

ආර්.ඩී.පී.ඩී සේනානායක මහත්මියට පහතරට සජීවි දැව වේයා පිළිබඳව ඉදිරිපත් කරන ලද පශ්චාත් උපාධි ග්‍රන්ථය වෙනුවෙන් කැළණිය විශ්වවිද්‍යාලය මඟින් ආචාර්ය උපාධිය පිරිනමන ලදි.

ද්‍රෝණිකා තුල තේ තවමැරීමේ ක්‍රියාවලිය පාලනය කිරීම පිළිබඳව ව්‍යාපෘතියක් දියත් කිරීමට 2015 සැප්තැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා කාලය සඳහා රුපියල් මිලියන 6.4 ක මූල්‍ය ප්‍රධානයක් ජාතික විද්‍යා පදනම මඟින් ලබා දෙන ලදි.

**අධ්‍යයන කටයුතු**

ආචාර්ය එච්.ඩබ්.ශ්‍යාමලි 2015 සැප්තැම්බර් 8 - 28 දිනවල චීනයේ පැවති දියුණු වෙමින් පවතින රටවල් සඳහා තේ සංස්කෘතිය හා කර්මාන්තකරණය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී විය.

එම්.ඒ.බී. රණතුංග මහතා 2015 දෙසැම්බර් 7 - 17 දක්වා චීනයේ යුනාන් ඇකඩමියේ සංචාරයක නිරත විය.

**පර්යේෂණ කඩඉම්**

**බෝග වැඩි දියුණු කිරීම**

2006-2007 වසර වල සිදු කල දෙමුහුම් කරන ක්‍රියාවලියන්හි අළුතින් වැඩි දියුණු කරන ලද වගා ප්‍රභේද වල විවිධ කෘෂි දේශගුණික කලාපයන් සඳහා ඇති උචිතභාවය හඳුනා ගැනීමේ පළමු පියවරේ අත්හදා බැලීම් පස්සර, හන්තාන හා තලවකැලේ යන ස්ථානයන් හි ආරම්භ කරන ලදී. මෙම දෙමුහුම්කරණයන් සඳහා ජනක ලෙස අස්වැන්න වර්ධන හැකියාව වැනි පරාමිතික වලින් වඩා උචිත ලක්ෂණ සහිත වගා ප්‍රභේද සහ විවිධත්වයෙන් යුත් දෙමාපිය ප්‍රභේදයන් භාවිතා කරන ලදී. උඩරට ප්‍රදේශයේ විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා සුදුසු තේ ප්‍රභේද ඇගයීම සඳහා අත්හදා බැලීමේ අදියර ii හි පර්යේෂණ පස්සර මධ්‍යස්ථානයේ ආරම්භ කරන ලදී.

TRI 5000 කාණ්ඩයේ දුර්වල මුල් වර්ධනයක් සහිත ප්‍රභේදයන් හි මුල් වර්ධනය උත්තේජනය කිරීම සඳහා භාවිතා කල හැකි ප්‍රශස්ත ශාක හෝමෝන සංයෝජන සොයා ගැනීමට සිදුකල පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව මුල් සහ ශාක වර්ධනය සඳහා වඩාත් ප්‍රශස්ත ශාක හෝමෝන සංයෝජන ලෙස ඉන්ඩෝල් බියුට්‍රික් ඇසිඩ් (IB) 6000 ppm ද්‍රාවණය හෝ නැප්තයිල් ඇසිටික් ඇසිඩ් (N) 6000 ppm සමග ඉන්ඩෝල් බියුට්‍රික් ඇසිඩ් (IB) 4000ppm මිශ්‍රණය වඩාත් උචිත බව තහවුරු විය.

**තේ වගාකරන ආන්තික ප්‍රදේශ සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යයක් ලෙස වැඩි දියුණු කල තේ බීජ යොදාගැනීම**
ඌව කලාපය තුළ වැඩි දියුණු කල බීජ සඳහා ඇති ඉහල ඉල්ලුමට සරිලන පරිදි බීජ සැපයීම සඳහා නව බහු ක්ලෝන බීජ උද්‍යානයක් පස්සර මධ්‍යස්ථානයේ ස්ථාපනය කරන ලදී.

**තේ ජාන සංචිතයේ රසායනික සංඝටක පැතිකඩ විශ්ලේෂණය කිරීම සහ අනුලක්ෂණය කිරීම**
තේ ජාන සංචිතයේ ඇති දර්ශ වල ඇති රසායනික සංඝටක පැතිකඩ අධිතාක්ෂණික ක්‍රම වේදයන් මගින් විශ්ලේෂණය කිරීමට අනුව ජාන ප්ලාස්මයේ දර්ශ අතර රසායනික සංඝටක පැතිකඩෙහි ඉහළ විචලතාවයක් දක්නට ඇති බව සොයා ගන්නා ලදී. මීට අමතරව ජාන ප්ලාස්මයේ ප්‍රධාන ඇමයිනෝ අම්ල කාණ්ඩ 2ක් වන තියැනින් සහ ප්‍රෝලීන් ප්‍රමාණයන්හි පුළුල් විචලනයක් පවතින බව තහවුරු වී ඇත. මේ අතුරින් තියැනින් සෞඛ්‍යය හා සම්බන්ධ වන අතර බොහෝ ශාකවල ජල හිඟතාවයට අනුවර්තනය වීම හා ප්‍රෝලීන් ඒකරාශී වීම අතර සම්බන්ධතාවයක්ද පවතී.

**හරිත තේ නිපදවීම සඳහා සුදුසු තේ ප්‍රභේද හඳුනා ගැනීම**
ජාන ප්ලාස්ම එකතුවේ ඇති විදේශීය ප්‍රභේද අතරින් පොලිෆීනෝල් සහ කැෆේන් වැඩි ප්‍රභේද හරිත තේ සඳහා උචිතභාවය පරීක්ෂා කිරීමට තෝරාගන්නා ලදී. මෙමගින් TRI 4067 සහ CH 13 ඇතුළුව ප්‍රභේද 12ක් හරිත තේ නිපදවීම සඳහා සුදුසු බව හඳුනා ගන්නා ලදී.

**නියගයට ප්‍රතිරෝධී 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදයන් අධ්‍යයනය කිරීම**
කායික හා ජෛව රසායනික ප්‍රතිචාර ඇසුරින් නියගයට ඔරොත්තු දෙන දර්ශ අධ්‍යයනය කරන ලදී පහතරට කලාපයට යෝජිත නියගයට ග්‍රාහීයතා දර්ශකයට අනුව 1/10, 29, 294 හා 62 යන වගාදර්ශයන් අනෙකුත් වගා දර්ශවලට වඩා අධික නියං ග්‍රාහීයතාවක් පෙන්නුම් කරයි 107, 11/12, 23/5, 1, 131, 133 සහ 163 නියං ප්‍රතිරෝධී වගාදර්ශයන් ලෙස වර්ගීකරණය කල හැක.

මැදරට කලාපයට යෝජිත නියගයට ග්‍රාහීයතා දර්ශකයට අනුකූලව 139,62 සහ 12 යන වගාදර්ශයන්, අනෙකුත් වගාදර්ශයන්ට වඩා නියගයට අධික ග්‍රාහීයතාවක් පෙන්වයි. 131 සහ 133 නියගයට ප්‍රතිරෝධී වගා දර්ශයන් වේ.

**තේ වගාවේ ප්‍රධාන පළිබෝධකයින්ට ප්‍රතිරෝධී තේ ප්‍රභේද සහ බීජ තේ වර්ග හඳුනා ගැනීම**
5000 කාණ්ඩයේ දර්ශ වලින් ප්‍රැටිලෙන්චස් ලූසියි වටපණුවන්ට කඳ විදින ගුල්ලාට හා පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී/ඔරොත්තුදෙන තේ දර්ශ හඳුනා ගැනීම සිදු කෙරිණ. මෙහිදී උඩරට කලාපයට යෝජිත 5000 කාණ්ඩයේ (VP 81, VP 83, VP 80) සහ ඌව කලාපයට යෝජිත ප්‍රභේද (VP 9) ප්‍රැටිලෙන්චස් ලූසියි වටපණුවන්ට දක්වන ප්‍රතිරෝධතාව විමර්ශනය කරන ලදී. ඒ අනුව ප්‍රභේද 05 සහ 272 ප්‍රතිරෝධී ලෙසත්, ප්‍රභේද 210 සහ 101 මධ්‍යම ප්‍රතිරෝධී ප්‍රභේද ලෙසත් වර්ගීකරණය කරන ලදී .

**5000 ශ්‍රේණිය තේ දර්ශ ඌව කලාපයේ බුබුළු අංගමාර රෝගයට දක්වන ප්‍රතිරෝධීතාව පරීක්ෂාවට ලක් කිරීම**
බුබුළු අංගමාර රෝගය සඳහා 5000 ශ්‍රේණියේ තේ දර්ශ දක්වන ප්‍රතිරෝධීතාවට අනුව 89 සහ 243 යන දර්ශ ඉතා ප්‍රතිරෝධී දර්ශ ලෙසත්, 88, 208 සහ 199 වර්ග මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී ලෙසත් හඳුනා ගන්නා ලදී.

**5000 ශ්‍රේණියේ තේ දර්ශ පහත රට කලාපයේ කඳ පිළිකා රෝගයට දක්වන ප්‍රතිරෝධීතාව පරීක්-ෂාවට ලක් කිරීම**

ශාන්ත ජෝකිම් වත්තෙහි දෙවන අදියරේ පර්යේෂණ වලින් ලද ප්‍රතිඵල වලට අනුව තේ දර්ශ 91 කින් තේ දර්ශ 7 ක් (5/35, 4/4, 6/24, PR-160, PR 171, PR 140, 14/11) රෝගය සඳහා ප්‍රතිරෝධීතාවක් දක්වන බව හඳුනා ගන්නා ලදී. තේ දර්ශ 11 රෝගයට මධ්‍යම ප්‍රතිරෝධීතාවක් දක්වන බවත්, තවත් දර්ශ 42 ක් රෝගයට නැඹුරුතාවක් දක්වන අතර දර්ශ 31 ක් අධික ලෙස රෝගයට නැඹුරුතාවක් දක්වන බවත් එහිදී හඳුනා ගන්නා ලදී.

පරීක්ෂණයේ තෙවන පියවර ලෙස ඉන්දොල වතුයාය යොදා ගත් අතර එහිදී තේ දර්ශ 2 ක් (P6 සහ P7) රෝගයට අධික ලෙස ප්‍රතිරෝධී බවත් තවත් තේ දර්ශ 2 ක් (P8 සහ P11) රෝගයට ප්‍රතිරෝධී බවත්, දර්ශ 3 ක් රෝගයට ගොදුරු වන ඒවා ලෙසත් තේ දර්ශ 4 ක් රෝගයට ඉතා නැඹුරු වර්ග ලෙසත් හඳුනා ගන්නා ලදී.

## භූමි ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ භෝග පාලනය
## පාංශු සශ්‍රීකත්වය උදෙසා ඒකාබද්ධ ක්‍රමවේද භාවිතය

**මේරූ තේ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස භාවිත කිරීම**

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව, කර්මාන්තශාලා දර අළු සමග කසල තේ සහ යූරියා යෙදූ ප්‍රතිකාරයකයේ පත්‍රවල පෝෂක ප්‍රතිශතය සහ දළු අස්වැන්න වැඩි වී ඇත ඒ අනුව, වැඩි පාංශු pH ස්වාරක්ෂ ධාරිතාවක් ඇති උඩරට ප්‍රදේශයේ තේ වගාවන් සඳහා දැව අළු සහ කසල තේ මිශ්‍රකර යූරියා සමග යෙදීමට පුලුවන.

**ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා (PGPR) ක්ෂේත්‍ර තත්ත්ව යටතේ ඇගයීම**

ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා යොදාගනිමින් කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල වලට අනුව, යොදාගත් බැක්ටීරියා මාදිලි පාංශු ශ්‍රේණි සඳහා විශේෂත්වයක් පෙන්වූ අතර ඒවා අස්වැන්න කෙරෙහිද ධනාත්මක ලෙස බලපා ඇතිබව පෙන්වන ලදී. එසේම, පාංශු ශ්‍රේණි සඳහා ද්විත්ව බැක්ටීරියා මාදිලි යොදා ගැනිමෙන් මේරූ තේ මිශ්‍රණයේ (වීපී/යූ එම්910) නයිට්‍රජන් ප්‍රමාණයෙන් 33%ක් සහ පොස්පරස් ප්‍රමාණයෙන් 50%ක් අඩු කළ හැකි බව පෙනේ.මැදරට ප්‍රදේශයේ තේ වගා කරන ඉඩම්වල පසේ භෞත රසායනික ලක්ෂණ වැඩිදියුණු කර, ඉහත සඳහන් කළ බැක්ටීරියා මාදිලි භාවිතයෙන් යොදන රසායනික පොහොර ප්‍රමාණය අඩු කරගත හැකි බව පෙනේ.

**සෙමින් පෝෂක මුදාහරින පොහොර (Slow Release Fertilizer) මගින් පසෙහි සහ ශාකයේ පෝෂක ප්‍රමාණයට සහ අස්වැන්නට ඇතිකරන බලපෑම අධ්‍යයනය**

මේ පර්යේෂණය සඳහා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) මගින් නිපද වූ සෙමින් පෝෂක මුදාහරින පොහොර වර්ග තෝරා ගන්නා ලදී. මෙහි දී ප්‍රතිකාරක ලෙස සෙමින් පෝෂක මුදාහරින පොහොරවල විවිධ ප්‍රමාණ සහ යොදන වාර ගණන තෝරා ගන්නා ලදී. ප්‍රතිඵල වලට අනුව, වැඩිම අස්වැන්න වන හෙක්ටයාරයකට නිමි තේ කිග්‍රෑම් 4258 ලබා දුන්නේ, නයිට්‍රජන් පෝෂක 100% නැනෝ යූරියා සහ 100% පොටෑසියම් පෝෂක එම්ඕපී පොහොර මගින් ලබා දුන් වාර ගණන 04 ක් වූ ප්‍රතිකාරකයේය. නැනෝ පොහොර යෙදූ ප්‍රතිකාරක, වර්තමාන තේ පර්යේෂණායතන නිර්දේශයට වඩා සංසන්දනාත්මකව වැඩි අස්වැන්නක් ලබා දුණී.

**පසෙහි අඩංගු ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය පදනම් කර ක්ෂුද්‍ර පෝෂක අඩංගු පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීම**

ආර්ථිකමය ලාභදායි ක්ෂුද්‍ර පෝෂක අඩංගු පත්‍ර මතට ඉසින පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සිදුකල අධ්‍යයනයේ ප්‍රතිඵල වලට අනුව සින්ක් සහ මැන්ගනීස් ඇතුළත් ප්‍රතිකාරක වලින් වැඩිම අස්වැන්නක් දී තිබිණී. සින්ක්, බෝරෝන් සහ මැන්ගනීස් යන පෝෂක තුනම අන්තර්ගත ප්‍රතිකාරය දෙවැනි වැඩිම අස්වැන්න දී තිබිණී.

**පසෙහි pH අගය සහ pH ස්වාරක්ෂක ක්‍රියාව කෙරෙහි කසල තේ වලින් නිෂ්පාදනය කරන ලද ජෛව අඟුරු (Bio-char) වල බලපෑම අධ්‍යයනය කිරීම**

මෙම අධ්‍යයනයෙන් ලැබූ ප්‍රතිඵල සලකා බැලීමේදී, ජෛව අඟුරු යෙදීම නිසා පසෙහි pH අගය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත ජෛව අඟුරු යෙදීමෙන් පසු කාලයත් සමග පසෙහි pH අගය ක්‍රමයෙන් අඩු වූ අතර, මෙම අඩුවීම 500°C දී පිළියෙල කර ගත් අඟුරු යෙදූ පල්ලේගොඩ ශ්‍රේණියේ වැඩියෙන් පෙන්නුම් කරනු ලබයි. ජෛව අඟුරු දැමීම නිසා පාංශු pH ස්වාරක්ෂක ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩි විණි. උෂ්ණත්වය 300°C සහ 500°C දී පිළියෙල කර ගත් අඟුරු 2% එකතු කළ විට, පල්ලේගොඩ ශ්‍රේණියේ පස්වල පාංශු pH ස්වාරක්ෂක ධාරිතාව වැඩිවීම පිළිවෙලින්, 54% සහ 21%ක් වූ අතර, මට්ටකැලේ පාංශු ශ්‍රේණියේ පස්වල pH ස්වාරක්ෂක ධාර්තාව වැඩිවීම පිළිවෙලින් 11% සහ 6% විය.

**තේ ඉඩම්වල පසෙහි පෝෂක සුලභතාවය සහ පොහොර අවශ්‍යතාවය නිර්ණය කිරීම සඳහා විශ්ලේෂණ කට්ටලයක් නිර්මාණය කිරීම**

මෙහිදී නිර්මාණය කරන ලද ආදර්ශ විශ්ලේෂණ කට්ටල, පසේ සහ තේ ශාකයේ පෝෂක ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිතා කල හැකි බව අනාවරණය විය. මෙම උපකරණය සඳහා පේටන්ට් බල පත්‍රයක් ලබා ගැනීමට අයදුම් කර ඇත ඉන් පසු මෙම උපකරණය වානිජකරණය කිරීමට බලාපොරොත්තු වේ.

**පාංශු තත්ත්ව දර්ශකය වලංගු කිරීම**

පාංශු තත්ත්ව දර්ශක (Soil Quality Index-SQI) අගයන් පුනරුත්ථාපනය කල ක්ෂේත්‍රයේ හා යාබද පවතින පැරණි බීජ පැළ හෝ රිකිලි තේ ක්ෂේත්‍රයේ සසඳා, බලන ලදී. තෘණ ක්ෂේත්‍රය සඳහා ගණනය කරන ලද පාංශු තත්ත්ව දර්ශක අගය 6.1(±0.19) ක් වු අතර, බීජ පැළ / රිකිලි තේ සඳහා, එය 5.3 (0.18 ±) විය. මෙමගින් ගුණාත්මකව පුනරුත්ථාපනය කල පසේ හා තේ ක්ෂේත්‍රවල පසෙහි වෙනස ගැන පැහැදිලි සංඥාවක් පෙන්වයි. කෙසේ වෙතත් SQI වටිනාකම් උන්නතාංශය මට්ටම අනුව වර්ගීකරණය කරන ලද විට, මැද රට වටිනාකම් පමණක් සැලකිය යුතු වෙනසක් පෙන්වන ලදී.

**තේ වගාව, කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කර ගැනීම**

අළුහුණු සහ ගෙන්දගම් මිශ්‍රණය යොදාගනිමින් විද්‍යාගාර තුල කරන ලද පර්යේෂණ නිමාකර ඇත. අළුහුණු සහ ගෙන්දගම් මිශ්‍රණය කඳ විදින ගුල්ලා පාලනය සඳහා සාර්ථක ප්‍රතිඵල ලබාදුන් බැවින් මිශ්‍රණය නිෂ්පාදන කිරීම සුදුසු ආයතනයක් සමග ගිවිස ගැනීමෙන් පසු මහා පරිමාණයෙන් නිෂ්ප-ාදනය කරනු ඇත.

***Exobasidium vexans* රෝගකාරකයාගේ ජෛව විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය**

*Exobasidium vexans* රෝගකාරකයා සහිත තේ නියැදි 33 ක් විවිධ කළාප වලින් ලබා ගෙන අනුක විශ්ලේෂණ ක්‍රම මගින් පරික්ෂා කරන ලදී. එහිදී අනුක්‍රම නිර්ණය මගින් ලද ප්‍රතිඵල වලට අනුව එම එක් එක් කළාප වලින් ලබා ගත් රෝගාකරකයින් එකිනෙකට ඉතාමත් සමාන බවත් ජෛව විද්‍යාත්මකව වෙනස් කමක් නොමැති බවත් තහවුරුවිය.

**ඌව කළාපයේ සබුක්කු (ග්‍රැවේලියා රොබස්ටා) ශාකයේ පසුමැරීම**

ඌව කළාපයේ වතු යායවල් 14 ක සහ උඩරට ශාන්ත කුම්බිස් වතු යායේ දක්නට ලැබෙන මෙම පසුමැරීමේ තත්වයට *Lasiodiplodia pseudotheobromae* සහ *Neofussicoccum parvum* යන ව්‍යාධිජනක දිලීර හේතු වේ. අනුක තාක්ෂණ ක්‍රම සහ රූප විද්‍යාත්මක ක්‍රම මගින් ව්‍යාධිජනකයා තහවුරු කරගෙන ඇත.

**ගෝලීය දේශගුණික විපර්යාසයන් කෙරෙහි තේ ශාකයෙහි කායික විද්‍යාත්මක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම**

අනාගත තේ අස්වැන්න නිර්ණය කිරීම සඳහා A1F1 සංකල්පය වසර 2000 සිට 2100 දක්වා පහත රට, මැද රට සහ උඩ රට යන තේ වගාකරනු ලබන උච්චත්ව සඳහා යොදා ගන්නා ලදී. ක්‍රමාංකිත ආකෘති පුරෝකථනයට අනුව වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් වායුවේ ඉහළයාම සියලූම තේ වගාකරන ප්‍රදේශ වල තේ අස්වැන්න සහ කාබන් තිරකිරීමේ විභවය කෙරෙහි ධනාත්මක ලෙස බලපාන බව සොයාගන්නා ලදී. නිරීක්ෂණය කරන ලද අස්වනු ඉහළයාම පහත රට, මැද රට සහ උඩ රට සඳහා පිළිවෙලින් වසරකට හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3.4, 2.9 සහ 3.6 ක් වන බව සොයා ගන්නාලදී. කාබන් තිර කිරීමේ විභවය සියලූ තේ වගාකරනු ලබන ප්‍රදේශ සඳහා ධනාත්මක වුවද කාබන් තිර කිරීමේ වේගය, වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් වැඩිවීමේ ඒකකයක් සඳහා ගණනය කළවිට, එහි අඩුවීමේ ප්‍රවණතාවයක් පවතින බව සොයාගන්නා ලදී.

**තේ වගාකරන විවිධ ප්‍රදේශවල දේශගුණික වෙනස්වීම් විශ්ලේෂණය**

දේශගුණික වෙනස්වීම්වල බලපෑම්වලට පාත්‍ර කෘෂි පාරිසරික කලාප හඳුනාගෙන ඒවා සිතියම් ගත කර ඇති අතර බලපෑම් අවම කිරීම පිණිස ගත හැකි වඩාත් සුදුසු ප්‍රතිකර්මද හඳුනාගෙන තිබේ. ඒ අතරින් බෝග සහ වායව පරිසරය වැඩි දියුණු කිරීම තේ ඉඩම් සඳහා භාවිතා කල හැකි වඩාත් වැදගත් ප්‍රතිකර්ම ලෙස දැක්වීමට පුලුවන. ආන්තික තේ ඉඩම් බෝග විවිධාංගිකරණයට යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කල යුතුව ඇත.

**දලු නෙලන හා කප්පාදු යන්ත්‍ර කුඩා තේ වතු ක්ෂේත්‍රවල ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කරමින් පවතී. මෙම වසර තුල 220 කට අධික කුඩා තේ වතු හිමියන් ගණනක් පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී යන්ත්‍ර ක්‍රියාකරුවන් හා පුහුණු කරන්නන් ලෙස දෙදින නේවාසික පුහුණුවක් ලැබීය. දෙවන අදියර තුලදී තේ සමිති 44 ක්, කර්මාන්තශාලා 44 ක් සහ තේ පර්යේෂණායතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති අංශවලට කප්පාදු යන්ත්‍ර දලු නෙලන යන්ත්‍ර සහ දලු කූඩ බෙදා දෙන ලදී.

තෝරා දලු නෙලන කතුර භාවිතයෙන් දිනකට දලු කිලෝ 30-35 ක් නෙලා ගත හැකි බවත්, බැටරි මගින් ක්‍රියාකරන යන්ත්‍රය මගින් හා ඉන්ධන වලින් ක්‍රියාකරන යන්ත්‍රය මගින් දිනකට නෙලා ගත හැකි දලු ප්‍රමාණය පිලිවෙලින් කිලෝ 40-50 ක් සහ 150-200 ක් පමණ වන බවත්, දිනකට යන්ත්‍රයෙන් කප්පාදු කල හැකි පඳුරු ගණන 1000-1500 ක් පමණ වන බවත්, යන්ත්‍රයෙන් දිනකට සකස් කල හැකි වලවල් ගණන 700-900 ක් පමණ වන බවත් අනාවරණය විය. මෙම ව්‍යාපෘතිය යටතේ මේ දක්වා දලු කතුරු හා කූඩ 1500 ක් බැගින්ද බැටරි වලින් ක්‍රියාකරන දලු නෙලන යන්ත්‍ර 100 ක්, ඉන්ධන මගින් ක්‍රියාකරන යන්ත්‍ර 200 ක්, කප්පාදු යන්ත්‍ර 200 ක් හා වලවල් හාරන යන්ත්‍ර 50 ක් බෙදාදී තිබේ.

**තේ සැකසුම් තාක්ෂණය හා නිපැයුම් වැඩි දියුණු කිරීම**

**තේ කර්මාන්ත ශාලා සහ ඒවායේ තේ නිෂ්පාදනයට භාවිත යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම**

**ද්‍රෝණිකා වල තව්මැරීමේ ක්‍රියාවලියේ දී වැය වන විද්‍යුත් ශක්තියේ කාර්යක්ෂමතාවය ප්‍රශස්ථ කිරීම පිණිස තත්කාලීන තාප හා ස්කන්ධ හුවමාරුවට අනුව සකස් කල ගණිතමය ආදර්ශයක් ප්‍රයෝජනයට ගැනීම**

තව් මැරීමේ ක්‍රියාවලිය පාලනය කිරීමට වැදගත් වන තව් මැරුනු දළුවල තත්කාලීන තෙතමනය (Real time moiture) නිර්ණය කර ගැනීම පිණිස ගණිතමය ආදර්ශයක් ගොඩ නගන ලදී. මෙම ගණිතමය ආදර්ශය වර්ගජ සමීකරණයක් හා සංයුක්ත කරමින්, වායු ධාරාවේ සීඝ්‍රතාවයට අනුව එහි ආන්තරික ස්ථිතික පීඩනය නිර්ණය කිරීම සඳහාද වැඩි දියුණු කෙරේ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම ඉංජිනේරු අංශය සමග ඒකාබද්ධව, තව් මැරීමේ ක්‍රියාවලියට අවශ්‍ය කරන පරාමිතීන් පාලනය කිරීම සඳහා ස්වයංක්‍රීය තව් මැරීම් පාලන පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය කරගෙන යාම පිණිස ජාතික විද්‍යා පදනමෙන් (NSF) රුපියල් මිලියන 6.4 ක මුදලක් ආධාර වශයෙන් ලබා දී ඇත. සැලසුම් කල පද්ධතිය වියදම් පිරිමසින තනි මව් පුවරුවක් සහිත පරිගණකයක් වන"Raspberry Piz "වලින් සමන්විත වේ. මේ සඳහා පයිතන් මෘදුකාංගය උපයෝගි කර ගනිමින් ගණිතමය ආකෘතියක්ද ඇතුලත් වන ලෙස මෘදුකාංගය ගොඩ නගන ලදී. මීට අමතරව තෝරා ගන්නා ලද පරීක්ෂණ මට්ටමේ තව් මැරීමේ ද්‍රෝණිකාවට අවශ්‍ය වන වෙනස්කම් ද සැලසුම් කරන ලදී.

**අධෝරක්ත කිරණ (IR) සහ තරල පත්ල වියළීමේ ක්‍රමය ඒකාබද්ධව තේ වියළීම මගින් නිමි තේ ප්‍රමිතියට සහ වියළීම් පිරිවැයට බලපෑම සාමාන්‍ය තරල පත්ල වියලන යන්ත්‍රයට සාපෙක්ෂව සංසන්දනය කිරීම**

අධෝරක්ත කිරණ භාවිතයෙන් ක්‍රියාකරන වියලන යන්ත්‍රයක් නිර්මානය කර පරීක්ෂා කරණ ලදීග මෙය විද්‍යාගාර මට්ටමේ තරල පත්‍ර වියලන යන්ත්‍රයක් සමග සසඳන ලදී මෙම අධ්‍යයනයේදී අධෝරක්ත (IR) කිරණ මාර්ගයෙන් තේ වල තෙතමන ප්‍රතිශතය 38% (W/W, Wet basi ) දක්වා අඩුකර ගැනීමට හැකි වූ අතර, එමගින් තරල පත්ල වියලන යන්ත්‍රයේ සාමාන්‍ය වියලුම් කාලය විනාඩි 3 කින් අඩුකර ගැනීමට හැකි විය.

**සීනි වලින් අපමිශ්‍රණය වූ නිම් තේ හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයන් දියුණු කිරීම**
නිම් කළු තේ වලට, සීනි අපමිශ්‍රණය වී ඇතිදැයි හඳුනා ගැනීමට "වෙනස්කල ලේන්-ඇන්ඩ්-අයිනෝන්, ෆීනෝල් සල්ෆියුරික් හා ඇන්ත්‍රෝන් (Lane and Eynone, Phenol sulfuric, Anthrone and strip methods) යන ක්‍රම වේදයන් යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය දියත් කරන ලදී. නිම් තේ නිස්සාරකයේ ඇති පොලිෆීනෝලික සංඝටක, ලෙඩ්-ඇසිටේට් ආධාරයෙන් ඉවත් කළ පසු, ඉහත ක්‍රම වේදයන් යොදා තේ නිස්සාරකයේ ඇති සීනි ප්‍රමාණය නිර්ණය කිරීමේදී, සීනි සාන්ද්‍රණයත් සමග ප්‍රතිඵලවල රේඛීය සහසම්බන්ධතාවක් ඇති බව දක්නට ලැබුණි.

තවද කළු තේ සාම්පල වර්ග අනුවද, තේ නිස්සාරකයේ ඇති සීනි ප්‍රමාණය වෙනස් වන බව සොයා ගැනිණි. එබැවින් ඉහත කී ක්‍රමවේදයන් භාවිතයෙන්, සීනි අපමිශ්‍රණය වී ඇත්දැයි හඳුනා ගැනීමට පෙරාතුව, විවිධ දේශගුණික තත්ව (වියලි හා තෙත් පරිසර තත්වයන්), විවිධ භූවිෂමතා තත්ව (උඩරට, මැදරට හා පහතරට) යටතේදී නිපදවන විවිධ තේ වර්ග වල ස්වභාවිකව අන්තර්ගත වන සීනි ප්‍රමාණයන් නිර්ණය කිරීම අත්‍යාවශ්‍ය බව නිගමනය කෙරිනි.

**භාවිතා කර ඉවත ලන තේ (spent tea) යොදාගනිමින් ප්‍රෝටීන නිස්සාරණය කිරීම**
පටල පෙරණ තාක්ෂණය භාවිතයෙන් ඉවත ලන තේ වලින් ප්‍රෝටීන නිස්සාරණය කිරීමට ඇති හැකියාව අධ්‍යයනය කෙරිණ මෙමගින් ප්‍රෝටීන 24% ක්, සම්පූර්ණ අළු 12% ක් ඊතර් නිස්සාරණ 0.4% ක්, දල තන්තු 0.4% ක් සහ පොලිෆීනෝල 7% ක් අඩංගු සාන්ද්‍ර ප්‍රෝටීන නිස්සාරකයක් සෑදීමට හැකි විය. දිනකට සාන්ද්‍ර ප්‍රෝටීන කිලෝ ග්‍රෑම් 1000ක ධාරිතාවක් පදනම් කොට ගෙන සිදු කරන ලද ආර්ථික සාධ්‍යතා පිළිබඳ අධ්‍යයනයන්ට අනුව මෙම ක්‍රියාවලිය මගින් නිපදවන ප්‍රෝටීන කිලෝග්‍රෑමයක් රු.250/ක පමණ මුදලකට විකිණීම ආර්ථික වශයෙන් වාසි දායක වන බව සොයා ගන්නා ලදී.

**යන්ත්‍ර සඳහා ඉහල ගුණාත්මයකින් යුතු ක්ෂණික කිරි තේ මිශ්‍රණයක් නිෂ්පාදනය කිරීම**
යන්ත්‍ර සඳහා සුදුසු ඉහල ගුණාත්මයකින් යුතු ක්ෂණික කිරි තේ නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කරන ලදී එහි සංඝටක අතර අනුපාතයන් වෙනස් කරමින් මෙම නිෂ්පාදනය යන්ත්‍රවල භාවිතය සඳහා සුදුසු තත්වයට වැඩිදියුණු කරන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අයදුම් කර ඇත.

**සමාජ ආර්ථික හා සම්පත් සැලසුම්කරණය**
**තේ වතුවල ශ්‍රමිකයන් සේවයට නොපැමිනීම හා සේවය හැර යාම පිළිබඳ අධ්‍යයනය**
වතු ක්ෂේත්‍රය තුල කම්කරු හිඟතාවය කොතරම් තීව්‍රද යන්න සොයා බැලීම සඳහා සමීක්ෂණයක් සිදුකරන ලදී මෙම සමීක්ෂණය ප්‍රාදේශීය වැවිලි සමාගම්, රාජ්‍ය වැවිලි සමාගම, ඇල්කඩුව වැවිලි සමාගම සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වන සියළු වතු ආවරණය වන පරිදි සිදු කරන ලදී. මේ අනුව ශ්‍රී ලංකාවේ දැනට පවතින වතු 337 අතුරින් වතු 307 ක්ම මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීය. මෙහි ප්‍රතිඵල වලින් පෙනී යන්නේ වතු 18%ක (වතු 54ක) සිටින ශ්‍රමිකයන් සංඛ්‍යාව දෛනික කම්කරු අවශ්‍යතාවයෙන් 50% ක් පමණ වන බවයි. තවද වතු 49% ක (වතු 150ක) දෛනික කම්කරු අවශ්‍යතාවයෙන් සපුරාගත හැකිව පවතින්නේ 50%-75% පමණි. වතු 14ක එනම් මුළු වතු සංඛ්‍යාවෙන් 5% ක කම්කරු හිඟතාවයක් නොපවතී. තව දුරටත් දත්ත විශ්ලේෂණයේදී පෙනී යන්නේ උඩරට හා ඌව ප්‍රදේශයන්ට සාපේක්ෂව මැදරට හා පහත රට වතුවල මෙම ප්‍රශ්ණය ඉතා උග්‍රව පවතින බවයි. (එනම් මැද රට වතු 39% ක සහ පහත රට වතු 25% ක දැනට කම්කරුවන් සිටින්නේ දෛනික අවශ්‍යතාවයෙන් 50% ක් පමණි).

**තේ වතුවල විකල්ප කම්කරු භාවිත ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනය**
බාහිර වගාකරු (out grower) ක්‍රමයෙහි සමාජ ආර්ථික ශක්‍යතාව නිර්ණය කිරීම සඳහා ශාන්ත කූම්බ්ස් වතුයායේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. බාහිර වගාකරුවන් ලෙස කම්කරුවන් යෙදවීමේ ක්‍රමය හඳුන්වාදීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී පවතින්නාවූ ගැටළු හා දුෂ්කරතාවයන් හඳුනාගැනීම තුලින් මෙම ක්‍රමය සමාජ ආර්ථිකමය වශයෙන් වාසිදායකව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සොයා බැලීම මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. අධ්‍යයනයෙන් අනාවරණය වූයේ මෙම ක්‍රමය හඳුන්වාදීම තුලින් අධ්‍යයනයට භාජනය වූ දළු නෙලන්නන්ගේ ඵලදායීතාවය ඉහළ ගොස් ඇති බවය.

මෙය ඉහළ හා පහළ තේ කොටස් සැසඳූ විට දිනකට නෙළන දළු ප්‍රමාණය පිලිවෙලින් කිලෝ ග්‍රෑම් 36 හා 27ක සාමාන්‍යයක් ලෙස දැක්විය හැක. තවද මොවුන් තම තේ බිම් කොටසෙහි ක්ෂේත්‍රයේ කටයුතු සඳහා දිනකට පැය 6-8ක් වැනි කාලයක් වැය කර ඇති බව ද වාර්ථා විය. ගණනය කිරීම් වලට අනුව මෙම බාහිර වගා කරුවන්ට අමු දළු කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් 26.84 - 36.82 අතර ප්‍රමාණයක් වැය වී ඇත. ශාන්ත කුම්බ්ස් වත්තෙහි දළු කිලෝවක නිශ්පාදන වියදම මෙම අගයට වඩා 37% (රු. 11.86) ක ඉහල අගයක් පෙන්නුම් කරන ලදී. ශුද්ධ ඉපැයීම් වලට අදාල දත්තයන් ධනාත්මකව පැවති බැවින් මෙම බාහිර වගාකරු (out grower) ක්‍රමය ආර්ථිකව පලදායි බව පෙනේ.

**මැදරට තේ ඉඩම්වල පාංශු පෝෂණ කළමනාකරණ ක්‍රම සඳහා සිදුකරන ආයෝජනයන්හි ප්‍රතිලා-භය නිර්ණය කිරීම**

ශ්‍රී ලංකාවේ තේ ඉඩම්වලට බලපාන්නා වූ ප්‍රධාන පාරිසරික ගැටලුවක් ලෙස ඉඩම් හායනය හඳුන්-වාදිය හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, පාංශු කළමනාකරණ ක්‍රමෝපායන් සඳහා සිදුකරන ආයෝජනයන්හි ප්‍රතිලාභය නිර්ණය කිරීමයි.

මූල්‍ය විශ්ලේෂණයේදී අනාවරණය වූයේ, ප්‍රධාන කාණු ගල් වැටි මුල්ලු ගැසීම හා කාබනික පොහොර සඳහා ආයෝජනය කිරීම තුලින් ඉහළ ප්‍රතිලාභයක් ලබාගත හැකි බවයි. හරස් කාණු, ප්‍රධාන කාණු ගල් වැටි හා මුල්ලු ගැසීම තේ එලදාව වර්ධනය කරගැනීම සඳහා ධනාත්මක ලෙස බලපාන බව පෙන්නුම් කරන ලදී.
කෙසේ නමුදු රාජ්‍ය අංශයේ මෙන් ම පුද්ගලික අංශයේ වතු වලද පාංශු පෝෂණ කළමනාකරණ ක්‍රමෝපායන් තේ පර්යේෂණායතනයේ නිර්දේශිත මට්ටමෙහි නොපවතින බව නිරීක්ෂණය විය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වලින් පෙන්නුම් කෙරෙනුයේ පාංශු පෝෂණ කළමනාකරණය සඳහා ප්‍රතිපත්තිමය සැකසුම්වල අවශ්‍යතාවය තේ කර්මාන්තයේ පැවැත්මට ඉතා වැදගත් බවයි.

**සේවා ලාභීන් සඳහා සේවාවන්**

**සමාගම් තේ වතු අංශය සඳහා පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය (PEA)**

2015 වසරේදී පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශ ව්‍යාපෘතිය වටවල, කැළණිවැලි සහ කොටගල වැවිලි සමාගම්වල සහයෝගයෙන් සිදුකරගෙන යන ලදී. ක්ෂේත්‍ර නිළධාරීන් 30-50ක් පමණ සමන්විත වන පරිපූරක පුහුණකරු කණ්ඩායමක් සඳහා කෘෂිකර්මය හා සන්නිවේදනය පිළිබඳව පුහුණුව ලබා දුනි. (තේ පැළ නිෂ්පාදනය, නැවත සිටුවීම සහ නඩත්තු කටයුතු, දළු නෙළීම, කප්පාදුව, නියගයෙන් ආරක්ෂා වීමට ගතයුතු ක්‍රියාමාර්ග, පසේ සාරවත් බව කළමණාකරණය, සෙවන කළමණාකරණය, ඒකාබද්ධ වල්පැළ පාලනය, ඒකාබද්ධ පළිබෝධ හා රෝග පාලනය සහ එලදායි ලෙස පළිබෝ-ධනාශක යෙදීම)

**නව ක්ලෝන වල අතු ලබාදිම - ADB මව්ශාක ව්‍යාපෘතිය**

2015 වසර තුළදී අතු රිකිළි මිලියන 9.54 ක් නිකුත් කිරිම සඳහා තක්සේරු කරන ලද නමුත් මෙම වසර තුළදී මහවතු හා කුඩාවතු යන අංශ දෙකටම මව් ශාක ව්‍යාපෘතිය මඟින් නිකුත් කිරීමට හැකි වූයේ අතු රිකිලි 5,555.525 පමණි.

**තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුව විසින් අනුමත නව තාක්ෂණයන්ගේ අනුවර්ත්‍යතාව ඇගයිම සඳහා අනුවර්ති අත්හදා බැලීම්**

මොරවක, අකුරැස්ස, සොයිසා වත්ත, පැලවත්ත, ග්‍රීන්වුඩ් , මල්බෙරි සහ හගුරුඅම වත්ත යන ස්ථාන වල ශාක අභිජනන අංශය විසින් ස්ථාපිත තේ.ප.ආ 5000 ශ්‍රේණියේ ප්‍රභේදවල අනුවර්ති අත්හදාබැලිම උපදෙස් කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලැබේ. ඩයගම වෙස්ට්, සෝගම, පීඩෲ, මට්ටකැලේ සහ ග්ලාස්ග්ලෝ යන සමාගම් වතුවලද තේ.ප.ආ 5000 ශ්‍රේණියේ අනුවර්තී පරියේෂණ ස්ථාපිත කර තිබේ.

තවද නව ප්‍රභේදයන්ගේ (තේ.ප.ආ 5000 ශ්‍රේණියේ) නිරික්ෂණ අත්හදාබැලීම් ආරම්භ කර ඇති අතර ඒවායේ අධීක්ෂණ කටයුතු දෙනියාය මධ්‍යස්ථානයේ උපදෙස් කාර්යමණ්ඩලය විසින් සිදු කරන ලබයි.

යන්ත්‍ර ප්‍රචලිත කිරිමේ ව්‍යාපෘතිය මඟින් දෙනියාය මධ්‍යස්ථානය වෙත ලබාදුන් යන්ත්‍ර භාවිතා කර යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ එක් අනුවර්තී අත්හදාබැලීමක් (බැටරි වලින් ක්‍රියාකරන දළු නෙලීමේ යන්ත්‍රය, පෙට්‍රල් මඟින් ක්‍රියාකරන දළු නෙලීමේ යන්ත්‍රය සහ තේ.ප.ආ තෝරා දළු නෙලනය) මොරවක, පෞද්ගලික තේ වත්තක ස්ථාපනය කරන ලදී.

**තේ වගා ආදර්ශන (තේ තාක්ෂණ උද්‍යාන)**

ශාන්ත කුම්බ්ස් වතුයායේ පහළ ක්ෂේත්‍ර අංක 8 හි ස්ථාපනය කළ තේ තාක්ෂණ උද්‍යානයේ වැඩ කටයුතු උපදෙස් හා ශෂ්‍ය විද්‍යා අංශ වල නිළධාරින්ගේ අධීක්ෂණයෙන් යුතුව ක්‍රියාත්මක වෙමින් පවතී. තේ පර්යේෂණ ආයතන පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ තේ වගා ආදර්ශනය, ස්ථානභාර නිළධාරීගේ සුපරීක්ෂණය යටතේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය විසින් මනා ලෙස නඩත්තු කර ඇත.

තේ පර්යේෂණ ආයතන නිර්දේශිත යහපත් කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ආදර්ශනය කිරීමට වතු ආදර්ශනයක් මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති අතර එහි නඩත්තු කටයුතු ස්ථානභාර නිළධාරී සහ අනෙකුත් පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතුව උපදෙස් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

**2015 තේ ඉඩම්වල පසෙහි සාරවත් බව වැඩිදියුණු කිරීම සඳහා වන තේ පර්යේෂණායතන නිර්දේශ පිලිපැදීමේ වසර**

පසෙහි සාරවත් බව වැඩිදියුණු කිරීමට අදාලව වැවිලි සමාගම් අංශයේ පුහුණු අවශ්‍යතාවන් හදුනාගැනීම පිණිස සියළුම පාරිසරික කළාප සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් ආවරණය වන සේ ප්‍රාදේශීය වැවිලි සමාගම් අංශයේ නියැදි සමීක්ෂණයක් පැවැත්වීය. අධ්‍යයනයේ සොයාගැනීම් පිළිබඳ මහවතු අංශය සහ කුඩා තේ වතු අංශය සඳහා පැවැත්වුන පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද තුළින් තේ වගා කරුවන් දැනුවත් කරන ලදී ප්‍රාදේශීය වැවිලි සමාගම් 15 කට පසේ සාරවත්බව කළමණාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ අය වැය ලේඛණ සකස් කිරීමට අවශ්‍ය තොරතුරු සපයා දෙමින් සහ වතු කළමණාකාරිත්වය සමග පැවති රැස්වීම් වලට සහභාගි වෙමින් ඔවුනට සහය දෙන ලදී.

**රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රදේශයේ තේ පසු මැරීම**

බලංගොඩ හා ඉඹුල්පේ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල (පින්නවල, රාස්සගල, බලංගොඩ සහ ඇල්ලරාව යන තේ පරීක්ෂක (TI) කොට්ඨාශ ආවරණය වන ලෙස) සිදුකල ක්ෂේත්‍ර සමීක්ෂණය නිම් කරන ලදී. අනෙකුත් සමහර ස්ථාන වලින්ද මෙම ගැටළුවම වාර්තා වූ හෙයින් මෙම තත්වය පිළිබඳ නියමාකාරයෙන් දැනගැනීම සඳහා තවත් සමීක්ෂණයක් සිදුකර දත්ත එක් රැස් කරන ලදී. මේ සඳහා වටපණු අංශයේ දායකත්වය සැපයිණි.

රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, රාස්සගල, පින්නවල, කලවාන සහ ගල්ලැල්ල යන ප්‍රදේශවල තේ වල පසු මැරීමේ තත්වය සඳහා ප්‍රධානතම හේතුව ලෙස ප්‍රැටි ලෙන්චස් ලූසි නම් වටපණු ආසාදනය බව සොයාගන්නා ලදී. පස සුරැකීමේ සහ සාරවත් කිරීමේ නිසියාකාර ක්‍රම අනුගමනය නොකිරීම මෙන්ම පසේ ආම්ලික බව නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රම නියමිත වෙලාවට නොකිරීම යනාදිය වටපණුවන්ගේ ව්‍යාධිජනකතාවය වැඩිකිරීමට හේතු වි ඇත. කඳ විදින ගුල්ලාගේ ආසාදනය, පහතරට සජීවි දැව වේයාගේ හානිය සහ ඒ හේතුවෙන් ඇතිවන කඳ දිරායාම වැනි තත්ව තව දුරටත් තේ පඳුරු දුර්වල වීමට හේතු වේ. මෙම තොරතුරු වලට අනුව තේ පර්යේෂණායතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වගකීම් හඳුනාගත් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කරන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහය ඇතිව හානියට ගොදුරු වූ තේ ක්ෂේත්‍ර කළමණාකරණය කිරීමට රාජ්‍ය මුදල් ලබා ගැනිම සඳහා විශේෂ ව්‍යාපෘති යෝජනාවක්ද සකසන ලදී.

**වාණිජ තේ තවාන් පරීක්ෂා**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත, නැවත වගාකිරිම සහ පාලු සිටුවීම සඳහා සුදුසු පැළ වලට අනුමැතිය ලබාදීමට, වාණිජ තේ තවාන් 283 ක් පරීක්ෂා කරන ලදී. සාමාන්‍යයෙන්, තවාන් මලු වල ප්‍රමාණය, පැළයක ඇති පත්‍ර ගණන, සහ පැළවල උස යන සාධක වලට අනුව පරීක්ෂාවට ලක් කරන ලද පැළ වලින් 61 - 69% ක ප්‍රමාණයක් නිර්දේශ කළහැකි සුදුසු ඒවා විය.

**විශ්ලේෂණ සේවා**

අදාල වසර තුළ තලවාකැලේ, වලහන්දුව සහ හන්තානේ සිදුකරන ලද පස්, පත්‍ර, පොහොර සහ කාබනික පොහොර සාම්පල් මුළු ගණන පිළිවෙළින් 13012, 822, 1048 සහ 196 විය. මෙම විශ්ලේෂණ අතරින් වැඩිම ප්‍රමාණයක් සිදු කරනු ලැබුයේ පසේ pH අගය නිර්ණය කිරීම (5904) සහ පාංශු කාබන් ප්‍රමාණය (3486) නිර්ණය කිරීම සඳහාය.

රත්නපුර, මහනුවර, ගාල්ල, ඌව සහ දෙනියාය යන ප්‍රාදේශිය සහ ව්‍යාප්ති මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය pH සහ කාබනික කාබන් සඳහා පාංශු විශ්ලේෂණ කටයුතු සිදුකර තිබේ. pH සඳහා සාම්පල 3063 ක්ද පාංශු කාබන් සඳහා සාම්පල 559 ක්ද, ව්‍යාධිජනක නෙමටෝඩාවන් සඳහා සාම්පල 37 ක්ද, 2015 වසර තුළදී උපදෙස් හා ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් පරික්ෂා කර ඇත.

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය මගින් ඊට අදාල සේවා අනෙකුත් අංශ, ඒකක, ප්‍රදේශීය සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන මෙන්ම අනුබද්ධ තේ වතු සඳහා ද ලබාදෙන ලදී. ඒවා ප්‍රධාන වශයෙන් අන්තර්ජාල, ඉලෙක්ට්‍රොනික තැපැල් සහ දත්ත ගොනු ගබඩා යන සේවා සපයන සේවා පරිඝනක පරිපාලනය සහ නඩත්තු කිරීම, පරිඝනක, පරිඝනක උපාංග සහ ආයතනික පරිඝනක ජාලයේ ස්ථාපන සහ නඩත්තු කටයුතු සිදුකිරීම, ආයතනික නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම, ඇඟිලි සලකුණු යන්ත්‍ර සහ අදාල පරිඝනක මෘදුකාංගය යාවත්කාලීන කර පවත්වාගෙන යාම, පරිඝනක, උපාංග සහ මෘදුකාංග සඟා වන ස්ථිර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම ආදිය වේ.

**ශාන්ත කුම්බිස් වත්ත තලවාකැලේ**

තේ කර්මාන්ත ශාලාවේ හා තේ දළු වල තත්වය ඉහල නැංවීම තුලින් බටහිර උස්බිම් වැවිලි කාණ්ඩය යටතේ 2015 වර්ෂයේදී ශාන්ත කුම්බිස් නාමය 4වන ස්ථානය ලබාගෙන ඇත. 2015 වසර සඳහා ශාන්ත කුම්බිස් දළ විකුණුම් සාමාන්‍යය රු.495.09ක් වූ අතර එය බටහිර උස්බිම් වැවිලි කාණ්ඩය යටතේ පිහිටීම අනුව විකුණුම් සාමාන්‍යයට වඩා රු. 88.07 ක වර්ධනයකි. ශාන්ත කුම්බිස් වත්ත 5 වතාවක් තේ විකුණුම් සඳහා වැඩිම මිල ගණන් ලබා ඇත. 2015 වර්ෂයේදී ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් පුද්. සමාගම විසින් පවත්වන ලද තිලිණ ප්‍රධාන උත්සවයේදී 2014 ශාන්ත කුම්බිස් වත්ත පහත සඳහන් ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත.

- මුහුදු මට්ටමේ සිට පිහිටීම අනුව උස්බිම් වැවිලි කලාපය යටතේ (High Grown Ortho - dox) ඉහළම විකුණුම් අගය සඳහා වන රන් පදක්කම
- 2014 වසරේ වැඩිම වාර ගනණක් "ඩස්ට් 1" සඳහා ඉහළම විකුණුම් අගයන් වාර්තා කිරීම
- බටහිර උස්බිම් වැවිලි කලාපය යටතේ ඉහළම විකුණුම් අගය වාර්තා කිරීම

ශාන්ත කුම්බිස් වතුයාය 2015 වර්ෂය සඳහා රු. 8,150,221.66 ක ශුද්ධ ලාභයක් ලබා ගන්නා ලදි.

**ශාන්ත ජෝකිම් වත්ත රත්නපුර**

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ කර්මාන්තශාලාවේ නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 143,173 කින් පහත වැටි ඇත. 2015 වර්ෂයේදී තේ කිලෝවක ශුද්ධ අලෙවි මිළ රු 393/09 ක් වූ අතර 2014 වර්ෂයේදී එය රු 432/85 විය. 2015 වර්ෂයේදී ශාන්ත ජෝකිම් වත්ත රු 16,352,741/- ක පාඩුවක් ලැබීය.

ආචාර්ය අයි එස් බී අබේසිංහ
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ කාර්ය මණ්ඩලය 2015

**ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය**

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**
ආචාර්ය අයි එස් බී අබේසිංහ, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Sheffield, UK)

**අතිරේක අධ්‍යක්ෂක**
ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Aberdeen, UK)

**නියෝජ්‍ය අධ්‍යක්ෂක /පර්යේෂණ / ( නිෂ්පාදන )**
ආචාර්ය කේ එම් මොහොට්ටි, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Reading, UK) F Biol (Sri Lanka), C Biol (Sri Lanka)

**කාර්යාල මණ්ඩලය**
ඒ පී වී කල්‍යානි, ලඝු ලේඛිකා/යතුරු ලේඛිකා (ඉංග්‍රීසි)
එස් ෂන්මුගනාදන්, ලඝු ලේඛිකා/යතුරු ලේඛිකා (ඉංග්‍රීසි)
දේවිකා රත්නායක, ලඝු ලේඛිකා/යතුරු ලේඛිකා (ඉංග්‍රීසි)
ආර් රායප්පන්, කළමණාකරණ සහකාර (ලිපිකරු)

**පොදු සේවකයන්**
පී සෙල්වරාජ්
පී සෙල්වරාජ්
එස් ජෝන් ෆැට්රික්

**උපදෙස් හා ව්‍යාප්ති අංශය**

**අංශ ප්‍රධානී,**
බී ඒ ඩී සමන්සිරි, ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරි, (Peradeniya, Sri Lanka) M Phil (University of Philippines) Principal Advisory Officer

**ප්‍රධාන උපදේශක නිලධාරින්**
ජේ සී කේ රාජසිංහ, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA, Peradeniya, Sri Lanka)
ආචාර්ය වී එස් සිධාකරන් , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) Ph D (TNAU, India)

**උපදේශක නිලධාරින්**
කේ පී ජේ පී මහින්දපාල, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) PG. Dip. (Applied Statistics)
ටී පී එන් මහින්ද , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
එස් පී රත්නායක, B Sc Agric. (Ruhuna, Sri Lanka) MBA (Wuhan University, China)
කේ ආර් ඩබ් බී කහඳව, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
එම් ඒ එච් නිශාන්ති, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)

එ එල් ආර් යූ කුමාර, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
සී ජේ ලියනාරච්චි, B Sc Agric. (Wayamba) M Sc (PGIA Peradeniya)

**ව්‍යාප්ති නිලධාරින්**
එච් ජේ එම් ඩී සිල්වා, B Sc Agric. (Ruhuna, Sri Lanka)
එච් ජයවීර , Undergraduate Level V (Open University)
පී කේ ආර් සී ඊ මුණසිංහ, B Sc Agric. (Wayamba)
ඒ ඒ අබේසූරිය , B Sc Agric. (Peradeniya )
එස් වී ඒ ආර් කේ ජයරත්න , B Sc Agric. (Peradeniya )
පී ඩී ද අල්විස්, B Sc Agri.(Ruhuna)
ආර් ජේ කේ රාජපක්ෂ, B Sc Agric (Ruhuna)
ජී එස් ප්‍රදීප්, B Sc Agric (Rajarata)
අයි ඩී සී සජීවිකා, B Sc Agri.(Sabaragamuwa)
එච් එන් දයානන්ද, B Sc Agri.(Sabaragamuwa)

**තාක්ෂණ නිලධාරින්**
එන් එස් ඒකනායක
එම් ජී එම් ජේ කුමාර, (Higher Diploma in Technology)(Hardy)

**පොදු සේවකයන්**
පී විජයකුමාර්
බී මනෝමණී

**කෘෂි ආර්ථික විද්‍යා අංශය**

**අංශ ප්‍රධානී**
ආචාර්ය එච් ඩබ්ලිව් ශ්‍යාමලී, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි . (Peradeniya, Sri Lanka) M Sc (PGIA, Sri Lanka) Ph D (CSKHPKV, India)

**පර්යේෂණ නිලධාරි**
බී එම් එන් සී කරුණාරත්න , B Sc Agric. (Rajarata)
එච් එම් සී ජී පිලපිටිය, B Sc Agric. (Ruhuna)

**තාක්ෂණ නිලධාරි**
කේ ඩබ් එන් නදීෂානි , B Sc Science (Peradeniya, Sri Lanka)

**පොදු සේවක**
පී ඩී එස් එස් ද සිල්වා

**ශෂ්‍ය විද්‍යා අංශය**

**වැඩ ආවරණ අංශ ප්‍රධානි**
ආචාර්ය එන් පී එස් එන් බන්ඩාර ,ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි.(Peradeniya, Sri Lanka) Ph D (Adelade University, Australia)

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි**
ආචාර්ය එම් ඒ විජේරත්න , B Sc Agric. (Ruhuna, Sri Lanka) Ph D (London, UK)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි. සහ ස්ථාන භාර නිලධාරි .පහත රට මධ්‍යස්ථානය, රත්නපුර.
ආචාර්ය එම් එස් ඩී එල් ද සිල්වා , B Sc (Peradeniya, Sri Lanka) M Phil (Peradeniya, Sri Lanka) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි සහ ස්ථාන භාර නිලධාරි .මැද රට මධ්‍යස්ථානය, හන්තාන.

**පර්යේෂණ නිලධාරි**
එස් ආර් ඩබ්ලිව් පතිරණගේ, B Sc Agric (Ruhuna, Sri Lanka)

**අත්හදා බැලීමේ නිලධාරි**
එච් එස් එන් පීරිස් , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Phil (Peradeniya, Sri Lanka)
එම් ජී එස් ලියනගේ, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (Peradeniya, Sri Lanka)
එල් ඒ එස් පී ජයසිංහ , B Sc Agric (Wayamba, Sri Lanka) M Sc (Peradeniya, Sri Lanka)
ඩී ඩබ්ලිව් විතාන , Diploma in Agriculture
යූ පී අබේසේකර , Diploma in Agriculture
එස් එන් විජේසේකර
ඊ ඩබ්ලිව් ටී පී ප්‍රේමතුංග

**පොදු සේවකයන්**
එන් සිවසුබ්‍රමනියම්
ආර් ගනේෂන්
එන් ශ්‍රීදේවි

**ශාක කායිකවේදී අංශය**

**වැඩ ආවරණ අංශ ප්‍රධානී**
ටී එල් විජේරත්න ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, B Sc Agric. M Sc , (Peradeniya, Sri Lanka) Ph.D (Peradeniya, Sri Lanka)

**පර්යේෂණ සහකාර**
ඩී එම් එස් නවරත්න  , B Sc (Peradeniya, Sri Lanka) M Phil (Peradeniya, Sri Lanka)

**පර්යේෂණ නිලධාරි**
එම්.එම්.එන් දමයන්ති , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Phil (Peradeniya, Sri Lanka)

**අත්හදා බැලීමේ නිලධාරි**
වී සිදාකරන්

**පොදු සේවක**
ආර් පුවනේස්වරන්

**ජෛව රසායන අංශය**

**අංශ ප්‍රධානී  (වැඩ ආවරණ ස්ථාන භාර නිලධාරි)**
ආචාර්ය කේ එම් මෙවන්, B Sc Agric (Ruhuna, Sri Lanka) Ph.D (Colombo Sri Lanka)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

**පර්යේෂණ නිලධාරි**
පී ඒ ඒ ආර් පෙරේරා , B Sc Agric (Peradeniya, SriLanka) M Sc (Sri Jayawardenapura, Sri Lanka)
එස් ඒ ඩී පී එස් ජයවර්ධන  , B Sc Sp (Colombo, Sri Lanka)
එම් එස් සී ප්‍රනාන්දු , B Sc (Jayawardenapura, Sri Lanka)

**තාක්ෂණ නිලධාරි**
ඊ එන් යූ එදිරිසිංහ Diploma in Agriculture

**පොදු සේවක**
පී පෙරියසාමී
ඒ මහේන්ද්‍රන්
එ සෙල්වරාජ්
එස් රාජේන්ද්‍රන්

**ශාක අභිජනන අංශය**

**ස්ථාන භාර නිලධාරි**
එම් ඒ බී රණතුංග ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරි , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (TNAU, India) Senior Research Officer

**පර්යේෂණ නිලධාරි**
ජේ එච් එන් පියසුන්දර , B Sc (OUSL, Sri Lanka) MPhil (Peradeniya, Sri Lanka)
ජේ ඩී කොට්ටව ආරච්චි , B Sc (OUSL, Sri Lanka) MPhil (Peradeniya, Sri Lanka)

**අත්හදා බැලීමේ නිලධාරි**
ටී එම් සරත්චන්ද්‍ර B Sc (Canterbury, UK)
කේ කේ රණවීර B Sc Agric. (Ruhuna, Sri Lanka) M Phil (Peradeniya, Sri Lanka)Sri Lanka)
ඒ කේ මුදලිගේ (පහත රට මධ්‍යස්ථානය) Diploma in Agriculture, B Sc Agric. / Science & Management (Sabaragamuwa, Sri Lanka)

**තාක්ෂණ නිලධාරි**
එම් පී එම් කුමාර, HNDT (Agric.)

**පොදු සේවක**
බී කේ ජයන්ති
ඩී රීටා
කේ විශ්වනාතන්
පී ජෙගදීසන්

**ශාක ව්‍යාධිවේදී අංශය**

**ස්ථාන භාර නිලධාරි , ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරින්**
ආචාර්ය පී ඩී සින්නයියා , B. Sc (EUSL, Sri Lanka) PhD (PGIS, Sri Lanka), Senior Research Officer

**ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරි**
එන් එච් එල් ප්‍රදීපා, B Sc (Ruhuna, Sri Lanka), M Sc (GBPUAT, India)

**පර්යේෂණ නිලධාරි**
එම් නිරංජන් , B Sc. (Peradeniya, Sri Lanka)

**තාක්ෂණ නිලධාරි**
ඩී පී එන් පී කරුණාජීව, (Diploma in Agriculture)

**පොදු සේවක**
රේනුකා පෙරේරා

**පාංශු සහ ශාක පෝෂක අංශය**
**අංශ ප්‍රධානී**
ආචාර්ය පී පී ගුණරත්න, B.Sc Agric (Peradeniya, Sri Lanka), M.Phil (Peradeniya, Sri Lanka), Ph.D (Peradeniya, Sri Lanka)

**පර්යේෂණ නිලධාරි**
ඩබ් එම් එස් විජයතුංග, B.Sc (Peradeniya, Sri Lanka) M.Sc (Peradeniya, Sri Lanka)
එස් රගුරාජ් , B.Sc Agric (Peradeniya, Sri Lanka).
ආර් කේ අමාලි, B.Sc (Jayawardenapura, Sri Lanka)

**පර්යේෂණ සහකාර**
එල් ආර් එම් සී ලියනගේ, B Sc Agric (Peradeniya, Sri Lanka)

**අත්හදා බැලීමේ නිලධාරි**
පී එල් කේ තෙන්නකෝන් , B.Sc (Peradeniya, Sri Lanka) M.Sc (Dharwat, India)
ඩබ් ටී බී ඩී ප්‍රියන්ත , B.Sc (J'Pura, Sri Lanka)
ජේ ආර් වයි අබේවර්ධන
ඕ පී කේ ඒ ගුණරත්න , Dip in Agriculture ACLT (OUSL, Sri Lanka)

**පොදු සේවක**
ඩී සිල්වෙස්ටර්
වී රාධක්‍රිෂ්නන්
ඒ සෙල්වනායගම්
එස් පරමේශ්වරන්

**තේ සැකසුම් තාක්ෂණ අංශය**

**වැඩ ආවරණ අංශ ප්‍රධානී**
කේ රවීන්ද්‍රන් , B Sc Engineering (Chemical) (Moratuwa, Sri Lanka), M Eng (Energy Technology) (AIT, Thailand)

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරින්**
ආචාර්ය ඩබ් එස් බොතේජු, B Sc (Colombo, Sri Lanka), M Phil (Peradeniya, Sri Lanka), PhD (Peradeniya, Sri Lanka)

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරින්**
පී එල් සී ගලහිටියාව, B Sc (Kelaniya, Sri Lanka)
එස් කෝනේශ්වරමූර්ති, B Sc Engineering (Mechanical) (Peradeniya, Sri Lanka)

**අත්හදා බැලීම් නිලධාරීන්**
එස් එච් ප්‍රියන්ති, N D T (Chemical) (Moratuwa, Sri Lanka)
එල් ජයසිංහ
ඩබ් එම් එස් වීරවර්ධන, B Sc Engineering (Chemical) (Peradeniya, Sri Lanka)
ඩබ් එම් යූ ඒ බී මාරපන, B Sc (Jayawardenapura, Sri Lanka)
එම් ඒ චමින්ද්‍ර, B Sc (Plantation Management) (Wayamba, Sri Lanka)

**කළමණාකරණ සහකාර**
ඩී එල් අයි යූ දිසානායක, B Sc (Tea Technology and Value Addition) (Uva Wellassa, Sri Lanka)

**ප්‍රධාන යාන්ත්‍රික නිලධාරී**
ඒ නන්දසිරි තාක්ෂණික නිලධාරි (යාන්ත්‍රික) ;තාක්ෂණ විද්‍යාලය (මහනුවර)

**යාන්ත්‍රික නිලධාරී**
එල් වීරසූරිය
එම්.ශ්‍රේබ්‍රියල්

**පොදු සේවක**
ආර් ඉලංගෝවන්
පී සෙල්ලදොරේ
කේ රාජලිංගම්
එම් මොහන්රාජ්
එස් සශිකුමාර්

**කීට විද්‍යා සහ වටපණු විද්‍යාවේදී අංශය**

**අංශ ප්‍රධානි**
ආචාර්ය කේ එම් මොහොට්ටි, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Reading, UK), F. Biol. (Sri Lanka), C. Biol. (Sri Lanka)

**පර්යේෂණ නිලධාරින්**
ආර් ඩී පී ඩී සේනානායක, B Sc (Peradeniya, Sri Lanka), M Sc (PGIS, Sri Lanka),Ph.D (Kelaniya)
පී ජී ඩී එස් අමරසේන, B Sc (Peradeniya, Sri Lanka), M Sc (PGIA, Sri Lanka) C. Biol. (Sri Lanka).

**අත්හදා බැලීමේ නිලධාරින්**
එන් නවරත්න
ඒ ආර් අබේසේකර
ආර් පෙරේරා, Diploma in Agriculture (Aquinas)
බී එස් විතාන, NDT Agriculture, (HARDI, Ampara)
ඒ කේ ප්‍රේමතුංග
යූ බී හේරත්

**පොදු සේවක**
එස් හෙට්ටිආරච්චී
වී සභාරත්නම්
ආර් ගුණසිරි
එල් ඒ ආර් ප්‍රියංජලී

**පුස්තකාලය**
ආර්. ඩබ්ලිව්. එම්. එස් .කේ.අමුණුගම, පුස්තකාල සහකාර, පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)

**පොදු සේවක**
එස් පරමේෂ්වරී

**ප්‍රචාරක හා ප්‍රචාරණ අංශය**

**ප්‍රචාරක හා ප්‍රචාරණ  නිලධාරි**
වී පී රණවකගේ, B Sc. Agri (Uva Wellassa, Sri Lanka)

**පොදු සේවක**
කේ ක්‍රිෂ්නමේනන්
පී සිවපාලන්
ඒ අම්බිගා

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය**

**අත්හදා බැලීමේ නිලධාරි**
යූ ඩී අලගියවඩු

**පොදු සේවක**
ටී කෝගිලන්

**පරිපාලන අංශය**
කේ පි කේ ඒ සෙව්වන්දි, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි B Sc (Jayawardenapura, Sri Lanka)
එන් ඩී එම් කරුණාදාස,  පරිපාලන නිලධාරි B.B. Mgt (Kelaniya, Sri Lanka)
පී එස් ආරියරත්න, මහජන සම්බන්ධතා නිලධාරි B Sc (Health Promotion) (Rajarata, Sri Lanka)
කේ ආර් ඇම් ප්‍රියන්ත,  ලිපිකරු / යතුරු ලේඛක
ඩබ් එම් එස් ආර් වනසිංහ, ලිපිකරු / යතුරු ලේඛක
සී ජෙයරාම්, ලිපිකරු / යතුරු ලේඛක
එස් ධර්මලිංගම්, ලිපිකරු / යතුරු ලේඛක
ඒ ඒ එච් චින්තක, ලිපිකරු / යතුරු ලේඛක
පී පී එච් විජේසේන, ලිපිකරු / යතුරු ලේඛක

**පොදු සේවක**
එන් පුෂ්පරාජ්
වී චන්ද්‍රසේකරන්
එල් විග්නේශ්වරන්
ඒ දිව්‍යකුමාරන්
වී ජසින්තාමේරි
එම් බී ඩබ්ලිව් සමන්තිකා
එස් රෙජිනාමේරි

**විදුලි අංශය**
යූ ඒ වික්‍රමසිංහ, ඉංජිනේරු සහකාර (Electrical & Electronics) (NCT)
ජේ එම් ආර් කේ බණ්ඩාර, විදුලි කාර්මික  (Technology electronics & Electrical) Technical Collage

**පොදු සේවක**
ජේ අන්තෝනි
කේ ජයරත්නම්
එල් ආර්.රාජලිංගම්
එම් බර්නාඩ්
එස් බාලක්‍රිෂ්නන්
ආර් සගායම්
පී තිරුමුරුගන්

**ඉංජිනේරු අංශය**
සී ජේ බී අබේකෝන්, ඉංජිනේරු සහකාර (සිවිල්) (Certificate in Technology)
කේ පහලතන්ත්‍රිගේ, තාක්ෂණ නිලධාරි (සිවිල්)
ඩබ් සී කේ ප්‍රනාන්දු, ප්‍රධාන ජලනල කාර්මික (Chief Plumber Mechanic Diploma in Plumber & Pipe fitting
පී ටී පෙරේරා ,ලිපිකරු / යතුරු ලේඛක
අයි ඩබ්ලිව් එන් කුමාර , ලිපිකරු / යතුරු ලේඛක
ආර් ජෙයරාජ්, වඩු කාර්මික
**පොදු සේවක**
ඒ ලෝගනාදන්
එච් එම් විජේසේකර
එන් සී පෝල්
බී කේ ජයසිංහ
ආර් වේල්මුරුගන්
ඩී ඒ විමලසිරි
එස් බාලක්‍රිෂ්නන්
එස් තංගරාජ්
ආර් පාක්‍යනාදන්
පී වීරමුතු
එම් පීරිස්
පී සරවනරාජ්
පී කාලිමුතු
එස් සභාපති
ඒ ලූර්දුදාසන්
එස් සිල්වෙස්ටර්
එස් මිල්ටන් කෙනඩි
කේ බාලේන්ද්‍රන්
පී කනගරාජ
එම් ඉරුදයරාජ්
පී ජයපුගාසම්
රාමසාමි රවි
කේ ඒ පී ධර්මදාස
ඒ ඔගස්ටීන්
පී ලෙච්චුමාර්
කේ ඒ ඕ ධර්මදාස
එස් කිස්ටෝපර්
පී පරමසිවම්
එස් මුතුකුමාර්
පී විජයකුමාරන්
ඩී ඒ සිරිශාන්ත

**මූල්‍ය අංශය**
එම් වී මෝහන්, ගණකාධිකාරි
ඩබ් එම් ටී බී වීරසේකර, ගණකාධිකාරි
ජී බී ජයවර්ධන, ගිණුම් නිලධාරි B.Com Sp (University of Kelaniya)MA (Econ) CBA .APFASL
බී කේ එස් හේරත්, ගිණුම් ලිපිකරු
කේ ටී යූ කුලතුංග, සහකාර ගබඩා පාලක
සමන් හේවාසිලියන්, ගිණුම් ලිපිකරු
එච් පී ඩබ්ලිව් ගුණසේකර, ගබඩා සහකාර
අයි ජයවික්‍රම, කලමණාකරණ සහකාර (ගිණුම්)
ඩබ් ඒ නිශාන්ත, වැඩ ආවරණ ගිණුම් නිලධාරි, පරිගණක දත්ත ක්‍රියාකරු හා ගිණුම්
ඒ ඒ ඒ පී අමරතුංග, කළමණාකරණ සහකාර (ගිණුම්)
එච් බී තල්ගහගොඩ, මුදල් අයකැමි සහ ගිණුම් ලිපිකරු
එච් එන් ධර්මපාල, කළමණාකරණ සහකාර (ගිණුම්)
කේ ඒ ඩී සුදත් ප්‍රදීප්, කළමණාකරණ සහකාර (ගිණුම්)
ටී එස් එස් කුමාර, කළමණාකරණ සහකාර (ගිණුම්)
ආර් එම් එන් එම් ආරියරත්න, කළමණාකරණ සහකාර (ගිණුම්)
ඩී එස් සී වීරසූරිය, කළමණාකරණ සහකාර (ගිණුම්)

**පොදු සේවක**
ජී එස් රාජු
පී කේ සරත්
කේ ජෙගතීස්වරන්
පී මුතුකුමාර්
එස් එන් එන් සමන්තිකා
එස් රාජනායගම්

**ආගන්තුක නිවාස/සංචාරක නිවාස/නේවාසිකාගාර**
ආර් එම් බී ඩී රත්නායක, සංචාරක නිවාස භාරකරු
ජී වීරප්පෙරුම , ආගන්තුක නිවාස භාරකරු

**පොදු සේවක**
පී කේ පී දනුෂ්කා
පී මදිඅලගන්
ටී පුෂ්පරාජ්
එම් විවේකනාදන්
කේ ඤානසුන්දරී
ආර් සේකර්
ටී සෙල්වේන්ද්‍රන්

**අභ්‍යන්තර විගණන ඒකකය**
කේ පී රණසිංහ, අභ්‍යන්තර විගණක BBA.Sp. (University of Ruhuna) Chartered Strategic level-1
එන් සී ජයවීර, අභ්‍යන්තර විගණක ලිපිකරු
වී ඊ කුමාර, කළමණාකරණ සහකාර (ගිණුම්)

**පොදු සේවක**
ආර් මනෝහරන්

**මෝටර් ගරාජය**
ඩබ්ලිව් ජී විජේරත්න, මෝටර් කාර්මික

**පොදු සේවක**
කේ රාජරත්නම්
වී ක්‍රිෂ්නමූර්ති
එස් කමලරූබන්
මෝහනසෙල්වම්

**මිලදීගැනීමේ ඒකකය**
බී තිලකරත්න, ප්‍රසම්පාදන නිලධාරි
පී ඩී එස් ඩී සිල්වා, ලිපිකරු/යතුරු ලේඛක

**පොදු සේවක**
කේ බාලක්‍රිෂ්නන්
ටී බාලක්‍රිෂ්නන්

**දුරකතන හුවමාරු පොල**
කේ ඇම් සෙනවිරත්න බණ්ඩා, දුරකතන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි
පී කේ එන් දමයන්ති, දුරකතන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරිණී

**පොදු සේවක**
පී වෛතිලිංගම්
ඩී ගේබ්‍රියල්

**ප්‍රවාහන අංශය**
එස් එන් ටී ප්‍රනාන්දු ඉංජිනේරු සහකාර (Auto mobile technology, (Open university)
ආර් ඒ සී ලසන්ත, කළමණාකරණ සහකාර /ලිපිකරු
පී ඒ එස් එල් ලක්ෂ්මන්, රියදුරු පළමු පන්තිය
ආර් සී ඒ ජයසිංහ, රියදුරු පළමු පන්තිය
එල් මුරුගේසු, රියදුරු පළමු පන්තිය
ඩබ් ජී සෙනවිරත්න, රියදුරු පළමු පන්තිය
ආර් එම් එන් ප්‍රේමතිලක, රියදුරු පළමු පන්තිය
රන්ජන් ගුණසේකර, රියදුරු දෙවන පන්තිය
යූ කේ ඒ බී උඩුවැල්ල, රියදුරු දෙවන පන්තිය
ඩබ්ලිව් එස් ජී ඩබ්ලිව් පෙරේරා, රියදුරු දෙවන පන්තිය
අයි එම් මරදමුත්තු, රියදුරු දෙවන පන්තිය
කේ බී වී යූ එන් ගුණසේන, රියදුරු දෙවන පන්තිය
ජී ජී එම් රණසිංහ, රියදුරු දෙවන පන්තිය
එස් පී ධම්මික තරංග, රියදුරු දෙවන පන්තිය
එම් බී එස් ප්‍රියශාන්ත, රියදුරු දෙවන පන්තිය
ටී කේ ඒ කුමාරසිංහ, රියදුරු දෙවන පන්තිය
එච් ඒ ඩී නිරංජන්, රියදුරු දෙවන පන්තිය
ඩබ්ලිව් ඩී විජේසූරිය, රියදුරු තුන්වන පන්තිය

**පොදු සේවක**
ඩබ් එම් එස් ජේ වීරසිංහ
එස් එල් ජෝෂප්
එම් තසදරන්
ඒ මුනිස්වරම්

**පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රත්නපුර**

**ස්ථානභාර නිලධාරි**
ආචාර්ය එම් ඒ විජේරත්න, B Sc Agric (Ruhuna, Sri Lanka) Ph D (London, UK)

**පරිපාලන නිලධාරි**
බී එම් බී බස්නාගොඩ, (BA-Mass Media Special, Sri Lanka) (Colombo, Sri Lanka) University of Colombo)
පී වී ජී කරුණානායක, ලඝුලේඛක/යතුරු ලේඛක (ඉංග්‍රීසි)
ජේ එස් කේ ඩී සිල්වා, විදුලි කාර්මික N C T Diploma (University of Moratuwa)
කේ ගුණවර්ධන, වැඩ සුපරික්ෂක
එච් කේ සීතා, ගිණුම් ලිපිකරු , (Certificate in Entrepreneurship) (Open University)
කේ ඒ එස් පියතිලක, ලිපිකරු/යතුරු ලේඛක
ඩී ඩී පී එස් ජයසිංහ කළමණාකරණ සහකාර , B Sc (Admin) (Jayawardenapura, Sri Lanka)
යූ ඩබ්ලිව් කේ මුණසිංහ, සහකාර ජලනල කාර්මික
එන් ඒ බෝවි, පොදු කාර්මික
එම් ඩී සරත්, ආගන්තුක නිවාස භාරකරු

**රියදුරු**
පී ඩී ආර් පී ඩී සිල්වා, රියදුරු පළමු පන්තිය
එස් එස් සුනිල්, රියදුරු දෙවන පන්තිය
ජී වී එස් ජයලත්, රියදුරු දෙවන පන්තිය
පී ජී අමරතුංග ,රියදුරු දෙවන පන්තිය
එස් ඒ සී සුරවීර, රියදුරු දෙවන පන්තිය
එස් එම් සී එස් සේනානායක, රියදුරු දෙවන පන්තිය
ජේ ටී එස් වීරක්කොඩි, රියදුරු දෙවන පන්තිය

**පොදු සේවක**
ඩී වී එස් පී දෙනගම
එච් ඒ ටී සුමනවීර
ඩී සී පෙරේරා
පී ඩී එන් ඩී සිල්වා
අයි ඩී සුභසිංහ
ඒ එම් යූ ලියනගේ
ඒ කේ ජේ අතුකෝරල
එම් දේවරාජ්
කේ පී ටි කරුණාරත්න
ටී රාජේන්ද්‍රන්
ආර් චන්ද්‍රකුමාර්
පී පි චන්ද්‍ර කීර්ති
පි කේ ප්‍රියන්ත

එම් මහේශ්වරන්
එස් මනික්කවාසම්
කේ පි නිලංක ධර්මදාස
පී ඒ යූ පතිරන
එස් සෙල්වේන්ද්‍රන්
පි ශිවශක්තිකුමාර්
පී මලිත් මධුරංග
කේ ඒ කරුණාතිලක
එන් පුෂ්පරාජ්
එස් සුරේශ්කුමාර්
වී රිශ්ද්‍රන්
පි ටී පී ජේ පෙරේරා
ආර් එම් සී පී ඩයස්
එම් පාර්වති
සී කේ සංජීව කුමාර්

**මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, හන්තාන**

**වැඩ බලන ස්ථාන භාර නිලධාරි**
ආචාර්ය එම් එස් ඩී එල් ද සිල්වා, ප්‍රධාන පර්යේෂණ නිලධාරි
කේ ආර් ඩබ් බී කහඳව, උපදෙස් නිලධාරි , B Sc. Agric. (Peradeniya, Sri Lanka)
M Sc (PGIA Peradeniya Sri Lanka)
ආර් එම් ඩී කේ රත්නායක, කළමණාකරණ සහකාර ලිපිකරු
ජී ඒ එස් ගුණසේකර, ගිණුම් ලිපිකරු
ආර් කේ විජේරත්න,රියදුරු පළමු පන්තිය
ඩබ් ඩී ජේ පී තිලක් බණ්ඩාර,රියදුරු පළමු පන්තිය
ඩබ් ඒ ඩී පී එම් යූ අත්තනායක, රියදුරු පළමු පන්තිය.
ජී පද්මසිරි, රියදුරු දෙවන පන්තිය
මංජුල රණසිංහ, රියදුරු දෙවන පන්තිය
බී ප්‍රියශාන්ත , රියදුරු දෙවන පන්තිය
ඩබ් එම් අබේ බණ්ඩාර, ආගන්තුක නිවාස භාරකරු

**පොදු සේවක**
ආර් එම් ජේ බී රත්නායක
ආර් එම් යූ විජේරත්න
ඒ ඩි පී එස් ප්‍රේමරත්න
ඩබ්ලිව් ආර් පී එන් ඩී වික්‍රමසිංහ

**උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, දෙනියාය**
**ස්ථාන භාර නිලධාරි**
එස් පී රත්නායක, උපදෙස් නිලධාරි B Sc Agric (Ruhuna Sri Lanka) MBA(Wuhan University, China)
ඕ ඩබ් ජයවර්ධන, ස්ථාන සහායක
එම් ඩී චන්දන, රියදුරු දෙවන පන්තිය

**උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, තල්ගම්පොල**
**ස්ථාන භාර නිලධාරි**
ටී පී එන් මහින්ද, උපදෙස් නිලධාරි, B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
පී කේ ජයවික්‍රම, අත් හදා බැලීමේ නිලධාරි
පී වී ඩී චන්ද්‍රකාන්ති, ගිණුම් ලිපිකරු
පී එස් කුලසිරි, ක්ෂේත්‍ර නිලධාරි
එම් සරත්, ක්ෂේත්‍ර නිලධාරි
ජගත් ප්‍රසන්න, සංචාරක නිවාස භාරකරු
කපිල චමින්ද, රියදුරු දෙවන පන්ති

**සාමාන්‍ය සේවක**
ඩී පී චන්ද්‍රලාල්
ඩබ්ලිව් ගාමිණී

**උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර**
**ස්ථාන භාර නිලධාරී**
ඒ එල් ආර් යු කුමාර, උපදෙස් නිලධාරි , B Sc Agric. (Peradeniya, Sri Lanka) M Sc. (PGIA Peradeniya,Sri Lanka)
කේ එම් ටී සෙනවිරත්න, රියදුරු දෙවන පන්තිය

**පොදු සේවක**
ආර් එච් සී නිසංසල
එස් එම් පී රම්‍යලතා
ආර් ඩබ්ලිව් එස් සී කුමාර
එස් එම් චූලරත්න
එම් රාමසාමි

**පස් හා පාංශු විශ්ලේෂණ රසායනාගාරය, වලහන්දුව**
එම් ඩී සරත් කුමාර, ක්ෂේත්‍ර නිලධාරි
ආර් කුලතුංග, කළමණාකරණ සහකාර
ඩබ් කේ ජේ සමරසේකර, රියදුරු දෙවන පන්තිය

**පොදු සේවක**
කේ පී එල් යූ පතිරනගේ

**උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය , මතුගම**
**ස්ථාන භාර නිලධාරී**
එච් ජයවීර, ව්‍යාප්ති නිලධාරි Undergraduate Level V (Open University)
ඩී පී එල් අමරතුංග, කළමණාකරණ සහකාර B Sc Eco-B.M (Sabaragamuwa, Sri Lanka)
වී සී සමන්මලි, කළමණාකරණ සහකාර
කේ එම් ටී ටී බණ්ඩාර, රියදුරු දෙවන පන්තිය

**පොදු සේවක**
සී ලියනපතිරන
ජී ඒ ඒ ඒන් ගුරුසිංහ
එම් විජේතිලක
ඩී පී කේ ලක්මිනි

# පර්යේෂණ කඩඉම්

## බෝග වැඩි දියුණු කිරීම

**ඵලදායිත්වය හා නිමි තේවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ ඉදිරියේදි මතුවිය හැකි අභියෝග වලට මුහුණ දිම සඳහා තේ ප්‍රභේද අභිජනනය කිරිම**

**නව තේ ප්‍රභේද නිපදවීම**
2015 වසරේ දෙමුහුම්කරණ ක්‍රියාවලිය ජාන ප්ලාස්මයේ විදේශීය ප්‍රභේද එකතුවේ ඇති විවිධ කැමිලියා උප විශේෂයන් භාවිතා කරමින් දුරස්ථ ප්‍රභේද දෙමුහුම්කරණය සඳහා ඉලක්ක කරන ලදී.දෙමුහුම්කරණය සඳහා ජනක (දෙමාපිය ප්‍රභේද) තෝරා ගැනීමේදී කැටකින් සහ කැෆේන් යන රසායනික සංඝටක වල විවිධත්වය සැලකිල්ලට ගත් අතර වාණිජ වගාවන් සඳහා භාවිතා කිරීමට යෝග්‍ය විචල්‍ය ප්‍රමාණ වලින් යුත් රසායනික සංඝටක අඩංගු නව තේ නිපදවීම මූලික අරමුණ විය. දෙමාපිය ප්‍රභේද 2 ක් භාවිතා කරමින් මුහුම් 400 ක් සිදු කරන ලද අතර පසුගිය වසර තුළ පැවති අයහපත් කාලගුණ තත්ත්වය නිසා තරමක අඩු සාර්ථකත්වයක් ලැබිණි. නෙලා ගත් දෙමුහුම් බීජ 99ක් ඉදිරි විශ්ලේෂණ සඳහා තවාන තුළ ප්‍රරෝහණය කර ගන්නා ලදී.

2006-2007 වසර වල සිදු කල දෙමුහුම් කරන ක්‍රියාවලියන්හි අළුතින් වැඩි දියුණු කරන ලද වගා ප්‍රභේද වල විවිධ කෘෂි දේශගුණික කලාපයන් සඳහා ඇති උචිතභාවය හඳුනා ගැනීමේ පළමු පියවරේ අත්හදා බැලීම්ල පස්සරල හන්තාන හා තලවකැලේ යන ස්ථානයන් හි ආරම්භ කරන ලදී. මෙම දෙමුහුම්ක රණයන් සඳහා ජනක ලෙස අස්වැන්න වර්ධන හැකියාව වැනි පරාමිතික වලින් වඩා උචිත ලක්ෂණ සහිත වගා ප්‍රභේද සහ විවිධත්වයෙන් යුත් දෙමාපිය ප්‍රභේදයන් භාවිතා කරන ලදී. උඩරට ප්‍රදේශයේ විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා සුදුසු තේ ප්‍රභේද ඇගයීම සඳහා අත්හදා බැලීමේ අදියර ii හි පර්යේෂණ පස්සර මධ්‍යස්ථානයේ ආරම්භ කරන ලදී.



### වතු ප්‍රභේද වරණය කිරීමේ වැඩසටහන

වතු ප්‍රභේද වරණය කිරීමේ වැඩසටහන මූලික අරමුණු 02 ක් මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරිණි. එනම් නව තේ ප්‍රභේද නිපදවීම සඳහා සුදුසු වතු දර්ශ තෝරා ගැනීම හා පැරණි බීජ තේ ඉඩම් වල ඇති බීජ විවිධත්වය ආරක්ෂා කර ගැනීමයි. හපුතලේ ග්ලෙනනෝර් වතුයායෙන් තෝරා ගත් වඩා උචිත ලක්ෂණ සහිත බීජ දර්ශ තේ පර්යේෂණායතනයේ හන්තාන සහ පස්සර මධ්‍යස්ථාන තුලදී ඇගයීම් වල පලමු අදියරේ අත්හදා බැලීම් සහ කඳ විදින ගුල්ලාගේ හානියට ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ඇගයීම්ද සිදු කරගෙන යන ලදී.

### "නිකුත් කිරීමට නියමිත TRI 5000 කාණ්ඩයේ නව තේ ප්‍රභේද

නිකුත් කිරීමට නියමිත TRI 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදයන්හි විභවය අධ්‍යයනය කිරීම සඳහා තේ වගාකරුවන්ගේ සහයෝගයෙන් සහ සහභාගීත්වයෙන් මේ වන විට අනුවර්තී පර්යේෂණ 37ක් ක්‍රියාත්මක වෙමින් පවතී. WU2 කෘෂි දේශගුණික කලාපය (ඩයගම බටහිර සහ ග්ලාස්ගෝවි වතුයාය) තුළ ස්ථාපනය කර ඇති පර්යේෂණ නියැදි දෙකෙහි පළමු කප්පාදු චක්‍රයේ අස්වැන්න සහ අනෙකුත් වර්ධන කාර්යසාධනයන් ඇගයීම අවසන් කර ඇත. TRI 5000 කාණ්ඩයට අයත් වීමේ විභවය සහිත ප්‍රභේද අතරින් ඩයගම-බටහිර වතුයායේ ප්‍රභේද 6 ක් සහ ග්ලාස්ගෝවි වතුයායේ ප්‍රභේද 5 ක් දැනට ජනප්‍රියව පවතින TRI ප්‍රභේදයන්ගේ සාමාන්‍ය අස්වැන්නට වඩා ඉහල අස්වැන්නක් වාර්තා කොට ඇත.

උඩරටල මැදරට සහ පහතරට ස්ථාපනය කරන ලද අනුවර්තී පර්යේෂණ නියැදි වල සතිපතා අස්වනු නෙළීම සිදුකරන ලදී. මෙම වගාකරුවන් විසින් පවත්වාගෙන යන ප්‍රජා මූලික පර්යේෂණ නියැදි අනාගතයේදී නව තේ ප්‍රභේද වල රෝපණ ද්‍රව්‍ය සපයන මව් ශාක වගාවන් ලෙසද භාවිතා කල හැකි වේ.

TRI 5000 කාණ්ඩයේ ප්‍රභේද වල දුර්වල මුල් වර්ධනයක් සහිත ප්‍රභේදයන් හි මුල් වර්ධනය උත්තේජනය කිරීම සඳහා භාවිතා කල හැකි ප්‍රශස්ත ශාක හෝමෝන සංයෝජන සොයා ගැනීමට සිදුකල පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව මුල් සහ ශාක වර්ධනය සඳහා වඩාත් ප්‍රශස්ත ශාක හෝමෝන සංයෝජන ලෙස ඉන්ඩෝල් බියුට්‍රික් ඇසිඩ් (IB) 6000 ppm ද්‍රාවණය හෝ නැප්තයිල් ඇසිටික් ඇසිඩ් (NA) 6000 ppm සමග ඉන්ඩෝල් බියුට්‍රික් ඇසිඩ් (IBA) 4000ppm මිශ්‍රණය වඩාත් උචිත බව තහවුරු විය.

### තේ වගාකරන ආන්තික ප්‍රදේශ සඳහා විකල්ප රෝපණ ද්‍රව්‍යයක් ලෙස වැඩි දියුණු කල තේ බීජ ලබාදීම

ඌව කලාපය තුළ වැඩි දියුණු කල බීජ සඳහා ඇති ඉහල ඉල්ලුමට සරිලන පරිදි බීජ සැපයීම සඳහා නව බහු ක්ලෝන බීජ උද්‍යානයක් පස්සර මධ්‍යස්ථානයේ ස්ථාපනය කරන ලදී. තවද වගාකරුවන්ට අවශ්‍ය වැඩි දියුණු කළ බීජ අඛණ්ඩව සැපයීම පිණිස පවතින බීජ උද්‍යාන වල නිෂ්පාදිතාවය ඉහළ නැංවීමටද කටයුතු කරන ලදී.

### තේ ජාන සංචිතයේ රසායනික සංඝටක පැතිකඩ විශ්ලේෂණය කිරීම සහ අනු ලක්ෂණය කිරීම

තේ ජාන සංචිතයේ ඇති දර්ශ වල ඇති රසායනික සංඝටක පැතිකඩ අධිතාක්ෂණික ක්‍රම වේදයන් මගින් විශ්ලේෂණය කිරීම සඳහා වූ සහයෝගීත්ව ව්‍යාපෘතිය අඛණ්ඩවම සිදුකරමින් පවතී. මෙහි ප්‍රථිඵල වලට අනුව ජාන ප්ලාස්මයේ දර්ශ අතර රසායනික සංඝටක පැතිකඩෙහි ඉහළ විචලතාවයක් දක්නට ඇති බව සොයා ගන්නා ලදී. මීට අමතරව ජාන ප්ලාස්මයේ ප්‍රධාන ඇමයිනෝ අම්ල කාණ්ඩ 2ක් වන තියැනින් සහ ප්‍රෝලීන් ප්‍රමාණයන්හි පුළුල් විචලනයක් පවතින බව තහවුරු වී ඇත. මේ අතුරින් තේ ශාකයට අනන්‍ය වූ ස්වාභාවිකව පවත්නා තියැනින් නම් ඇමයිනෝ අම්ලය තේ පානයට මිහිරි රසයක් ගෙන දෙන අතර විඩා නිවීමල මානසික ඒකාග්‍රතාව දියුණු කිරීම සහ ධාරණ ශක්තිය වැඩි දියුණු කිරීම වැනි ගුණාංග ඇති කිරීමටද දායක වේ. එමෙන්ම මෙය ප්‍රතිශක්තීකරණ හැකියාව දියුණු කරනල හෘද රෝග සහ ඇතැම් පිළිකාවන් හටගැනීම වළැක්වීමට ශක්තිය ඇති සෞඛ්‍ය රැක දෙන සංඝටකයකි.

බොහෝ ශාකවල ජල හිඟතාවයට අනුවර්තනය වීම හා ප්‍රෝලීන් ඒකරාශී වීම අතර සම්බන්ධතා-වයක් පවතී. ශාකය ආතතික තත්ත්වයන්හි ඇතිවිට ප්‍රෝලීන් ඒකරාශී වීමෙන් ශක්තිය ගබඩා කරගැනීමට හා ඔක්සිහාරක බලය වැඩි කිරීමට ක්‍රියාකරයි. එමනිසා මෙම ප්‍රෝලීන් නැමැති ඇමයිනෝ අම්ලය තේ ප්‍රභේදයන්හි නියඟයට ඔරොත්තු දීමේ හැකියාව මැනීම සඳහා සළකුණ-ක් ලෙස භාවිතා කළ හැකි වේ.

**පුළුල් විචල්‍යතාවයන් සහිත එකිනෙකට වෙනස් තේ ප්‍රභේද ජාන සංචිතයට එකතු කිරීම**

ජාන ප්ලාස්මයේ ඇති ජාන සංචිතය දියුණු කිරීම සඳහා ජාන ප්ලාස්ම ප්‍රභේද ගණන ඉහළ නැංවීමේ ක්‍රියාවලිය ඉදිරියටම ක්‍රියාත්මක කෙරිණ. මේ යටතේ යබුකිටා බීජ දර්ශ ප්‍රජනිත 6 ක් ජාන ප්ලාස්මයට එකතු කරන ලද අතර නැගෙනහිර අප්‍රිකානු බීජ දර්ශ 10ක් අතු මගින් පැළකර ගන්නා ලදී.

**හරිත තේ නිපදවීම සඳහා සුදුසු තේ ප්‍රභේද හඳුනා ගැනීම**

වෙළඳපොළේ හරිත තේ සඳහා ඇති ඉල්ලුම දිනෙන් දින ඉහළ යන බැවින් හරිත තේ නිපදවීමට වඩාත් සුදුසු තේ ප්‍රභේද හඳුනා ගැනීමේ වැඩ පිළිවෙල ආරම්භ කරන ලදී. ජාන ප්ලාස්මයේ ඇති විදේශීය ප්‍රභේද අතරින් පොලිෆීනෝල් සහ කැෆේන් වැඩි ප්‍රභේද හරිත තේ සඳහා උචිතභාවය පරික්ෂා කිරීමට තෝරාගන්නා ලදී. මෙමගින් TRI 4067 සහ CH 13 ඇතුළුව ප්‍රභේද 12ක් හරිත තේ නිපදවීම සඳහා සුදුසු බව හඳුනා ගන්නා ලදී.

පටක රෝපණ තාක්ෂණය භාවිතා කරමින් සාම්ප්‍රදායික අභිජනන ක්‍රියාවලිය පරිපූර්ණ කිරීම සම්ප්‍රදායික අභිජනන ක්‍රියාවලිය ඌනපූරණය කිරීමට අවශ්‍ය පටක රෝපණ තාක්ෂණ ක්‍රමවේද සොයාගැනීම අරමුණු කරගත් පර්යේෂණ අඛණ්ඩව සිදු කරමින් පවතී. බීජ පත්‍ර භාවිතා කරමින් සෘජු දෛහික කලල ජනනය සඳහා ක්‍රමවේදයන් අත්හදා බලමින් පවතී. 3g/lBAP+ 0.1mg/l NAA සහිත Murashige සහ skoog මාධ්‍යය දෛහික කලල ජනනය සඳහා වඩාත්ම උචිත බව හඳුනා ගන්නා ලදී. පත්‍ර කැලස භාවිතා කොට සෘජු දෛහික කලල ජනනය මගින් බහු ප්‍රචාරණ ක්‍රමවේද සොයා ගැනීම ආරම්භ කරන ලදී. ඒ සඳහා 2mg/lBAP+ 3mg/l NAA Murashige නදදට මාධ්‍යය වඩාත් උචිත බව හඳුනා ගන්නා ලදී.

අමතරව 2mg/lBAP+ 3mg/l N අඩංගු මාධ්‍යය ක්ෂේත්‍රයේ පවතින තේ පත්‍ර වලින් කැලස ලබා ගැනීමට මෙන්ම දෛහික කලල ලබා ගැනීම සඳහාද එක සේ උචිත බව සොයා ගන්නා ලදී. පහතරට තෙත් කලාපය සදහා නියගයට ඔරොත්තු දෙන නව 5000 කාණ්ඩයේ තේ දර්ශ හඳුනා ගැනීම.

නව වගාදර්ශවල කායික විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක ප්‍රතිචාර කිහිපයක් අධ්‍යයනය කිරීම තුලින් නියගයට ඔරොත්තු දෙන දර්ශ හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණවිය.

ඉහත ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සදහා රත්නපුර ශාන්ත ජෝකීම් වතුයායේ ක්ෂේත්‍ර අංක 01 හි, දෙවන අදියරෙහි පවතින 5000 කාණ්ඩයේ තේ පැල (107, 131, 01, 133, 163, 62, 23/5, 12/11, 10/1,29 සහ 294 යන වගාදර්ශ සහ TRI 2025, TRI 2026 සහ TRI 2023 ප්‍රභේද) භාවිතා කරන ලදී පාංශු තෙතමනය, අස්වැන්න සහ පත්‍රවල සාපේක්ෂ ජල ප්‍රමාණය හා ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය මනිනලදී. දන්නා ප්‍රභේදයන්ගේ හා වගාදර්ශවල අස්වැන්න හා සාපේක්ෂ ජල ප්‍රමාණය ආශ්‍රේය පරාමිතින් ලෙස භාවිතා කරමින් වියලි හා වියලි නොවන තත්වයන් යටතේ නියං ග්‍රාහීයතා දර්ශකය ගණනය කරන ලදී.

සමූහ විශ්ලේෂණය හා නියං ග්‍රාහීයතා දර්ශකය ඇසුරෙන් නියගයට ඔරොත්තු දෙන ප්‍රභේදවල වෙනස්කම් හදුනා ගන්නා ලදී. ඉහත පරාමිතීන්ට අනුකූලව, බහුතරයක් වගාදර්ශවල හා දන්නා ප්‍රභේදයන්හි, ඉහල තෙතමන මට්ටම්වලදී කැපීපෙනෙන පැහැදිලි වෙනස්කමක් දැකගත නොහැකිවිය. එසේවී නමුදු, වියලි තත්වයන් තුලදී ප්‍රභේද අතර කැපීපෙනෙන පැහැදිලි වෙනසක් දැකගත හැකිවිය. නියං ග්‍රාහීයතා දර්ශකයට අනුව 1/10, 29, 294 හා 62 යන වගාදර්ශ-යන් අනෙකුත් වගා දර්ශවලට වඩා අධික නියං ග්‍රාහීයතාවක් පෙන්නුම් කරයිග 107, 11/12, 23/5, 1, 131, 133 සහ 163 නියගයට ඔරොත්තු දෙන වගාදර්ශ ලෙස වර්ගීකරණය කල හැක. මෙම පර්යේෂණ කටයුතු තවදුරටත් ඉදිරියට සිදුකරනු ලබයි.

**මැදරටතෙත් කලාපය සඳහා නියගයට ඔරොත්තු දෙන නව 5000 කාණ්ඩයේ තේ දර්ශ හඳුනා ගැනීම**

ඉහත පර්යේෂණයේ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා තේ පර්යේෂණ ආයතනයේ මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර අංක 02 යොදා ගන්නා ලදී. පර්යේෂණයේ කටයුතු සඳහා TRI 2025 සහ TRI 4042 මෙන්ම LVP 75-12, LVP 75-139, LVP 75-133, LVP 75-62 සහ LVP 75-131 යන වගාදර්ශ උපයෝගී කරගන්නා ලදී. පාංශු තෙතමන ප්‍රමාණය, අස්වැන්න සහ පත්‍ර වල සාපේක්ෂ ජල ප්‍රමාණය හා ද්‍රාව්‍ය සීනි ප්‍රමාණය මනින ලදී. දන්නා ප්‍රභේදයන්ගේ හා වගාදර්ශවල අස්වැන්න හා සාපේක්ෂ ජල ප්‍රමාණය ආශ්‍රේය පරාමිතින් ලෙස භාවිතා කරමින් නියං ග්‍රාහීයතා දර්ශකය ගණනය කරන ලදී. සාපේක්ෂ ජල ප්‍රමාණයේ පැහැදිලි වෙනසක් මුල් අවධියේදී දැකගත නොහැකිවූ නමුදු, ඉතාම පහල තෙතමන මට්ටම්වලදී එහි කැපීපෙනෙන පැහැදිලි වෙනසක් ප්‍රභේදයන් අතර දැකගත හැකිවිය. නියං ග්‍රාහීයතා දර්ශකයට අනුකූලව 139,62 සහ 12 යන වගාදර්ශයන්, අනෙකුත් වගා දර්ශයන්ට වඩා නියගයට අධික ග්‍රාහීයතාවක් පෙන්වයී. 131 සහ 133 නියගයට ඔරොත්තු දෙන වගාදර්ශයන් වේ. මෙම පර්යේෂණ කටයුතු තවදුරටත් ඉදිරියට සිදුකරනු ලබයි.

**ඌව කලාපයේ  නියගයට ඔරොත්තු දෙන නව 5000 කාණ්ඩයේ තේ දර්ශ හඳුනා ගැනීම**

ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද්දේ, තේ පර්යේෂණායතනයේ, පස්සර පිහිටි ඌව මධයස්ථානයෙහිය. 5000 කාණ්ඩයේ වගාදර්ශයන් වන 243,199,210,88,89,21,05,17 සහ 208 සමග පාලිත ප්‍රභේදයන් වන TRI 2025, TRI  2023 , TRI 3019, DT1 සහ DN පර්යේෂණය සඳහා උපයෝගී කරගනු ලැබීණි. RCBD සැලස්ම සමග ප්‍රතිවලිත (replicates) දෙකක් අතුලත්ව, ක්ෂේත්‍රය සකස්කරන ලදී. විවිධ තේ වගාදර්ශයන්හි මූල පද්ධතියේ වර්ධනය හා පැතිරීම තීරණයකීරිමල මෙම අධයයනයේ අරමුණ විය. තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූලව ශෂ්‍ය විද්‍යාත්මක භාවිතයන් ක්‍රියාවට නංවන ලදී. මෙම පර්යේෂණ කටයුතු තවදුරටත් ඉදිරියට සිදුකරනු ලබයි.

**තේ වගාවේ ප්‍රධාන පළිබෝධකයින්ට ප්‍රතිරෝධී තේ ප්‍රභේද සහ බීජ තේ වර්ග හඳුනා ගැනීම**

ඒකාබද්ධ පළිබෝධ පාලනයේ ප්‍රධාන ක්‍රමවේදයක් වන ප්‍රතිරෝධී/ඔරොත්තුදෙන තේ ප්‍රභේද හඳුනා ගැනීම සිදු කෙරේ. 5000 කාණ්ඩයේ (VP 81, VP 83, VP 80, සහ VP 9) ප්‍රභේද ප්‍රැටිලෙන්චස් ලූසායි වටපණුවන්ට දක්වන ප්‍රතිරෝධතාව තලවාකැලේ සහ පස්සර මධ්‍යස්ථාන වලදී විමර්ශනය කරන ලදීග වටපණු දර්ශකය, මුල්වල සහ අතුවල බර, පර්ව වල දිග වැනි දත්ත ලබා ගන්නා ලදී. තේ ප්‍රභේද ප්‍රතිරෝධී සහ මධ්‍යම ප්‍රතිරෝධී ලෙස වර්ග කරන ලදී. ප්‍රභේද 05 සහ 272 ප්‍රතිරෝධී ලෙසත්, ප්‍රභේද 210 සහ 101 මධ්‍යම ප්‍රතිරෝධී ප්‍රභේද ලෙසත් වර්ගීකරණය කරන ලදී. 5000 කාණ්ඩයට අයත් විය හැකි තේ ප්‍රභේද (දර්ශ) 29, 62, 88, 131, 139, 582, 12/11 කඳ ගුල්ලා කෙරෙහි ඇති ප්‍රතිරෝධතාව විමර්ශනය කරන ලද අතර මෙ ප්‍රභේද සියල්ලම කඳ විදින ගුල්ලාට ග්‍රාහී ප්‍රභේද වන බව තහවුරු විය.

5000 කාණ්ඩයේ (LVP 74 LVP 76 LVP 77 LVP 78 LVP 79 සහ LVP 83) පහතරට සජීවි දැව වේයාට දකිවන ප්‍රතිරෝධිතාව විමර්ශනය කරමින් පවති. USP 2 ප්‍රභේදවල කඳ විදින ගුල්ලාට ඇති ප්‍රතිරෝධතාව විමර්ශනය කරමින් පවති. හදාරගග ප්‍රභේද පහතරට සජීවි දැව වේයාට දක්වන ප්‍රතිරෝධතාව විමර්ශනය කිරීමේදී මෙම ප්‍රභේද වලින් HG 23, HG 35, HG 28, HG 45, HG 32, HG 37 සහ HG 10 සජීවි දැව වේයාට මධ්‍යම මට්ටමෙන් ඔරොත්තු දෙන බව නිරීක්ෂණය කරන ලදී.

**5000 ශ්‍රේණිය තේ දර්ශ ඌව කලාපයේ බුබුළු අංගමාර රෝගයට දක්වන ප්‍රතිරෝධිතාව පරික්ෂාවට ලක් කිරීම**

බුබුළු අංගමාර රෝගය සඳහා 5000 ශ්‍රේණියේ තේ දර්ශ දක්වන ප්‍රතිරෝධිතාව මැන බැලීමට පස්සර සහ හපුතලේ යන ප්‍රදේශ වල පර්යේෂණ සිදු කරන ලදීග එහිදී ලද ප්‍රතිඵල වලට අනුව 89 සහ 243 යන දර්ශ ඉතා ප්‍රතිරෝධී දර්ශ ලෙසත්, 88, 208 සහ 199 වර්ග මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී බවත්, 5, 17, 210 සහ 21 යන තේ දර්ශ බුබුළු අංගමාර රෝගය සඳහා ඉතා ග්‍රාහී දර්ශ ලෙසත් හඳුනා ගන්නා ලදී.

**5000 ශ්‍රේණියේ තේ දර්ශ පහත රට කලාපයේ කඳ පිළිකා රෝගයට දක්වන ප්‍රතිරෝධිතාව පරික්ෂාවට ලක් කිරීම**

පරීක්ෂණයේ දෙවන පියවර ලෙස ශාන්ත ජෝකිම් වත්තෙහි දෙවන අධියරේ පර්යේෂණ වන LVP 76, 77, 78, 79 සහ 83 හි ඇති තේ දර්ශ කඳ පිළිකා රෝගයට දක්වන ප්‍රතිරෝධිතාව 0-9 දක්වා වූ දෘෂ්ටි පරිමාණයක් (visual score) යොදා ගනිමින් මැනගත් අතර එහිදී ලද ප්‍රතිඵල වලට අනුව තේ දර්ශ 7 ක් රෝගය සඳහා ප්‍රතිරෝධීතාවක් දක්වන බව හඳුනා ගන්නා ලදී. තේ දර්ශ 11 ක් සාමාන්‍ය ලෙස ප්‍රතිරෝධී වන බවත්, දර්ශ 42 ක් රෝගයට නැඹුරු බවත්, තවත් දර්ශ 31 ක් අධික ලෙස රෝගයට නැඹුරුතාවක් දක්වන බවත් එහිදී හඳුනා ගන්නා ලදී.

පරීක්ෂණයේ තෙවන පියවර ලෙස ඉන්දොල වතුයාය යොදා ගත් අතර 0-9 දෘෂ්ටි පරිමාණය යොදා ගනිමින් තේ දර්ශ 2 ක් (P6 සහ P7) රෝගයට අධික ලෙස ප්‍රතිරෝධී ලෙස හඳුනා ගන්නා ලදී තවත් තේ දර්ශ 2 ක් (P8 සහ P11) රෝගයට ප්‍රතිරෝධී බවත්, දර්ශ 3 ක් රෝගයට ගොදුරු වන ඒවා ලෙසත් අනෙක් තේ දර්ශ 4 ක් රෝගයට ඉතා නැඹුරු වන වර්ග ලෙසත් හඳුනා ගන්නා ලදී.

**යොදන පොහොරට දක්වන ප්‍රතිචාරය මත තේ ප්‍රභේද හඳුනා ගැනීම**

තේ අභිජනන ක්‍රියාදාමයේ මූලික පරමාර්ථය වනුයේ වැඩි අස්වැන්නක් දෙන තේ ප්‍රභේද වරණය කිරීමයි. තේ අස්වැන්න ඉතාමත් සංකීර්ණ ප්‍රමාණාත්මක ලක්ෂණයක් වන අතර එය අස්වැන්නට අදාළ වූ ප්‍රවේණි ලක්ෂණ කිහිපයක් මත රදා පවතී. එම නිසා, අස්වැන්නට අදාළ වූ ප්‍රවේණි ලක්ෂණ පිළිබඳ අවබෝධයක් තිබීම අභිජනන ක්‍රියාදාමයකදී වැදගත් වේ. එම නිසා මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය වූයේ, යොදන පොහොරට දක්වන ප්‍රතිචාරය මත තේ දර්ශ හඳුනා ගැනීමයි.

මෙම පර්යේෂණය ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ, ශාන්ත කූම්බ්ස් වතුයායේ, ක්ෂේත්‍ර අංක 13 හි පිහිටුවන ලදි. මෙහිදී තෝරා ගත් තේ දර්ශ වන 5000 කාණ්ඩයට අයත් VP80/272, VP80/208, VP80/99, VP80/5 සහ පාලකය ලෙස TRI 2025 ද ප්‍රතිකාරක ලෙස යොදා ගන්නා ලදි. මෙයට අමතරව නයිට්‍රජන් පොහොර මට්ටම් 4 ක් ප්‍රතිකාරක ලෙස යොදා ගන්නා ලදි. නයිට්‍රජන් පොහොර මට්ටම් 4 සහ තේ ප්‍රභේද 5, ප්‍රතිවලිත තුනක් සහිත ස්ප්ලිට් ප්ලොට් පර්යේෂණ සැලැස්මට අනුව සකස් කරන ලදි.

පත්‍රවල නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් ප්‍රමාණ තේ ශාක දර්ශ සහ නයිට්‍රජන් මට්ටම් අනුව සැලකිය යුතු ලෙස වෙනස් විණි. එසේම සක්‍රීය සහ අක්‍රිය අංකුර ප්‍රමාණය සහ ඒවායේ තෙත් සහ වියළි බර ප්‍රමාණය තේ ශාක දර්ශ සහ නයිට්‍රජන් මට්ටම් අතර සැළකිය යුතු ලෙස වෙනස් විණි. වාර්ෂික මුළු අස්වැන්නද තේ දර්ශ සහ නයිට්‍රජන් මට්ටම් අතර සැළකිය යුතු ලෙස වෙනස් විණි. ඒ කෙසේ වෙතත්, ශාක පෝෂක ප්‍රමාණය සහ අස්වනු සංරචක, තේ දර්ශ සහ නයිට්‍රජන් මට්ටම් අතර අන්තර් ක්‍රියාව සඳහා සැළකිය යුතු ලෙසින් වෙනස් නොවිණි.

**ජාන සංරක්ෂණය සඳහා, අණුක ජීව තාක්ෂණය යොදා ගැනීම සහ ශාක අතර අභිජනන ක්‍රියාවලියේදී ඩී.එන්.ඒ. අණුක සලකුණු යොදා ගනිමින් තේ ශාකයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම**

**ඩී.එන්.ඒ. අණුක සලකුණු භාවිතයෙන්, තේ ශාකයෙහි අණුක ජීව විද්‍යාත්මක ලක්ෂණ විදහා පෑම.**
**තේ ශාකයෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම හා ජාන සංරක්ෂණය සඳහා අණුක ජෛව තාක්ෂණය යොදා ගැනීම - බීජ තේ පැළ පිළිබඳ අධ්‍යයනය**

ප්‍රාථමිකයන් පිළිබඳව කළ අධ්‍යයනය තුලින් භාවිතයට යෝග්‍ය ප්‍රාථමික හයක් (ජී.එම්.ටී. සලකුණු හතරක් හා ඊ.එස්.ටී.එස්.එස්.ආර්. සලකුණු දෙකක්) අනාවරණය කර ගැනිණි.

බීජ තේ පැළ හා නිර්දේශන පැළ (වගා පැළ) වල අණුක ජෛව තාක්ෂණ අධ්‍යයනය සඳහා, ඉහත කී ප්‍රාථමික ආධාරයෙන් ජාන සංඛ්‍යාතය ඉහළ නැංවීම හා අනෙකුත් පර්යේෂණ කටයුතු මේ වන විට සිදු කර ගෙන යනු ලැබේ.

**"කැමේලියා" ගණයට අයත් වන, වගා කරන තේ වර්ග හා තේ නොවන අලංකරණ තේ ශාක (තේ-රෝස) වල, ජානමය විවිධත්වය හා සමානතාව අධ්‍යයනය කිරීම හා චරිතායනය සඳහා මයික්‍රොසැටලයිට සලකුණු තාක්ෂණය යොදා ගැනීම**

තේ නොවන අලංකරණය සඳහා වගාකරන තේ (තේ-රෝස) වර්ග වන "කැමේලියා සැසැන්ක්-වා, කැමේලියා රොසිෆ්ලෝරා, කැමේලියා ජැපොනිකා, ගෝඩිනියා සෙලෙනිකා සහ පයිරනේරියා බැරින්ටෝනිෆ්ලෝරියා යන ප්‍රභේද වලින් ඩී.එන්.ඒ. නිස්සාරණය කිරීමේ ක්‍රමවේදය ඉතා සාර්ථකව නිම කරන ලදී.

එම වගා නොකරන තේ වල අණුක ජෛව තාක්ෂණ අධ්‍යයනය සඳහා, ඉහත අනාවරණය කර ගන්නා ලද ජී.එම්.ටී. සහ ඊ.එස්.ටී.එස්.එස්.ආර්. අණුක සලකුණු යොදා ගනිමින් වැඩි දුර පර්යේෂණ සිදු කර ගෙන යනු ලැබේ.

**පහතරට සජීවී දැව වේයාගේ හානියට ග්‍රාහිවන හා ඔරොත්තු දෙන තේ ප්‍රභේද වල ඇති තෝරාගත් ජෛවරසායනික සංඝටක සංසන්දනය කිරීම**

පහත රට සජීවී දැව වේයා (*Glyptotermes dibitatus*) ශ්‍රී ලංකාවේ පහතරට කලාපයේ තේ වගා කරන ප්‍රදේශ වල දක්නට ඇති ප්‍රධාන පළිබෝධකයෙකි. මෙම පළිබෝධකයා ශාකයේ දැවයට හා කඳට විශාල ලෙස හානි කරමින් සන්නායක පටල වලටද හානි සිදු කරයි. මේ හේතුවෙන් විශාල වේ ගහනයක් ඇති වීටදී අතු හෝ සම්පූර්ණ ශාකය පවා මරණයට පත් විය හැක. පහතරට සජීවී දැව වේයාගේ ගහනය පාලනය කිරීම සඳහා සමෝධානික කළමණාකරණයක් භාවිතා කරන අතර එහිදී වගා බිම් වල ප්‍රතිරෝධී ප්‍රභේද සිටුවීම, සුළු වශයෙන් ආක්‍රමණය කර ඇති කොටස් කපා ඉවත් කිරීම සහ කප්පාදුකරන ලද කොටස්වල දැව ආරක්ෂණ ආලේපනයක් (Brunolium 15%)

ප්‍රතිරෝධී ප්‍රභේද හඳුන්වා දීම මෙම පළිබෝධකයා පාලනයට සුදුසුම ක්‍රමයක් වන අතර මේ සඳහා ප්‍රභේද තෝරා ගැනීම සිදු කල යුතුය. වර්තමානයේ මේ සඳහා සාම්ප්‍රදායික තෝරා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක වන අතර මෙම ක්‍රමයේදී වේයා විසින් සිදු කරන ලද හානියේ ප්‍රමාණය ගහනය වැඩි වීමේ සීඝ්‍රතාවයට සාපේක්ෂව ගුණාත්මකව තීරණය කල යුතුය. නමුත් මෙම ක්‍රමයේ සීමාවන් කිහිපයක් පවතින අතර මේ සඳහාම වෙන්වූ ක්ෂේත්‍ර අත්හදා බැලීම්, පුහුණු තක්සේරුකරුවන් අවශ්‍ය වීම සහ වැඩි කාලයක් (අවුරුදු 11) සහ වැඩි ශ්‍රමයක් අවශ්‍ය වීම ඒ අතර ප්‍රධාන වේ. එසේම මෙහි ප්‍රතිඵලය පළිබෝධකයාගේ පැවැත්ම හා ඌට හිතකර වූ පරිසර තත්වයන් පැවතීම යන කරුනු මත රඳා පවතී. එම නිසා ප්‍රභේද වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව හා සඵලත්වය වැඩි කිරීමට වඩාත් විශ්වාසදායී නවතම ඉක්මන් ක්‍රමයක් හඳුන්වා දීම අවශ්‍ය වේ. පහතරට සජීවී දැව වේයාට ඔරොත්තු දෙන හා ග්‍රාහී ප්‍රභේද අතර කැෆේන්, පොලිෆීනෝල් හා කැටනින් යන රසායනික සංඝටකයන්ගේ ප්‍රමාණවල වෙනසක් ඇති බැවින් ඒවාට ඇති පළිබෝධකයා ආකර්ශනය හෝ විකර්ශනය කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයක් සිදු කර තහවුරු කිරීම මගින් ප්‍රභේද තෝරා ගැනීම සඳහා ජෛව රසායන මත පදනම් වූ නව ක්‍රමයක් හඳුන්වා දීම සිදු කළ හැකිය.

ප්‍රභේද තෝරා ගැනීමට ජෛව රසායන මත පදනම් වූ නව ක්‍රමයක් හඳුන්වා දීමේ අරමුණෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කල අතර එහිදී පහත රට සජීවී දැව වේයාට ඔරොත්තු දෙන හා ග්‍රාහී ප්‍රභේද අතර තෝරා ගත් රසායනික සංඝටකයන්ගේ සංසන්දනයක් සිදු කිරීම ආරම්භ කරන ලදී. රත්නපුර ශාන්ත ජෝකීම් වතුයායේ ක්ෂේත්‍රයකින් ප්‍රභේද හඳුනාගත් අතර ඒවායේ ප්‍රාථමික අතු නියඳි එකතු කර විද්‍යාගාරයේදී ඒවායේ අඩංගු කැෆේන්, පොලිෆීනෝල සහ කැටකීන් ප්‍රමාණ විශ්ලේෂණය කරන ලදී.



මෙම පරීක්ෂණය දැනට ආරම්භ කර මාස 03ක් පමණ වන අතර කීට විද්‍යා අංශය හා එක්ව පරීක්ෂණය තවදුරටත් ක්‍රියාත්මක වේ.

# භූමි ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ භෝග පාලනය

**පාංශු සශ්‍රීකත්වය උදෙසා ඒකාබද්ධ ක්‍රමවේද භාවිතය**
**තේ තවාන් වල සාමාන්‍ය කාලය ඉක්මවා තබාගන්නා තේ පැල සඳහා පොහොර මිශ්‍රණයක් සැකසීම**

තේ තවානේ පැල තිබෙන කාලය උච්චත්වය මත මාස 10 සිට 12 දක්වා වෙනස් වේ. අවශ්‍යතාව මත සමහරවිට මෙම කාලසීමාව අවු 1 1/2 සිට 2 දක්වා දීර්ග කිරීමට සිදුවේ විශේෂයෙන්ම, මෙම තේ පැල භාවිත කරන්නේ, ක්ෂේත්‍රයේ පාළු සිටුවීම සඳහායි. තවානේ සහ නොමේරූ තේ පැල සඳහා තේ පර්යේෂණායතනයේ නිර්දේශිත පොහොර මිශ්‍රණ වන්නේ, ටී 65 සහ ටී 200 මිශ්‍රණයි මේවායින් ටී 65 පොහොර මිශ්‍රණය ජලයේ හොඳින් ද්‍රව්‍ය වුවත්, එප්පාවල රොක් පොස්පේට් අඩංගු ටී 200 මිශ්‍රණය සාපේක්ෂව අඩු ද්‍රාව්‍යතාවයක් පෙන්වයි. කෙසේ වුවද, තවානේ සාමාන්‍ය කාලසීමාව ඉක්ම වූ විශාල තේ පැල සඳහා පොහොර මිශ්‍රණයක් තේ පර්යේෂණායතනය මඟින් නිර්දේශ කර නොමැත. එම නිසා මෙම පරීක්ෂණයේ ප්‍රධාන පරමාර්ථය වුයේ, තේ තවානේ සාමාන්‍ය කාලය ඉක්මවා තබාගන්නා තේ පැල සලකන ලදී.සඳහා සුදුසු පොහොර මිශ්‍රණයක් නිර්දේශ කිරීමය.

තේ පර්යේෂණායතනයේ, හන්තාන පිහිටි මැදරට මධ්‍යස්ථානයේ මෙම පර්යේෂණය සිදුකරන ලදී. මෙහිදී ටී 65 සහ ටී 200 පොහොර මිශ්‍රණ විවිධ ප්‍රමාණ සමඟ යොදන වාර ගණන ප්‍රතිකාරක ලෙස ලැබූ ප්‍රතිඵල වලට අනුව, කඳෙහි වියලි බර සහ ප්‍රරෝහකයේ (පැලයේ) උස යන පරාමිතිකයන් ප්‍රතිකාරක අතර සැලකිය යුතු ලෙස වෙනස් වියග ටී 65 මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණයෙන් යෙදූ ප්‍රතිකාරකයෙහි ඒවායේ වැඩිම අගයන් වාර්තා වියග පත්‍රවල පෝෂක ප්‍රතිශතය ප්‍රතිකාරක අතර සැලකිය යුතු ලෙසින් වෙනස් නොවිණි. පාංශු ච්‍ය අගයද ප්‍රතිකාරක අතර සැලකිය යුතු ලෙස වෙනස් වු අතර, අඩුම අගයන් වාර්තා වුයේ, ටී 65 යෙදූ ප්‍රතිකාරකවලයි එසේම පසේ නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්, මැග්නීසියම් සහ සල්පර් මට්ටම ප්‍රතිකාරක අතර සැලකිය යුතු ලෙස වෙනස් වුණිග එමනිසා, තේ තවාන් සඳහා නිර්දේශිත ටී 65 මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණ වලින්ම තවානේ සාමාන්‍ය කාලය ඉක්මවා තබාගන්නා තේ පැල සඳහාද භාවිතා කල හැකි බව නිගමනය කරන ලදි.

**මේරූ තේ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස භාවිත කිරීම**

මෙම අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වූයේ, කරමාන්තශාලා දර අළු සහ කසල තේ, තේ වගාවේ පෝෂක ප්‍රභවයන් ලෙස භාවිත කිරීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමයිග මෙම අධ්‍යයනයන් සඳහා ශාන්ත කූම්බ්ස් වතුයාය (උඩරට ප්‍රදේශය), මොරගොල්ල වතුයාය (පහතරට ප්‍රදේශය) සහ කූරුගම වතුයාය (මැදරට ප්‍රදේශය) තෝරා ගැනිණගී මෙහිදී ප්‍රතිකාරක ලෙස කර්මාන්තශාලා දර අළු (අවුරුද්දකට හෙක්ටයාරයකට කිග්‍රෑම් 1000, 2000 වන පරිදි) සමඟ කසල තේ (අවුරුද්දකට හෙක්ටයාරයකට ටොන් 20) මිශ්‍රකර යූරියා පොහොර ඇතිව සහ නැතිව යොදන ලදී. තේ පර්යේෂණායතනයේ වර්තමාන නිර්දේශ වන වීපී/යූඑම් 910 සහ වීපී/එල්සී 880 සංසන්දනය සඳහා යොදා ගන්නා ලදී .

උඩරට ප්‍රදේශයේ පැවැත්වූ පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව, කර්මාන්තශාලා දර අළු සමඟ කසල තේ සහ යූරියා යෙදූ ප්‍රතිකාරයකයේ පත්‍රවල පෝෂක ප්‍රතිශතය සහ දළු අස්වැන්න වැඩි වී ඇත. ඒ අනුව, වැඩි පාංශු ච්‍ය ස්වාරක්ෂ ධාරිතාවක් ඇති උඩරට ප්‍රදේශයේ තේ වගාවන් සඳහා දැව අළු සහ කසල තේ මිශ්‍රකර යූරියා සමඟ යෙදීම හානිදායක නොවේ.



**මස්කෙළිය පාංශු ශ්‍රේණියට අයත් තේ වගාවේ ඇති මැන්ගනීස් පෝෂක ඌනතාවය සඳහා ප්‍රතිකර්ම සෙවීම**

මැන්ගනීස් ඌනතාවය මස්කෙළිය ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ. එය හේතුකොට ගෙන තේ අස්වැන්නේ සැලකිය යුතු අඩුවීමක් වාර්තා වේග එමනිසා, මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ, මැන්ගනීස් ඌනතාවයට ප්‍රතිකර්මයක් ලෙස මැන්ගනීස් අඩංගු පොහොර සමඟ නයිට්‍රජන් පොහොරවල විවිධ ප්‍රභව යොදා ගත හැකි ද යන්න පරීක්ෂා කිරීමයිග මෙම පරීක්ෂණය, මස්කෙළිය, ලක්ෂපාන වතුයායේ, හැමිල්ටන් කොටසේ ක්ෂේත්‍ර අංක 07 හි පිහිටුවන ලදී. මෙහිදී මැන්ගනීස් පොහොර පස සහ පත්‍ර මතට යෙදීමත් සමඟම නයිට්‍රජන් පොහොරවල විවිධ ප්‍රභව යෙදීමත් ප්‍රතිකාරක ලෙස තෝරා ගන්නා ලදී.

ලැබූ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී, ඇමෝනියම් සල්ෆේට් නයිට්‍රජන් ප්‍රභවය ලෙස යෙදූ ප්‍රතිකාරකවල පාංශු pH අගය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එසේම පත්‍ර මතට මැන්ගනීස් පෝෂක යෙදීම නිසා පත්‍රවල මැන්ගනීස් ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. ඒ කෙසේ වුවද යෙදූ ප්‍රතිකාරක මගින් අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකර නොමැත. නමුත් මැන්ගනීස් සල්ෆේට් පත්‍ර මතට යෙදූ ප්‍රතිකාරකවල වැඩි අස්වැන්නක් වාර්තා විය.

**ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා (PGPR) ක්ෂේත්‍ර තත්ත්ව යටතේ ඇගයීම**

ශාක මුල් ආශ්‍රිතව වෙන් කර ගත් ඵලදායී, සජීවි, සංගමික සහ සහජීවී බැක්ටීරියා ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා ලෙස හැඳින්වේ. මෙම බැක්ටීරියා, ශාක වර්ධනය සහ අස්වැන්න වැඩි කරන බව පර්යේෂණ මඟින් පෙන්වා දී ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ, තේ තවාන් තත්ත්ව යටතේ දැනටමත් තෝරා වෙන් කර ගත් කාර්යක්ෂම බැක්ටීරියා මාදිලි ක්ෂේත්‍ර තත්ත්ව යටතේ රසායනික පොහොර සමඟ ඇගයීමයි. මෙහිදී යොදා ගත් ප්‍රතිකාරක වනුයේ, හොඳම නයිට්‍රජන් තිර කරන මාදිලිය සහ පොස්පරස් ද්‍රාව්‍ය කරන මාදිලිය සමඟ නිර්දේශිත නයිට්‍රජන් ප්‍රමාණයෙන් 2/3 සහ නිර්දේශිත පොස්පරස් ප්‍රමාණයෙන් 1/3 යෙදීම සහ ඒ ඒ පාංශු ශ්‍රේණිය සඳහා හොඳම නයිට්‍රජන් තිර කරන මාදිලිය සහ පොස්පරස් ද්‍රාව්‍ය කරන මාදිලිය සමඟ නිර්දේශිත නයිට්‍රජන් ප්‍රමාණයෙන් 2/3ක් සහ නිර්දේශිත පොස්පරස් ප්‍රමාණයෙන් 1/3ක් යෙදීමය.

ප්‍රතිඵල වලට අනුව, යොදාගත් බැක්ටීරියා මාදිලි පාංශු ශ්‍රේණි සඳහා විශේෂත්වයක් පෙන්වූ අතර ඒවා අස්වැන්න කෙරෙහිද ධනාත්මක ලෙස බලපා ඇතිබව පෙන්වන ලදී. එසේම, පාංශු ශ්‍රේණි සඳහා ද්විත්ව බැක්ටීරියා මාදිලි යොදා ගැනිමෙන් මේරූ තේ මිශ්‍රණයේ (වීපී/යු එම්910) නයිට්‍රජන් ප්‍රමාණයෙන් 33%ක් සහ පොස්පරස් ප්‍රමාණයෙන් 50%ක් අඩු කළ හැකි බව පෙනේග මැදරට ප්‍රදේශයේ තේ වගා කරන ඉඩම්වල පසේ භෞත රසායනික ලක්ෂණ වැඩිදියුණු කර, ඉහත සඳහන් කළ බැක්ටීරියා මාදිලි භාවිතයෙන් යොදන රසායනික පොහොර ප්‍රමාණය අඩු කරගත හැකි බව පෙනේ.

**සෙමින් පෝෂක මුදාහරින පොහොර (Slow Release Fertilizer) මගින් පසෙහි සහ ශාකයේ පෝෂක ප්‍රමාණයට සහ අස්වැන්නට ඇතිකරන බලපෑම්**

වර්තමානයේ වෙළඳපොළෙහි ඇති තේ පොහොර මිශ්‍රණ, අඩු අස්වනු ප්‍රතිචාරයක් පෙන්වන බව, තේ වගාකරුවන් නිතරම පැමිණිලි කරනු ලැබේ. පහතරට ප්‍රදේශයේ පවතින අධික උෂ්ණත්වය නිසා ඇමෝනියා වායුව ලෙස පොහොර හානි වීම වැඩියෙන් සිදු වේ. එසේම එම ප්‍රදේශයේ පවතින අධික වර්ෂාව නිසා ක්ෂරණය සහ සෝදා පාළුව හේතුකොට ගෙන ඇතිවන පෝෂක හානියද වැඩිය. එමනිසා, මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, ආර්ථිකව ඵලදායි සෙමින් පෝෂක මුදාහරින පොහොර වර්ගයක් හඳුන්වා දීමයි. මේ සඳහා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) මගින් නිපද වූ සෙමින් පෝෂක මුදාහරින පොහොර වර්ග තෝරා ගන්නා ලදී මෙහි දී ප්‍රතිකාරක ලෙස සෙමින් පෝෂකමුදාහරින පොහොරවල විවිධ ප්‍රමාණ සහ යොදන වාර ගණන තෝරා ගන්නා ලදී. ඒවා වර්තමානයේ නිර්දේශ කර ඇති පොහොර සමග සංසන්දය කරන ලද.

ප්‍රතිඵල වලට අනුව, දළු අස්වැන්න සැලකිය යුතු ලෙස ප්‍රතිකාරක අතර වෙනස් වී ඇතග වැඩිම අස්වැන්න වන හෙක්ටයාරයකට නිම් තේ කිලෝග්‍රෑම් 4258 ලබා දුන්නේ, නයිට්‍රජන් පෝෂක 100% නැනෝ යූරියා සහ 100% පොටෑසියම් පෝෂක එම්ඕපී පොහොර මගින් ලබා දුන් වාර ගණන 04 ක් වූ ප්‍රතිකාරකයේය. නැනෝ පොහොර යෙදූ ප්‍රතිකාරක, වර්තමාන තේ පර්යේෂණායතන නිර්දේශයට වඩා සංසන්දනාත්මකව වැඩි අස්වැන්නක් ලබා දුණි.

**පසෙහි අඩංගු ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය පදනම් කර ක්ෂුද්‍ර පෝෂක අඩංගු පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීම**

වර්තමානයේදී පත්‍ර මතට යොදන විවිධ පොහොර වර්ග විශාල ප්‍රමාණයක් තේ වගාවේදී භාවිත කරනු ලබයි. එවා භාවිත කරන්නන් තේ අස්වැන්න වැඩිවන බව ප්‍රකාශ කළද, දීර්ඝකාලීනව යෙදීමෙන් සිදුවන අහිතකර ප්‍රතිඵල පිලිබඳවද වාර්තා වී ඇත. පත්‍ර මතට යොදන පොහොර පිළිබඳව කර ඇති පර්යේෂණ සංඛ්‍යාව සීමිතයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, ඵලදායී හා ආර්ථිකමය ලාභදායී ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීමයි. මෙහිදී ප්‍රතිකාරක ලෙස සින්ක් (සින්ක් සල්ෆේට්), මැන්ගනීස් (මැන්ගනීස් සල්ෆේට්) සහ බෝරොන් (බෝරික් ඇසිඩ්) වල විවිධ සංයෝජන භාවිත කරන ලදී.

ප්‍රතිඵල වලට අනුව, ප්‍රතිකාරක අතර සැලකිය යුතු අස්වැනු වෙනසක් දක්නට නොලැබිණ. කෙසේ වුවද, සින්ක් සහ මැන්ගනීස් ඇතුළත් ප්‍රතිකාරක වැඩිම අස්වැන්නක් දී තිබිණී. අඩුම අස්වැන්න වාර්තා වූයේ කිසිවක් නොයෙදූ ප්‍රතිකාරයේයග සින්ක්, බෝරෝන් සහ මැන්ගනීස් යන පෝෂක තුනම අන්තර්ගත ප්‍රතිකාරය දෙවැනි වැඩිම අස්වැන්න දී තිබිණ.

**මුල්වල ව්‍යුහය සහ පැතිරීම (root architecture) පෝෂක අවශෝෂණය, වර්ධනය සහ ඵලදායිතාවයට බලපෑම්**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, මුල්වල ව්‍යුහය සහ පැතිරීම නයිට්‍රජන්, පොස්පරස් සඳහා පොටෑසියම් පෝෂක අවශෝෂණය කෙරෙහි බලපෑම සෙවීමයිග මෙහිදී වර්තමාන තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශය වන ටීපී/යූඑම් 910 මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණයෙන් අර්ධයක් හෝ සම්පූර්ණ ප්‍රමාණය සමඟ තේ ප්‍රභේද වන TRI 2023, TRI 2025,TRI 3072, TRI 4071, DT1, DN සහ බීජ තේ ප්‍රතිකාරක ලෙස යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ, ශාන්ත කූම්බ්ස් වතුයායේ ක්ෂේත්‍ර අංක 13 හි පිහිටුවන ලදී .

**පසෙහි pH අගය සහ pH ස්වාරක්ෂක ක්‍රියාව කෙරෙහි කසල තේ වලින් නිෂ්පාදන කරන ලද ජෛව අඟුරු (Bio-char) වල බලපෑම අධ්‍යයනය කිරීම**

පසෙහි ආම්ලිකතාවය, තේ ක්ෂේත්‍රවල ඵලදායිතාවයට බලපාන ප්‍රධාන සීමාකාරී සාධකයක් වේ. එමනිසා මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ, පසෙහි pH අගය සහ pH ස්වාරක්ෂක ක්‍රියාව කෙරෙහි කසල තේ වලින් නිෂ්පාදනය කරන ලද ජෛව අඟුරු (Bio-char) වල බලපෑම සෙවීමය. ජෛව අඟුරු නිෂ්පාදන කරනු ලැබුයේ, නිර්වායු තත්ත්ව යටතේ විවිධ උෂ්ණත්වයන්ට (300 °C සහ 500 °C) දහනය කිරීමෙන්ය. මෙහිදී තෝරාගත් පාංශු ශ්‍රේණි වන්නේ, වැඩි ව්‍ය ස්වාරක්ෂක ධාරිතාවක් ඇති මට්ටකැලේ පාංශු ශ්‍රේණිය සහ අඩු pH ස්වාරක්ෂක ධාර්තාවක් ඇති පල්ලේගොඩ පාංශු ශ්‍රේණියයි.මෙම පස්වලට බර අනුව 0%, 1% සහ 2% වන පරිදි ජෛව අඟුරු මිශ්‍ර කරන ලදී. මෙහිදී පසෙහි pH ස්වාරක්ෂක ධාරිතාව අනුමාපන ප්‍රස්තාර ක්‍රමය මගින් නිර්ණය කරන ලදී.

ලැබූ ප්‍රතිඵල සලකා බැලීමේදී, ජෛව අඟුරු යෙදීම නිසා පසෙහි pH අගය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ජෛව අඟුරු යෙදීමෙන් පසු කාලයත් සමග පසෙහි pH අගය ක්‍රමයෙන් අඩු වූ අතර, මෙම අඩුවීම පල්ලේගොඩ ශ්‍රේණියේ වැඩියෙන් පෙන්නුම් කරනු ලබය. ජෛව අඟුරු 1% සහ 2% ක් යොදූ පස්වල බීජෞෂණ කාලය අවසාන වීමෙන් පසුව පාලකයට සාපේක්ෂව pH අගය වැඩිවීම මට්ටකැලේ ශ්‍රේණියේ පිළිවෙලින් ඒකක 0.15 සහ 0.31 වූ අතර, පල්ලේගොඩ ශ්‍රේණියේ එය ඒකක 0.43 සහ 0.84 විය. ජෛව අඟුරු දැමීම නිසා පාංශු pH ස්වාරක්ෂක ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩි විය. උෂ්ණත්වය 300°C සහ 500ඝඪ් දී පිළියෙල කර ගත් අඟුරු එකතු කළ විට, පල්ලේගොඩ ශ්‍රේණියේ පස්වල පාංශු pH ස්වාරක්ෂක ධාරිතාව වැඩිවීම පිළිවෙලින්, 54% සහ 21%ක් වූ අතර, මට්ටකැලේ පාංශු ශ්‍රේණියේ පස්වල pH ස්වාරක්ෂක ධාර්තාව වැඩිවීම පිළිවෙලින් 11% සහ 6% විය ඒ අනුව පහළ උෂ්ණත්වයේදී කසල තේ උපයෝගී කරගෙන ජෛව අඟුරු සාදා ගැනීමෙන්, පසේ ආම්ලිකතාවය පාලනය කරගැනීමට පුළුවන.

**තේ ඉඩම්වල පසෙහි පෝෂක සුලභතාවය සහ පොහොර අවශ්‍යතාවය නිර්ණය කිරීම සඳහා විශ්ලේෂණ කට්ටලයක් නිර්මාණය කිරීම**

මෙහි මූලික පරමාර්ථය වූයේ, තේ වගා කරන පසෙහි පෝෂක සුලභතාවය නිර්ණය කිරීම සඳහා ඉක්මන් සහ අඩු පිරිවැයක් සහිත ක්‍රමයක් හඳුන්වා දීමයි. මේ සඳහා විශ්ලේෂණ කට්ටලයක් නිර්මාණය කරනු ලැබිණි. මෙහිදී සාදාගත් ආදර්ශ විශ්ලේෂණ කට්ටලය මඟින් ලබාගන්නා ලද අගයන් සාම්ප්‍රදායික විශ්ලේෂණ ක්‍රම මඟින් ලබාගත් අගයන් සමග සංසන්දනය කරන ලදී.

මෙහිදී විශ්ලේෂණ කට්ටලය මඟින් පාංශු pH, කාබන් ප්‍රතිශතය, පොස්පරස්, සල්පර් සහ ඇලූමිනියම් සඳහා ලබාගත් අගයන්, සම්ප්‍රදායික විශ්ලේෂණ ක්‍රම මඟින් ලබාගත් අගයන් සමග ඉතා හොඳින් සැසඳේ. එසේම පත්‍රවල නයිට්‍රජන් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා, මෙම උපකරණය මඟින් ලබාගත් අගයන්, සම්ප්‍රදායික ක්‍රමය මඟින් ලබාගත් අගයන් සමග හොඳින් සැසඳේ. එමනිසා මෙම ආදර්ශ විශ්ලේෂණ කට්ටල, පසෙ සහ තේ ශාකයේ පෝෂක ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා යෝග්‍ය බව තහවුරු විණි. මෙම උපකරණය සඳහා පේටන්ට් බල පත්‍රයක් ලබා ගැනීමට අයදුම් කර ඇතග ඉන් පසු මෙම උපකරණය වානිජකරණය කිරීමට බලාපොරොත්තු වේ.

**ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මගින් භූමි පලදායිතාවය වැඩි දියුණු කිරීම**

**පැල නැවත සිටුවීමට පෙර පස පුනරුත්ථාපනය නොකිරීම /පුනරුත්ථාපන කාල සිමාව අඩුකිරීම**

**පාංශු පුනරුත්ථාපන කාලය අඩු කරගැනිම සඳහා "ජෛව පටල පොහොර" යොදා ගැනිමේ සක්‍යතා අධ්‍යයනය**

නිවි පිකොක්,ගම්පොල සහ හවුපේ, කහවත්ත යන වතුවල ආරම්භ කරන ලද මෙම අත්හදා බැලීම සඳහා පහත ප්‍රතිකාරකයන් යොදා ගන්නා ලදි.

**T1-** මානා තෘණ සමග මාස 12 කාල සිමාවක් පස පුනරුත්ථාපනය කිරිම (මානා සිටුවිම 2012)+ " ජෛව පොහොර " + නිර්දේශිත පොහොර (U625) ප්‍රමාණයෙන් අඩක් යෙදිම (තේ නැවත සිටුවිම 2013)

**T2-** මානා තෘණ සමග මාස 12 කාල සිමාවක් පස පුනරුත්ථාපනය කිරිම (මානා සිටුවිම 2012)+ "පටලමයජෛව පොහොර" (තේ නැවත සිටුවිම 2013)

**T3-** පස පුනරුත්ථාපනය කිරිමකින් තොරව පැල සිටුවිම සමග, "ජෛවපටල පොහොර" නිර්දේශිත පොහොර ( T750) ප්‍රමාණයෙන් අඩක් යෙදිම (තේ පැල සිටුවිම 2011)

**T4-** මානා තෘණ සමග මාස 24 කාල සිමාවක් පස පුනරුත්ථාපනය කිරිම (U 625 මාණාවලට යෙදිම) (තේ නැවත සිටුවිම 2013)තේ පර්යේෂණායතනයේ නිර්දේශිත ක්‍රමය

**T5 -** පස පුනරුත්ථාපනය කිරීමකින් තොරව පැල සිටුවීම (තේ පැල සිටුවීම 2013) "ජෛව පටල පොහොර" + නිර්දේශිත පොහොර ( T750) ප්‍රමාණයෙන් අඩක් යෙදීම

**T6 -** පස පුනරුත්ථාපනය කිරීමකින් තොරව පැල සිටුවීම (තේ පැල සිටුවීම 2013)+නිර්දේශිත රසායනික පොහොර සම්පූර්ණ ප්‍රමාණය යෙදීම

නිව් පිකොක් වතු යායේ කරන ලද පර්යේෂණ වලින් ලබාගත් පාංශු සාම්පල වල ක්ෂේත්‍ර ධාරිතාවය, ස්ථිර මැලවීමේ අංකය, දෘශ්‍ය ඝනත්වය සහ ලබා ගත හැකි ජල ප්‍රමාණය යන පරාමිතින් පරීක්ෂා කරන ලදි.

ජලය රඳවා ගැනීමේ ධාරිතාවය (මිලි මීටර/30 සෙන්ටි මීටර) සහ දෘශ්‍ය ඝනත්වයේ අගයන් පිළිවෙලින් (T1- 55.2 සහ 1.27; T2 - 56.2 සහ 1.21 ; T3 - 51.15 සහ 1.3 ; T4-53.2 සහ 1.31; T5 -51ග94 සහ 1.30 හා T6 - 54.4 සහ 1.27 විය. සම්මත ක්‍රමය වන T4 ට වඩා ඉහල ජලය රඳවා ගැනීමේ ධාරිතාවයක් T2 මගින් ද T4 ට වඩා අඩු දෘශ්‍ය ඝනත්වයක් T2 මගින් ද පෙන්නුම් කරන ලදී. සාරවත් පසක දර්ශක ලෙස ඉහල ජලය රඳවා ගැනීමේ ධාරිතාවය සහ පහල දෘශ්‍ය ඝනත්වයක් තිබීම දැක්විය හැකිය. T1 සහ T4 යන සම්මත ප්‍රතිකාරයන්හි කඳේ විශ්කම්භය, පරිධිය, පත්‍ර වල වියලි බර, රිකිලි වල වියලි බර, දෙවන සහ තුන්වන පැල පුහුණු කැපුමේ බර යන වර්ධන ක්‍රියාකාරිත්වයේ පරාමිතීන් අතර විශේෂිත වෙනසක් නොමැතග ජෛව පොහොර සමග අනුමත රසායනික පොහොර ප්‍රමාණයෙන් අඩක් :½ U 625) යොදා මානා තෘණ ශාක සමග මාස 12 කාල සීමාවක් පස පුනරුත්ථාපනය කිරීමෙන් හොඳ ප්‍රතිපල ලබාගත හැකි බව අනාවරණය විය.

හවුපේ වතුයායේ කරන ලද අත්හදා බැලීමේදී T1 සහ T4 යන ප්‍රතිකාරයන්හි පාංශු කාබන් ප්‍රතිශතය සහ නයිට්‍රජන් අතර විශේෂිත වෙනසක් නොමැති බව පෙනේග T1 වල පාංශු ක්ෂුද්‍රජීවී ගහණයේ පාංශු කාබන් ප්‍රතිශතය ඉහල අගයක් පෙන්වන නමුත් සම්මත ක්‍රමය වන T4 සඳහා ඉහල කැටායන හුවමාරු ධාරිතාවක් සහ ඉහල පාංශු පොටැසියම් ප්‍රමාණයක් දක්නට ලැබුණි. T1 සහ T4 යන ප්‍රතිකාරයන් අතර කඳේ විශ්කම්භය, පරිධිය, පත්‍ර වල වියලි බර, රිකිලි වල වියලි බර, අතු වල සණකම පැල පුහුණු කැපුමේ බර යන වර්ධන පරාමිතීන් අතර විශේෂිත වෙනසක් නොමැත. එම නිසා T1 ප්‍රතිකාරය භාවිතා කිරීමට හැකියාවක් පවතින අනාවරණය විය.

මෙම නිශ්පාදන වානිජකරණය කර වෙළඳ පොලට නිකුත්කර ඇති හෙයින් නිව් පිකොක් සහ හව්පේ යන වතුවල කරන ලද අත්හදා බැලීමේ කටයුතු නතර කිරීමට කලමනාකාරිත්වය තිරණය කරන ලදිග එම නිසා මේ සඳහා නිගමනයන් ලබා දීමට නොහැකි වියග නිගමනයක් ලබා දීමට නම් අවම වශයෙන් පලමු කප්පාදුව සම්පූර්ණ වන තෙක්වත් දත්ත රැස් කල යුතු වේ.

**"ජෛව පටල " තාක්ෂණය භාවිතයෙන් පසේ සරුබව වැඩි දියුණු කිරීම**

"ජෛවපටල පොහොර" සමග රසායනික පොහොර මිශ්‍රණ මාත්‍රා වෙනස් කරමින් කරනු ලබන අත්හදා බැලීම් රත්නපුර ශාන්ත ජොකිම් වත්ත, බණ්ඩාරවෙල කහගල්ල වතුයාය, බලංගොඩ කුඩා තේ වතු වල සහ නාවලපිටිය බාර්කෙපල් වතුවල පවත්වා ගෙන යනු ලැබේ. ප්‍රතිකාරක ලෙස T1-නිර්දේශිත රසායනික පොහොර (T200) යෙදූ ප්‍රතිකාරකය T2- නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් අඩක් (T100) යෙදූ ප්‍රතිකාරකය T3- නියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණයට වඩා 1/3 වැඩිපුර සහ නියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු පොස්පරස් ප්‍රමාණයට වඩා 1/3 අඩු ප්‍රමාණයක් (T133) යෙදූ ප්‍රතිකාරකය T4-නියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණයට වඩා 1/3 වැඩිපුර සහ නියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු පොස්පරස් ප්‍රමාණය (T142) යෙදූ ප්‍රතිකාරකය T5-නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් අඩක් (T100) +"ජෛව පටල පොහොර" යෙදූ ප්‍රතිකාරකය T6- නිර්දේශිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණයට වඩා 1/3 වැඩිපුර සහ නියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු පොස්පරස් ප්‍රමාණයට වඩා 1/3 අඩු ප්‍රමාණයක් (T133) +"පටලමය ජෛව පොහොර යෙදූ ප්‍රතිකාරකය T7- නිර්දේශිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොර වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණයට වඩා 1/3 වැඩිපුර සහනියමිත පොහොර මාත්‍රාවෙන් අඩක් වූ රසායනික පොහොරවල අඩංගු පොස්පරස් ප්‍රමාණය (T142)+"පටලමය ජෛව පොහොර" යෙදූ ප්‍රතිකාරකය යොදා ගෙන ඇත.

| ප්‍රතිකාරක | **SA (20.6 % N)** | **ERP (28.5% $P_2O_5$** | **MOP (60% $K_2O$)** | **Kieserite (24% Mg O)** | **මුළු එකතුව** |
|---|---|---|---|---|---|
| T1 - T200 (සම්මත) | 100 | 50 | 25 | 25 | 200 |
| T2 - T100 | 50 | 25 | 12.5 | 12.5 | 100 |
| T3 - T134 | 67 (1/3 more of T2) | 17 (1/3 less of T2) | 25 | 25 | 134 |
| T4 - T142 | 67 | 25 | 25 | 25 | 142 |
| T5 - T100 + පටලමය ජෛව පොහොර | | | | | |
| T6– T134 + පටලමය ජෛව පොහොර | | | | | |
| T7– T142 + පටලමය ජෛව පොහොර | | | | | |

මෙම අත්හදා බැලීම සිදු කල ස්ථාන සියල්ලෙහිම T1 T5 T6 සහ T7 යන ප්‍රතිකාරක වල වර්ධන පරාමිතීන් වලට අනුව කිසිදු විශේෂිත වෙනසක් දක්නට නොමැතග එම නිසා, පර්යේෂණය සඳහා යොදා ගත් අනෙකුත් පොහොර මිශ්‍රණ වල පිරිවැය විශ්ලේෂණය සලකා බැලීමේදී ජෛව පොහොර සමග අනුමත පොහොර ප්‍රමාණයෙන් අඩක් පමණ රසායනික පොහොර යෙදීමට හැකියාවක් පවතින බව අනාවරණය විය.

මෙම නිශ්පාදන වාණිජකරණය කර වෙළඳ පොලට නිකුත්කර ඇති හෙයින් නිව්පිකොක් සහ හව්පේ යන වතුවල කරන ලද අත්හදා බැලීමේ කටයුතු නතර කිරීමට කලමනාකරණය තිරණය කරන ලදි. එම නිසා මේ සඳහා නිගමනයන් ලබා දීමට නොහැකි විය.

**පාංශු පුනරුත්ථාපන කාලය කෙටි කර ගැනීම සඳහා වැඩි අස්වැන්නක් ලබා දෙන නව තෘණ විශේෂ දෙකක් අධ්‍යයනය කිරීම, හවුපේ වත්ත (කහවත්ත) සහ කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය (2011)**

මෙහිදී වැඩි ජීවී අස්වැන්නක් ලබාදෙන නව තෘණ විශේෂ දෙකක් වන හයිබ්‍රිඩ් නේපියර් (*Pennisetum Purpureum x Pennisetum americanum*) CO-3 ප්‍රභේදය සහ නැගෙනහිර ඉන්දීය ලෙමන් ග්‍රාස් (*Cymbopogon flexuosus*) හි වර්ධන ඇගයිම පිණිස ගෞතමාලා (*Tripsacum laxmum*) සහ මානා (*Cymbopogon confertiflorus*) පාලක ප්‍රතිකාරක ලෙස යොදාගනිමින් සංසන්දනාත්මක විශ්ලේෂණයක් හවුපේ වත්ත (කහවත්ත) සහ තේ පර්යේෂණායතනයේ කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය යන ස්ථානයන්හි ක්ෂෙත්‍ර වල ස්ථාපනය කරන ලදි.

**හවුපේ වත්ත, කහවත්ත( 2011 ජූලි)**
2013 ජූනි මසදි ඉහත සඳහන් තෘණ වර්ග 4 මගින් පාංශු පුනරුත්ථාපන කල සහ "පාංශු පුනරුත්ථාපන නොකල" භූමියේ TRI 4042 තේ ප්‍රභේදය වගා කරන ලදි. වගා කිරිමෙන් පසුව තේ පැළවල වර්ධන ලක්ෂණ ඇගයිමත් පැවති නියං කාලය තුලදී සහ අවසානයේ තේ පැල මැරිමේ ප්‍රතිශතය සටහන් කර ගන්නා ලදි.

තේ පැළ සිටුවා අවුරුදු 1 1/2 කට පසුව 2015 වසර තුලදි දෙවන මට්ටම් කැපීම සිදු කරන ලද අතර මට්ටම් කැපිමේදි ඉවත් කරන අතු කැබලි වල තෙත් සහ වියළි බර සටහන් කර ගන්නා ලදි.පැළයක තෙත් බර (ග්‍රෑම් 87.34) සහ වියළි බර(ග්‍රෑම් 22.87) අඩුම වූයේ "පාංශු පුනරුත්ථාපනය නොකල" ප්‍රතිකාරකයේ වන අතර තෙත් බර (ග්‍රෑම් 140.88) සහ වියළි බර(ග්‍රෑම් 38.74) වැඩීම ප්‍රතිකාරකය වූයේ හයිබ්‍රිඩ් නේපියර් ප්‍රතිකාරකයයි.

නියගය තුල පැළ මියයෑමේ ප්‍රතිශතය (2015) සටහන් වූයේ පිලිවෙලින් 1%, 2.5%, 2%, 2% සහ 13% ලෙසය. වැඩීම පැළ මියයෑමේ ප්‍රතිශතය සටහන් වූයේ "පාංශු පුනරුත්ථාපනය නොකල" ප්‍රතිකාරකයෙහිය.

තුන්වන මට්ටම් කැපීම දෙවන මට්ටම් කැපීමෙන් මාස 6 කින් පසුව (2015) සිදු කරන ලදී. අතු කැබලි වල තෙත් සහ වියළි බර සටහන් කර ගන්නා ලදි. පැළයක තෙත් බර (ග්‍රෑම් 316.25) සහ වියළි බර(ග්‍රෑම් 103.81) වැඩීම ප්‍රතිකාරකය වූයේ හයිබ්‍රිඩ් නේපියර් ප්‍රතිකාරකයයි. පැළයක තෙත් බර (231.41 ග්‍රෑම් ) සහ වියළි බර(ග්‍රෑම් 77.08) අඩුම වූයේ නැගෙනහිර ඉන්දීය ලෙමන් ග්‍රාස් ප්‍රතිකාරකයේය. පරීක්ෂණය ඉදිරියටත් සිදුකරමින් පවති.

**කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය මධ්‍යස්ථානය,(2011 ඔක්තෝබර්)**
2013 ඔක්තෝබර් මසදි ඉහත සඳහන් තෘණ වර්ග 4 මගින් පාංශු පුනරුත්ථාපන කල සහ "පාංශු පුනරුත්ථාපන නොකල" භූමිය තුල, TRI 4049 තේ ප්‍රභේදය වගා කරන ලදි. වගා කිරිමෙන් පසුව තේ පැළ වල වර්ධන ලක්ෂණ ඇගයිම සිදු කරන ලදි.

තේ පැළ සිටුවා මාස 10 (2010) කින් පසුව පළමු මට්ටම් කැපීම සිදු කරන ලද අතර මට්ටම් කැපිමේදි ඉවත් කළ අතු කැබලිවල තෙත් සහ වියළි බර සටහන් කර ගන්නා ලදි. දෙවන මට්ටම් කැපීම පැල සිටුවා අවුරුදු 1 1/2 කින් පසුව 2015 වසර තුලදි සිදුකරන ලදි. ප්‍රතිකාරක වල තෙත් බර සහ වියළි බර අතර කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුනි. ප්‍රතිකාරක වල පැළයක තෙත් බර සහ වියළි බර පිලිවෙලින් ග්රෑම් 256.51 සහ 94.09, 210.22 සහ 74.72, 304.65 සහ 111.04, 227.84 සහ 77.05 සහ 77.79 සහ 29.79 ලෙස සටහන් විය.

තුන්වන මට්ටම් කැපීම දෙවන මට්ටම් කැපීමෙන් මාස 6 කට පසුව (2015) දී සිදුකරන ලදී, ප්‍රතිකාරක වල තෙත් බර සහ වියළි බර අතර කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුනි. එනම් ග්රෑම් 518.61 සහ 193, 405.46 සහ 144.66, 483.01 සහ 173.74, 397.63 සහ 136.26 සහ ග්රෑම් 101.05 සහ 38.52 වේග පරීක්ෂණය ඉදිරියටත් සිදුකරමින් පවති.

**තෘණ සහ රනිල ශාක විශේෂ සිටුවා පරණ තේ වගාවේ පස පුනරුත්තාපනය කර නැවත වගාවේ පාංශු පූනරුත්ථාපන කාල සිමාව අඩුකිරිම**

පස පුනරුත්ථාපනය කිරිම සදහා පරණ තේ ඉවත් නොකර එහි ඇති තේ පදුරු අතර ඇති ඉඩ කොටසේ ග්ලිරිසිඩියා ශාක සහ ෆ්ලේමින්ජියා ශාක සිටුවා මෙම අත්හදා බැලීම ගම්පොල නිව් පීකොක් වත්තෙහි 2011 වසරේදී අරමභ කරන ලදි. ප්‍රතිකාරක ලෙස T1- පස පුනරුත්ථාපනය සදහා පරණ තේ ඉවත් නොකර එහි ඇති තේ පදුරු අතර ග්ලිරිසිඩියා ශාක සහ මානා තෘණ සිටුවිම. (තේ නැවත සිටුවිම 2013) T2-පස පුනරුත්ථාපනය කිරිම සදහා පරණ තේ ඉවත් නොකර එහි ඇති තේ පදුරු අතර ෆ්ලේමින්ජියා ශාක සහ මානා තෘණ ශාක සිටුවිම ( තේ නැවත සිටුවිම 2013) T3- පරණ තේ පදුරු අතර නිර්දේශිත පරතරයන් යටතේ ඇති ග්ලිරිසිඩියා ශාක නඩත්තු කිරිම (වසර 2 ක් අවසානයේ නැවත පැල සිටුවිම T4- පාලක ප්‍රතිකාරකය ලෙස තේ පරියේෂණායතනයේ නිර්දේශිත පාංශු පුනරුත්ථාපනය ක්‍රමවේදයන් අනුගමනය කිරිම (තේ නැවත සිටුවිම 2013) T5-පස පුනරුත්ථාපනය කිරිමකින් තොරව පැල සිටුවිම (තේ පැල සිටුවිම 2011) යොදා ගන්න ලදි.

ෆ්ලේමින්ජියා සහ ග්ලිරිසිඩියා ශාක කප්පාදු කර වසුනක් ලෙස සහ කොළ පොහොරක් ලෙස පසේ ගුණාත්මක බව වැඩි දියුණු කිරිම සදහා යෙදිම සිදුකරයි. ක්‍ෂෙත්‍රයට කැපූ මානා තෘණ ශාක වසුන් ලෙස දිගින් දිගටම යෙදිමෙන් එය වල් මර්ධන ක්‍රමයක් සහ පොහොරක් ලෙස ක්‍රියාකරයි.

ග්ලිරිසිඩියා කප්පාදු අතු හෙක්ටයාරයට ටොන් 10.34, 4.56 , 4.78, 7.57 සහ 6.03 ලෙස පිලිවෙලින් යොදා ඇති අතර තේ අස්වැන්න හෙක්ටයාරයට නිෂ්පාදිත තේ කිලෝ ග්‍රැම් (T1) 918, (T2) 882, (T3) 939, (T4) 682 සහ (T5) 1034 ලෙස සටහන් විය. තේ අස්වැන්න සැලකීමේදී ප්‍රතිකාරක අතර විශේෂිත වෙනසක් දක්නට නොමැත.

ජලය රදවා ගැනිමේ ධාරිතාවය දෘශ්‍ය ඝනත්වය සහ පාංශු කාබන් ප්‍රතිශතය වැනි පාංශු පරාමිතීන් සැලකීමේදී ප්‍රතිකාරක අතර විශේෂිත වෙනසක් දක්නට නොමැත. නමුත් T3 ප්‍රතිකාරකයේ (පස පුනරුත්ථාපනය කිරිමකින් තොරව පැල සිටුවිම) පාංශු ක්‍ෂුද්‍රජිවි ගහණයේ කාබන් ප්‍රතිශතය පහල අගයක් පෙන්විය.

**පාංශු තත්ත්ව දර්ශකය වලංගු කිරීම**

පාංශු තත්ත්ව දර්ශක (Soil Quality Index-SQI) අගයන් පුනරුත්ථාපනය කල ක්ෂේත්‍රයේ හා යාබද පවතින පැරණි බීජ පැළ හෝ රිකිලි තේ ක්ෂේත්‍රයේ සසඳා, බලන ලදී. සියළු සාම්පල හම්බන්තොට දිස්ත්‍රික්කයේ වරාපිටිය දී ඇති ස්ථානය හැර, කලාපීය තේ වතු වලින් එකතු කර ඇති මෙම පාංශු තත්ත්ව දර්ශක අගය, පාංශු නිකර ඝනත්වය (BD- g/cm3) ප්‍රයෝජ්‍ය ජල ප්‍රමාණය AWC (මිමී / 10cm), කාබන් (%), ක්ෂුද්‍ර ජීවී ජෛව ස්කන්ධ අන්තර්ගතය (ග්‍රෑම් පස), පරපෝෂිත නෙමටෝඩා (කිසිදු/ග්‍රෑම් 100 පස) සහ නිදහස් ජීවන ගණනය කිරීම සඳහා නෙමටෝඩා (කිසිදු / ග්‍රෑම් 100) තක්සේරු කරන ලදී. පහත වගුව අනුව එක් එක් පරාමිතිය සඳහා ලකුණු හා අගය ලබා දෙන ලදී

| නිකර ඝණත්වය (g/cm$^3$) | | ප්‍රයෝජිත ජල ප්‍රමාණය | | කාබන් (%) | | ක්ෂුද්‍ර ජිවී ජෛව ස්කන්ධ අන්තර්ගතය | | ආසාදිත වටපණුවන් | | නිදහස්ව වසන වටපණුවන් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අගය | ලකුණු | අගය | ලකුණු | අගය | ලකුණු | අගය | ලකුණු | අගය | ලකුණු | අගය | ලකුණු |
| 1.0 - 0.7 | **10** | 60 - 70 | **9 to 10** | >5 | **10** | 300-400 | **10** | 0 | **10** | >40 | **10** |
| 1.2 -1.0 | **9 to 10** | 50 - 60 | **8 to 9** | 4 - 5 | **10 to 8** | 250-300 | **8 to 10** | 0 – 2 | **5** | 32 - 40 | **8.0-9.0** |
| 1.3-1.2 | **7 to 9** | 40- 50 | **7 to 8** | 3 - 4 | **6 to 8** | 200-250 | **7 to 8** | 2 – 4 | **4** | 24 - 32 | **6.0-8.0** |
| 1.4-1.3 | **5 to 7** | 30 - 40 | **6 to7** | 2 - 3 | **4 to 6** | 150-200 | **5 to 7** | 4 – 6 | **3** | 16 - 24 | **4.0-6.0** |
| 1.5-1.4 | **3 to 5** | 20- 30 | **3 to 6** | 1 - 2 | **2 to 4** | 100-150 | **3 to 5** | 6 – 8 | **2** | 8 - 16 | **2.0-4.0** |
| 1.6 - 1.5 | **1 to 3** | 10-20 | **1 to 3** | 0.6 -1 | **0 -2** | 50-100 | **1 to 3** | 8 - 10 | **1** | 1 - 8 | **0.0-2.0** |
| >1.6 | **0** | <10 | **0** | <0.6 | **0** | <50 | **0** | >10 | **0** | 0 | **0** |

ලබා දී ලකුණු වටිනාකම මත පදනම් වූ" SQI අගය එහිදී BD- සනත්වය, AWC - ලබා ගත හැකි ජල ප්‍රමාණය, C - කාබනික කාබන් %, MBC- ක්ෂුද්‍ර ජීවී ජෛව ස්කන්ධ අන්තර්ගතය, PN = පරපෝෂිත නෙමටෝඩාවන් සහ FLN - නිදහස්ව ජීවත්වන නෙමටෝඩාවන් පහත දැක්වෙන සූත්‍රය මත පදනම් කරගෙන ගණනය කරන ලදී.

**SQI=BD*0.2+AWC*0.1+ C%*0.3+MBC*0.1 +PN*0.1+FLN*0.2**

තෘණ ක්ෂේත්‍රය සඳහා ගණනය කරන ලද පාංශු තත්ත්ව දර්ශක අගය 6.1(±0.19) ක් වූ අතර, බීජ පැළ / රිකිලි තේ සඳහා, එය 5.3 (±0.18) විය. මෙමගින් ගුණාත්මකව පුනරුත්ථාපනය කල පස හා තේ ක්ෂේත්‍රවල පසෙහි වෙනස ගැන පැහැදිලි සංඥාවක් පෙන්වයි කෙසේ වෙතත් SQI වටිනාකම් උන්නතාංශය මට්ටම අනුව වර්ගීකරණය කරන ලද විට, රට මැද වටිනාකම් පමණක් සැලකිය යුතු වෙනසක්, පහත සඳහන් වගුවේ ඇති පරිදි පෙන්වන ලදී

| උච්චත්වය | ක්ෂේත්‍රය තෘණ | පාංශු තත්ත්ව අගය | Significance |
|---|---|---|---|
| (n = 9) | පැරණි බීජ / රිකිලි | 6.42(±1.08) | P = 0.171 |
| | තෘණ | 5.78(±0.80) | |
| (n=9) | පැරණි බීජ / රිකිලි | 5.40(±0.79) | P = 0.215 |
| | තෘණ | 4.88(±0.92) | |
| (n=6) | පැරණි බීජ / රිකිලි | 6.06(±1.00) | P = 0.010 |
| | තෘණ | 4.60(±0.53) | |
| (n=5) | පැරණි බීජ / රිකිලි | 6.842(±0.78) | P = 0.212 |
| | | 6.06(±1.02) | |

**පහතරට තේ සඳහා ජල බිංදු හා විසුරුම් ජල සම්පාදන පද්ධති ඇගයීමට ලක් කිරීම සහ නියඟය ඇතිවන ප්‍රදේශවල තේ සඳහා ජල කළමනාකරණ තාක්ෂණ සංවර්ධනය**

තේ වර්ධනය මත ජල බිංදු හා විසුරුම් ජල සම්පාදනය මගින් සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයන් දෙකක් ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර හි සිදු කෙරේ මේ සඳහා TRI 4061 හා TRI 2021 ප්‍රභේදවල රිකිලි, 2013 ජුනි මාසයේ දී ජල බිංදු සහිතව සහ රහිතව රෝපණය කරන ලදී (මුලදී, TRI 2023 සිටුවන ලද නමුත්, බොහෝ ශාක අනවසරයෙන් ඉවත්කර තිබිම නිසා, එය TRI 2021 සමඟ ආදේශ කිරීමට සිදු විය දෙවැනි පරීක්ෂණය ලෙස TRI 2023, TRI 2027 සහ TRI 4004 පැල සඳහා විසිරි ජල සම්පාදනය පද්ධතියේ බලපෑම අධ්‍යයනය කරන ලදී කෙසේ වෙතත් 2015 වසර තුලදී දැඩි නියගයක බලපෑමක් ක්ෂේත්‍රය තුල ඇති නොවිය TRI 2023 සහ TRI 2027 ඉහළ ප්‍රතිචාර පෙන්වන ලදී

**වැසි ජලය රැස් කිරීමේ සුදුසු ක්‍රම, රදවා ගැනීම හා වියලි කාලය තුළ දී තේ සඳහා වැසි ජලය භාවිත කාර්යක්ෂමතාව ඇගයීම**

විවිධ වසුන් භාවිතයෙන් පාංශු ජලය සංරක්ෂණය කර තබා ගැනීමේ පර්යේෂණයන්, හපුතලේ කහගල්ල සහ රත්නපුර ශාන්ත ජෝකිම් වතුවලදී සිදු කරන ලදී මෙහිදී රසායනික වල් නාශක මත ඇතිකරන ලද තහනම හේතුවෙන්, වසුන් යොදා ගැනීම මගින් වල් මර්දනය කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයන්ද සිදු කරන ලදී

රත්නපුර සිදු කරන ලද බඳුන් පරීක්ෂණයකදී, රිදී / කළු කෘෂිකාර්මික වසුන් සහ කළු පොලිතින් භාවිතය පසේ වාෂ්පීකරණය පාලනය සඳහා ඵලදායී වී ඇති බව පෙන්වා දුන්නේය

| ප්‍රතිකර්මය | මධ්‍යස්ථාන ජල හානිය (මි . මි / දිනකට ) |
|---|---|
| රිදී / කළු කෘෂිකාර්මික වසුන් - T 1 | 0.194[a] |
| කොම්පෝසුට් - T 2 | 0.545[b] |
| කළු පොලිතීන් - T 3 | 0.238[a] |
| මානා *(Cymbopogon cofertiflorus )* - T 4 | 0.522[b] |
| පාලිතය - T 5 | 0.620[b] |

කහගල්ල වත්ත පරීක්ෂණයේදී දලු නෙලීම 2015 ජුනි මාසයේදී ආරම්භ කරන ලද අතර, කෘතිම කෘෂිකාර්මික වසුන යොදන ලද ප්‍රතිකර්මය තුල 3% පමණ අස්වැන්න ඉහල යාමක් දක්නට හැකිවිය

පර්යේෂණ ක්ෂේත්‍ර දෙකෙහිම, කළු / රිදී කෘෂිකාර්මික, වසුන් සහ කළු පොලිතීන්, වසුන් ක්ෂේත්‍රයේ වල් ඝනත්වය සහ වල ශාක ජෛව ස්කන්ධ පාලනය සඳහා ඵලදායී වී ඇත.

කහගල්ල වත්ත, හපුතලේ

| ප්‍රතිකර්මය | වල් ශාක ස්කන්ධය Kg/ $m^2$ | වල් ශාක ප්‍රමාණය No/$m^2$ |
|---|---|---|
| රිදී / කළු කෘෂිකාර්මික වසුන් - T 1 | $0.232^c$ | $76^c$ |
| පාලිතය - T 2 | $0.645^a$ | $568^a$ |
| කළු පොලිතීන් - T 3 | $0.183^c$ | $81^c$ |
| මානා - T 4 | $0.365^b$ | $267^b$ |

ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර

| ප්‍රතිකර්මය | වල් ශාක ස්කන්ධය no / $m^2$ | වල් ශාක ප්‍රමාණය kg / $m^2$ |
|---|---|---|
| රිදී / කළු කෘෂිකාර්මික වසුන් - T 1 | $92^c$ | $0.286^c$ |
| කොම්පෝස්ට් - T 2 | $1173^a$ | $1.925^a$ |
| කළු පොලිතීන් - T 3 | $102^c$ | $0.313^c$ |
| මානා - T 4 | $517^b$ | $1.059^b$ |
| පාලිතය - T 2 | $732^b$ | $1.489^{ab}$ |

**නව සෙවන ශාක විශේෂයන්හි වර්ධන හැකියාවන් ඇගයීම**

**a). උස් සෙවන සහ මධ්‍යම සෙවනඃ මිල්ලකන්ද වතුයාය, ඇගල් ඔය, බුලත්සිංහල**

ක්ෂේත්‍ර පර්යේෂණයන්හි පහත දැක්වෙන පරිදි උස් සහ මධ්‍යම සෙවන ශාක සිටුවා ඇත.

**T1:** *Derris microphylla (20'x20') + Gliricidia (10'X10')*
**T2:** *Albizzia molluccana (20'x20') + Gliricidia (10'X10')*

සෙවන ශාකවල වර්ධන ප්‍රතිචාර අධ්‍යයනය කිරීම ආරම්භ කරන ලදී. මානා තෘණ වල ආක්‍රමණශීලී වර්ධනය නිසා උස් සෙවන ශාකවල වර්ධනය දුර්වල විය.

**b) මධ්‍යම සෙවන සහ මධ්‍යම සෙවනඃ මිල්ලකන්ද වතුයාය, ඇගල් ඔය, බුලත්සිංහල**
පවතින ක්ෂේත්‍ර පර්යේෂණයන්හි පහත දැක්වෙන මධ්‍යම සෙවන ශාක ඇත.

**T1:** *Tecoma stans (10'X10')*
**T2:** *Gliricidia (10'X10')*

මානා තෘණ වල ආක්‍රමණශීලී වර්ධනය නිසා සෙවන ශාකවලට තරගයකට මුහුණ දීමට සිදුවිය. තවද ඉතා පහළින් අතු බෙදෙන සහ අතු එල්ලා වැටෙන ස්වභාවයක් ඇති ඕජදප් ශාකය ක්ෂේත්‍රයේ ස්ථාපනය වීම දුර්වල බව නිරීක්ෂණය කරන ලදී.

**c) උස් සෙවන සහ මධ්‍යම සෙවනඃ හවුපේ වතුයාය කහවත්ත**
පවතින ක්ෂේත්‍ර පර්යේෂණයන්හි පහත දැක්වෙන උස් සහ මධ්‍යම සෙවන ශාක සිටුවා ඇත.

| | |
|---|---|
| **T1** | *Derris microphylla (20'x20') + Gliricidia (10'x10')* |
| **T2** | *Derris microphylla (30'x30') + Gliricidia (10'x10')* |
| **T3** | *Derris microphylla (20'x30') + Gliricidia (10'x10')* |
| **T4** | *Cassia nodosa (20'x30') + Gliricidia (10'x10')* |
| **T5** | *Cassia nodosa (30'x30') + Gliricidia (10'x10')* |
| **T6** | *Cassia nodosa (20'x30') + Gliricidia (10'x10')* |
| **T7** | *Albizzia molluccana (20'x30') + Gliricidia (10'x10')* |

සෙවන ශාකවල වර්ධන ප්‍රතිචාර අධ්‍යයනය කිරීම 2015 මැයි මස සිට ආරම්භ කරන ලදී. *Albizia molluccana* ශාකය අනෙකුත් උස් සෙවන ශාකවලට සාපේක්ෂව වැඩි වර්ධන සීඝ්‍රතාවයක් පෙන්වනලදී. පාංශු පෝෂක ප්‍රමාණය, කාබන් ප්‍රමාණය සහ pH මැනීම සඳහා පස් නියැදි ලබා ගැනීමද ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

**D)උස් සෙවන සහ මධ්‍යම සෙවනඃ තල්ගස්වල වතුයාය, තල්ගස්වල**
පවතින ක්ෂේත්‍ර පර්යේෂණයන්හි පහත දැක්වෙන උස් සහ මධ්‍යම සෙවන ශාක සිටුවා ඇත.

| | |
|---|---|
| **T1** | *Derris spp. (20'x20') + Gliricidia (10'X10')* |
| **T2** | *Cassia siamea (20'x20') + Gliricidia (10'X10')* |
| **T3** | *Albizzia molluccana ( 20'x20') + Gliricidia (10'X10')* |

සෙවන ශාකවල සහ තේ ශාකයේ වර්ධක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම 2015 ජූලි මස සිට ආරම්භ කරන ලදී. *Albizia molluccana* සහ *Cassia siamea* ශාක, *Derris* සෙවන ශාකයට සාපේක්ෂව වැඩි වර්ධන සීඝ්‍රතාවයක් පෙන්වනලදී. පාංශු පෝෂක ප්‍රමාණය, කාබන් ප්‍රමාණය සහ **pH** මැනීම සඳහා පස් නියැදි ලබා ගැනීමද ආරම්භ කරන ලදී.

මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

**රිකිලි බද්ධ තාක්‍ෂණය මගින් තේ ශාඛයේ පලදායිතාවය සහ නිමි තේ වල තත්වය වැඩි කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම**
තේ ශාඛයේ වැඩි අස්වැන්න, නිමි තේ වල උසස් තත්වය, දියුණු මූල පද්ධතිය සහ නියගයට හා රෝග පලිබෝධ වලට ඔරොත්තු දීම යන ධනාත්මක ලක්ෂණ සහිත ප්‍රභේද බද්ධ සංයෝජනය මගින් ලබා ගැනීම සඳහා පර්යේෂණයන් සිදුකරන ලදි..

**i) ඉහල අස්වැන්න සහ පලිබෝධ වලට ඔරොත්තු දීමේ හැකියාව ඇති පැළ ලබාගැනීම සඳහා වන බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.**
අනුජයේ ලක්ෂණ වනුයේ බුබුලු අංගමාරයට සහ කඳ විදින ගුල්ලාගේ හානියට ඔරොත්තු දෙන සහ වැඩි අස්වැන්නක් ලබා දීමයිග ග්‍රාහකයේ ලක්ෂණ ලෙස තෝරාගනු ලැබූයේ හොඳ මුල් පද්ධතියක් පැවතීම සහ නියගයට ඔරොත්තු දීමයි. දෙවන කප්පදු චක්‍රයේ පවතින පර්යේෂණය ශාන්ත කුම්බ්ස් වත්තේ පවත්වා ගෙන යනු ලබයි.

TRI 4046/TRI 4006, TRI 3072/TRI 4053 සහ TRI 4006/TRI 3072 යන බද්ධ සංයෝජනයන් මෙම වසරේදී (මාර්තු සිට දෙසැම්බර් දක්වා) වැඩි අස්වැන්නක් ලබාදී ඇත. බුබුලු අංගමාරය සඳහා සිදු කරන ලද විශ්ලේශණයේදී, එම රෝගය සඳහා ඔරොත්තු දෙන බද්ධ සංයෝජනයන් එම ගුණය තවදුරටත් පෙන්වා ඇත. පර්යේෂණය තවදුරටත් පවත්වා ගෙන යනු ලැබේ.

### ii) බලන්ගොඩ ප්‍රදේශය සඳහා ඉහල අස්වැන්නක් සහ නියගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.

බද්ධ පැල සඳහා TRI 4053ල TRI 4054 සහ TRI 4042 අනුජයන්ද, DG 7 සහ DG 39 ග්‍රාහකයන්ද තෝරා ගන්නා ලදී. බද්ධ පැලවල ක්ෂේත්‍ර වර්ධනය හොඳින් සිදුවී ඇති අතර අස්වැන්න වාර්තා කිරීම එන වසරේ සිට සිදුකිරීමට නියමිතය.

### iii.) පහතරට පවතින අහිතකර කාලගුණික විපර්යාසයන් සඳහා සුදුසු වන බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.

ශාන්ත ජෝකිම් වත්තේ සිටවූ බද්ධ සංයෝජනයන් ක්ෂේත්‍රයේ පළමු වසරේ වන අතර TRI 4042/TRI 4049, TRI 4042/TRI 3025, TRI 4053/TRI 4049, TRI 2023/TRI 4049 සහ TRI 4006/TRI 4049 යන බද්ධ සංයෝජනයන් ඒවායේ පාලක සමග සැසඳීමේදී පාලක වලට සමාන වර්ධනයක් පෙන්වා ඇත. පැල පළමු හා දෙවන කැපුමට භාජනය කල අතර එම ප්‍රතිඵල වලට අනුව ප්‍රතිකාරක අතර වෙනසක් දැකිය නොහැක. පර්යේෂණය ඉදිරියටත් පවත්වා ගෙන යනු ලැබේ.

### iv.) තවානේදී මුල් වර්ධනය අඩු හෝ පමාවී මුල් වර්ධනය වන තේ ප්‍රභේද වල එම අහිතකර ලක්‍ෂණය මග හැරවීම සඳහා රිකිලි බද්ධ තාක්‍ෂණය යොදා ගැනිම

පර්යේෂණය සඳහා 5000 කාණ්ඩයේ වර්ග කිහිපයක් යොදා ගත් අතර ඒවා ක්ෂේත්‍රයේදී වැඩි අස්වැන්නක් දෙන නමුදු තවානේදී මුල් හට ගැනීම අඩු හෝ පමා වීම යන අහිතකර ලක්ෂණය පෙන්වයි. සාර්ථක ප්‍රභේද ලෙස නිකුත් කිරීමට පෙර මෙම වර්ගවල පවතින අහිතකර ලක්ෂණය ජය ගැනීම සඳහා රිකිළි බද්ධ තාක්ෂණය යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. තවානේ සාර්ථකත්වය මැනීම සඳහා පරීක්ෂණ තලවකැලේ සහ රත්නපුර පර්යේෂණ මධ්‍යස්ථාන දෙකෙහි සිදු කරන ලදි.

මේ සඳහා උඩරට හා ඌව ප්‍රදේශ වෙනුවෙන් 210 සහ 89 දර්ශද පහතරට ප්‍රදේශය වෙනුවෙන් 168 සහ 84 දර්ශද අනුජය ලෙසින් හා TRI 4053, TRI 3072 හා TRI 4049 ප්‍රභේද ග්‍රාහකයන් ලෙසත් තෝරා ගනු ලැබීය. තවාන් පැලවල සාමාන්‍ය වර්ධනයට අනුව කරන ලද විශ්ලේශණයේදී බද්ධ නොකල පාලක ලෙස ගන්නා ලද (බද්ධ නොකල) දර්ශයන්හි වර්ධනය ඉතා පහල මට්ටමක පැවති අතර බද්ධ පැල වල වර්ධනය ඉහල මට්ටමක පවතී. ප්‍රථිපල විශ්ලේශණය තවදුරටත් සිදුකිරීමට නියමිතය.

### කදපොල කොන්කෝඩියා වතුයායේ තේ මුල් පද්ධතියේ හැසිරීම පිළිබඳව ඇගැයීම

තේ කප්පාදු අතු වලදැමීම, තේ ශාකවල මුල පද්ධතියේ කායික විද්‍යාව කෙරෙහි දක්වන බලපෑම ඇගැයීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙහිදී වතු වගා ප්‍රභේද තුනක් (PK2, DT1, NAY3) සහ තේ පර්යේෂණායතන ප්‍රභේද දෙකක් (TRI 2024, TRI 2025) සහිතව ක්ෂෙත්‍ර පර්යේෂණය සිදුකරනු ලැබීය.

තේ අස්වැන්න වාර්තා ගත කරන ලදී. වසර 2015 ඔක්තෝබර් මස මෙම පර්යේෂණ භූමිය කප්පාදු කරන ලදී. කප්පාදු අතු වැළලු පාත්තිවල තේ අස්වැන්න සැළකියයුතු ප්‍රමාණයකින් වැඩිබව නිරීක්ෂණය කරන ලදී. මෙමගින් කප්පාදු අතු වැළලීම නිසා පසෙහි සරු බව වැඩිවන බව තහවරු කරනු ලබයි.

තවද කප්පාදු අතු වැළලීම නිසා ලැබෙන වාසි වගා ප්‍රභේද අතර සැළකියයුතු ලෙස වෙනස් වන බව සොයා ගනුලැබීය. කප්පාදු අතු ප්‍රමාණය වතු ප්‍රභේදවල වැඩි බව දක්නට ලැබුණි. එවගේම වතු ප්‍රභේදවලින් වැඩි අස්වැන්නක් ලබාගැනීමට හැකිවිය. මෙම සොයා ගැනීම්වලින් අනතුරුව මෙම පර්යේෂණය අවසන් කරන ලදී.

## විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස දූව ඉන්ධන භාවිතය අධ්‍යයනය

### විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස කැසියා ශාකය සහ කැලියැන්ඩ්‍රා ශාකය අධ්‍යයනය - පස්සර යූරි වතුයාය (2009) සහ තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයාය (2010)

මෙහිදී අදාල ශාක මීටර 1×1, මීටර 1×2 සහ මීටර 2×2 යන පරතර වලින් සිටුවන ලදී.

යූරි වතුයාෙය් මීටර 1×1, මීටර 1×2 සහ මීටර 2×2 යන පරතර වලින් සිටවූ ග්ලිරිසීඩියා ශාක ලබාදුන් දූවදර වල වියලි බර ප්‍රමාණය (හෙක්ටාරයට ටොන්) 22.3, 15.7 සහ 6.6 ලෙස සටහන්විය. එමෙන්ම මීටර 1×2 සහ මීටර 2×2 යන පරතර වලින්ලබාදුන් කප්පාදු අතුවල මුලු බර, දූව කොටස්වල බර සහ ලපටි කොටස් වල බර පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 13.8, 9.9 සහ 4.0 සහ 11.3, 8.8, සහ 2.4 ක් ලෙසත් සටහන්විය.

යූරි වතුයාෙය් කැසියා ශාක දූව ලබාගතහැකි මට්ටමට වර්ධණය වී නොතිබිණ.
ශාන්ත කූම්බ්ස් වතුයාෙයන් ලද ප්‍රතිඵල ඉහත ඒවාටම සමානවූ අතර, ග්ලිරිසීඩියා සහ කැලියැන්ඩ්‍රා යන ශාක වර්ග මීටර 1×1 පරතරයට සිටුවීම වඩා සුදුසු බව තීරණය කරන ලදී. ශාන්ත කූම්බ්ස් වතුයාෙය් ආරම්භ කරන ලද පර්යේෂණය 2016 වර්ෂයේ අවසාන වීමට නියමිතය.

### කාබනික තේ වගාවේ වර්ධනය, අස්වැන්න, රෝග හා පළිබෝධ කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය

ස්වාභාවික හා ජෛව විද්‍යාත්මක ක්‍රියා තුළින් කාබනික තේ වගාවේ රෝග, පළිබෝධ හා වල් පැළෑටි පාලනය හා පාංශු සහ භෝග ඵලදායිතාවය පවත්වා ගැනීම යනාදියෙහි විද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කිරීම තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ ස්ථාපනය කරන ලද දිගු කාලීන පර්යේෂණ භූමින් වන "TRIORCON" සහ "BIDORCON" පර්යේෂණයන්හි දී සිදු කෙරිණි.

පසේ නීරෝගී බව පිළිබිඹු කරන සාධක ලෙස ගැඩවිලි පණුවන්ගේ ජෛව ස්කන්ධය හා පාංශු ශ්වසනය යනාදිය අධ්‍යයනය කෙරිණි පසේ ගැඹුර සෙන්ටිමීටර 0-15 හා 15-30 හිදී ගැඩවිලි පණුවන්ගේ ජෛව ස්කන්ධය කාබනික හා ජෛවගතික තේ වගා පද්ධතීන් තුළ රසායනික යෙදූ පද්ධතීන්ට වඩා ඉහළ බව දක්නට ලැබිණි එමෙන් ම කාබනික හා ජෛවගතික (bio-dynamic) තේ වගා පද්ධතීන් තුළ පාංශු ශ්වසනය ද සාපේක්ෂව ඉහළ බව පෙන්වා දෙන ලදී.

ජෛව කොම්පොස්ට්, කොළ පොහොර, දියර පොහොර හා කාබනික හා ගැඩවිලි පණු තාක්ෂණය යනාදී පාංශු පෝෂක කළමනාකරණ ක්‍රමවේද තුළින් කාබනික හා ජෛවගතික තේ වගා පද්ධතීන් තුළ තිරසාරත්වය තහවුරු කර ඇති පාංශු පෝෂක පිළිබඳ අධ්‍යයනයේ දී පසේ නයිට්‍රජන්, පොටෑසියම් හා පොස්පරස් සංයුතිය තේ පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත ප්‍රමාණවලින් යුක්ත බව පෙන්වන ලදී එමෙන් ම පසේ මැග්නීසියම් ප්‍රමාණය ද සියලුම පද්ධතීන් තුළ ප්‍රශස්ථ අගයන්ගෙන් යුක්ත විය යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය තුළින් පාංශු පෝෂක කළමනාකරණයේ වැදගත්කම මෙහි දී පෙන්වා දෙන ලදී.

**කාබනික හා අකාබනික ලෙස තේ වගා කරන ලද තේ ඉඩම්වල පසේ ජීව විද්‍යාත්මක හා භෞතික සාධක පිළිබඳ අධ්‍යනය ගාල්ල, බද්දේගම ප්‍රදේශයේ කරන ලද සිද්ධි අධ්‍යයනය**

බද්දේගම ප්‍රදේශයේ වසර 05 කට වැඩි කාලයක සිට කාබනික ලෙස තේ වගාව පවත්වාගෙන යන කුඩා තේ වතු ඉඩම් කිහිපයක පර්යේෂණ දත්ත රැස් කෙරිණි. මෙම අධ්‍යනයේ අභිමාර්ථය වූයේ, රසායනික පොහොර යෙදූ ක්ෂේත්‍ර / පද්ධතිවලට සාපේක්ෂව කාබනික තේ ඉඩම්වල පසේ රසායනික හා ජෛව විද්‍යාත්මක නිර්ණායකයන් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙහිදී කාණ්ඩ දෙකකදී කුඩා තේ වතු හිමියන් 23 දෙනෙකුගේ ඉඩම්වල දත්ත අධ්‍යයනයට ලක් කෙරිණි. තවද, මේ සමඟ සමාජ හා ආර්ථික දත්ත සංසන්දනය කිරීම සඳහා සමීක්ෂණයක් ද සිදු කරන ලදී.

මෙහිදී ලද ප්‍රතිඵලවලට අනුව, රසායනික පොහොර යෙදූ පද්ධතීන්ට සාපේක්ෂව කාබනික වගා පද්ධතීන් තුළ ජීව විද්‍යාත්මක පරාමිතීන් සැලකිය යුතු තරම් ඉහළ අගයක පවත්නා බව දක්නට ලැබුණි. පසේ සෙන්ටිමීටර 0 සිට 15 දක්වා ගැඹුරෙහි සිටින ගැඩවිලි පණුවන් සංඛ්‍යාව, පාංශු ශ්වසනය, පසේ සිටින ක්ෂුද්‍ර සන්ධිපාදකයන් සංඛ්‍යාව හා පසේ හානිකර නොවන වටපණුවන්ගේ ගහණය යන පරාමිතීන් සැළකූ විට කාබනික තේ වගා පද්ධතීන් ඉදිරියෙන් සිටී. විශේෂයෙන්ම, රසායනික ද්‍රව්‍ය යෙදූ පද්ධතීන් හා සසඳන කළ ජීව විද්‍යාත්මක පරාමිතීන් අතින් කාබනික පද්ධතීන් ස්වාභාවික වනාන්තර වලට ඉතා සමාන අගයන් පෙන්නුම් කරයි.

පාංශු ච්‍ය අගය කාබනික හා රසායනික පද්ධතීන් දෙකෙහිම ප්‍රශස්ථ පරාසයේ (4.5-5.5) පැවතුණි. කාබනික හා රසායනික පද්ධතීන් වල පාංශු pH අගයන් පිළිවෙලින් 4.78 හා 4.65 විය කාබනික පද්ධතීන් හා ස්වාභාවික වනාන්තරවල පාංශු කාබනික කාබන් ප්‍රතිශතයන් පිළිවෙලින් 2.37% හා 2.66% විය රසායනික ද්‍රව්‍ය යෙදූ පද්ධතීන්ගේ එම ප්‍රතිශතය 1.75% විය. පසේ මුළු නයිට්‍රජන් ප්‍රමාණය කාබනික හා රසායනික පද්ධතීන් වල 0.2% හා 0.08 විය එමෙන් ම කාබන් නයිට්‍රජන් අනුපාතය පිළිවෙලින් 11.85 හා 19 විය. කාබනික වගා පද්ධතීන් වල පසේ ඉහළ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය මේ සඳහා දායක වී ඇත.

කාබනික හා රසායනික පද්ධතීන්වල අස්වැන්න පිළිවෙලින් හෙක්ටයාරයකට සතියකට අමු දළු කිලෝග්‍රෑම් 136 හා 149 විය සමාජ ආර්ථිකමය පරාමිතික පිළිබඳ සමීක්ෂණයට අනුව කාබනික වගාකරුවන් ඉතා සතුටුදායක මට්ටමක සිටී.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වලට අනුව කාබනික තේවගා පද්ධතියක තිරසාරත්වය පිළිබිඹු කරන නිර්ණායක ලෙස ජීව විද්‍යාත්මක, රසායනික හා සමාජ ආර්ථිකමය පරාමිතීන් සැළකිය හැකිය. එමෙන්ම, තිරසාර ඵලදායීතාවය, පරිසර සංරක්ෂණය හා සමාජ ආර්ථිකමය ප්‍රතිලාභ යනාදිය තුළින් වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට කෙරෙහි කාබනික තේ වගාවේ දායකත්වය මෙයින් මනාව පිළිබිඹු කරයි.

**ඒකාබද්ධ පළිබෝධ පාලනය සඳහා ආරක්ෂිත පළිබෝධනාශක හඳුනාගැනීම**

**ටී ටෝට්‍රික්ස් පාලනය කිරීම සඳහා කෘමිනාශක හඳුනාගැනීම**

ටී ටෝට්‍රික්ස් දළඹුවා පාලනයට කෘමිනාශකයක් වන එමමෙක්ටින් බෙන්සොඒට් (Emamectin benzoate 5% SG) විද්‍යාගාරය තුළ පරීක්ෂා කරන ලදී. එහිදී මෙම කෘමිනාශක සාර්ථක ප්‍රතිඵල ලබාදුන් බැවින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සඳහා යොදාගැනීමට බලාපොරොත්තුවේ.

ඒකාබද්ධ පළිබෝධ පාලනයේ එක් ක්‍රමවේදයක් වන ජෛව විද්‍යාත්මක පාලනය සඳහා ටී ටෝට්‍රික්ස් දළඹුවාගේ පරපෝෂිතයෙක් වන මැක්රොසෙන්ට්‍රස් හොමොනේ ( *Macrocentrus homonae* ) විද්‍යාගාරය තුළ ජනිත කර උඩරට ප්‍රදේශවලට මුදා හැරීම තවදුරටත් සිදු කරන ලදී.

**ෆිප්රොනිල් (*Fipronil*) කෘමිනාශකයේ අවශේෂ විශ්ලේෂණය කිරීම**

ෆිප්රොනිල් සඳහා කරන ලද පර්යේෂණ වලදී එය කඳ විදින ගුල්ලා පාලනය කිරීම සඳහා සාර්ථක ප්‍රතිඵල ලබා දුන් නමුත්, අධික අවශේෂ ප්‍රමාණය නිසා ප්‍රශ්න පැන නැගුණි. මේ නිසා අවශේෂ ප්‍රමාණය අවම කිරීම සඳහා දැඩි දලු නෙලීම (black plucking) ක්‍රමයට දලු නෙලීම සිදුකර අවශේෂ විශ්ලේෂණය සිදු කරන ලදී. ජර්මනියේ විද්‍යාගාරයක අවශේෂ විශ්ලේෂණය කරන ලදී black plucking ක්‍රමයේදී ෆිප්රොනිල් යොදා දින 21 ක් අවසානයේ අවශේෂ ප්‍රමාණය 0.0125 ppm වූ අතර සාමාන්‍ය දලු නෙලන ක්‍රමයේදී 7 වන දිනයේ අවශේෂ ප්‍රමාණය 0.27 ppm බව අනාවරණය විය. යුරෝපා සංගමය සහ ජපානය පනවන ලද උපරිම අවශේෂ ප්‍රමාණයන් වන 0.005 ppm සහ 0.002 ppm වලට වඩා වැඩි අගයක් black plucking වලදී වාර්තා විය. එවගේම black plucking නිසා මුඩ්ච්චි වල වැඩිවීමක් දක්නට ලැබිණි. පර්යේෂණය සඳහා තේ ප්‍රභේද වන TRI 2025, TRI 3019 සහ TRI 2024 යොදා ගැනිණි. black plucking මගින් කෘමිනාශකයේ අවශේෂ ප්‍රමාණය ඉතා අඩු මට්ටමක ගත හැකි බව පැහැදිලි විය. එබැවින් වෙනත් පළිබෝධනාශක සඳහා ද මෙම ක්‍රමය ප්‍රයෝජනවත් විය හැකිය.

**කුඩා තේ වතු ඉඩම්වල අස්වනු අඩුවීම, තේ පඳුරු දුර්වල වීම හා මැරීයාම කෙරෙහි වටපණුවන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම**

බලංගොඩ ප්‍රදේශයේ ගුරුබැවිල, කලවාන හා එගොඩ වලේබොඩ යන ස්ථානවලත් දෙනියාය ප්‍රදේශයේත්, කුඩා තේ වතු ඉඩම්වල අස්වනු අඩුවීම, තේ පඳුරු දුර්වල වීම හා මැරීයාම තවදුරටත් වාර්තා විය. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහය ඇතිව එම ඉඩම් පර්යේෂණයට ලක් කෙරිණි. ගුරුබැවිල, කලවාන හා එගොඩ වලේබොඩ යන ප්‍රදේශවල වටපණු ආසාදනයේ ප්‍රතිශත පිළිවෙලින් 81, 91, 86 හා 40% විය විශ්ලේෂණය සඳහා සාම්පල ලබාගත් ඉඩම්වලින් 81% ක් ම වටපණු ආසාධිත වු ඒවා බවට විශ්ලේෂණ ප්‍රතිඵල වලින් සනාථ විය.

එමෙන් ම මෙම ඉඩම්වල වටපණු හානියට හේතු වි ඇති කරුණු ලෙස පාත්‍රී / ආසාධිත හෝ ප්‍රමිතියෙන් තොර තවාන් පැල භාවිතය, දුර්වල පාංශු හා භෝග කළමනාකරණය යනාදී සාධක හදුනා ගැනිණි. කෙටි කාලීන හා දිගු කාලීන පිළියම් ලෙස ප්‍රදේශයට උචිත ඒකාබද්ධ වටපණු පාලන ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් හා වගා සායන එම ප්‍රදේශ වලදී පවත්වන ලදී. දෙහෙනකන්ද (හපුගස්තැන්න), මඩලාගම (කහවත්ත) හා වතුරාව (කලවාන) යනාදී පහතරට අනෙකුත් ප්‍රදේශ වල ද පස් සාම්පල විශ්ලේෂණය කර තවදුරටත් සමීක්ෂණයට ලක් කෙරිණි.



Small holder land heavily infested by Nematodes in Balangoda

මෙම පහතරට ප්‍රදේශවල වටපණු ආසාදනයේ ප්‍රභවය පිළිබඳ ගැටළු සහගත තත්වයක් ඇති බැවින් ආසාධිත ඉඩම් අවට මෙම වටපණු විශේෂයට ධාරක වන වෙනත් ශාක විශේෂ පරීක්ෂාවට ලක් කරන ලදී. සිංහරාජ වනාන්තරයේ මායිම්වල පිහිටා ඇති පිටවතුර, වතුරාව හා කලවාන ප්‍රදේශවල ශාකවල මුල් හා පස් පරීක්ෂා කෙරිණි.

එම ශාක විශේෂ වූයේ, බට දොඹ *(Syzygium operculatum)*, ගැඩුඹ (*Trema orientalli*), දවට (*Caralia branchiate*), බදුල්ල (*Semecarpus accuminata*), නොනන් කෙන්ද, කහමඩොල්, රත් කෙළිය (*Litsea longifolia*), පේරතඹල (*Gaertnera vaginans*), ඊරිය, පත්කෙල (*Bridelia moonit*), පිනිබරු (*Doona ovalifolia*), දිමිහුප්ප (*Rivina humilis)*, දිවිකදුරු (*Pagiantha dichotoma*), ගල් වෙරලු (*Elaeocarpus montanus*), ගඳපාන (*Lantana camara*), මිල්ල (*Vitex pinnata*), බෝකර (*Ochna lanceolata*), පෙලංග (*Putranjiva zeylanica*), වනහලු (*Eurya acuminate*), බුරුල්ල (*Leea indica*), බෝඹු, කැළණි (*Tecoma stans*), නියකොළ, තෙබු (*Costus speciosus*), නුග (*Ficus bengalensis*), අංකෙන්ද (*Acronychia pedunculata*), හුනුකිරිල්ල (*Glochidion zeylanicum*), වෙරළු (*Elaeocarpus serratu*) සහ දං (*Syzygium operculatum*) යනාදියයි. පරීක්ෂාවට ලක් කළ ශාක විශේෂ කිසිවක් ප්‍රැටිලෙන්චස් ලූසයි සහ අනෙකුත් පරපෝෂී වටපණු විශේෂ වලට ධාරක ශාක නොවන බව පැහැදිලි විය. වටපණු හානියට ප්‍රතිරෝධී හා මනා ප්‍රමිතියෙන් යුත් තවාන් පැල භාවිතය, මනා පාංශු හා භෝග කළමනාකරණය යනාදියෙහි වැදගත්කම මෙහි දී පෙන්වා දෙන ලදී.

**තේ වගාව, කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කර ගැනීම**

කඳ විදින ගුල්ලාගෙන් තේ වගාව ආරක්ෂා කර ගැනීම සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම අනුගමනය කෙරේ. ෆිප්රොනිල් කෘමිනාශකයේ අධික අවශේෂ ප්‍රමාණය අඩු කර ගැනීමේ අරමුණින් එහි මාත්‍රාව අඩුකර, ගසේ රඳා පැවැත්ම වැඩි කිරීමට ක්‍රමවේදයන් අත්හදා බලමින් සිටි. අළුහුණු සහ ගෙන්දගම් මිශ්‍රණය කඳ විදින ගුල්ලා පාලනය සඳහා සාර්ථක ප්‍රතිඵල ලබාදුන් බැවින් මිශ්‍රණය නිෂ්පාදන කිරීම සුදුසු ආයතනයක් සමඟ ගිවිස ගැනීමෙන් පසු මහා පරිමාණයෙන් නිෂ්පාදනය කරනු ඇත. විද්‍යාගාරය තුළ දී කොරජන් (Clorantraniporale 200 g/ L SC) වලට කඳ විදින ගුල්ලා පාලනය කිරීමට ඇති හැකියාව විමර්ශනය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමට නියමිතය.
කඳ විදින ගුල්ලා හා සහජීවනයෙන් ජීවත් වන ඇම්බ්‍රෝසියා දිළිරය බෘනෝලියම් වලින් විනාශ කිරීමට හැකදැයි විද්‍යාගාරය තුළ දී විමර්ශනය කරන ලදී. මාත්‍රා 03 ක් මේ සඳහා යොදා ගැනිණි. දත්ත විශ්ලේෂණය කිරීමට නියමිතයි.

**පහතරට සජීවී දැව වේයාගේ ආසාදනයට කප්පාදු යන්ත්‍රවල සහ බෘනෝලියම් වල බලපෑම අධ්‍යයනය කිරීම**

තේ වගාව කප්පාදු කිරීම සඳහා යන්ත්‍ර යොදා ගැනීම පහතරට සජීවී දැව වේයාගේ ආසාදනයට බලපෑමක් අතිදැයි සෙවීමට ක්ෂේත්‍ර පරීක්ෂණයක් පහත සඳහන් අයුරින් ආරම්භ කරන ලදී.

1 සනීපාරක්ෂක කප්පාදුව - බෘනෝලියම් ආලේප කිරීම
2 යන්ත්‍ර මඟින් කප්පාදුව - බෘනෝලියම් ආලේප කිරීම
3 යන්ත්‍ර මඟින් කප්පාදුව - දිරාගිය අතු ඉවත් කිරීම - බෘනෝලියම් ආලේප කිරීම

ඊළඟ කප්පාදුවේදී නිරීක්ෂණයන් ලබා ගැනීමට නියමිතය.

**සාම්පල ලබාගැනීම, විද්‍යාගාර හා ක්ෂේත්‍ර පර්යේෂණ සමීක්ෂණ, පර්යේෂණ සැලසුම් කිරීම සඳහා ක්‍රමවේද වැඩිදියුණු කිරීම**

වටපණු හානියට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන තේ ප්‍රභේද හඳුනාගැනීම ඒකාබද්ධ වටපණු කළමනාකරණයේ වැදගත්ම අංගයකි. ප්‍රභේද හඳුනාගැනීම සඳහා දැනට දියත් කෙරෙන පර්යේෂණ දිගු කාලයක් ගත වෙන හා අපහසු ක්‍රියාවලියකි. එම නිසා පසුගිය පර්යේෂණ දත්ත සලකා බලා ඒවායින් භාවිතයට ගැනීම සඳහා ඉතාමත්ම වැදගත් හා නිවරද්‍ය පරාමිතික පිළිබඳ අධ්‍යයනයක් මෙහිදී සිදු කරන ලදී.

දන්නා ප්‍රතිරෝධී, මධ්‍යස්ථ ප්‍රතිරෝධී හා පාත්‍රී ප්‍රභේද ඇසුරින් ඒවායේ වර්ධනය පිළිබඳ පාරාමිතීන් හා වටපණු ආසාධිත මට්ටම මෙහිදී ඇගයීමට ලක් කරන ලදී. මෙහිදී CRD හා RCBD යන සංඛ්‍යාන මූලධර්ම භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කළ අතර එමඟින් ගසේ බර (අමු බර) හා මුල්වල බර (අමු බර) යනාදිය ඉතාමත්ම යෝග්‍ය පරාමිතීන් ලෙස හඳුනාගන්නා ලදී. මීට අමතරව වටපණුවන් සංඛ්‍යාව ද සැලකිල්ලට ගත හැකි බව පෙනේ.

එමෙන්ම තවාන් පැල භාවිතයෙන් කරන ලද පරීක්ෂණයට අනුව, කුඩා තවාන් පැල භාවිතයෙන් පාත්‍රී ප්‍රභේද මුල් අවස්ථාවේ හඳුනාගත හැකි බව තහවුරු විය. මෙම ප්‍රතිපල තහවුරු කරගැනීම පිණිස තවදුරටත් පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වේ.

**විද්‍යාගාරය තුළ දී කඳ විදින ගුල්ලාට ප්‍රතිරෝධී ප්‍රභේද තෝරා ගැනීම**

දැනට ක්ෂේත්‍රයේ කරගෙන යන පර්යේෂණයන්ට ආදේශනයක් වශයෙන් විද්‍යාගාරය තුළ දී ප්‍රතිරෝධී ප්‍රභේද තෝරා ගැනිම සඳහා පර්යේෂණ කරන ලදී එමඟින් ශාක කඳේ ගැට 02 ක් අතර දුර, අතු සංඛ්‍යාව සහ කප්පාදු අතුවල බර යන ලක්ෂණ ප්‍රතිරෝධී ප්‍රභේද තොරා ගැනීම සඳහා භාවිතා කලහැකි අනාවරණය විය. මෙම පරීක්ෂණයෙන් පහත සඳහන් සමීකරණ ව්‍යුත්පන්න කරන ලදී .

සෙමී 30ක් වූ කැබැල්ලක සිදුරු ගණන = (-827) + 0.1183 x කැපූ අතු සංඛ්‍යාව + 1.987 ▪ කඳේ ගැට 02 ක් අතර දුර

පහතරට සජීවි දැව වේයා සඳහා ද ප්‍රතිරෝධිතාව සොයා ගැනීම පිණිස විද්‍යාගාරය තුළ පර්යේෂණ ආරම්භ කරන ලදී .

**බුබුළු අංගමාර රෝගය පාලනයට සිලිකා යොදා ගැනීම**

TRI 2024 ප්‍රභේදයේ පත්‍ර මතට සිලිකන් ඉසීම මගින් බුබුළු අංගමාරය සඳහා සිලිකන් වල බලපෑම පරික්ෂා කරන ලදී. මෙහිදී 0.1%, 0.2%, 0.3%, 0.5% සහ 1% යන සාන්ද්‍රණ වලින් යුත් සිලිකන් පත්‍ර මතට ඉසීම සිදු කල අතර ලද ප්‍රතිඵල 0.1% කොපර් ඔක්සික්ලෝරයිඩ් ඉසින ලද තේ ක්ෂේත්‍රයක් සමඟ සංසන්දනය කරන ලදී. මීට අමතරව පාලක පරීක්ෂණයක්ද සිදු කරන ලදී. ලද ප්‍රතිඵල වලට අනුව පෙනී යන්නේ බුබුළු අංගමාර රෝගය සඳහා සිලිකන් ප්‍රතිකාරය සාර්ථකව යොදාගත හැකි බවයි.

**බුබුළු අංගමාර රෝගය සඳහා උචිත දිලීරනාශක පරික්ෂා කිරීම**

දියරමය දිලීර නාශක 2 ක් වන කොපර් ඔක්සික්ලොරයිඩ් සහ කොපර් හයිඩ්රොක්සයිඩ් මිශ්‍රණයක් සහ කොපර් සල්ෆේට් දියරමය මිශ්‍රණයක් පරික්ෂණයට යොදා ගන්නා ලදී. 0.12% සාන්ද්‍රණයකින් යුත් කොපර් ඔක්සික්ලොරයිඩ් සහ කොපර් හයිඩ්රොක්සයිඩ් මිශ්‍රණයක් සහ 0.5% සාන්ද්‍රණයකින් යුත් කොපර් සල්ෆේට් දියරමය මිශ්‍රණය දැනට නිර්දේශිත කොපර් හයිඩ්රොක්සයිඩ් දිලීර නාශකයට සමානවන ලෙසින් රෝගය පාලනය කරන බව තහවුරු විය.

**පහතරට සජීවි දැව වේයා සඳහා තේ ප්‍රභේදවල ඇති ප්‍රතිරෝධිතාවය ජෛව රසායනිකයන් භාවිෙයන් අධ්‍යයනය කිරීම**

පොතු ඉවත් කරන ලද තේ කඳන්වල පොලිෆිනෝල් කැටෙකින්, කැෆේන් ප්‍රමාණයන් විශ්ලේෂණය කිරීම ආරම්භ කරන ලදී. හානියට ඔරොත්තු දෙන ප්‍රභේද (TRI 4049, TRI 3069, TRI 2016, KP 204) තරමක් ඔරොත්තු දෙන ප්‍රභේද ( TRI 3055, TRI 4053, TRI 4061, TRI 2025, TRI 2017, TRI 4052, TRI 3053, TRI 3069) සහ පාත්‍රී ප්‍රභේද ( TRI 2023, TRI 4042, TRI 4055) යොදා ගන්නා ලදී. අධ්‍යයනයේ දත්ත ලබා ගනිමින් සිටී.

**තේ ශාකයේ කඳට ඇති වන රෝග විමර්ශනය කිරීම**

*Botryosphaeria spp* සහ *Lassiodiplodia theobromae* යන රෝග කාරකයින් ඇතිදැයි සොයා බැලීම පිණිස වැසි ජලය සහ පිළිකා රෝගය සහිත කඳ කොටස් පරික්ෂා කරන ලදී මේ සඳහා සුවිශේෂි ජෛව තාක්ෂණය *(specific primers)* යොදා ගත් අතර ප්‍රතිඵල වලට අනුව *Botryosphaeria dothide* යන රෝගකාරකයා වැසි ජලයේ සහ තේ ශාක කඳන් වල ප්‍රමුඛව සිටින බව සොයා ගන්නා ලදී. කප්පාදු කල තේ වගා ක්ෂේත්‍රයක හෙක්සාකොනසෝල් නම් දිලිර නාශකය යොදා ගනිමින් *Botryosphaeria* දිලිරය ප්‍රමාණාත්මකව තක්සේරු කරන ලදී. පරීක්ෂණ තවදුරටත් කරගෙන යනු ලැබේ.

### ***Exobasidium vexans*** **රෝගකරකයාගේ ජෛව විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය**

*Exobasidium vexan* රෝගකාරකයා සහිත තේ නියැදි 33 ක් විවිධ කළාප වලින් ලබා ගෙන අනුක විශ්ලේෂණ ක්‍රම මගින් පරික්ෂා කරන ලදී. එහිදී අනුක්‍රම නිර්ණය මගින් ලද ප්‍රතිඵල වලට අනුව එම එක් එක් කළාප වලින් ලබා ගත් රෝගාකරකයින් එකිනෙකට ඉතාමත් සමාන බව පැහැදිලි විය. එයින් පැහැදිලි වුයේ ජෛව විද්‍යාත්මකව වෙනස් කමක් නොමැති බවයි.

### **ඌව කළාපයේ සබුක්කු (ග්‍රැවිලියා රොබස්ටා) ශාකයේ පසුමැරීම අධ්‍යයනය**

ඌව කළාපයේ වතු යායවල් 14 ක සහ උඩරට ශාන්ත කුම්බිස් වතු යායේ මෙම පසුමැරීමේ තත්වය දක්නට ලැබේ. මේ සඳහා *Lasiodiplodia pseudotheobromae* සහ *Neofussicoccum parvum* යන ව්‍යාධිජනක දිලීර හේතු වේ. අනුක තාක්ෂණ ක්‍රම සහ රූප විද්‍යාත්මක ක්‍රම මගින් ව්‍යාධිජනකයා තහවුරු කර ඇත මෙම ව්‍යාධිජනකයා විවිධ දිලීර නාශක හමුවේ දක්වන සංවේදීතාව විද්‍යාගාර තත්ත්ව යටතේ හඳුනාගෙන ඇත. හෙක්සකොනසොල් නම් දිලීර නාශකය *L. theobromae* සහ *L. pseudothoeobromae* සඳහා ඵලදායි වන අතර ටෙබුකොනසෝල් දිලීර නාශකය *N. parvum* සඳහා ඵලදායි වේ.

### **ප්‍රධාන මුල් රෝග පාලනය සඳහා පසෙන් ලබා ගන්නා විරෝධක ද්‍රව්‍ය පරික්ෂා කිරීම, ඇගයීම සහ වෙළඳපල සඳහා සකස් කිරීම**

ජෛවීය පාලනය යනු රසායනික නොවන ස්වභාවික සමෝධානික පාලන ක්‍රමයකි. මේ අනුව ජෛවීය පාලන ක්‍රමය මගින් දියුණු කල *Trichoderma harzanium* ජෛව පාලක දිලිරයේ වෙළඳ සැකසුමක් විවිධ ප්‍රදේශ වලදී පරික්ෂා කරන ලදී .

### **තේ වගාවේ රෝග කාරක දිලීර හඳුනා ගැනීමට බහු කාර්යය අනුක විද්‍යා රෝග නිර්ණ කට්ටල නිපදවීම**

අනුක විද්‍යා මෙවලම් මගින් රෝග නිර්ණය කිරීම පහසු කරයි මේ සඳහා දිලීර රෝග කාරකයන් විශාල සංඛ්‍යාවකගෙන් DNA නිස්සාරණය කර ඇති අතර එම DNA යොදාගෙන ඉහත රෝග නිර්ණ කට්ටලය නිර්මාණය කරමින් පවතී.

### **නිමි තේ වල විෂජනක දිලීර විසංගත හඳුනා ගැනීම**

නිමි තේ වල ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වයක් නොමැති බව තහවුරු කිරීම තේ කර්මාන්තයේ නියැලි සැමගේ වගකීමකි. මෙහිදී විෂජනක දිලීර වල අනන්‍යතාව හඳුනා ගැනීම, අධ්‍යයනය, ප්‍රමාණාත්මක ලෙස ගණනය කිරීම සහ විෂ නිපදවීමට හිතකර සාධක හඳුනා ගැනීම ආදිය කාලින අවශ්‍යතා වේ. මේ යටතේ උඩරට කලාපයේ තේ කම්හල් 12 කින් ලබා ගත් නිමි තේ නියැදි පරික්ෂා කරන ලද අතර එහිදී විෂ සහිත දිලීර විසංගත 42 ක් හඳුනා ගන්නා ලදී. ඒවායින් බහුතරයක් *Penicillium spp.* සහ *Aspergillus spp* වේ විසංගත වර්ග 5 ක් මගින් විෂ නිපදවන බව හඳුනා ගන්නා ලදී. තහවුරු කිරීමේ පරික්ෂා සහ අනුක විද්‍යාත්මක විශලේෂණ තවදුරටත් සිදු කරමින් පවතී .

**නව වල්පැලටි නාශක තෝරාගැනීම**

**බයිමාස්ටර් (ග්ලයිපොසෙට් 240 g/l + 2,4D 120 g/l)**

ග්ලයිපොසෙට් (Glyphosate) සහ බයිමාස්ටර් (Bimaster) සැසදුම සඳහා වන වල් නාශක අත්හදා බැලීමේ කටයුතු 2015 ජනවාරි මස ආරම්භ වුනි. නමුත් ග්ලයිපොසෙට් නිෂ්පාදන තහනම හේතුවෙන් එම පර්යේෂණ කටයුතු 2015 මැයි මසදී අවසන් කෙරුණි.

**ගෝල් 4F (ඔක්සිෆ්ලූරොෆෙන් 480g/l SC) - පූර්ව නිර්ගමන වල් නාශකය**

මෙම වල් නාශකය අනෙකුත් පූර්ව නිර්ගමන වල් නාශක සමග පරීක්ෂා කිරීම නිව් පීකොක් වතුයායේ ආරම්භ කරන ලදිග වතුයායේ අවට වල් පැලෑටි කළමණාකරනයේදී පර්යේෂණ කොටු වලට බාධා සිදු වූ බැවින් මෙම අත්හදා බැලීම නැවතත් රත්වත්ත වතු යායේ සිදු කෙරේ.

මෙහිදී ප්‍රතිකාර ලෙස ගෝල් 4F මාත්‍රා හතරක් ද (400, 500, 600, 700 මිලි ලිටර/හෙක්ටයාරයට) , ඩයියුරොන් මාත්‍රා දෙකක් ද (1.2 , 1.5 කිලෝ ග්‍රෑම්/හෙක්ටයාරයට) ඉන්ඩෙසිෆ්ලේම් මාත්‍රා තුනක් ද (50 a.i, 75 a.i, 100 a.i ග්‍රෑම්/හෙක්ටයාරයට) , පාලකය ලෙස අතින් වල් ගැලවීම සහ ගෝල් 2E (සම්මත) (1.2 ලිටර/-හෙක්ටයාරයට) යොදා ගැනුණි. ගෝල් 2E (සම්මත) සහ ගෝල් 4F 600 මිලි ලිටර/ හෙක්ටයාරයට සහ ඉන්ඩෙසිෆ්ලේම් මාත්‍රා දෙකක් ද ( 75 a.i , 100 a.i ග්‍රෑම්/හෙක්ටයාරයට) අනෙකුත් ප්‍රතිකාරකයන්ට සාපේක්ෂව ඉහල ක්‍රියාකරිත්වයක් පෙන්නුම් කෙරුණගි තවද ඉහත ප්‍රතිකාරක වල වල් පැලැටි බීජ ප්‍රරෝහන ප්‍රතිශතයේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ශාන්ත කුම්බ්ස් සහ ශාන්ත ජෝකිම් වතු අතුලුව ස්ථාන තුනකදී ගෝල් 2E සඳහා අත්හදා බැලීම් කටයුතු තව දුරටත් සිදු කෙරේ.

**විනාශ කිරීමට අපහසු වල් පැලැටි පාලනය**

මේ සඳහා විනාශ කිරීමට අපහසු වල් පැලැටි සඳහා යොදා ගන්නා වල් නාශක මිශ්‍රණ සහ ග්ලූෆොසිනේට් ඇමෝනියම් (බස්ටා-බේයර් නිශ්පාදන) සමග අත්හදා බැලීම් කටයුතු තලවකැලේ ශාන්ත කුම්බ්ස්, රත්නපුර ශාන්ත ජෝකිම් සහ මාතලේ රත්වත්ත යන ස්ථාන තුනක දී සිදු කෙරේ.

මෙම ප්‍රතිකාරක යොදා ගෙන ශාන්ත කුම්බ්ස් වතු යායේ කරන ලද මූලික පර්යේෂණ වලට අනුව අලව-න්ගුපිල්ලූ හැර අනෙකුත් බයිඩන්ස් විශේෂ, ගැටකොල සහ තෘණ වැනි වල් පැල විශේෂ සඳහා මෙම මිශ්‍රණ සුදුසු බව පෙනුනි . තව දුරටත් පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී.



**Figure 1**



**Figure 2**

Figure 1: Field testing of *Trichoderma harzanium* bio formulation against root diseases
Figure 2: Field testing of new fungicides against blister blight disease

**වල්පැලෑටි නාශක සඳහා උපරිම අවශේෂ මට්ටම (MRL)**

ග්ලූෆොසිනේට් ඇමෝනියම් (බස්ටා-බේයර් නිශ්පාදන) සඳහා වන MRL අධ්‍යයනයේ හීන වීමේ සහ ප්‍රාදේශීය මට්ටමේ අත් හදා බැලීම් කටයුතු ඉදිරියටත් කෙරී ගෙන යයි.

**ඒකාබද්ධ වල් පැලෑටි කළමනාකරණය**

නව අත් හදා බැලීම් ආරම්භ කර නොමැතග පාංශු පරාමිතීන් පිලිබඳව ඇගයීම කරනු ලැබේ. නුවරඑලිය ලබුකැලේ වත්තේ ක්ෂේත්‍ර පුහුණුව ඒ ආකාරයටම පවත්වා ගෙන යාම සහ වල් පැලෑටි ඉහලින් කපා දමා වල් පැලෑටි පාලනය කිරිම සිදු කරන ලදි.

# දේශගුණික විපර්යාසයන්හි බලපෑම අධ්‍යයනය

**ගෝලීය දේශගුණික විපර්යාසයන් කෙරෙහි තේ ශාකයෙහි කායික විද්‍යාත්මක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම**

මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථයවූවේ 21 වන ශතවර්ෂය සඳහා ප්‍රක්ෂිප්ත දේශගුණික විපර්යාස වලට අන්කූලව තේ ශාකයේ අස්වැන්න සහ කාබන් තිරකිරීමේ විභවය ක්ෂේත්‍ර පර්යේෂණ සහ භෝග ආකෘති ඇසුරින් පුරෝකථනය කිරීමයි.

ඒ සඳහා SDGVM භෝග ආකෘතිය ශ්‍රී ලංකාවේ තේ වගාවට උචිතවන ලෙස පිළියෙල කිරීම, ක්‍රමාංකණය කිරීම සහ තහවුරුකිරීම සිදුකරන ලදී. අනාගත තේ අස්වැන්න නිර්ණය කිරීම සඳහා A1F1 සංකල්පය වසර 2000 සිට 2100 දක්වා පහත රට, මැද රට සහ උඩ රට යන තේ වගාකරනු ලබන උච්චත්ව සඳහා යොදා ගන්නාලදී. ක්‍රමාංකිත ආකෘති පුරෝකථනයට අනුව වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් වායුවේ ඉහළයාම සියලුම තේ වගාකරන ප්‍රදේශ වල තේ අස්වැන්න සහ කාබන් තිරකිරීමේ විභවය කෙරෙහි ධනාත්මක ලෙස බලපාන බව සොයාගන්නා ලදී. නිරීක්ෂණය කරන ලද අස්වනු ඉහළයාම පහත රට, මැද රට සහ උඩ රට සඳහා පිළිවෙලින් වසරකට හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3.4, 2.9 සහ 3.6 ක් වන බව සොයා ගන්නාලදී. කාබන් තිර කිරීමේ විභවය සියලූ තේ වගාකරනු ලබන ප්‍රදේශ සඳහා ධනාත්මක වුවද කාබන් තිර කිරීමේ වේගය, වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් වැඩිවීමේ ඒකකයක් සඳහා ගණනය කළවිට, එහි අඩුවීමේ ප්‍රවණතාවයක් පවතින බව සොයාගන්නා ලදී.

කෙසේනමුදු වායුගෝලයේ අනාගත කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයේ ඉහළයාම භෝග ආකෘතියෙන් ඉවත් කළ විට පහත රට සඳහා සෘණාත්මක ප්‍රතිචාරයකුත්, මැද රට සහ උඩ රට සඳහා පිළිවෙලින් ආන්තික සහ නොසැළකිය හැකි මට්ටමින්වූ ධනාත්මක ප්‍රතිචාරයකුත් ලැබෙන බව සොයාගන්නා ලදී. නිරීක්ෂිත අස්වනු ප්‍රතිචාර පහත රට, මැද රට සහ උඩ රට සඳහා පිළිවෙලින් වසරකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් -0.62, 0.01 සහ 0.09 ලෙසවේ. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

**තේ වගා කරනු ලබන විවිධ ප්‍රදේශ සඳහා කාබන් අය වැය වාර්තා පිළියෙල කිරීම**

පාංශු තෙතමනය, කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, පාංශු උෂ්ණත්වය සහ pH අගය තේ වගා කරනු ලබන විවිධ ප්‍රදේශයන්හි පාංශු ස්වසනය සඳහා බලපාන සාධක ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුසාරයෙන් කාබන් අය වැය වාර්තා පිළියෙල කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කරන ලදී. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.



**තේ වගාකරන විවිධ ප්‍රදේශවල දේශගුණික වෙනස්වීම් විශ්ලේෂණය**

දේශගුණික වෙනස්වීම්වල බලපෑම්වලට පාත්‍රී කෘෂි පාරිසරික කලාප හඳුනාගෙන ඒවා සිතියම් ගත කර ඇති අතර බලපෑම් අවම කිරීම පිණිස ගත හැකි වඩාත් සුදුසු ප්‍රතිකර්මද හඳුනාගෙන තිබේ. ඒ අතරින් බෝග වැඩිදියුණුකිරීම (වියලි හා උෂ්ණ අධික තත්වයන්ට ඔරොත්තු දෙන ප්‍රභේද භාවිතය, වැඩි දියුණු කල බීජ තේ සහ බද්ධ පැල භාවිතය පාංශු තත්වය වැඩි දියුණු කිරීම (පාංශු ජල සංරක්ෂණය, කාබනික ද්‍රව්‍ය එකතු කිරීම සහ ජල සම්පාදනය සහ වායව පරිසරය වැඩි දියුණු කිරීම (සෙවන ශාක ස්ථාපනය සහ කළමණාකරනය ආදිය තේ ඉඩම් සඳහා භාවිතා කල හැකි වඩාත් වැදගත් ප්‍රතිකර්ම ලෙස දැක්වීමට පුලුවන. ආන්තික තේ ඉඩම් බෝග විවිධාංගිකරණයට යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කල යුතුය. අනෙකුත් තේ නිපදවන රටවල අත්දැකීම් කැටිකර ගනිමින් පරිසර බලපෑම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ඇතුලත් වාර්ථාවක් සකස් කල අතර එය ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තේ පිලිබඳ කමිටුවේ අනුග්‍රහයෙන් මුද්‍රණයකර එලි දැක්වීමට කටයුතු යොදා ඇත. තේ ප්‍රභේද අධික උෂ්ණත්වයට දක්වන ප්‍රතිචාර/හැඩ ගැසීම පිලිබඳව මූලික පරීක්ෂණ තේ පර්යේෂණායතනයේ පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී ආරම්භකරන ලදී. පොලිතීන් ආවරණ තුල හා හරිතාගාර තුල තේ පැල/පඳුරු තැබීමෙන් ඒවා වැඩි උෂ්ණත්වයකට නිරාවරණය කල හැකි බව නිරීක්ෂණය කරන ලදී. එනමුදු පහතරට කලාපයේ පැවති වලාකුල් වලින් වැසී ගිය අන්ධකාර ස්වභාවය හා වැසි සහිත කාලගුණික තත්වය හේතුවෙන් නිසිපරිදි දත්ත රැස් කිරීමට නොහැකිවිය. ඉතා නිවැරදි දත්ත ලබා ගැනීමට නම් නිශ්චිත උෂ්ණත්ව පරාසයන් පාලනය කල හැකි වර්ධක කුටි මේ සඳහා උපයෝගීකර ගත යුතුව ඇත.

**දේශගුණික විපර්යාස හා ඒවායින් පළිබෝධකයින්ට වන බලපෑම**

**ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු ගහණයේ වෙනස් වීම කෙරෙහි පාංශු උෂ්ණත්වයේ බලපෑම අධ්‍යයනය කිරීම**

පශ්චාත් උපාධි අධ්‍යයනයක් හරහා සිදු කෙරෙන මෙම පර්යේෂණයේදී, විවිධ කෘෂි දේශගුණික කලාපයන් හා උච්චත්වයන් වල ඇති ක්ෂේත්‍ර හයක පර්යේෂණ සිදු කෙරිණි. සිසිල්ටන් වත්ත (PL1), ඩෙල්ම වත්ත (PL2), හපුගස්තැන්න වත්ත (PL3), මහදෝව වත්ත (PL4), රිච්ලන්ඩ් වත්ත (PL6) හා නාවලපිටියේ කුඩා තේ වතු හිමි ඉඩමක මෙම ක්ෂේත්‍ර පිහිටා ඇත. මාසිකව දත්ත රැස් කෙරුණු අතර පාංශු උෂ්ණත්වය, වර්ෂාපතනය, ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ ගහණය මෙන්ම වටපණු හානිය නිසා හටගත් රෝග ලක්ෂණ යනාදිය අධ්‍යයනයට ලක් කෙරිණි.

**ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ පාංශු ගහණය හා පාංශු උෂ්ණත්වය අතර සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම**

මෙම ක්ෂේත්‍ර පර්යේෂණ වලින් ලබාගත් දත්ත අනුව පෙනීගිය කරුණ නම්, සියළුම ස්ථානවල පාංශු උෂ්ණත්වය ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාට ප්‍රශස්ථ පරාසයට වඩා ඉහළ ගොස් ඇති බවයි. PL2 හා PL6 ස්ථානවල මෙම උෂ්ණත්වය 24 0C ට වඩා ඉහළ අගයක් ගනී වැඩිම හා අඩුම පාංශු උෂ්ණත්වය වාර්තා වූයේ, පිළිවෙලින් PL6 හා PL2 ස්ථානවලදීය PL1 හා PL4 ස්ථානවල හැර අනෙකුත් ස්ථානවලදී පසේ වටපණු ගහණය හා පාංශු උෂ්ණත්වය අතර සෘණාත්මක සම්බන්ධතාවයක් දක්නට ලැබිණි.

ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණු විශේෂය ලංකාවේ සියවම තේ වගා ප්‍රදේශයන්හි සාර්ථකව ව්‍යාප්ත වීම හා වැඩි පාංශු උෂ්ණත්වයක් අවශ්‍ය වන රැඩොෆොලස් සිමිලිස් වටපණු විශේෂය සමග එකම ස්ථානයේ සහයෝගීව පැවතීම යනාදි කරුනු මෙම පර්යේෂණ දත්ත මගින් තහවුරු කරයි. මෙම වෙනස්කම් බොහෝ විට ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ චර්යාව, ජීවන චක්‍රය හා රෝග ලක්ෂණ ඇති කිරීම් යනාදියෙහි වෙනස්කම් වලට බලපෑම් ඇති කළ හැකිය. මේ පිළිබඳ වැඩිදුර අධ්‍යයනයන් සිදු කෙරේ.

**ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ පාංශු ගහණය හා පසේ තෙතමනය අතර සම්බන්ධතාවය අධ්‍යයනය**

PL2 හා PL5 හැර අනෙකුත් සියළුම ස්ථානවල පාංශු තෙතමනය හා පාංශු වටපණු ගහණය අතර ධනාත්මක සම්බන්ධතාවයක් දක්නට ලැබිණි. PL2 හා PL5 හි අවම හා උපරිම පාංශු තෙතමනයන් මෙම වටපණු විශේෂයේ පැවැත්මට හානිකර ලෙස බලපා ඇත.

**තේ මුල්වල ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ ගහණය හා පාංශු තෙතමනය අතර සම්බන්ධතාවය අධ්‍යයනය**

PL1 හා PL5 යන ස්ථානවල හැර අනෙකුත් ස්ථානවල ධනාත්මක සම්බන්ධතාවයක් දක්නට ලැබිණි. මෙම අධ්‍යයනයන් වලින් ලද ප්‍රතිඵල වලට අනුව පෙනීගිය කරුණ නම්, ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාගේ ගහණයේ වැඩිවීම කෙරෙහි පාංශු තෙතමනය පමණක් නොව අනෙකුත් සාධක ද බලපාන බවයි.


# ක්ෂේත්‍ර ක්‍රියා යාන්ත්‍රීකරණය

**තේ (*Camellia sinensis*) භෝගයේ අස්වැන්න සහ වර්ධණය යාන්ත්‍රික දළු නෙලීම කෙරෙහි දක්වන ප්‍රතිචාරය පිලිබඳ ශාක කායික විද්‍යාත්මක අධ්‍යයනය**
අතින් සිදුකරන තෝරා දළු නෙලීමේදී වසරකට හෙක්ටාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 4987ක සැලකිය යුතු ඉහල දළු අස්වැන්නක් වාර්තා වූ අතර, තේ පර්යේෂණායතන තෝරා දළු නෙලන කතුර, තේරීමකින් තොරව දළු නෙලන කතුර සහ පෙට්‍රල් වලින් ක්‍රියා කරන (දළු තේරීම කල නොහැකි) යන්ත්‍රය භාවිතයේදී අතින් දළු නෙලීමට සාපේක්ෂව ලබාදුන් අස්වැන්න පිළිවෙලින් 90%, 60% සහ 50%ක් ලෙස නිරීක්ෂණය කරන ලදී.

යන්ත්‍රය මගින් අරිම්බු දළු ඉවත් කිරීමේ ප්‍රතිශතය (දළු නෙලීමට පෙර සහ පසු) සැලකියයුතු ඉහල අගයක් ගත් අතර, දළු තේරීමට නොහැකි කතුර, තේ.ප.ආ. තෝරා දළු නෙලනය සහ අතින් දළු නෙලීම යන අනු පිළිවෙලට එහි අඩු වීමක් දක්නට ලැබිණ. එමෙන්ම, අතින් දළු නෙලීමේදී වංගි දළු ඉවත් කිරීම සැලකියයුතු ඉහල අගයක් ගත් අතර, කතුරු සහ යන්ත්‍රය භාවිතයේදී වංගි ඉවත් කිරීම එයට වඩා අඩු අගයක් පෙන්වන ලදී.

දළු නෙලීමේ තීව්‍රතාවය යනු, නෙලාගන්නා දල්ල එහි කුමණ ස්ථානයකින් වෙන් කරගන්නවාද යන්නයි. මීන පත්‍රයට පහලින්, මීන පත්‍රය ඉතිරි කරමින්, මවු පත්‍රයක් ඉතිරි කරමින් සහ පත්‍ර එකකට වඩා වැඩි ගනනක් ඉතිරි කරමින් දළු නෙලීම ලෙස තීව්‍රතාවය වෙනස් වේ. මෙහිදී, වඩාත් පහලින් දළු නෙලා ගැනී-මේදී, එය ඉහල තීව්‍ර තාවයක් ලෙස හැඳින්වේ. මෙසේ, යන්ත්‍ර මගින් දළු නෙලීමේ වැඩිම තීව්‍රතාවය වාර්තා වූ අතර, කතුරු වලින් එයට වඩා අඩු තීව්‍රතාවයක් වාර්තා විය. තවද, යන්ත්‍රය මගින් දළු නෙලීමේදී එක් පත්‍රයකට වඩා ඉතිරිකර දළු නෙලීම වැඩි වශයෙන් සිදුවූ අතර, කතුරු භාවිතයේදී එය අඩුවෙන් සිදු විය. එමෙන්ම, අතින් දළු නෙලීමේදී එක් පත්‍රයකට වඩා ඉතිරිකර නෙලාගත් අවස්ථා වාර්තා නොවිය.

පර්යේෂණය ආරම්භයේ සිට මාස පහක කාළයකට පසුව මනින ලද මුල්වල අඩංගු පිශ්ඨ ප්‍රමාණය තෝරා දළු නෙලන ලද තේ පඳුරු වලට සාපේක්ෂව තේරීමක් නොකර දළු නෙලූ තේ පඳුරු වල සැලකියයුතු අඩු අගයක් පෙන්විය. නමුත්, තේ ශාකයේ පත්‍රවල විශිෂ්ඨ ස්කන්ධයෙහි (Specific Leaf Weight) (වර්ග සෙන්ටිමීටරයට ග්‍රෑම්) වෙනසක් එම කාලය තුල නිරීක්ෂණය නොවූ අතර පර්යේෂණය තවදුරටත් සිදුවෙමින් පවතී.





**දලු නෙලන හා කප්පාදු යන්ත්‍ර කුඩා තේ වතු ක්ෂේත්‍රවල ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කරමින් පවතී. එය තේ පර්යේෂණායතනය, කුඩා තේ වතු හිමියන්ගේ සමිති සම්මේලනය, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය, හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මෙහෙයවීමෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම පිණිස රැස්වීම් තුනක් පවත්වා ඇත. මෙම වසර තුල 220 කට අධික කුඩා තේ වතු හිමියන් ගණනක් පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී යන්ත්‍ර ක්‍රියාකරුවන් හා පුහුණු කරන්නන් ලෙස දෙදින නේවාසික පුහුණුවක් ලැබීය. ශෂ්‍ය විද්‍යා අංශය, උපදෙස් හා ව්‍යාප්ති අංශය, පරිපාලන අංශය හා ශාන්ත ජෝකිම් වත්තේ සහයෝගිත්වය ඇතිව ආචාර්ය එම්.ඒ.විජේරත්න, සමන් රත්නායක සහ සම්පත් පතිරණගේ යන මහත්වරුන් විසින් එම පුහුණු වැඩ සටහන් මෙහෙයවන ලදී. දෙවන අදියර තුලදී තේ සමිති 44 ක්, කර්මාන්තශාලා 44 ක් සහ තේ පර්යේෂණායතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති අංශවලට කප්පාදු යන්ත්‍ර දලු නෙලන යන්ත්‍ර සහ දලු කූඩ බෙදා දෙන ලදී. මෙම යන්ත්‍ර භාවිතය පිලිබඳ මාර්ගෝපදේශ සහ පෝස්ටර් ආදිය සකස් කර තේ සමිති හා කරමාන්තශාලාවලට බෙදා දෙන ලදී.

මෙම යන්ත්‍ර වල භාවිතය බලාපොරොත්තු වූ තරමට වඩා අඩු මට්ටමක පවතින බව ඉහත රැස්වීම් වලදී අනාවරණය වුවත් තෝරා දැලු නෙලන කතුර හා කප්පාදු යන්ත්‍රය කෙරේ හොඳ ප්‍රතිචාරයක් ඇතිබව හෙළිවිය. ඉන්ධන/බැටරි මගින් ක්‍රියාත්මක වන දැලු නෙලන යන්ත්‍රය භාවිතයේදී තේ පඳුරට ඇතිකරන බලපෑම සහ මේරූ කොටස් අස්වැන්නට එකතුවීම කුඩාතේ වතු හිමියන් අධෛර්යමත් කිරීමට හේතු වී ඇති බව පෙනේ. කරමාන්තශාලාවල එම යන්ත්‍ර භාවිතය කුඩා තේ සමිති වලට වඩා ඉතා අඩු මට්ටමක පැවතින.

යන්ත්‍ර සූත්‍ර වල යම්යම් දුර්වලතා හඳුනා ගත් අතර ඒවා පිලිබඳව යන්ත්‍ර නිෂ්පාදකයින්ට දන්වන ලදී. තෝරා දැලු නෙලන කතුර භාවිතයෙන් දිනකට දැලු කිලෝ 30-35 ක් නෙලා ගත හැකි බවත්, බැටරි මගින් ක්‍රියාකරන යන්ත්‍රය මගින් හා ඉන්ධන වලින් ක්‍රියාකරන යන්ත්‍රය මගින් දිනකට නෙලා ගත හැකි දැලු ප්‍රමාණය පිලිවෙලින් කිලෝ 40-50 ක් සහ 150-200 ක් පමණ වන බවත්, දිනකට යන්ත්‍රයෙන් කප්පාදු කල හැකි පඳුරු ගණන 1000-1500 ක් පමණ වන බවත්, යන්ත්‍රයෙන් දිනකට සකස් කල හැකි වලවල් ගණන 700-900 ක් පමණ වන බවත් අනාවරණය විය. මෙම ව්‍යාපෘතිය යටතේ මේ දක්වා දැලු කතුරු හා කුඩ 1500 ක් බැගින් බැටරි වලින් ක්‍රියාකරන දැලු නෙලන යන්ත්‍ර 100 ක්, ඉන්ධන මගින් ක්‍රියාකරන යන්ත්‍ර 200 ක්, කප්පාදු යන්ත්‍ර 200 ක් හා වලවල් හාරන යන්ත්‍ර 50 ක් බෙදාදී තිබේ.

# තේ තවාන් පාලන ක්‍රම

**තේ තවාන් මළු සඳහා වෙනස් මාධ්‍ය හා ඒවායේ මිශ්‍රණ**
පහත සඳහන් ප්‍රතිකර්ම, TRI 4042 ප්‍රභේදය භාවිතා කරමින් RCBD ආකාරයට පරීක්ෂණය සිදු කරන ලදී.

**T1 -** කොම්පෝස්ට් ඃ පස් (1ඃ1 මිශ්‍රණය)

**T2 -** කොම්පෝස්ට් ඃ පස් ඃ වැලි (1ඃ1ඃ1 මිශ්‍රණය)

**T3 -** කසල තේ ඃ පස් (1 ඃ 1 මිශ්‍රණය)

**T4 -** කසල තේ ඃ පස් ඃ වැලි (1ඃ1ඃ1 මිශ්‍රණය)

**T5 -** දහයියා ඃ පස් (1ඃ1 මිශ්‍රණය)

**T6 -** දහයියා ඃ පස් ඃ කොම්පෝස්ට් (1ඃ1ඃ1 මිශ්‍රණය)

**T7 -** තවාන් පස් (කැලෑ/පුනරුත්තාපිත) පාලකය

පහත වගුවට අනුව, කසල තේ මිශ්‍ර කිරීම නිසා මුල් වර්ධනයේ ඉහළයාමක් දැකිය හැකි අතර කොම්පෝස්ට් සහ දහයියා එකතු කරන ලද ප්‍රතිකර්මයන්ගේ ශාක පත්‍ර වර්ධනය වැඩිවී ඇත.

| ප්‍රතිකර්මය | පත්‍රයේ වර්ගඵලය ($cm^2$) | පත්‍ර සංඛ්‍යාව | පත්‍ර බර (g) | කඳ වට ප්‍රමාණය (mm) | කඳෙහි බර (g) | මුල් බර (g) |
|---|---|---|---|---|---|---|
| T 1 | $507.0^{a}$ | $28.8^{a}$ | $4.6^{a}$ | $5.8^{a}$ | $3.3^{a}$ | $3.6^{ab}$ |
| T 2 | $342.0^{b}$ | $21.0^{a}$ | $3.2^{b}$ | $5.4^{a}$ | $2.5^{a}$ | $2.8^{ab}$ |
| T 3 | $401.0^{ab}$ | $24.8^{a}$ | $4.1^{ab}$ | $5.9^{a}$ | $3.2^{a}$ | $4.1^{a}$ |
| T 4 | $385.6^{ab}$ | $22.4^{a}$ | $3.5^{ab}$ | $5.4^{a}$ | $2.4^{a}$ | $2.5^{b}$ |
| T 5 | $451.0^{ab}$ | $26.4^{a}$ | $3.9^{ab}$ | $5.7^{a}$ | $3.2^{a}$ | $3.7^{ab}$ |
| T 6 | $446.6^{ab}$ | $27.0^{a}$ | $3.9^{ab}$ | $5.9^{a}$ | $3.3^{a}$ | $2.7^{ab}$ |
| T 7 | $390.2^{ab}$ | $24.4^{a}$ | $3.5^{ab}$ | $6.0^{a}$ | $3.4^{a}$ | $3.6^{ab}$ |

පැළ තවාන් අත්හදා බැලීම් 2014 දී අවසන් කර ඇති අතර ශාක ක්ෂේත්‍රයේ රෝපණය කරන ලදී.

**තේ තවාන් මලු ප්‍රමාණයෙහි බලපෑම විමර්ශන ( *Camellia sinensis L*) තවාන් සහ ක්ෂේත්‍රයේ ශාක වර්ධනය**

සෞඛ්‍ය සම්පන්න සහ දැඩි තේ තවාන් පැළ නිෂ්පාදනය කිරීමට තවාන් මලු සඳහා අවම පස භාවිතා කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, පර්යේෂණ දෙකක් ශාන්ත කුම්බිස් තලවකැලේ (ක්ෂේත්‍ර පර්යේෂණ) ස්ථාපනය කරන ලද අතර පහතරට මධ්‍යයස්ථානය, රත්නපුර හා තවාන් පරීක්ෂණ 2014 දී නිම කරන ලදී

ක්ෂේත්‍රය තුලදී අගල් 5 x 9 පැල සඳහා වැඩි අස්වැන්නක් ලැබුණ අතර පර්යේෂණ තව දුරටත් සිදු කෙරෙමින් පවතී

**විවිධ තේ තවාන් දැල් වර්ග සහ ඒවා තැබිය යුතු උස අධ්‍යයනය කිරීම**

විවිධ තේ තවාන් දැල් ද්‍රව්‍ය වල බලපෑම තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ප්‍රතිකාර යොදා ඇති පර්යේෂණාත්මක අඩවි ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර හා ශාන්ත කුම්බිස්, තලවාකැළේ හි ස්ථාපිත කරන ලදී

1. 70% නයිලෝන් දැල්, 1.8 මී
2. 70% නයිලෝන් දැල්, 2.4 මී
3. 80% නයිලෝන් දැල්, 1.8 මී
4. 80% නයිලෝන් දැල්, 2.4 මී
5. ගෝනි දැල්, 1.8 මී
6. කොහු ලණු දැල්, 2.4 මී
7. කොහු ලණු දැල්, 1.8 මී (පාලිතය)

**ශාන්ත කුම්බිස්, තලවකැලේ**

පහත වගුවට අනුව,TRI 3013 ප්‍රභේදයේ, පත්‍ර නිෂ්පාදනය තවාන් අදියරේදී ඉතා දුර්වල ය සාමාන්‍ය පත්‍ර ගණන, අනුව, ලණු දැල් (උස ප්‍රමාණයන් දෙකම), සහ 2.4 මී උස සඳහා නයිලෝන් දැල් සහ ගෝනි වඩාත් ඵලදායී වී ඇත

| ප්‍රතිකර්මය / ප්‍රභේදය | TRI 3013 | TRI 3019 | TRI 4052 | TRI 4071 |
|---|---|---|---|---|
| 70% නයිලෝන් දැල්, 1.8 m | 30 | 100 | 181 | 128 |
| 70% නයිලෝන් දැල්, 2.4 m | 49 | 138 | 149 | 114 |
| 80% නයිලෝන් දැල්, 1.8 m | 25 | 139 | 91 | 163 |
| 80% නයිලෝන් දැල්, 2.4 m | 48 | 187 | 217 | 125 |
| ගෝනි දැල්, 1.8 m | 30 | 189 | 197 | 169 |
| කොහු දැල්, 1.8 m | 62 | 152 | 253 | 150 |
| කොහු දැල්, 2.4 m | 91 | 113. | 243. | 139 |
| CV | 79.52 | 39.85 | 22.98 | 48.9 |
| PV | 0.41 | 0.69 | 0.19 | 0.94 |

**ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර**

මාස 5 විශ්ලේෂණයෙන් පසු පැල වල වර්ධනය ලණු දැල් 1.8 මී දී ඵලදායී වී ඇති බව පෙන්වා දුන්නේය මෙම නයිලෝන් දැල් භාවිතා කරන විට, 1.8 මී උස 70% ක් නයිලෝන් දැල් පහතරට සඳහා සුදුසු බව පෙනේ එමෙන්ම ඉතා ඉක්මනින් දිරන නිසා ගෝනි දැල් භාවිතය නතර කර දැමීමට සිදුව තිබේ

| ප්‍රතිකර්මය | දළු වියලි බර (g) | මුල් වියලි බර (g) | පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 70% නයිලෝන් දැල්, 1.8 m | 15.6[a] | 1.9[ab] | 10.0[a] |
| 70% නයිලෝන් දැල්, 2.4 m | 14.2[a] | 1.7[bc] | 10.3[a] |
| 80% නයිලෝන් දැල්, 1.8 m | 14.0[a] | 1.8[ab] | 10.0[a] |
| 80% නයිලෝන් දැල්, 2.4 m | 15.0[a] | 1.4[c] | 9.5[a] |
| කොහු දැල්, 1.8 m | 16.0[a] | 2.1[a] | 10.6[a] |
| කොහු දැල්, 2.4 m | 14.4[a] | 1.7[bc] | 8.8[a] |

**තේ තවාන් පැල වර්ධනය පිළිබඳ පොහොර හා සෙමෙන් පෝෂක නිකුත් කරන පොහොර වල බලපෑම්**

තවාන් ශාක සඳහා පොහොර යෙදීමේ කාර්යක්ෂමතාව අධ්‍යයනය සඳහා පරීක්ෂණයක් සිදු කරන ලදී. මෙහිදී ඇල්බර්ට් මිශ්‍රණය (T1), සෙමින් නිකුත් වන පොහොර සමග බිඳිති ජල සම්පාදනය (T2) සෙමින් නිකුත් වන පොහොර සමග අතින් ජලය යෙදීම (T3), T 65 පොහොර මිශ්‍රණය සමග බිඳිති ජල සම්පාදනය (T4) සහ T 65 පොහොර මිශ්‍රණය සමග අතින් ජලය යෙදීම (T5) ප්‍රතිකර්ම ලෙස යොදන ලදී.

ඉහලම පත්‍ර ක්ෂෙත්‍රඵලය, කඳ වට ප්‍රමාණය සහ මුල් වර්ධනය නිරීක්ෂණය කරන ලද්දේ සෙමින් නිකුත් වන පොහොර සමග අතින් ජලය යෙදීම (T3) ප්‍රතිකර්මය මගිනී  කෙසේ වෙතත්, ජල බිංදු සමඟ සෙමින් නිදහස් කරන පොහොර (T2) ද ශාක වර්ධනය සඳහා ඊළඟ හොඳම කාර්ය සාධනය ලබා දී ඇති ඇල්බට් මිශ්‍රණ පොහොර වඩා හොඳ තවාන් ශාක වර්ධනය සඳහා ඵලදායී වී නැත.

| ප්‍රතිකර්මය | පත්‍ර ක්ෂෙත්‍රඵල ($cm^2$) | කඳ වට ප්‍රමාණය | මුල් බර (නොවියලි) (g) |
|---|---|---|---|
| T 1 | 286.8[b] | 5.2[b] | 9.3[a] |
| T 2 | 421.5[ab] | 6.0[ab] | 11.9[a] |
| T 3 | 489.1[a] | 6.3[a] | 13.2[a] |
| T 4 | 316.3[b] | 5.5[ab] | 10.0[a] |
| T 5 | 408.3[ab] | 5.8[ab] | 10.9[a] |

# තේ සැකසුම් තාක්ෂණය හා නිපැයුම් වැඩි දියුණු කිරීම

**තේ කර්මාන්ත ශාලා සහ ඒවායේ තේ නිෂ්පාදනයට භාවිත යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම**

**පහත රට තේ වර්ගීකරණ ක්‍රියාවලියේ විවිධ අදියර වලදී තේ වලට තෙතමනය උරා ගැනීම වැලැක්වීම විමර්ශණය කිරීම**

පහත රට තේ නිෂ්පාදනයේදී තේ ශ්‍රේණිගත කිරීම සිදුකොට මළු වල ඇසිරීමට සාමාන්‍යයෙන් සති දෙකක පමණ කාලයක් ගත වේ. තේ ශ්‍රේණිගත කිරීමේ අංශයේ නිමි තේ දිගු වේලාවක් පැවතීම නිසා තේ වලට තෙතමනය උරා ගැනීම පාලනය කිරීම අපහසු වේ.

ගුණාත්මයට හානි නොවී නිමි තේවලට උරා ගත හැකි උපරිම තෙතමන ප්‍රමාණය (Maximum permissible moisture content) නිර්ණය කිරීම පිණිස, පහතරට ප්‍රධාන තේ වර්ග 8 ක් භාවිතා කරමින්, පාරිසරික සාධක ස්ථායි ලෙස පවත්වා ගත හැකි කුටියක් තුල (Tea craftEcm chamber) සමතුලිත සාපේක්ෂ ආර්ද්‍රතාවයන් (Equilibtriun relative humidity) පහක, එනම් 50%, 60%, 70%, 80%, 90%, යන අගයන් යටතේ වියලි බල්බ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 25,30,32,35 යන උෂ්ණත්වයන් වල තබා ගනිමින් අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහිදී මෙම නිමි තේ වර්ග 8 සඳහා උරා ගත හැකි උපරිම තෙතමන ප්‍රමාණය 5.7% සිට 11.8% දක්වා වෙනස් වන බව නිර්ණය කරන ලදී. ඉහත ප්‍රතිඵල මෙවැනි පරීක්ෂා සඳහා සම්මත ක්‍රමය වූ සාන්ද්‍ර ලවණ ආශ්‍රිතව සිදු කරනු ලබන ක්‍රම වේදය මගින් තහවුරු කිරීමට නියමිතයි.

**ද්‍රෝණිකා වල තව්මැරීමේ ක්‍රියාවලියේ දී වැය වන විද්‍යුත් ශක්තියේ කාර්‍යක්ෂමතාවය ප්‍රශස්ථ කිරීම පිණිස තත්කාලීන තාප හා ස්කන්ධ හුවමාරුවට අනුව සකස් කල ගණිතමය ආදර්ශයක් ප්‍රයෝජනයට ගැනීම**

තේ නිෂ්පාදනයේ දී වැය වන විද්‍යුත් ශක්තියෙන් වැඩි ප්‍රමාණයක් තේ දළුවල තව් මැරීමේ ක්‍රියාවලිය සඳහා වැය වේ. තව් මැරීමේ ක්‍රියාවලියේ පරාමිතින් පාලනය කිරීම, අතින් (Manual) සිදු කරනු ලබන බැවින් නිසි වේලාවට ඒ සඳහා අවධානය යොමු කිරීම බෙහෝ දුරට මග හැරේ. මේ නිසා විද්‍යුත් ශක්තිය නාස්ති වන අතර, එමගින් තව් මැරුනු දළුවල ගුණාත්මයද හානි වේ.තව් මැරීමේ ක්‍රියාවලිය පාලනය කිරීමට වැදගත් වන තව් මැරුනු දළුවල තත්කාලීන තෙතමනය (Real time moiture) නිර්ණය කර ගැනීම පිණිස ගණිතමය ආදර්ශයක් ගොඩ නගන ලදී. මෙම ගණිතමය ආදර්ශය වර්ගජ සමීකරණයක් හා සංයුක්ත කරමින්, වායු ධාරාවේ සීඝ්‍රතාවයට අනුව එහි ආන්තරික ස්ථිතික පීඩනය නිර්ණය කිරීම සඳහාද වැඩි දියුණු කෙරේ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම ඉංජිනේරු අංශය සමග ඒකාබද්ධව, තව් මැරීමේ ක්‍රියාවලියට අවශ්‍ය කරන පරාමිතීන් පාලනය කිරීම සඳහා ස්වයංක්‍රීය තව් මැරීම් පාලන පද්ධතියක් නිර්මාණය කිරීම සදහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය කරගෙන යාම පිණිස ජාතික විද්‍යා පදනමෙන් (NSF) රුපියල් මිලියන 6.4 ක මුදලක් ආධාර වශයෙන් ලබා දී ඇත. සැලසුම් කල පද්ධතිය වියදම් පිරිමසින තනි මව් පුවරුවක් සහිත පරිගණකයක් වන"Raspberry Piz "වලින් සමන්විත වේ. මේ සඳහා පයිතන් මෘදුකාංගය උපයෝගි කර ගනිමින් ගණිතමය ආකෘතියක්ද ඇතුලත් වන ලෙස මෘදුකාංගය ගොඩ නගන ලදී. මීට අමතරව තෝරා ගන්නා ලද පරීක්ෂණ මට්ටමේ තව් මැරීමේ ද්‍රෝණිකාවට අවශ්‍ය වන වෙනස්කම් ද සැලසුම් කරන ලදී. පරීක්ෂණ ඇටවුම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය මිලදී ගැනීමට ද පියවර ගෙන ඇත.





**අධෝරක්ත කිරණ (IR) සහ තරල පත්ල වියලීමේ ක්‍රමය ඒකාබද්ධව තේ වියලීම මගින් නිමි තේ ප්‍රමිතියට සහ වියලීම් පිරිවැයට බලපෑම සාමාන්‍ය තරල පත්ල වියලන යන්ත්‍රයට සාපෙක්ෂව සංසන්දනය කිරීම.**

ඕතෝඩොක්ස් රොටවේන නිෂ්පාදන ක්‍රමයේදී තේ වියලීම සඳහා තරල පත්ල වියලනය (TRI CCC-FBD) භාවිතා කිරීම වඩාත් සුදුසු බව සොයා ගෙන ඇත. මෙම වියලනයෙන් තේ වියලා ගැනීම සඳහා අවශ්‍ය උණුසුම් වාතය නිපදවීම දැව භාවිතයෙන් සිදු කෙරේ. නිමි තේ කිලෝ ග්‍රෑම් 1 ක් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන දර ප්‍රමාණය, එනම් දරවල විශිෂ්ට භාවිතා අගය (Specific Firewood Consumption) කි.ග්‍රෑ 0.7-1.0 දක්වා අගයක් ගනී. දරවල ගුණාත්මක තත්ත්වයේ වෙනස් වීම මත මෙම අගය වෙනස් වේ. උඩරට ප්‍රදේශයන් හි තරල පත්ල වියලන යන්ත්‍රය බහුලව භාවිතා වේ. එසේම ගුණාත්මක තත්ත්වයේ දර ලබා ගැනීමද මෙම ප්‍රදේශයට අපහසුය. දර ලබා ගැනීමේ අපහසුතාවයන් හේතුවෙන් නිසි පරිදි වියලුම් කාර්යය සඳහා පරිභෝජනය වන දර ප්‍රමාණය නිමි තේ වල ගුණාත්මක භාවයට හානි නොවී අඩු කර ගැනීම සඳහා ක්‍රමෝපායන් සොයා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

මෙම අධ්‍යයනයේදී අධෝරක්ත (IR) කිරණ මාර්ගයෙන් තේ වල තෙතමන ප්‍රතිශතය 38% (W/W, Wet basis ) දක්වා අඩුකර ගැනීමට හැකි වු අතර, තරල පත්ල වියලන යන්ත්‍රයේ සාමාන්‍ය වියලුම් කාලයට වඩා විනාඩි 3 ක් අඩුකර ගැනීමට හැකි විය. සමහර අවස්ථාවන් වල අමු දර කර්මාන්ත ශාලාවලට ලැබෙන අතර ඒවා පසු දිනම වාතය උණුසුම් කිරිම සඳහා යොදා ගනී.

**ඕතෝඩොක්ස් රොටවේන ක්‍රමයට නිෂ්පාදිත තේ වියලීම සඳහා භාවිතා වන තරල පත්ල වියලීම වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක කල හැකි නිරීක්ෂණ සහ පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.**

තරල පත්ල වියලනය (TRI CCC-FBD) යන්ත්‍රයේ තේ වියලීම පාලනය කරනු ලබන්නේ යන්ත්‍රය තුලට තෙත තේ කුඩු (Wet dhools) ඇතුලත් කරන සීඝ්‍රතාවය සීරු මාරු කිරීමෙන් හා තේ පිටවන ස්ථානයේ (weir end) උෂ්ණත්වය අධීක්ෂණය කිරීමෙනි. තේ පිටවන ස්ථානයේ උෂ්ණත්වය ෆැරන්හයිට් අංශක 200 මට්ටමේ පවත්වා ගැනීම මගින් වියලුනු තේ වල තෙතමනය 2.5-3.0 (W/W- wet basis ) පමණ අගයක පවත්වා ගත හැක. දැනට භාවිතා වන ක්‍රමය මගින් තේ වියලීම පාලනය කිරීම ප්‍රමාද වන අතර තේ පිටවන ස්ථානයේ උෂ්ණත්වය අඩු වැඩි විම නිසා වියලා ගන්නා ලද තේ වල තෙතමනය ද විවිධ අගයන් ගනී. එම නිසා මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ඕතෝඩොක්ස් රොටවේන නිෂ්පාදනයේ වියලීමට භාවිතා කරන තරල පත්ල වියලනය සඳහා කාර්‍යක්ෂමව මෙය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පරාමිතීන් හඳුනාගෙන ඒවා අධීක්ෂණයට සහ පාලනයට පද්ධතියක් (Control System) ගොඩ නැගීමයි.

එම දත්ත රැස් කිරීමට අවශ්‍ය කරන නිරීක්ෂණ (Monitoring) සහ පාලන පද්ධතියක් (Control System) සකස් කර තරල පත්ල වියලනයට සවිකර ඇත. වියලනයේ ක්‍රියා කරවීමේ පරාමිතීන් අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණ දෙකක් සිදු කරන ලදී. මෙම පරීක්ෂණ තව දුරටත් සිදු කරනු ලබන අතර ලබා ගන්නා ප්‍රතිඵල විශ්ලේෂණය කර තරල පත්ල වියලනය ක්‍රියා කරවීම සඳහා සුදුසු පාලන පද්ධතියක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. පරීක්ෂණ වල ප්‍රතිඵල වලට අනුකූලව (PLC- Programmable Logic Control) පාලන පද්ධතියක් සඳහා සුදුසු වැඩ සටහනක් සකස් කරන අතර එම දත්ත එක් රැස් කරන සහ පාලන පද්ධතිය තරල පත්ල වියලනය මගින් තේ වියලීමේ ක්‍රියාවලිය සඳහා පරීක්ෂා කරනු ලැබේ.

**තේ නිෂ්පාදනය සඳහා භාවිතා කරන යන්ත්‍ර සූත්‍රවල යකඩ නොවන වාත්තු උපාංග හා CTC රෝල කොටස් සංයුතිය අධ්‍යයනය**

තේ නිෂ්පාදනයේ දී භාවිතා කරන රෝලර් යන්ත්‍ර සහ රොටවේන යන්ත්‍ර නිපදවීම සඳහා භාවිතා කරන තඹ මිශ්‍ර වාත්තු උපාංග වල ගෙවී යාම සහ බිඳී යාම නිසා නිමි තේ වල ගුණාත්මක බවට හා ධූල්ස් සෑදීමේ (dhool production) ප්‍රතිශතයට බෙහෙවින් බලපානු ලැබේ. එබැවින් මේ සඳහා හේතු හඳුනා ගැනීම, විසඳුම් සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි. රොටවේන වලට භාවිත කරන ස්බැ සාම්පල 4 ක රසායනික සංයුතිය විශ්ලේෂණය කල නමුත් ඉන් එක සාම්පලයක ප්‍රතිඵලවත් ප්‍රශස්ථ සංයුතිය වූ Gunmetal හා සංසන්දනය නොවුනි. එම නිසා තව දුරටත් මෙම ෆේන්ල කෝන්ල බැටන් යන සාම්පල සඳහා ද රසායනික සංයුතීන් අධ්‍යයනය කර ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ යන්ත්‍ර වලට යොදා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමිතිය සකස් කිරීමට යෝජනා වුනි. තවද CTC රෝල් වල රසායනික සංයුතිය නිර්ණය කර CTC තේ වල ක්‍රෝමියම් අවශේෂ (residue) ඉතිරි වීමට හේතු සොයා බැලීම සඳහා ද අධ්‍යයනයක් ආරම්භ කිරීමට යෝජනා විය.

රසායනික සංඝටක විශ්ලේෂණය කිරීම පිණිස තාක්ෂණික ආයතන වෙත යැවීම සඳහා රොටවේන සාම්පල 6 ක්, කෝන් සාම්පල 3 ක්, බැටන් සාම්පල 3 ක්, සහ CTC රෝල් සාම්පල 4 ක්, එකතු කරන ලදී. මෙම රසායනික සංඝටක විශ්ලේෂණය අවසන් වීමෙන් පසු ඒවායේ දෘඩ බව සහ ක්ෂුද්‍ර ආකෘති පරීක්ෂා කිරීම සඳහා මොරටුව සරසවියේ ද්‍රව්‍යමය ඉංජිනේරු දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ.

**කුඩා ප්‍රමාණයේ අමු දළු සාම්පල වලින් තේ නිෂ්පාදනය**

විවිධ පරීක්ෂණ කිරීම සඳහා ශෂ්‍ය විද්‍යා, කීටවේදී, වටපනුවේදී, ශාක අභිජනන, සහ ජෛව රසායන යන අංශ වලින් ගෙන එන ලද අමු දළු සාම්පල 286 ක් සඳහා කුඩා ප්‍රමාණයේ තේ නිෂ්පාදන (Miniature Manufacture) පහසුකම් ලබාදී එම නිමි තේ වර්ග කිරීම, පිරිසිදු කිරීම, ඇසුරුම් කිරීම සිදු කොට අදාල අංශ වලට භාර දෙන ලදී.

**තේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන විකල්ප බල ශක්ති ප්‍රභවයන් ඇගයීම**

තේ නිෂ්පාදනයේ දී තව් මැරීම සහ තේ වියලීම සිදු කිරීමට තාප ශක්තිය අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලීන් සිදුකර ගැනීම සඳහා අවශ්‍ය වන උණුසුම් වාතය උත්පාදනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දැව භාවිත කරනු ලැබේ. විකල්ප බල ශක්ති ප්‍රභවයක් ලෙස දහයියා ප්‍රයෝජනයට ගනිමින් තාප ශක්තිය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනයක් කරමින් පවතී. විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස දහයියා භාවිතා කිරීමේ සුදුසුකම පිළිබඳ ලියවුනු ශාස්ත්‍රීය කරුණු සමීක්ෂණය කරමින් අධ්‍යයනය සිදු කරනු ලැබේ. වායු තාපක වල දහයියා භාවිතා කිරීමේ දී ඇති වන ගැටළු සහ ඒවා දැවීමෙන් පසු ඉතිරි වන අළු ඉවත දැමීම පිළිබඳවද අධ්‍යයනය කරනු ලැබේ. වායු තාපක වලට භාවිතා කිරීමේදී අනුගමනය කල යුතු විද්‍යාත්මක කරුණු ගැන ද සාකච්ඡා කරන ලදී.

**නිෂ්පාදිත තේ වල තත්වය වැඩි දියුණු කිරීම**

**හරිත තේ නිෂ්පාදනය සඳහා සම්මත ක්‍රමවේදයක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ වෙළඳපොලෙහි ඇති හරිත තේ වල ගුණාත්මක ලක්ෂණයන්ට අදාල මූලික දත්ත ලබා ගැනිමේ අරමුණෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙහිදී මුලින් විශ්ලේෂණය කරන ලද හරිත තේ නියැදි වලින් වෙනස් වූ නිෂ්පාදිත දිනයක් ඇති දෙවන නියැදි කාණ්ඩයක් එකතු කර ඒවායේ ISO නිර්දේශිත පරාමිතීන් වන ජලයේ ද්‍රාව්‍ය සංඝටක % , සම්පූර්ණ අළු % , ජලයේ ද්‍රාව්‍ය අළු % , සම්පූර්ණ අළු වල භාෂ්මිකතාවය % , අම්ලවල ද්‍රාව්‍ය සංඝටක % , අමු තන්තු %, සහ සම්පූර්ණ පොලීෆීනෝල් % විශ්ලේෂණය කරන ලදී. මීට අමතරව දිනපතා තේ පානයේදී වැදගත් වන ප්‍රතිඔක්සිකාරක හැකියාව, ඇමයිනෝ අම්ල ප්‍රමාණය, ෆ්ලෝරයිඩ් අයන ප්‍රමාණය සහ ඇළුමිනියම් අයණ ප්‍රමාණය ආදි නිර්ණායකද අධ්‍යයනය කරන ලදී.

ISO නිර්දේශිත ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය පිළිබඳ නිර්ණායක වන ස්වායු බැක්ටීරියා ගණනය, යීස්ට් සහ පුස් ගණනය, සම්පූර්ණ කෝලිෆෝම් බැක්ටීරියා ප්‍රමාණය, E Coli සහ Salmonell ප්‍රමාණය යන නිර්ණායකද ශාක ව්‍යාධි වේදී අංශය සමග සම්බන්ධ වී අධ්‍යයනය කරන ලදී. මෙහි ප්‍රතිපල ISO නිර්දේශිත තත්වයන් සමග සංසන්දනය කරන ලදී. මෙම අධ්‍යයනය මගින් එකතු කල දත්ත සාරාංශගත කොට ශ්‍රී ලංකාවේ වෙළඳපොලෙහි ඇති හරිත තේ වල තත්වය පිළිබඳව මූලික දත්ත පද්ධතියක් ඇති කිරීමට පියවර ගෙන ඇත.

**ව්‍යාපෘතිය B 107: සීනි වලින් අපමිශ්‍රණය වූ නිමි තේ හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයන් දියුණු කිරීම**

නිමි කළු තේ වල, සීනි අපමිශ්‍රණය වී ඇතිදැයි හඳුනා ගැනීමට "වෙනස්කල ලේන්-ඇන්ඩ්-අයිනෝන්, ෆීනෝල් සල්ෆියුරික් හා ඇන්ත්‍රෝන් (Lane and Eynone, Phenol sulfuric, Anthrone and strip methods) යන ක්‍රම වේදයන් යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය දියත් කරන ලදී. නිමි තේ නිස්සාරකයේ ඇති පොලිෆීනෝලික සංඝටක, ලෙඩ්-ඇසිටේට ආධාරයෙන් ඉවත් කළ පසු, ඉහත ක්‍රම වේදයන් යොදා තේ නිස්සාරකයේ ඇති සීනි ප්‍රමාණය නිර්ණය කිරීමේදී, සීනි සාන්ද්‍රණයත් සමග ප්‍රතිඵලවල රේඛීය සහසම්බන්ධතාවක් ඇති බව දක්නට ලැබුණි.

තවද කළු තේ සාම්පල වර්ග අනුවද, තේ නිස්සාරකයේ ඇති සීනි ප්‍රමාණය වෙනස් වන බව සොයා ගැනිණි. එබැවින් ඉහත කී ක්‍රමවේදයන් භාවිතයෙන්, සීනි අපමිශ්‍රණය වී ඇත්දැයි හඳුනා ගැනීමට පෙරාතුව, විවිධ දේශගුණික තත්ව (වියලි හා තෙත් පරිසර තත්වයන්), විවිධ භූවිෂමතා තත්ව (උඩරට, මැදරට හා පහතරට) යටතේදී නිපදවන විවිධ තේ වර්ග වල ස්වභාවිකව අන්තර්ගත වන සීනි ප්‍රමාණයන් නිර්ණය කිරීම අත්‍යාවශ්‍ය බව නිගමනය කෙරිනි.

ඒ අනුව බී.ඕ.පී., බී.ඕ.පී.එෆ්. ඩස්ට් 1, පෙකෝ යන විවිධ තේ වර්ග සහ විවිධ දේශගුණික කලාපවලින් වලින් ලබා ගත් කළු තේ නියැදිවල ස්වභාවිකව අඩංගු සීනි ප්‍රමාණය ඉහත කී රසායනික ක්‍රමවේදයන් මගින් නිර්ණය කරන ලදී.

මෙම රසායනික ක්‍රමවේදයන්ගේ සංවේදීතාව අඩු බැවින් කළු තේ වල ස්වභාවිකව පවතින සීනි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා, එච්.පී.එල්.සී. උපකරණය භාවිතා කිරීම හෝ මේ සඳහා වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව අයි.ආර් තාක්ෂණය යොදා ගැනීමේ අවශ්‍යතාවද අවධාරණය කෙරිණි.

**අගය එකතු කළ නිෂ්පාදන වැඩි දියුණු කිරීම**

**කසල තේ භාවිතා කර ප්‍රෝටීන නිස්සාරණය කිරීම**

පටල පෙරණ තාක්ෂණය භාවිතයෙන් කසල තේ වලින් ප්‍රෝටීන නිස්සාරණය කිරීමට ඇති හැකියාව අධ්‍යයනය කිරීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් ප්‍රෝටීන 24% ක්, සම්පූර්ණ අළු 12% ක් ඊතර් නිස්සාරණ 0.4% ක්, දල තන්තු 0.4% ක් සහ පොලිෆීනෝල 7% ක් අඩංගු සාන්ද්‍ර ප්‍රෝටීන නිස්සාරකයක් සෑදීමට හැකි විය. ආර්ථික සාධ්‍යතා පිළිබඳ අධ්‍යයනයන්ට අනුව මෙම ක්‍රියාවලිය මගින් නිපදවන ප්‍රෝටීන කිලෝග්‍රෑමයක් රු.250/ක පමණ මුදලකට විකිණීම ආර්ථික වශයෙන් වාසි දායක වන බව සොයා ගන්නා ලදී. මෙම අධ්‍යයනය දිනකට සාන්ද්‍ර ප්‍රෝටීන කිලෝ ග්‍රෑම් 1000ක ධාරිතාවක් පදනම් කොට ගෙන සිදු කරන ලදී. මෙම තේ ප්‍රෝටීන නිෂ්පාදනය සත්ව ආහාර නිපදවීම සඳහා යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීමට නව පර්යේෂණයක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.

**යන්ත්‍ර සඳහා ඉහල ගුණාත්මයකින් යුතු ක්ෂණික කිරි තේ මිශ්‍රණයක් නිෂ්පාදනය කිරීම**

යන්ත්‍ර සඳහා සුදුසු ඉහල ගුණාත්මයකින් යුතු ක්ෂණික කිරි තේ නිෂ්පාදනයක් නිපදවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ඉහල ගුණාත්මයකින් යුතු කිරි තේ නිෂ්පාදනය කිරීමට ක්‍රියාවලියක් සකස් කල අතර එහි සංඝටක අතර අනුපාතයන් වෙනස් කරමින් මෙම නිෂ්පාදනය යන්ත්‍රවල භාවිතය සඳහා සුදුසු තත්වයට පත් කරන ලදී. සංවේදක විශ්ලේෂණයක් සිදු කර එහි ගුණාත්මකභාවය තහවුරු කිරීමෙන් පසු මෙම ක්‍රියාවලිය සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අයදුම් කර ඇත.

# සමාජ ආර්ථික හා සම්පත් සැලසුම්කරණය

**තේ වතුවල ශ්‍රමිකයන් සේවයට නොපැමිනීම හා සේවය හැර යාම පිළිබඳ අධ්‍යයනය**

කම්කරු හිඟතාවය, තේ කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා බලපාන ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගෙන ඇත. තේ වගාව සඳහා ශ්‍රමිකයන් ලබා ගැනීමට ඇති හැකියාව ඉතා වැදගත් නිශ්පාදන සාධකයක් වන අතර තේ වත්තක කොතරම් කම්කරුවන්ගේ හිඟතාවක් පවතීද යන්න මත එහි පැවත්ම තීරණය කරයි. එම නිසා වතු ක්ෂේත්‍රය තුල කම්කරු හිඟතාවය කොතරම් තීව්‍රද යන්න සොයා බැලීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ප්‍රධාන වශයෙන් මහ වතු ක්ෂේත්‍රයේ කම්කරු හිඟතාවය කොතරම්දුරට පවතීද, එහි බලපෑම කොපමණද යන්න තක්සේරු කිරීම හා මේ සඳහා බලපාන්නාවූ සමාජ ආර්ථික සංසිධීන් හඳුනාගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. කම්කරු හිඟතාවය හා එහි බලපෑම් වලින් මිදීමට සුදුසු ක්‍රියාමාර්ග සොයා බැලීමද මෙහි තව එක් අරමුණකි. ප්‍රථමයෙන් ප්‍රශ්ණාවලියක් ආධාරයෙන් මූලික සමීක්ෂණයක් දියත් කරන ලදී. එමගින් කම්කරු හිඟතාවය දැඩිව පවතින වතු හා වතු ක්ෂේත්‍රය තුල කොතරම් මට්ටමකින් මෙය පවතීද යන්න හඳුනා ගන්නා ලදී. මෙම සමීක්ෂණය ප්‍රාදේශීය වැවිලි සමාගම්, රාජ්‍ය වැවිලි සමාගම, ඇල්කඩුව වැවිලි සමාගම සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වන සියළු වතු ආවරණය වන පරිදි සිදු කරන ලදී. මේ අනුව ශ්‍රී ලංකාවේ දැනට පවතින වතු 337 අතුරින් වතු 307ක්ම මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීය. මෙහි ප්‍රතිඵල වලින් පෙනී යන්නේ වතු 18%ක (වතු 54ක) සිටින ශ්‍රමිකයන් සංඛ්‍යාව දෛනික කම්කරු අවශ්‍යතාවයෙන් 50% ක් පමණ වන බවයි. තවද වතු 49% ක (වතු 150ක) දෛනික කම්කරු අවශ්‍යතාවයෙන් සපුරාගත හැකිව පවතින්නේ 50%-75% පමණි. වතු 14ක එනම් මුළු වතු සංඛ්‍යාවෙන් 5% ක කම්කරු හිඟතාවයක් නොපවතී. තව දුරටත් දත්ත විශ්ලේෂණයේදී පෙනී යන්නේ උඩරට හා ඌව ප්‍රදේශයන්ට සාපේක්ෂව මැදරට හා පහත රට වතුවල මෙම ප්‍රශ්ණය ඉතා උග්‍රව පවතින බවයි. (එනම් මැද රට වතු 39% ක සහ පහත රට වතු 25% ක දැනට කම්කරුවන් සිටින්නේ දෛනික අවශ්‍යතාවයෙන් 50% ක් පමණී).

**තේ වතුවල විකල්ප කම්කරු භාවිත ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනය**

බාහිර වගාකරු (out grower) ක්‍රමයෙහි සමාජ ආර්ථික ශක්‍යතාව නිර්ණය කිරීම සඳහා ශාන්ත කූම්බ්ස් වතුයායේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. බාහිර වගාකරුවන් ලෙස කම්කරුවන් යෙදවීමේ ක්‍රමය හඳුන්වාදීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී පවතින්නාවූ ගැටළු හා දුෂ්කරතාවයන් හඳුනාගැනීම තුලින් මෙම ක්‍රමය සමාජ ආර්ථිකමය වශයෙන් වාසිදායකව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සොයා බැලීම මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. ශාන්ත කූම්බ්ස් වතු යායේ ඉහළ කොටසේ කම්කරුවන් පස් දෙනකු හා පහළ කොටසේ කම්කරුවන් පස් දෙනකු මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී. මෙහිදී ඉහළ කොටසේ කම්කරුවන් සඳහා අයෙකුට තේ පඳුරු 7500ක් හා පහළ කොටසේ එක් අයෙකුට තේ පඳුරු 10500 ක් බැගින් වෙන් කර දෙන ලදී.

අධ්‍යයනයෙන් අනාවරණය වූයේ මෙම ක්‍රමය හඳුන්වාදීම තුලින් අධ්‍යයනයට භාජනය වූ දළු නෙලන්නන්ගේ ඵලදායීතාවය ඉහළ ගොස් ඇති බවය. මෙය ඉහළ හා පහළ තේ කොටස් සැසඳු විට දිනකට නෙළන දළු ප්‍රමාණය පිලිවෙලින් කිලෝ ග්‍රෑම් 36 හා 27ක සාමාන්‍යයක් ලෙස දැක්විය හැක. තවද මොවුන් තම තේ බිම් කොටසෙහි ක්ෂේත්‍රයේ කටයුතු සඳහා දිනකට පැය 6-8ක් වැනි කාලයක් වැය කර ඇති බව ද වාර්ථා විය.

ගණනය කිරීම් වලට අනුව මෙම බාහිර වගා කරුවන්ට අමු දළු කිලෝවක් නිෂ්පාදනය කිරිම සඳහා රුපියල් 26.84 - 36.82 අතර ප්‍රමාණයක් වැය වී ඇත. ශාන්ත කූම්බ්ස් වත්තෙහි දළු කිලෝවක නිශ්පාදන වියදම මෙම අගයට වඩා 37% (රු. 11.86) ක ඉහල අගයක් පෙන්නුම් කරන ලදී. මේ අනුව බාහිර වගාකරුවන්ගේ නිෂ්පාදන වියදම අඩු වීමට හේතු ලෙස ඔවුන්ගේ ඵලදායීතාවය වැඩි වීම හා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සඳහා දිනයේ වැඩි වේලාවක් කැපකිරීම වැනි හේතූන් බලපා ඇති බව පෙනීයයි. වත්තත් සමඟ සංසන්දනය කිරීමේදී, බාහිර වගා කරුවන්ගේ ක්ෂේත්‍ර වල  දළු නෙලීමේ ප්‍රමිතිය, දළු මට්ටම් පවත්වා ගෙන යාම හා පදුරු නඩත්තුව ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. සෙවන පාලනය මායිම් නඩත්තුව හා ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනීම ද සතුටුදායක මට්ටමක පැවතිනි.

තවද ගෘහස්ථ උපකරණ භාවිතය, ආහාර රටාව, වියදම් රටාව වැනි කරුණු විමර්ශණයෙන් හදුනාගත හැකි වූයේ,  ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය පෙර පැවති මට්ටමට වඩා සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරණ බවයි


වත්ත පිලිබඳ සැලකූ විට, බාහිර වගා කරුවන් හට වෙන් කරණ ලද බිම් ප්‍රමාණය වත්තේ පාලනයෙන් ඉවත් වීම තුලින් ඉතිරි කරගත හැකි මිනිස් දින ප්‍රමාණය ශ්‍රමිකයන් හිඟ වත්තක් සඳහා සැලකිය යුතු වාසියකි. සාමානයයෙන් හෙක්ටයාර 8.11 වැනි ප්‍රමාණයක් නඩත්තුවට හා දළු නෙලීමට වාර්ෂිකව මිනිස් දින 2200 ක ප්‍රමාණයක් අවශ්‍යවේ. එය මූල්‍යමය ඉතිරියක් ලෙස ගත් කල රු.මි 1.5 කි. තවද බාහිර වගා කරුවන්ගෙන් ලබා ගත් අමු දළු වල නිමි තේ නිෂ්පාදනයෙන් වත්තට ලැබුනු ආදායම වර්ෂයකට රු.මිලියන 1.6 ප්‍රමාණයකි.

මෙම ව්‍යාපෘතිය ශාන්ත කූම්බ්ස් වත්තෙහි දියත් කිරීමේදී ගැටළු රැසකට මුහුණ දීමට සිදුවිය. ප්‍රධාන වශයෙන් වත්තේ වෘත්තීය සමිති මගින් දැඩි විරෝධතාවයක් පැනනැගීම දැක්විය හැක. තවද වතු සම්ප්‍රදායට හුරුවූ ශ්‍රමිකයන් නව පද්ධතියක් තුලට යොමු කිරීම හා ආකල්පමය වෙනස්කම් ඇති කිරීම තරමක් අපහසු කාර්ය-යක් විය. බාහිර වගා කරුවන්ට තම ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් කරගෙන යාමට වත්ත පාර්ශවයෙන් අවශ්‍ය සහයෝගය නොපමාව නොලැබීම ඔවුන් මුහුණ දුන් තවත් දුෂ්කරතාවයකි. මෙම අධ්‍යයනයෙන් හදුනාගත් ප්‍රධාන කරුණක් නම් අමු දළු වල ප්‍රමිතිය විශ්ලේෂණය හා නිරන්තර ක්ෂේත්‍ර පරික්ෂාව සිදුකිරීම ඉතා වැදගත් බවයි.

**Cost of soil fertility management strategies in different plantation companies**




**Overall share of investment on each soil fertility management strategy in tea lands**



දත්ත විශ්ලේෂණයෙන් පෙනී යන්නේ මෙම බාහිර වගාකරු ක්‍රමවේදය සමාජ ආර්ථිකමය වශයෙන් වාසි දායක වන බවයි. නමුත් නිශ්චිත නිර්දේශයන් ලබා දීම සඳහා මෙම දත්ත යොදා ගැනීම අසීරුය. මෙවැනි අධ්‍යයනයක් සඳහා ශාන්ත කුම්බිස් වත්ත තුල සුදුසු වාතාවරණයක් නොපැවතීම මෙයට ප්‍රධානතම හේතුව වේ. මෙහි පවතින කම්කරු අතිරික්තය මෙවැනි අධ්‍යයන සඳහා සුදුසු නොවීමට එක් කාරණාවකි. එම නිසා සුදුසු තත්වයන් පවතින වත්තක මෙවැනි අධ්‍යයනයක් සිදුකිරීම වඩාත් යෝගය වේ.

පැවති සීමිත තත්වයන් හේතුවෙන් මෙම අධ්‍යයනය කුඩා නියැදියකට සීමා කිරීමට සිදුවිය. එය නිශ්චිත නිර්දේශයන් කරා යාමට ප්‍රමාණවත් නොවේ. විවිධ ඵලදායිතා මට්ටම් යටතේ මෙම පර්යේෂණය සිදු කල යුතු වුවත් ශාන්ත කුම්බිස් වත්ත සාපෙක්ෂව ඵලදායිතාවය ඉහල මට්ටමක් ඇති වත්තක් හෙයින් අවශ්‍ය පරිදි ප්‍රතිවලිත පර්යේෂණයක් සිදුකිරීමට නොහැකි විය. පවුලකට නඩත්තු කල හැකි ආර්ථිකමය ලාභදායි උපරිම පදුරු ප්‍රමාණය නිර්ණය කිරිමද මෙහි එක් අරමුණක් වුවත් ඒ සඳහා දත්ත ප්‍රමාණවත් නොවීය. නමුදු ලබා ගත් දත්තයන්ට අනුව, පදුරු 7500ක් පවුලේ ශ්‍රමය පමණක් භාවිතයෙන් නඩත්තු කර ගත හැකි වුවත් පදුරු 10500 ක් නඩත්තු කිරීමට කුලී ශ්‍රමිකයන් යොදා ගැනීමට සිදුවන බව පෙනේ. තවද විවිධ හේතූන් නිසා මෙම පර්යේෂණය වසරක කාලයකට සීමා කිරීමට සිදුවිය. නමුත් සම්පූර්ණ අධ්‍යයනයක් සිදු කිරීමට වසරක කාලයක් ප්‍රමාණවත් නොවේ.

**ශ්‍රී ලංකාවේ වතු ක්ෂේත්‍රය හා ග්‍රාමීය ශ්‍රමිකයන්ගේ ජීවන වෘත්තීය සුරක්ෂිතතාවය**

වතු ක්ෂේත්‍රය හා ග්‍රාමීය ශ්‍රමිකයන්ගේ ගෘහස්ථ ජීවන සුරක්ෂිතතාවය නිර්ණය කිරීම හා ඔවුන් මුහුණ පාන්නාවූ දුෂ්කරතාවයන් හඳුනාගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවුල් 180 ක් ආශ්‍රිතව (වතු ක්ෂේත්‍රය පවුල් 90, ග්‍රාමීය පවුල් 90) මෙම අධ්‍යනය සිදු කරන ලදී. ස්ථිරභවිත සසම්භාවි (stratified Random) ක්‍රමය අනුගමනය කරමින් නියැඳිය තෝරා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා සවිස්තරාත්මක අනුක්‍රමික ක්‍රම උපයෝගී කරගන්නා ලදී.

දත්ත විශ්ලේෂණයෙන් හඳුනාගත හැකි වූයේ, වතු ක්ෂේත්‍රය තුළ පෝෂණය පිළිබඳව වන සුරක්ෂිතතාවය ග්‍රාමීය ප්‍රදේශයන්ට වඩා ඉහළ මට්ටමක පවතින බවයි. මේ සඳහා වතු ක්ෂේත්‍රයේ තිරිඟු පිටි පරිභෝජනය ප්‍රධාන ලෙස බලපා ඇති බව අපගේ නිරීක්ෂණයයි. මක් නිසාද යත්, තිරිඟු පිටි මඟින් ලබාදෙන කැලරි ප්‍රමාණය ප්‍රතිශතාත්මකව ඉහළ අගයක් ගැනීමයි. ආර්ථිකමය සුරක්ෂිතතාවය සැලකූ විට ග්‍රාමීය ශ්‍රමිකයන් වතු ක්ෂේත්‍රයට වඩා ඉහළ තත්වයක ඇතිබව පෙන්නුම් කරන ලදී. එනමුදු එම අගයන් අතර සැලකිය යුතු වෙනසක් නොපැවතුණි. මෙම අධ්‍යයනයෙන් ඉස්මතු වූ තවත් වැදගත් කාරණයක් නම්, ග්‍රාමීය ජනතාවගේ අධ්‍යාපනය හා සෞඛ්‍ය සුරක්ෂිතතාවයන් වතු ක්ෂේත්‍රයට වඩා සාපේක්ෂව අඩු මට්ටමක පවතින බවයි. තව ද සමස්ත වාසස්ථාන සුරක්ෂිතතාවය වතු ක්ෂේත්‍රය තුළ පහළ මට්ටමක පවතින බව පෙන්නුම් කරන ලදී. මෙම අධ්‍යනයේ ප්‍රතිඵල උපයෝගී කර ගනිමින් ගෘහස්ථ ජීවන සුරක්ෂිතතාවයන් ඉහළ නැංවීමේදී, ග්‍රාමීය හා වතු ක්ෂේත්‍රයන් සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රතිපත්ති සකස් කල යුතුය.

**ලෝක තේ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ සංසන්දනාත්මක වාසිදායක බව සොයා බැලීම**

අනෙකුත් තරඟකාරී රටවල් සමඟ සංසන්දනය කිරීමේදී අධ්‍යයන වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා තේ භූමි ප්‍රමාණයන්හි, කිසිදු වර්ධනයක් පෙන්නුම් නොකරන ලදී. තව ද ගැනුම්කරුවන් විසින් පසුගිය දශකය තුළ සිදුකල අපනයන ප්‍රමාණයන්හි වර්ධනයක් පෙන්නුම් නොකරන ලදී.

සැලකිය යුතු මට්ටමින් භූගෝලීය වශයෙන් විවිධාංගිකරණයක් ක්‍රියාත්මක වුවද මේ වනතුරුත් 37%ක තේ ප්‍රමාණයක් පවතිනුයේ, වෙළඳපලවල් තුනක පමණි. තව ද ශ්‍රී ලංකා තේ අපනයනය සඳහා සැලකිය යුතු දායකත්වයක් නොදරන ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ජර්මනිය, එක්සත් රාජධානිය සහ පාකිස්ථානය යන රටවල් විශාල ලෙස තේ ආනයනය කරන රටවල් වේ. එබැවින්, මෙම රටවල් ශ්‍රී ලංකා තේ සඳහා වෙළඳපොලවල් ලෙස යොදා ගැනීමට විභවයක් පවතී.

බැලස්සා (ඊකී) දර්ශකයේ අගය සැලකූ විට ශ්‍රී ලංකාවේ තේ සඳහා 300-400 ත් අතර අගයක පවතී. විවිධ තේ නිෂ්පාදන අතරින් තේ වෙළඳපොලට සංසන්දනාත්මක වාසියක් ලබාදිය හැකි නිෂ්පාදනයක් හඳුනාගැනීම වැනි ගැඹුරු විශ්ලේෂණයන් සඳහා මෙම දර්ශකය යොදා ගත හැකිය. සමස්ත බැලස්සා දර්ශකයේ අගය සම්පූර්ණ වශයෙන් රඳා පවතිනුයේ අපනයනය කරන්නා වූ කළු තේ ප්‍රමාණය මතය. වැඩිදුර ප්‍රතිඵල විශ්ලේෂණයේදී හඳුනාගත හැකි වූයේ, ඉදිරි කාලයේදී ද ශ්‍රී ලංකාවේ තේ සඳහා ලෝක තේ වෙළඳපලෙහි බලාපොරොත්තු සහගත තත්ත්වයක් පවතින බවයි.

**මැදරට තේ ඉඩම්වල පාංශු පෝෂණ කළමනාකරණ ක්‍රම සඳහා සිදුකරන ආයෝජනයන්හි ප්‍රතිලා-භය නිර්ණය කිරීම**

ශ්‍රී ලංකාවේ තේ ඉඩම්වලට බලපාන්නා වූ ප්‍රධාන පාරිසරික ගැටලුවක් ලෙස ඉඩම් හායනය හඳුන්-වාදිය හැකිය. මැදරට ඉඩම්වල පවතින අධික බෑවුම් සහිත බව හා පාංශු කළමනාකරණ ක්‍රමෝපායන් යොදා ගැනීමේ දුර්වලතාවයන් මේ සඳහා හේතු වී ඇති බව පෙනී යයි. තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුව පාංශු පෝෂණ කළමනාකරණ ක්‍රමෝපායන් යොදා ගැනීම මගින් තේ ඉඩම්වල පාංශු පෝෂණ මට්ටම ඉහළ නැංවිය හැකිය. තවද මේ සඳහා සිදු කරන ආයෝජනවලින් වාසිදායක ප්‍රතිලාභ ලබාගත හැකිය.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, මෙම ආයෝජනයන්හි ප්‍රතිලාභය නිර්ණය කිරීමයි. අවශ්‍ය ද්විතියික දත්ත මැදරට තේ වතු 15 ක වසර දහයක වාර්තාවලින් ලබාගන්නා ලදී. මූල්‍ය විශ්ලේෂණයේදී අනාවරණය වූයේ, ප්‍රධාන කාණු ගල් වැටි මුල්ලු ගැසීම හා කාබනික පොහොර සඳහා ආයෝජනය කිරීම තුළින් ඉහළ ප්‍රතිලාභයක් ලබාගත හැකි බවයි.

හරස් කාණු, ප්‍රධාන කාණු ගල් වැටි හා මුල්ලු ගැසීම තේ එලදාව වර්ධනය කරගැනීම සඳහා ධනාත්මක ලෙස බලපාන බව පෙන්නුම් කරන ලදී. කෙසේ නමුදු රාජ්‍ය අංශයේ මෙන් ම පුද්ගලික අංශයේ වතු වලද පාංශු පෝෂණ කළමනාකරණ ක්‍රමෝපායන් තේ පර්යේෂණායතනයේ නිර්දේශිත මට්ටමෙහි නොපවතින බව නිරීක්ෂණය විය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වලින් පෙන්නුම් කෙරෙනුයේ පාංශු පෝෂණ කළමනාකරණය සඳහා ප්‍රතිපත්තිමය සැකසුම්වල අවශ්‍යතාවය තේ කර්මාන්තයේ පැවැත්මට ඉතා වැදගත් බවයි.

**GIS තාක්ෂණය භාවිතයෙන් තේ ඉඩම් සිතියම් ගත කිරීම**

කලුතර, කෑගල්ල, මාතර, රත්නපුර සහ මහනුවර දිස්ත්‍රික්කවල තේ සහ රබර් ඉඩම් සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. ඉඩම් පරිහරණ සහ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ තේ සහ රබර් ඉඩම් සිතියම් ගත කිරීම නිමාකර තිබේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම පිණිස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් රැස්වීම් ගණනාවක් කැඳවනු ලැබීය. ශෂ්‍ය විද්‍යා අංශයේ නිලධාරීන් ඉඩම්පරිහරණ සහ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කටයුතු වලදී සහ සිතියම් නිවැරදි කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.

# සේවා ලාභීන් සඳහා සේවාවන්

2013 - 2017 සංයුක්ත සැලස්මට අනුව උපදෙස් හා ව්‍යාප්ති අංශය මඟින් සිදුකරන උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සහ ව්‍යාප්ති අධ්‍යයනයන් පහත පරිදි වේ.

**උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන්**

**ප්‍රධාන අරමුණු** - තේ වතු වල වගා කටයුතු සම්බන්ධ ගැටළු විසඳීම, තේ වගා කරුවන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම, සහභාගිත්ව ක්‍රමයෙන් සේවා ලාභීන් වෙත තේ තාක්ෂණය ප්‍රචාරණය කිරීම

**විශේෂ අරමුණු**

1) ප්‍රාදේශිය වැවිලි සමාගම් වතු හා කුඩා තේ වතු සඳහා නව තාක්ෂණය තොරතුරු ප්‍රචාරණය කිරීම.
2) තේ වගා ක්‍රම පිළිබඳව තේ වගා කරුවන් පුහුණු කිරීම සහ කුසලතා වැඩිදියුණු කිරීම
3) තේ පර්යේෂණායතනයේ නිර්දේශිත යහපත් කෘෂිකාර්මික ක්‍රම පිළිබඳ තේ වගා කරුවන් ගේ දැනුම යාවත්කාලීන කිරීම
4) තේ කර්මාන්තයේ වර්තමාන තත්වය පිළිබඳ තේ වගා කරුවන්ගේ ප්‍රතිචාර රැගෙන ඒම
5) තේ වගාවේ සහ නිෂ්පාදනයේදී වන පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනිම

**ප්‍රගතිය**

සැලසුම් කරන ලද උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන් බොහොමයක් අවසන් කර ඇත. එක් එක් ප්‍රදේශයේ තේ වගා කරුවන්ගේ ඉල්ලීම මත සිදුකරන ලද උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම් පහත වගුවේ දක්වා ඇත.



| ප්‍රධාන ව්‍යාප්ති වැඩසටහන් | TK | RT | Ky | Gl | Den | Uva | Kal | TOTAL |
|---|---|---|---|---|---|---|---|---|
| පැමිණි අමුත්තන් | 4,113 | 1207 | 848 | 534 | 1228 | 630 | 95 | 8,655 |
| උපදෙස් ලිපි හා වාර්තා | 571 | 549 | 92 | 188 | 604 | 120 | 328 | 2,452 |
| උපදෙස් චාරිකා | 173 | 119 | 40 | 72 | 157 | 28 | 56 | 645 |
| කණ්ඩායම් පුහුණු ප්‍රවේශ | 51 | 25 | 45 | 77 | 82 | 21 | 40 | 341 |
| ප්‍රකාශන බෙදාහැරීම | 652 | 305 | 317 | 119 | 434 | | 67 | 1,894 |
| පී.එච් පරීක්ෂා (පස්) සඳහා | - | 691 | 479 | 396 | 450 | 871 | 176 | 3,063 |
| පාංශු කාබන් සඳහා පරීක්ෂා | - | - | - | - | 18 | 541 | - | 559 |
| වටපණුවන් සඳහා පස් පරීක්ෂා | - | - | 07 | - | 30 | - | - | 37 |
| වාණිජ තේ තවාන් පරීක්ෂා | - | 07 | 51 | 21 | 93 | 88 | 23 | 283 |
| අනුවර්තී පරීක්ෂණ සඳහා සහභාගි වීම | 19 | | 48 | - | 11 | - | 11 | 89 |
| ප්‍රදර්ශන / බෝග සායන | වතුරව/කලවානේ පැවති කුඩා පරිමාණ  බෝග සායනය<br><br>ගුරුදෙණිය පුහුණු පාසලේ සහ මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයේ පැවති ප්‍රදර්ශන සඳහා සහභාගි විය | | | | | | | |

TK- තලවාකැලේ, RT- රත්නපුර, Ky- මහනුවර Gl- ගාල්ල, Den- දෙනියාය Uv බදුල්ල, Kal- කළුතර

### 1. ගැටළු හඳුනා ගැනිම සහ විසඳීම

සමාගම් වතු අංශයේ කළමණාකාරිත්වයෙන් සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉල්ලීම මත තේ වගාව ආශ්‍රිත ගැටළු හඳුනා ගැනීමට සහ ඒවාට විසඳුම් ලබාදීම සඳහා  එක් එක්  වතු වලට උපදෙස් චාරිකා සිදුකිරීම මෙම වසරේදීද සිදුකල ප්‍රධානතම කටයුත්තකි. තවද, වතු සංවර්ධනය කිරීම හා සම්බන්ධ  උපදෙස් ලබාදීම සඳහා මහවතු මෙන්ම කුඩාවතු කිහිපයක් සඳහාද උපදෙස් චාරිකා සිදුකරන ලදී. ගැටළු හඳුනාගැනීම සඳහා කුඩා තේ වතු අංශයෙන් කරන ලද ඉල්ලිම් සඳහා කුඩා තේ වතු  සංවර්ධන අධිකාරියේ නිළධාරින්ගේ  සහභාගිත්වයද ඇතිව ඒ සඳහා යොමු වන ලදී.

### 1.1 උපදෙස් හා ව්‍යාප්ති චාරිකා

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ  කාර්ය මණ්ඩලය විසින් මහ වතු සහ කුඩා තේ වතු  සඳහා උපදෙස් හා ව්‍යාප්ති චාරිකා 645 ක් සිදුකර ඇත. මින් ප්‍රධාන වශයෙන් මහවතු අංශය සඳහා උපදෙස්  චාරිකා 172 ක් උඩරට ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින්ද, විශේෂයෙන්ම කුඩා තේ වතු අංශය සඳහා උපදෙස්  චාරිකා 157 ක් දෙනියාය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන්ද සිදුකර ඇත. පහතරට ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් චාරිකා 119 ක් සිදුකර ඇත.

මහනුවර, මතුගම, කොට්ටව සහ ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පිළිවෙළින් චාරිකා 40, 56, 72 සහ 28 ක් සිදුකර තිබේ. මේවා අතුරින් බොහොමයක් චාරිකා සිදු කර ඇත්තේ නැවත තේ සිටුවීම සඳහා ඉඩමේ යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සඳහායි. අනෙකුත් උපදෙස් චාරිකා අස්වනු අඩුවීම සඳහා හේතු සොයා බැලීම, පළිබෝධ හානි, තේ පඳුරු දුර්වල වීම, තවාන් පාළු වීම සහ පළිබෝධ හා රෝග නිශ්චය කිරීම වැනි ඒවා විය. වසර තුළ හමු වූ විශේෂිත ගැටළු ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, කළවාන සහ කහවත්ත ප්‍රදේශවල ඇති වූ තේ පසු මැරීමේ තත්වය (die-back), ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්ගොඩ, යක්කලමුල්ල ප්‍රදේශවලද මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය, ගම්පොළ ප්‍රදේශවලින් හමු වු දෙනියාය කුඹියා (*cropyga acutiventris*) ගේ ගැටළුව ප්‍රධාන ලෙස හඳුනාගත හැකි විය.

## 1.2 කණ්ඩායම් පුහුණු ප්‍රවේශ

සමාගම් වතු අංශයේ නිළධාරින් සඳහාත් කුඩා තේ වතු හිමියන් සඳහාත් ඔවුන්ගේ ඉල්ලීම මත 2015 වසර තුළදී සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු කිරීම් ආදි වැඩසටහන් 341ක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් අතරින් බොහොමයක් පස සාරවත් කිරීම සඳහා තේ පර්යේෂණායතන නිර්දේශ අනුගමනය කිරීමේ වසරල යන විශේෂ වැඩසටහන යටතේ පවත්වන ලද ඒවාය. තවද, දින 100 වැඩසටහන යටතේ පාංශු හා ශාක පෝෂක අංශයේ නිළධාරින්ගේ සහයෝගීත්වය ඇතුව පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ පරිපූරක ව්‍යාප්ති කණ්ඩායම් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්ද විය. මේවාට අමතරව පසු මැරීමේ රෝගය බහුලව පවත්නා බලංගොඩ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්, යහපත් කෘෂිකාර්මික ක්‍රියාවිධි අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා රත්නපුර ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිළධාරින් විසින් විශේෂ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## 1.3 නේවාසික පුහුණු වැඩසටහන්

ජාතික වැවිලි කළමණාකරණ ආයතනයේ සම්බන්ධීකරණයෙන් පාසල් අධ්‍යාපනය නිම කළ ශිෂ්‍යයන් සඳහා තේ පිළිබඳව නේවාසික පුහුණු වැඩසටහන් ජූනි මස 23-29 දක්වා (දින 7) තේ පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලද්දේ උපදෙස් නිළධාරි හිරෝමි නිශාන්ති මහත්මියයි. බගවන්තලාව වැවිලි සමාගමේ නියෝජ්‍ය/සහකාර කළමණාකරුවන් සඳහා තේ වගාවේ සියළුම වගා කටයුතු සහ නිෂ්පාදන කටයුතු ආවරණය වන සේ විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## 2. සහභාගිත්ව තාක්ෂණ ප්‍රචාරණ ක්‍රියාකාරකම්

### 2.1 ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදය (RTEF)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සියළුම ප්‍රාදේශීය කළමණාකරණ ප්‍රදේශ ( 8 ) ආවරණය වන පරිදි කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වය ඇතිව ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසද 14ක් පවත්වන ලදී. මේවා අතරින් විශේෂ සංසද 7ක් තේ සංවර්ධන සමිති සාමාජිකයන් 100-125ක පමණ සහභාගිත්වය ඇතිව පවත්වන ලදී. මෙහිදී තේ ඉඩම්වල පසේ සාරවත් බව කළමණාකරණය පිළිබඳ සෛධාන්තික හා ප්‍රායෝගික කරුණු සැළකිල්ලට ගන්නා ලදී. මෙම ප්‍රාදේශීය සංසද තුළින් මතුවන විශේෂ කරුණු පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයේදී මෙන්ම තේ පර්යේෂණ ආයතනය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අන්තර් සම්බන්ධතා කමිටු රැස්වීමේදී තව දුරටත් සාකච්ඡා කෙරේ.
තේ ඉඩම්වල පසේ සරුබව කළමණාකරණය කිරීම සම්බන්ධව පවත්වන ලද ක්ෂේත්‍ර ආදර්ශන පහත සඳහන් තේමා යටතේ ක්‍රියාත්මක විය.

- කප්පාදු කොටස් වළ දැමීම
- පරිණත තේ ක්ෂේත්‍ර මුල්ලු කිරීම
- තේ කර්මාන්තශාලා වලින් සහ තේ ක්ෂේත්‍ර වලින් ලබාගත හැකි ද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය
- පස සංරක්ෂණය කිරීමේ විවිධ ව්‍යූහ
- පාංශු ඛාදනය අවම කිරීම සඳහා ආවරණ බෝග වගා කිරීම
- තේ ඉඩම්වල දෙවැටි වගා ක්‍රමය (SALT) ස්ථාපනය සහ පවත්වා ගැනීම
- තේ ක්ෂේත්‍රවල සෙවණ කළමණාකරණය
- පරිණත තේ වගාවන් සඳහා රසායනික පොහොර විද්‍යාත්මක ලෙස භාවිතා කිරීම
- පසේ සරු බව වැඩිදියුණු කිරීම සඳහා පාංශු පුනරුත්ථාපනය
- තේ සඳහා කොළ පොහොර ආවරණ බෝග සහ ගැඩවිල් කොම්පෝස්ට් භාවිතය

### 2.2 කුඩා තේ වතු අංශය සඳහා පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය

උපදෙස් නිළධාරි සී ජේ ලියනාරච්චි මහතා මෙම සංසදයේ සම්බන්ධීකාරක වේ. මෙම සංසදය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ SLPTOA තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය සහ තේ සංවර්ධන සමිතිවල නිළධාරින්ගේ සහභාගිත්වයෙන් වසරකට දෙවතාවක් පැවැත්වේ. සැසි 2ක් පැවැත්වීමට නියමිතව තිබුණ නමුත්, නොවැළැක්විය හැකි කරුණු මත 2015 වසරේදි පවත්වනු ලැබුයේ එක් වැඩසටහනක් පමණි.

### 2.3 සමාගම් වතු අංශය සඳහා පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය

මෙම වසරේදි සමාගම් වතු අංශය සඳහා පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද 2ක් පැවැත්විණි. නියෝජ්‍ය අධ්‍යක්ෂ -පර්යේෂණ (නිෂ්පාදන), ආචාර්ය කීර්ති මොහොට්ටි මහතා මෙම සංසදය සම්බන්ධීක-රණය කළේය.

**2.4 ප්‍රාදේශිය විද්‍යාත්මක කමිටු රැස්වීම (RSC)** ප්‍රාදේශිය විද්‍යාත්මක කමිටු විසින් වැඩසටහන් 3ක් සංවිධානය කරන ලදී. මෙමගින් කෑගල්ල/ රත්නපුර / කලුතර/ ඌව සහ දික්ඔය/ ගාල්ල/ මාතර ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු ආවරණය කරන ලදී. මෙම ප්‍රාදේශිය විද්‍යාත්මක කමිටු රැස්වීම් වලදී පසේ සාරවත් බව කළමණාකරණය කිරීම සහ පොහොර භාවිතය යන මාතෘකා සාකච්ඡාවට භාජනය කරන ලදී. රත්නපුර, කෑගල්ල, සහ කලුතර දිස්ත්‍රික්කයන්හි කළමණාකාරවරුන් සහ සහකාර කළමණාකාරවරුන් සඳහා වු ප්‍රාදේශිය විද්‍යාත්මක කමිටුවේදි සාකච්ඡාවට බඳුන් වූ තේමාව වූයේ පසේ සරුබව වැඩිදියුණු කිරීම තුළින් ඉහළ නිෂ්පාදිතාවයක් ලබාගැනීම යන්නයි. මෙය 2015 ජූනි මස 18 වැනි දින රත්නපුර, තේ පර්යේෂණ ආයතන පහතරට ප්‍රාදේශිය මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදි කළමණාකාරවරුන් සහ සහකාර කළමණාකාරවරුන් 110ක ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. ඉදිරිපත්කිරීම් හැරුණුවිට ගැඩවිලි කොම්පෝස්ට්, තේ වතුවල පස සුරැකීමේ පනත ක්‍රියාත්මක කිරීම, කප්පාදු කොටස් වළ දැමිම සහ පාංශු හායනයේ ආර්ථික විශ්ලේෂණය යන මාතෘකා යටතේ ප්‍රායෝගික සැසි පවත්වන ලදී.

**3. තොරතුරු ප්‍රචාරණය**

විවිධ මාතෘකා යටතේ වූ ලිපි සහ මහවතු සහ කුඩා තේවතු වල චාරිකා වලට පසු ලියන ලද උපදෙස් ලිපි 2452 ක් 2015 වසරේදී උපදෙස් අංශයෙන් නිකුත් කර ඇත. මේවායින් වැඩි ලිපි ප්‍රමාණයක් නිකුත් කර ඇත්තේ අවුරුද්දේ දෙවන කාර්තුව තුළදීය. මෙම කාලය තුළ ලිපි වැඩි ප්‍රමාණයක් නිකුත් කිරීමට හේතුව වූයේ 2015 පසේ සරු බව කළමණාකරණය කිරීමේ වසර වූ නිසාත් බලංගොඩ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගේ ගැටළු ආශ්‍රිත ක්‍රියාකාරාකම් නිසාත්ය.

**සමාගම් තේ වතු අංශය සඳහා පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය (PE)**

**අරමුණු**

1. සමාගම් වතුවල පහළ මට්ටමේ සේවකයන් වෙත (grass root level) තේ පර්යේෂණායතන ව්‍යාප්ති සේවාව ලබාදීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම.
2. කම්කරුවන්ගේ දැනුම, ආකල්ප සහ යහපත් කෘෂිකාර්මික ක්‍රියාවිධි අනුගමනය කිරීම වර්ධනය කිරීම

2015 වසරේදී පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශ (PEA) ව්‍යාපෘතිය වටවල, කැළණිවැලි සහ කොටගල වැවිලි සමාගම්වල සහයෝගයෙන් සිදුකරගෙන යන ලදී. වැවිලි සමාගම් තුළ පහල මට්ටමේ අය (කම්කරුවන්) වෙත ඵලදායි තාක්ෂණ ප්‍රචාරන ගලායැමේ ක්‍රමවේදයක් සැකසීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. තේ වතුවල තෝරාගත් ක්ෂේත්‍ර නිළධාරි කණ්ඩායමක් පරිපූරක පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සහ ඔවුන් විසින් පහළ මට්ටමේ සිටින කම්කරුවන් සඳහා තේ ක්ෂේත්‍ර පාසල් පවත්වමින් නිරන්තර පුහුණුව ලබාදීම පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශය තුළින් සිදුවේ. මෙතුළින් පහළ මට්ටමේ සිටින කම්කරුවන්ගේ දැනුම සහ යහපත් කෘෂිකාර්මික ක්‍රියාවිධි වලට යොමුවීම වැඩිදියුණු කිරීම අරමුණු කරඇත. ව්‍යාප්ති අවශ්‍යතා සහ ගැටළු හඳුනාගෙන පරිපූරක පුහුණුකරුවන් විසින් පහල මට්ටමේ අය සඳහා පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් පවත්වනු ලබයි. ක්ෂේත්‍ර නිළධාරින් 30-50ක් පමණ සමන්විත වන පරිපූරක පුහුණකරුවන් කණ්ඩායමක් සඳහා කෘෂිකර්මය හා සන්නිවේදනය පිළිබඳව පුහුණුව ලබා දේ. (තේ පැළ නිෂ්පාදනය, නැවත සිටුවීම සහ නඩත්තු කටයුතු, දළු නෙළීම, කප්පාදුව, නියඟයෙන් ආරක්ෂා වීමට ගතයුතු ක්‍රියාමාර්ග, පසේ සාරවත් බව කළමණාකරණය, සෙවන කළමණාකරණය, ඒකාබද්ධ වල්පැළ පාලනය, ඒකාබද්ධ පළිබෝධ හා රෝග පාලනය සහ ඵලදායි ලෙස පළිබෝධනාශක යෙදීම)

**වසර තුළදී පවත්වන ලද පරිපූරක ව්‍යාප්ති ප්‍රවේශ ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | වැවිලි සමාගම් | | | |
|---|---|---|---|---|
| | වටවල වැවිලි සමාගම | කැළණි වැවිලි සමාගම | කොටගල වැවිලි සමාගම | එකතුව |
| තේ.ප.ආ විසින් පරිපූරක පුහුණුකරුවන් පුහුණු කිරීම | පරිපූරක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් -1 | පරිපූරක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්- 2 | පරිපූරක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්- 3 | 6 |
| පරිපූරක පුහුණුකරුවන් විසින් පවත්වනු ලැබූ තේ ක්ෂේත්‍ර පාසල් | 6 | 3 | 4 | 13 |
| කෘෂි තොරතුරු මධ්‍යස්ථාන (නව) | - | - | - | 0 |
| ආදර්ශන/ වගා ක්ෂේත්‍ර සඳහා චාරිකා | 2 | 4 | 5 | 11 |
| පරිපූරක පුහුණුකරුවන් තේ.ප.ආ වෙතපැමිණ, හඳුනාගැනීමේ චාරිකා | 1 | 1 | 1 | 3 |
| තරඟ (ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන්) | - | 2 | 2 | 4 |
| ඇගයීම/ සමාලෝචන වැඩසටහන | 2 | - | - | 2 |
| ත්‍යාග ප්‍රදාන උත්සව | 1 | - | - | 1 |

**ව්‍යාප්ති සහ ඉගැන්නුම් ආධාරක සැලසුම්කරණය සහ නිපදවීම**

**අරමුණු:** තාක්ෂණය ප්‍රචාරණය කිරිම සඳහා අවශ්‍ය අධ්‍යාපනික, ව්‍යාප්ති ද්‍රව්‍ය නිපදවීම සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සහ මුද්‍රිත ප්‍රකාශන ප්‍රදර්ශන පිණිස තැබීම

**ප්‍රගතිය**
ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීමට, තොරතුරු ප්‍රචාරණය සහ ප්‍රචාරාත්මක වැඩසටහන් සඳහා අවශ්‍ය ව්‍යාප්ති සහ අධ්‍යාපනික තොරතුරු උපදෙස් අංශයේ කාර්ය මණ්ඩලය විසින් සම්පාදනය කරන ලදී.

• තලවකැලේ, තේ පර්යේෂණායතන තොරතුරු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරිම සඳහා Slim light box 1ක් සහ crystal digital box 6 ක් නිපදවිම.

• තේ තවාන් පාලනය බිත්ති පෝස්ටරය නැවත මුද්‍රණය කිරීම දැයට කිරුළ ප්‍රදර්ශනයේදී බෙදා දීම සඳහා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සහ තේ පර්යේෂණ ආයතනය නම් පොත් පංච භාෂා ත්‍රිත්වයෙන්ම නැවත මුද්‍රණය කිරීම

• තේ තතු පුවත්පතේ කළාප දෙකක් (වෙලුම 12, අංක 1 සහ 2) නිකුත් කිරීම

පසේ සාරවත්බව කළමනාකරණය උදෙසා තේ පර්යේෂණායතන නිර්දේශ භාවිතයට ගැනීමේ වසර නම් විශේෂ ව්‍යාපෘතිය යටතේ නිපදවන ලද අනෙකුත් ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රවය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති ප්‍රගති වාර්තාවේ සඳහන් කර ඇත.

**නව තේ ප්‍රභේද වල අතු ලබාදිම - ADB මව්ශාක ව්‍යාපෘතිය**
මෙම ව්‍යාපෘතිය 1999 දි ආරම්භ කල අතර 2015 වසර අවසන් විමත් සමග ව්‍යාපෘති කාල සීමාවද අවසන් විය. තේ.ප.ආ 3000 ශ්‍රේණියේ සහ 4000 ශ්‍රේණියේ වැඩිදියුණු කළ තේ ප්‍රභේද තේ වගා කරුවන් වෙත නිකුත් කිරීම සම්බන්ධීකරණය කිරීම උපදෙස් හා ව්‍යාප්ති අංශය මඟින් සිදුකරන තවත් වැදගත් සේවාවකි. විවිධ තේ වගා ප්‍රදේශයන්හි ස්ථාපිත මව් ශාක වගාවන් පවත්වා ගැනීම හා අතු රිකිළි නිකුත් කිරීම පිළිබඳ උපදෙස් ලබාදීමේ සේවාව, මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක වන ජේ සී කේ රාජසිංහ මහතා සිදුකරයි. මෙම වසර තුළදි මහවතු හා කුඩාවතු යන අංශ දෙකටම මව් ශාක ව්‍යාපෘතිය මඟින් මිලියන 5.5 කට ආසන්න (අතු රිකිලි 5,557.525) අතු රිකිළි ප්‍රමාණයක් නිකුත් කර ඇත. වසර තුළදි අතු රිකිළි මිලියන 9.54 ක් නිකුත් කිරිමට තක්සේරු කර තිබිණි. මව් ශාක ව්‍යාපෘතිය මඟින් අදාල වසර තුල අතු රිකිළි නිකුත් කිරීම දුර්වල මට්ටමක පැවතීම සඳහා පහත කරුණු හේතු වී ඇත.

• ඉලක්ක වෙත ළඟා නොවිමට ප්‍රධාන වශයෙන්ම බලපෑ හේතුව වූයේ අවශ්‍යම කාල වලදී පැවති අහිතකර කාලගුණික තත්ව සහ සමහර ප්‍රභේද සඳහා ඉල්ලුමක් නොමැති වීම

• තේ වගා කරන බොහෝ ප්‍රදේශ වල එක දිගටම පැවති අධික වර්ෂාව නිසා වාණිජ තේ තවාන් මෙන්ම අනෙක් කුඩා පරිමාණ තේ තවාන් ආරම්භ කිරීම සඳහා බාධා පැවතිම

• වර්ෂාවත් සමඟ පැවති අඳුරු කාලගුණික තත්වය අතු රිකිළි වර්ධනයට හිතකර නොවීම

• පස් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් රජය විසින් පනවා ඇති නීති, බොහෝ ප්‍රදේශ වල තවාන් පවත්වා ගැනීමට අහිතකර ලෙස බලපෑම. අතු රිකිළි නිකුත් කරන අවස්ථාවේදි තවාන් වල තවාන් මළු පස් පුරවා සකස් කර නොතිබීම

• අමු දළු වල මිල පහත වැටීම නිසා විශේෂයෙන්ම පහතරට, කුඩා තේ වතුවල සංවර්ධන කටයුතු නිසියාකාර ලෙස සිදු නොවීම

**තේ පාර්ශව කරුවන් සමග පැවති අන්තර් සබඳතා**
**අරමුණු**
■ තේ වගා කරුවන් සමග අන්තර් සබඳතා ශක්තිමත් කිරීම සඳහා ව්‍යාප්ති ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
■ තේ වගාකරුවන්, පාසල් ළමුන් සහ සාමාන්‍ය මහජනතාව අතර තේ තාක්ෂණය සහ තේ පර්යේෂණායතනයේ වැඩ කටයුතු පිලිබඳ දැනුවත් භාවය වැඩිකිරීම

**Progress**
තේ වගා කරුවන් සමග අන්තර් ක්‍රියාකාරකම් සහ මහජන සම්බන්ධතා වැඩ කටයුතු

තේ පර්යේෂණායතනය වෙත පැමිණි අමුත්තෝ : අධ්‍යාපනික සහ දැනුවත් වීම උදෙසා තේ වගා කරුවන්, ශිෂ්‍යයන් සහ විදේශිකයන් 8655 ක් පමණ තේ.ප.ආයතනය වෙත පැමිණ ඇත. මොවුන් අතරින් බහුතරය අධ්‍යාපනික වැඩසටහන් සඳහා පැමිණි පාසල් ළමුන්ය.

**බෝග සායන සහ ප්‍රදර්ශන**
රත්නපුර දිස්ත්‍රික්කයේ වතුරව/කලවාන ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහ වටපණුවේදී අංශයේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් රත්නපුර, ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් කුඩා පරිමාණ බෝග සායනයක් පවත්වන ලදී. වටපණු හානියට ගොදුරු වූ ප්‍රදේශවල තේ වගාකරුවන් මෙම වැඩසටහන සඳහා ඉලක්ක කරගන්නා ලදී. මෙම වගා සායනයේදී යහපත් කෘෂි කාර්මික වගා ක්‍රම මෙන්ම වටපණු හානිය පිලිබඳව සහ ඉන් ආරක්ෂාවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආදර්ශන පවත්වන ලදී. මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ව්‍යාප්ති කාර්යමණ්ඩලය අධ්‍යාපනික ප්‍රදර්ශන දෙකක් සඳහා සහභාගි විය එක් ප්‍රදර්ශනයක් ගුරුදෙනිය පුහුණු විද්‍යාලයේද අනෙක මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයේදීද පැවැත්විණි. මැදරට සහ තලවකැලේ උපදෙස් කාර්ය මණ්ඩලය මේ ප්‍රදර්ශන සඳහා සහභාගි විය.

**තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුව විසින් අනුමත නව තාක්ෂණ ක්‍රමවේද ඇගයිම සඳහා සිදුකරන අනුවර්ති පර්යේෂණ**
නව තාක්ෂණයන්ගේ අනුවර්ත්‍යතාව ගොවිබිමේදි සහ විශේෂිත පරිසර තත්ව යටතේදි ඇගයීම අනුවර්තී පර්යේෂණවල අරමුණු වේ.මෙය සාක්ෂාත් කරගැනිම සඳහා බොහොමයක් අත්හදා බැලිම් කටයුතු ගොවි බිමේදීම සිදු කරනු ලබන අතර එම කටයුතු කළමනාකරණය කරනු ලබන්නේ ගොවි මහතා විසිනි.
මේ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකාර පර්යේෂණ සහ ව්‍යාප්ති නිළධාරින් විසින් සපයනු ලබයි. එමගින් වගාකරුවාගේ විවිධ ජීව විද්‍යාත්මක සහ සමාජ ආර්ථික වාතාවරණයද සැලකිල්ලට ගනු ලබයි.

**අරමුණු:** නව සොයාගැනීම් පිළිබඳ වගාකරුවාගේ හැඟීම, සමාජ ආර්ථික ශක්‍යතාව සහ ප්‍රායෝගිකබව පිළිබඳ ඇගයිම

**ප්‍රගතිය**
මොරවක, අකුරැස්ස, සොයිසා වත්ත, පැලවත්ත, ග්‍රීන්වුඩ්, මල්බෙරි සහ හගුරුඅම වත්ත යන ස්ථාන වල ශාක අභිජනන අංශය විසින් ස්ථාපිත තේ.ප.ආ 5000 ශ්‍රේණියේ ප්‍රභේදවල අනුවර්ති අත්හදාබැලිම් උපදෙස් කාර්යමණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලැබේ. ඩයගම වෙස්ට්, සෝගම, පීඩෲ, මට්ටකැලේ සහ ග්ලාස්ග්ලෝ යන සමාගම් වතුවල තේ.ප.ආ 5000 ශ්‍රේණියේ අනුවර්තී පර්යේෂණ ස්ථාපිත කර තිබේ. තවද නව ප්‍රභේදයන්ගේ තේ.ප.ආ 5000 ශ්‍රේණියේ නිරීක්ෂණ අත්හදාබැලිම් ආරම්භ කර තිබේ.
තවද නව ප්‍රභේදයන්ගේ (තේ.ප.ආ 5000 ශ්‍රේණියේ) නිරික්ෂණ අත්හදාබැලීම් ආරම්භ කර ඇති අතර ඒවායේ අධීක්ෂණ කටයුතු දෙනියාය මධ්‍යස්ථානයේ උපදෙස් කාර්යමණ්ඩලය විසින් සිදු කරන ලබයි.
පාංශු සහ ශාක පෝෂක අංශය සමඟ සහයෝගි පර්යේෂණයක් වන බටුවන්ගල වත්තේ පිහිටුවා ඇති ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ (SSFR) පිළිබඳ අනුවර්ති අත්හදා බැලීමේ වසරක දත්ත රැස්කිරිම සම්පූර්ණ කර ඇත.

යන්ත්‍ර ප්‍රචලිත කිරිමේ ව්‍යාපෘතිය මඟින් දෙනියාය මධ්‍යස්ථානය වෙත ලබාදුන් යන්ත්‍ර භාවිතා කර යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ එක් අනුවර්තී අත්හදාබැලීමක් (බැටරි වලින් ක්‍රියාකරන දළු නෙලීමේ යන්ත්‍රය, පෙට්‍රල් මඟින් ක්‍රියාකරන දළු නෙලීමේ යන්ත්‍රය සහ තේ.ප.ආ තෝරා දළු නෙලනය) මොරවක, පෞද්ගලික තේ වත්තක ස්ථාපනය කරන ලදී.

**තලවකැලේ, ශාන්ත කුම්බ්ස් වත්තේ ඇති තේ වගා ආදර්ශනය (තේ තාක්ෂණ උද්‍යානය)**
ශාන්ත කුම්බ්ස් වතුයායේ පහළ කොටසේ ක්ෂේත්‍ර අංක 8 හි ස්ථාපනය කළ තේ තාක්ෂණ උද්‍යානයේ වැඩ කටයුතු උපදෙස් හා ශෂ්‍ය විද්‍යා අංශ වල නිළධාරින්ගේ අධීක්ෂණයෙන් යුතුව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම වසර තුළ ආදර්ශනයේ එක් කොටසක් කප්පාදු කිරීම මානා හා ගෝතමාලා තෘණ කපා දැමීම, වල් පැළ ගැලවීම තේ පැළ දළු නෙලීමේ අවධියට රැගෙන ඒම, සෙවණ ශාක අතු පැහීම, පොහොර යෙදීම, කාණුවල තැන්පත් වූ රොන්මඩ ඉවත් කිරීම, පාලු සිටුවීම යනාදි ක්ෂේත්‍ර කටයුතු සිදු කෙරිණි. අනෙක් යහපත් කෘෂිකාර්මික කටයුතු තවදුරටත් කෙරෙමින් පවතී.

තේ පර්යේෂණ ආයතන පහතරට ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ තේ වගා ආදර්ශනය, ශෂ්‍ය විද්‍යා අංශයේ සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලය විසින් මනා ලෙස නඩත්තු කර ඇත තේ පර්යේෂණ ආයතන නිර්දේශිත යහපත් කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ආදර්ශනය කිරිමට වතු ආදර්ශනයක් මැදරට ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති අතර එහි නඩත්තු කටයුතු ස්ථානභාර නිළධාරීගේ සහ අනෙකුත් පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතුව උපදෙස් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

**ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා**

**අරමුණු:** තාක්ෂණික විෂයන් සඳහා විඩියෝ වැඩසටහන් නිපදවීම, පර්යේෂණ, ව්‍යාප්ති සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා අවශ්‍ය වන ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි පවත්වාගැනීම සහ තේ පර්යේෂණායතනය විසින් නිපදවන ලද ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නිකුත් කිරිම.

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ, තාක්ෂණ නිළධාරි නෙවිල් ඒකනායක මහතා ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා සැපයීම සඳහා පහත වැඩකටයුතු වල නිරත විය.

• නිළධාරි මණ්ඩලයේ සම්මන්ත්‍රණ, පුහුණු වැඩ සටහන්, වතු වල පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්, වතුවල පවත්වනු ලැබූ පුහුණු ව්‍යාප්ති වැඩමුළු, විශ්ව විද්‍යාල / තාක්ෂණික විද්‍යාල ශිෂ්‍ය කණ්ඩායම් සඳහා, ප්‍රදර්ශන සහ අනෙක් විශේෂ වැඩසටහන් 41 ක් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා ලබාදීම.

• ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්, ප්‍රකාශන, ඩිජිටල් බැනර්/ පෝස්ටර් සැකසීම / මුද්‍රණය කිරීම සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ මිලදි ගැනීම වැනි දේ සඳහා චාරිකා 23ක් සිදුකර ඇත.

• තේ වගාව සහ තේ වතුවල යන්ත්‍ර භාවිතය පිළිබඳ වීඩියෝ පට 1840ක් සමඟDVD 255ක් සැක-සීමේ කටයුතු සහ තේ වගාකරුවන් වෙත ඒවා බෙදාහැරීම.

• පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදී ඉදිරිපත්කිරීම් සඳහා පර්යේෂණ කටයුතු පිළිබඳ විඩියෝපට සැකසීම. පරිගණක කාර්යාලීය උපකරණ, සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ආදිය මිලදී ගැනීමේදී ඒ සඳහා වන තාක්ෂණික ඇගයීමේ කමිටුවට සහාය දීම සහ තාක්ෂණික පිරිවිතර (Technical Specification) සැකසීම.

• තේ පර්යේෂණායතන ශ්‍රවණාගාරයේ පැවැත්වෙන වැඩසටහන් සඳහා සහ මහජන ඇමතිම සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීම.

• ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ වගකීම් හැරුණුවිට C/PCOPY ව්‍යාපෘතියේ (ඡායා පිටපත් ලබාගැනීමේ සේවය) සේවාවන්ද ඒකනායක මහතා විසින් පරික්ෂා කරයි. ඡායා පිටපත් සේවාව මගින් ඡායා පිටපත් සඳහා වන ගෙවීම් ලෙස ආයතනයේ නිළධාරින්ගෙන් රු.17,971.00ක්ද අංශ ව්‍යාපෘති මගින් රු59,856 ක මුදලක් ආදායම් ලෙස උපයා ඇත

**ව්‍යාප්ති පර්යේෂණ**

## 1. උඩරට ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීම කෙරෙහි බලපෑ හැකි හේතු විමර්ශනය කිරීම-යුලිෆීල්ඩ් වත්තේ සිද්ධි අධ්‍යනය

යුලිෆීල්ඩ් වත්තේ කළමනාකාරිත්වයේ ඉල්ලීම මත මෙම විමර්ෂණය ආරම්භ කරන ලදී. පසුගිය වසර කිහිපයක් තුල දක්නට ලැබෙන අස්වනු අඩුවීමේ නැඹුරුව වැළැක්වීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. වත්තේ ඇති සියළුම කොටස් වලින් (five division) දුර්වල තත්වයේ වූ සහ අඩු අස්වනු සහිත කැබලි 238 ක් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් හඳුනාගෙන තිබිණි. පඳුරු දුර්වල වී අස්වනු අඩුවීම සඳහා හේතුවිය හැකි සාධක හඳුනාගැනීමට වතු කළමණාකරුවන්, නියෝජ්‍ය / සහකාර කළමණාකරුවන්ගේ සහයෝගය ඇතිව උපදෙස් කාර්ය මණ්ඩලය විසින් මේ සියළුම කැබලි පරික්ෂාවට ලක් කරන ලදී.

**පඳුරු දුර්වල වීම සඳහා හේතුවිය හැකි හඳුනාගත් සාධක**

ඉහත තෝරාගත් කැබලි 238 තුළ පරිණත තේ පඳුරුවල වර්ධනය ප්‍රමාද වීම සඳහා හේතු වූ කරුණු ගණනාවක් හඳුනාගන්නා ලදී. රැස් කරගන්නා ලද සියළු තොරතුරු වගුගත කර ඒවා ප්‍රධාන සාධක යටතේ වර්ග කරන ලදී.

**සාමාන්‍ය තත්වය:** සිටුවා ඇති ප්‍රභේද පැතිකඩ අනුව මෙම වත්තේ ප්‍රධාන වශයෙන් සිටුවා ඇත්තේ TRI 2025 ප්‍රභේදය වේ. ඉන්පසු පිළිවෙළින් DN DTI සහ ණ 145 ප්‍රභේද සිටුවා ඇත. මෙම ප්‍රභේද 4 වත්තේ වගා කරන ලද මුළු රිකිළි තේ වපසරියෙන් 83% ක් නියෝජනය කරයි. අපගේ අත්දැකීම් වලට සහ පසුගිය කාලවල ප්‍රකාශිත තොරතුරු වලට අනුව කඳ විදින ගුල්ලාගේ හානියටත් ඉන්පසු කඳ දිරායාමටත් තදින්ම පාත්‍ර වන TRI 2025 ප්‍රභේදය, සිටුවා වසර 25 - 30 පමණ පසු ශාකයේ දිරිමත් බව අඩු වි අස්වනු අඩුවීමට පටන් ගනී. තවද මෙම ප්‍රභේදය මැංගනීස් (Mn) පෝෂක ඌනතාවයේ ලක්ෂණ වලට සමාන ලක්ෂණ පෙන්නුම් කිරීම ආරම්භ කරයි. මෙම තත්වය විශේෂයෙන්ම මස්කෙළිය පාංශු ශ්‍රේණියේදී සුලභව දැකිය හැකිය. DN ප්‍රභේදය සිටුවා වසර 25කට පමණ පසු සැලකිය යුතු ලෙස අස්වැන්න අඩුවීම පෙන්නුම් කරයි.
මෙම රිකිළි තේ ක්ෂේත්‍ර වල වයස් පැතිකඩ විශ්ලේෂණය කල විට මෙම කැබලිවල ඇති තේ පඳුරු වලින් 97%ක්ම වසර 30කට වඩා වයස්ගත වූ ඒවා බව දැකගත හැකි විය. 2008 වසරේදී තේ පර්යේෂණායතනය විසින් සිදුකල ගැටළු හඳුනාගැනීමේ සමීක්ෂණයට (Diagnostic survey) අනුව කොටගල ප්‍රදේශයේ රිකිළි තේ සිටුවා වසර 25 - 29 දි පමණ ඒවායේ උපරිම අස්වනු කරාලඟා වන බවත් ඉන්පසු දුර්වල පඳුරු ඉවත් කර නැවත පැල සිටුවීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකළහොත් ඒවායේ අස්වනු ක්‍රමයෙන් අඩුවන බවත් පෙන්වා දි ඇත.

**මෙම ඉඩම් කැබලි තුළ නිරීක්ෂිත තත්වයන්**

සාමාන්‍යයෙන් බොහෝ පඳුරුවල පත්‍ර මතට හෝ කඳට හානි කරන ලද ව්‍යාධිජනකයන් හෝ කෘමීන් දක්නට නොලැබිණි. පඳුරු දුර්වල වීමට හේතු සහ මෙවැනි ක්ෂේත්‍ර එම තත්වයෙන් මුදවා ගැනිම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පහත දී ඇත.

**ඇස්ෆික්සියේෂන් (Asphyxiation) නම් තත්වය නිසා සිදුවන පඳුරු දුර්වල වීම**
තේ ශාකයේ පෝෂක මුල්වල ශ්වසනයට බාධාවක් වන සේ පාංශු වාතනය අවහිර වූ විට ශාකයේ ඇතිවන කායික විද්‍යාත්මක තත්වයක් ලෙස මුල්වල ඇස්ෆික්සියේෂන් නම් තත්වය (ශ්වසනයට බාධා පැමිණවීම) හඳුන්වා දිය හැක. මෙම තත්වයට ගොදුරු වූ පඳුරුවල පත්‍ර පතනය වීම නිසා කොළ තට්ටුවේ ඝණකම අඩුවෙනවා පමණක් නොව නව දළු ඇදීමේ හැකියාවද දුර්වල වේ. සමහර පඳුරුවල මල් හටගැනීම, ඵල හටගැනීම වංගි දළු ඇතිවීම ආදියද නිරීක්ෂණය කළ හැකිය. සමහර අවස්ථා වලදී පත්‍ර වල යාන්තමින් හරිතක්ෂ (chlorosis) ලක්ෂණ පෙන්නුම් කලද මෙය සෑම පඳුරකම පොදු ලක්ෂණයක් නොවේ. මෙම තත්වය උග්‍ර වූ විට සම්පූර්ණයෙන්ම කොළ හැලේ. මෙම තත්වයට ගොදුරු වූ ප්‍රදේශ වල තේ පඳුරු දුර්වලව පැවතීම හෝ කප්පාදුවෙන් පසු නැවත දළු ලියලා නොවැඩීම දැකිය හැක. මේ නිසා, සාමාන්‍යයෙන් මෙම තත්වය ඇති වූ තේ පඳුරු දුර්වලව පවත්නා බව පෙනේ.

වැසි කාලවලදී තේ ශාකයේ මූල පද්ධතියද ජලයෙන් යටවී පවතින ප්‍රධාන කාණු දෙපස මෙම තත්වය සුලභව දැකිය හැක. මෙයට ගොදුරු වූ ප්‍රදේශවල ඇති රිකිළි තේ පඳුරුවල මූල පද්ධතිය ගැඹුරට නොවිහිදී පාර්ශවිකව වර්ධනය වී ඇති බව දැක ගත හැක. විශාල මුල් පවා පොළවේ ගැඹුරට වර්ධනය නොවී පොළව මතුපිටට සමාන්තරව පැති අතට විහිදී තිබේ. මෙහිදී පෝෂක මුල් ඇත්තේද පස මතුපිටට ආසන්නයේමය.

සමහර අවස්ථා වලදී ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි මැටි අධික යටි පසක් හෝ එසේ නැත්නම් තදින් ඇහිරුණු ගල් තට්ටුවක් හෝ ගල් පර්වතයක් සමඟ ඇති මැටි පසක් දැකගත හැක. මතුපිට ඇති සාරවත් පස් තට්ටුව ඉතා තුනී කොටසකට සීමා වී පවතී. මෙහි ප්‍රතිඵලය වනුයේ ජලය පස තුළට ගලා නොගොස් පසෙහි එක් රැස් වී පැවතීමයි. පස තුල පාර්ශවික අතට වන ජල වහනය ඉතා සෙමින් සිදුවීමෙන් සතුටුදායක ජලවහනයකට බාධා පැමිණීම, මෙහිදී තවදුරටත් නිරීක්ෂණය කළ හැකි කරුණකි. මැටි පස හෝ වෙනත් බාධකයක් පැවතීම හේතුවෙන් වැසි කාල වලදී ජලය පස තුළට කාන්දුවීමට බාධා පමුණුවන නිසා පස තුල ඇති ජල මට්ටම ඉහළ නැග පෝෂක මුල් පවා ජලයෙන් යට කරනු ලබයි. මෙවිට මුල්වල ශ්වසනය සඳහා පස තුළ ඇති වාතය ඉවත්ව යයි. මුල් වල ශ්වසනයට බාධා පැමිණීම හේතුවෙන් පෝෂක මුල් මියයාමට පටන් ගනී. ජීවීව පවත්නා මුල්ද, ස්වභාවයෙන්ම මතුපිටට ආසන්නයේම පවතී.

**ජලය රඳාපැවතීම**
පරීක්ෂාවට ලක් කරන ලද කැබලි 18කම ජලය රඳා පවතින තත්වයක් නිරීක්ෂණය කරන ලදී. ඉඩම පිහිටි ස්වභාවය අනුව මෙම තත්වය මඟ හරවා ගත නොහැකිය.

**නුසුදුසු පාංශු / ගල් බොරළු හා ඝණ වූ පස් ස්ථර නිසා ඇති වූ පඳුරු දුර්වල වීම**

විවිධ කෘෂිකාර්මික කටයුතු සඳහා කම්කරුවන්ට තේ පේළි අතර නිරන්තරයෙන් එහා මෙහා යාමට සිදුවේ. මේ හේතුව නිසා මැටි සහිත මතුපිට පස් තට්ටුව තද වී ඝනවීමකට ලක් වේ. මෙවිට පසේ හිදැස්වල තිබූ පාංශු වාතය ඉවත් වේ. මෙම තත්වය තේ වගාව සඳහා සුදුසු නැත.

**මුල් රෝග - කලු මුල් රෝගය**
කලු මුල් රෝගය දක්නට ලැබුණු කැබලි 12ක් විය. තේ පඳුරු වල මෙම වර්ධක අවධියේදි කලු මුල් රෝගය සඳහා ප්‍රතිකාර නොමැත. නිර්දේශිත ආරක්ෂාකාරි ක්‍රියාපිළිවෙත් අනුගමනය කර සියළුම තේ පඳුරු ගලවා නැවත පාලු සිටුවීම කළ යුතුය.

**තීව්‍ර කප්පාදුවල වයස්ගත වීම/ සහ මැංගනිස් (Mn) ඌණතාවය නිසා සැකිල්ල දුර්වල වීම**
මැංගනිස් (එබ) ඌණතාවය නිසා සැකිල්ල දුර්වල වීම/ වයස්ගත වීමත් සමඟ තීව්‍ර කප්පාදුවකට ලක් කිරීම හෝ අනුමත නොකරන ලද වෙනත් කෘෂිකාර්මික ක්‍රියාවිධි අනුගමනය නිසා හෝ කැබලි සුළු ප්‍රමාණයක දුර්වල සැකිළි සහිත තේ පඳුරු තිබුනි. මෙම වයසේදී මේ තේ පඳුරු නැවත යථා තත්වයට පත්කළ නොහැක. තවද, මැංගනිස් (Mn) ඌණතා ලක්ෂණ පෙන්නුම් කරන තේ පඳුරුද දක්නට ලැබුණි.

**අනෙකුත් තත්ව**
දුර්වල වූ අනෙක් තේ පඳුරු වලට සාපේක්ෂව වයසින් අඩු තේ කැබලි හතරක ඇති තේ පඳුරුද තරමක් දුරට දුර්වල තත්වයේ පවතින ඒවා විය. නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර මෙම තත්වයට හේතු තවදුරටත් විමර්ෂණය කල යුතුව ඇත.

**2. විවිධ තේ ප්‍රභේද වල අස්වනු සහ වයස් පැතිකඩ අතර ඇති සම්බන්ධතාව පරීක්ෂා කිරීම**
වයස්ගත වීමත් සමඟ පඳුරු දුර්වල වීම සහ අනෙකුත් කායික තත්ව නිසා රිකිළි තේ වල අස්වනු අඩුවන බව තේ පර්යේෂණායතනය විසින් පෙර කරන ලද අධ්‍යයනයන් සහ නිරීක්ෂණ තුළින් පෙන්වා දී තිබේ. මෙම තත්වය තේ පඳුරු වියපත් වීම ලෙස හඳුන්වයි. මෙලෙස වියපත් විම ඉතා ඉක්මනින් සිදුවීම සඳහා බලපාන හේතු රාශියක් ඇති බව සොයාගෙන තිබේ. තේ පඳුරු ඉක්මනින් වියපත් වීම සඳහා බලපාන සාධක අතරින් පාංශු තත්ව, දේශගුණික සාධක, වැරදි වගා ක්‍රම අනුගමනය කිරිම, උචිත නොවන රසායනික පොහොර භාවිතය සහ වගාකර ඇති ප්‍රභේද යන ඒවා ප්‍රධාන තැනක් ගනී.
සමාගම් තේ වතු වල ඇති රිකිළි තේ වලින් වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 30 ට වඩා වැඩි බව පෙර කරන ලද අධ්‍යයනයන් මඟින් පෙන්වා දී ඇත. එයට අමතරව, නිර්දේශිත ක්‍රම වලට අනුව පොහොර සහ අනෙකුත් යෙදවුම් නියමිත ප්‍රමාණයෙන් යෙදුවද සමහර ක්ෂේත්‍රවල අඛණ්ඩ අස්වනු අඩුවීමක් සිදුවන බව පෙනීගොස් ඇත.
මෙම අධ්‍යයනය තුළින් ලබාගත් තොරතුරු වලින්, අස්වනු රටාව කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා හේතුවන තේ ප්‍රභේද සහ වයස අතර සම්බන්ධයක් තිබේදැයි යන්න පරික්ෂා කිරිමට තීරණය විය.

**අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු**

• තේ පඳුරු වියපත් වීම සහ අස්වනු අඩුවීම අතර සම්බන්ධයක් ඇති බව පෙර අධ්‍යනයන් තුළින් පෙන්වා දී ඇත. තේ.ප.ආයතනය විසින් සිදුකරන ලද ගැටළු හඳුනාගැනීමේ සමීක්ෂණයෙන්, උඩරට ප්‍රදේශයේ (හොරණ වැවිලි සමාගම) රිකිළි තේ ක්ෂේත්‍රවල කප්පාදු චක්‍රයක් තුළදී ලබාගන්නා උපරිම අස්වැන්නේ සාමාන්‍යය වසරකදී හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑ 2686 ක් වන අතර එය පඳුරුවල වයස අවු.26 දී පමණ ලැබෙන බවත් එම නිෂ්පාදිතාව කි.ග්‍රෑ 2043 සිට 3328 දක්වා වෙනස් විය හැකි බවත් පෙන්වා දී ඇත.

• මෙම අධ්‍යයනය සඳහා භ2 (නෝර්වුඩ්) සහ KEN 16/3 (කෙනිල්වර්ත් ) යන ප්‍රභේදයන් තෝරා ගන්නා ලදි. KEN 16/3 ප්‍රභේදය වගා කරන ලද පළමු තේ ක්ෂේත්‍රය (ක්ෂේත්‍ර අංක 18) සිටුවා වසර 31කට පසුව වසරකදී හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑ 3.56 ක අස්වනු අඩුවීමක් පෙන්වන ලදී.

• මෙම ප්‍රදේශයෙන්ම පැවත එන N2 ප්‍රභේදය ප්‍රදේශය තුළ වඩාත්ම ප්‍රචලිත ප්‍රභේදයයි. මෙම අධ්‍යයනය සඳහා භ2 ප්‍රභේදය පමණක් වගා කළ ක්ෂේත්‍ර 3ක් වයස සහ නිෂ්පාදිතාව අතර සම්බන්ධය ස්ථාපිත කිරීමට තෝරා ගන්නා ලදී.

• තෝරාගන්නා ලද්දේ 2004 වසරේදි භ2 ප්‍රභේදය වගා කල ක්ෂේත්‍ර අංක 8 ක්ෂේත්‍රයයි. මෙම ක්ෂේත්‍රයේ වයස අවුරුදු 10ක් පමණ වන නිසා තවමත් එහි උපරිම නිෂ්පාදිතාවයට ලඟා වී නැත. මෙම ක්ෂේත්‍රයේ අස්වනු නැඹුරුතා චක්‍රය මඟින් (yield trend curve) මසකදී හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑ 0.015 ක අස්වනු වැඩිවීමක් පෙන්නුම් කරයි.

• 2003/2004 දී N2 ප්‍රභේදය වගා කරන ලද ක්ෂේත්‍ර අංක 5B ද, ක්ෂේත්‍ර අංක 8 හි සිද්ධි අධ්‍යයනයට සමානතාවක් පෙන්නුම් කරයි. මෙම ක්ෂේත්‍රයන්හි තේ පඳුරුවල වයස සහ නිෂ්පාදිතාවය අතර ධනාත්මක සම්බන්ධතාවක් පෙන්වයි.

• 1990 දී N2 ප්‍රභේදය වගා කරන ලද ක්ෂේත්‍ර අංක 25 පැරණි බීජ ක්ෂේත්‍රයකි. දලු නෙලීම අරඹා මාස 96 කට පමණ පසු මෙම ක්ෂේත්‍රය එහි උපරිම නිෂ්පාදිතාවයට ලඟාවී ඇත. මෙම ක්ෂේත්‍රය මසකදී හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑ 0.010 ක අස්වනු අඩුවීමක් පෙන්නුම් කරයි.

**3.** 2015 - තේ ඉඩම්වල පසෙහි සාරවත් බව වැඩිදියුණු කිරීම සඳහා වන තේ පර්යේෂණායතන නිර්දේශ පිළිපැදීමේ වසර

**අරමුණු**

- පස සුරැකීම සහ සාරවත් බව කළමනාකරණය කිරීම සඳහා වැවිලි ක්ෂේත්‍රය දැනට අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳ තක්සේරු කිරීම.
- පසේ සාරවත් බව වැඩිදියුණු කිරීම සඳහා වන තේ වගා කරුවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම
- පසේ සාරවත් බව දියුණු කිරීමට අවශ්‍ය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා තේ වගා කරුවන්ට උපකාර/ උපදෙස් ලබාදීම
- තේ ක්ෂේත්‍රවල පසේ සාරවත් බව දියුණු කිරීමේ වැදගත්කම සහ එයින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ තේ වගා කරුවන් දැනුවත් කිරීම
- තේ පර්යේෂණායතනය විසින් නිර්දේශිත පාංශු සාරවත් බව සුරැකීමේ ක්‍රියාවිධි පිළිබඳ තේ වගා කරුවන් වෙත දැනුම ලබාදීම සහ පුහුණු කිරීම

**ප්‍රගතිය/ ප්‍රතිඵල**

- සියළුම පාරිසරික කළාප සහ ප්‍රාදේශිය වැවිලි සමාගම් ආවරණය වන පරිදි ප්‍රාදේශිය වැවිලි සමාගම් අංශයේ නියැදි සමීක්ෂණයක් පැවැත්වීය. (අධ්‍යයනයේ සොයාගැනීම් පහත දක්වා ඇත)
- මහවතු අංශය සහ කුඩා තේ වතු අංශය සඳහා පැවැත්වූ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද තුළින් අධ්‍යයනයේ සොයාගැනීම් පිළිබඳ තේ වගා කරුවන් දැනුවත් කිරීම
- ප්‍රාදේශිය වැවිලි සමාගම් 15 කට පසේ සාරවත්බව කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය තොරතුරු සපයා දෙමින් සහ වතු කළමනාකාරිත්වය සමඟ පැවති රැස්වීම් වලට සහභාගි වෙමින් ඔවුනට සහාය දීම.
- වතුවල පසේ සරු බවෙහි තත්වය පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ ඉල්ලීම මත වතු බොහොමයක් වෙත ගොස් ඒ සඳහා සහාය වීය.

- සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පස සුරැකීම පිළිබඳ පත්‍රිකා
- සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ පත්‍රිකාව
- පසේ සාරවත් බව කළමනාකරණය සහ පාංශු සංරක්ෂණය පිලිබඳ පත්‍රිකා තුනක්
- ඩිජිටල් පොස්ටර් 6ක් සහ පෝස්ටර් 8000 ක් (සිංහල)
- ඩිජිටල් බැනර් 04 ( සම්මන්ත්‍රණ සඳහා)
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ වීඩියෝ චිත්‍රපටය
- පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (මහවතු අංශය) සඳහා ඉදිරිපත් කිරීමක්
- පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (කුඩා වතු අංශය) සඳහා ඉදිරිපත් කිරීමක්
- තේ පර්යේෂණායතන නිර්දේශ වලට අනුගත වීමේ වසර වෙනුවෙන් සඟරාවක්
- පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ blog අඩවිය
- පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ මුහුණු පොත් කණ්ඩායම (facebook group)

පහත සඳහන් දැනුවත්කිරීමේ සහ පුහුණු ක්‍රියාකාරකම් සිදුකරන ලදී

- මහවතු අංශය සඳහා වූ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයේ ඉදිරිපත් කිරීමක් සහ කුඩා වතු අංශය සඳහා ඉදිරිපත් කිරීමක්
- කුඩා තේ වතු හිමියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 24 (පාංශු සහ ශාක පෝෂක අංශය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ)
- ප්‍රාදේශිය විද්‍යාත්මක කමිටු 3ක් සහ ප්‍රාදේශිය තාක්ෂණික ව්‍යාප්ති සංසද 08ක්
- සමාගම් වතු සඳහා ව්‍යාප්ති සංසද 48 ක්

**4. රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රදේශයේ තේ පසු මැරීම පිළිබඳ දැනුවත් කිරීම**

පසුගිය වසර තුළ බලංගොඩ හා ඉඹුල්පේ යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල (පින්නවල, රාස්සගල, බලංගොඩ සහ ඇල්ලරාව යන තේ පරීක්ෂක (TI) කොට්ඨාශ ආවරණය වන ලෙස) සිදුකල ක්ෂේත්‍ර සමීක්ෂණය නිම කරන ලදී. අනෙකුත් සමහර ස්ථාන වලින්ද මෙම ගැටළුවම වාර්තා වූ හෙයින් මෙම තත්වය පිළිබඳ නියමාකාරයෙන් දැනගැනීම සඳහා තවත් සමික්ෂණයක් සිදුකර දත්ත එක් රැස් කරන ලදී. මේ සඳහා වටපණු විද්‍යා අංශයේද දායකත්වය සැපයිණි.

**අධ්‍යයනයෙන් ලැබුන තොරතුරු සහ නිගමනයන්**

1. රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, රාස්සගල, පින්නවල, කලවාන සහ ගල්ලෑල්ල යන ප්‍රදේශවල තේ වල පසු මැරීමේ තත්වය සඳහා ප්‍රැටිලෙන්චස් ලූසී නම් වටපණු ආසාදනය හේතු-වන බව සොයාගන්නා ලදී.(මොහොට්ටි, 2014,2010)

2. පස සුරැකීමේ සහ සාරවත් කිරීමේ නිසියාකාර ක්‍රම අනුගමනය නොකිරීම මෙන්ම පසේ ආම්ලික බව නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රම නියමිත වෙලාවට සිදු නොකිරීම යනාදිය වටපණු-වන්ගේ ව්‍යාධිජනකතාවය වැඩිකිරීමට හේතු වි ඇත.

3. කඳ විදින ගුල්ලාගේ ආසාදනය, පහතරට සජීවි දැව වේයාගේ හානිය සහ ඒ හේතුවෙන් ඇතිවන කඳ දිරායාම වැනි තත්ව තව දුරටත් තේ පඳුරු දුර්වල වීමට හේතු වි ඇත.

4. වටපණු ආසාදනය සහ අනෙකුත් ද්විතීයික ව්‍යාධිජනකයන්ගේ ආසාදනයන් නිසා තේ පඳුරුවල මූල පද්ධතියට තදින්ම හානි සිදුවී තිබේ.

5. බහුලව වගාකර ඇති TRI 2026 ප්‍රභේදය වටපණු හානිය සඳහා වැඩියෙන්ම ගොදුරුවන ප්‍රභේදයකි. TRI 2025, TRI 2043 සහ DG 7 වැනි ප්‍රභේද මෙම හානියට ඔරොත්තු දෙන බව සොයාගන්නා ලදී.

6. ආසාදනයට ලක් වූ අවුරුදු 18-20 ක් අතර වයස් කාණ්ඩයේ වූ හෝ ඊට වැඩියෙන් වු තේ පඳුරු යළි ප්‍රකෘති තත්වයට පත්කළ නොහැක.

7.නිසි කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය නොකොට නැවත තේ වගා කිරීම සුදුසු නොවේ.

සමීක්ෂණය තුළින් සොයාගත් තොරතුරු තේ තතු (වෙළුම 11 නිකුතුව 2) සහ තේ පුවත් (Tea Bulletin) වෙලූම 24 හි ප්‍රකාශයට පත් කර ඇත.

a. තේ පර්යේෂණායතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වගකීම් හඳුනාගත් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කිරීම.
b. හානියට ගොදුරු වූ තේ ක්ෂේත්‍ර කළමණාකරණය කිරීමට රාජ්‍ය මුදල් ලබා ගැනිම සඳහා විශේෂ ව්‍යාපෘති යෝජනාවක් සැකසිම සහ එය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරිම

**5. කුඩා තේ වතු ක්ෂේත්‍රය තුළ දලු නෙලිම යාන්ත්‍රීකරණය පිළිබඳ ව්‍යාපෘතිය**

වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ මගපෙන්වීම යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය සහ ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය සමග එක්ව තේ පර්යේෂණ ආයතනය විසින් මෙම ව්‍යාප-ෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ උපදෙස් නිලධාරි එස් පී රත්නායක මහතා එහි සම්බන්ධීකාරක ලෙස අඛණ්ඩව කටයුතු කරමින් සිටි. මෙම ව්‍යාපෘතිය යටතේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙදින නේවාසික වැඩසටහන් (TOT) 07 ක් (යාන්ත්‍රික කප්පාදුව, දලු නෙලීම, වළවල් හෑරීම පිළිබඳ ක්ෂේත්‍ර වැඩමුළු) රත්නපුර පර්යේෂණ ආයතන පහතරට මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී.

**ව්‍යාපෘතියේ අරමුණු**

1). ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් කුඩා තේ වතු ක්ෂේත්‍රය තුළ දළු නෙලීම, කප්පාදුව සහ වළවල් හෑරීම සඳහා යාන්ත්‍රික උපකරණ ප්‍රචලිත කිරීම.

2). නිවැරදිව යන්ත්‍ර භාවිතය සඳහා කුඩා තේවතු හිමියන් පුහුණු කිරීම.

3). තේ කර්මාන්තය තුළ තරුණ තරුණියන් රඳවා ගැනීම සහ ඒ වෙත ඔවුන් ආකර්ශනය කරවීම.

4). විවිධ මාදිලියේ යන්ත්‍ර ආශ්‍රිතව ඇති ගැටළු හඳුනාගැනීම සහ අවශ්‍ය පරිදි ඒවායේ නවීකරණයන් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

**තෝරාගත් කුඩා තේ වතු සංවර්ධන සමිති හා තේ කර්මාන්තශාලා ගණන සහ තෝරාගැනීමේ නිර්ණායක**

අදාළ ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් උදෙසා සේවා සපයන මධ්‍යස්ථාන ලෙස කුඩා තේ වතු සංවර්ධන සමිති හා තේ කර්මාන්තශාලා තෝරාගන්නා ලදී. මූලිකව, මෙම සමිති සහ තේ කර්මාන්තශාලා තෝරාගනු ලැබුයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය විසිනි.

ව්‍යාපෘතියේ දෙවන පියවර යටතේ කුඩා තේ වතු සංවර්ධන සමිති 44ක් සහ පෞද්ගලික තේ කර්මාන්තශාලා 44 ක් තෝරාගන්නා ලදී. තවද තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයද ඇතුළුව සියළුම පර්යේෂණ, උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථාන සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන වෙත තවදුරටත් පුහුණු කටයුතු සහ ආදර්ශන පැවැත්වීම සඳහා යන්ත්‍ර කට්ටලයක් සහ අනෙකුත් උපකරණ ලබා දෙන ලදී. තෝරා ගත් සියළුම පුහුණු කරුවන් සඳහා රත්නපුර තේ පර්යේෂණායතනයේදී මෙම යන්ත්‍රෝපකරණ භාවිතය හා නඩත්තු කටයුතු පිළිබඳ (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික) දෙදින නේවාසික පුහුණු වැඩසටහන් සාර්ථකව පවත්වා නිමකරන ලදී. මේ සඳහා ආචාර්ය එම් ඒ විජේරත්න, සම්පත් පතිරණගේ සමන් රත්නායක යන මහත්වරුන්ගේ සහ ශෂ්‍ය විද්‍යා අංශයේ සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ කාර්ය මණ්ඩලයේ සම්පත් දායකත්වය සැපයිණි. පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා මෝටරයකින් ක්‍රියාකරන දළු නෙලන යන්ත්‍රය බැටරියක් මගින් ක්‍රියාකරන දළු නෙලන යන්ත්‍රය මෝටරයකින් ක්‍රියාකරන කප්පාදු යන්ත්‍රය, තේ.ප.ආ තෝරා දළු නෙලනය හා දළු කූඩය, වළවල් හෑරීමේ යන්ත්‍රය, භාවිතා කරන ලදී.

**2015 දී පවත්වන ලද පුහුණුකරුවන් පුහුණුකිරීමේ නේවාසික වැඩසටහන්**

| දිනය / මාසය | සහභාගි වූවන් ගණන | සහභාගි වූ අයගේ විස්තර |
|---|---|---|
| ජනවාරි 19 හා 20 | 40 | තේ.ප.ආ කර්මාන්තශාලා හිමියන්, කර්මාන්තශාලා ව්‍යාප්ති නිළධාරින් |
| පෙබරවාරි 18 හා 19 | 23 | තේ.ප.ආ කර්මාන්තශාලා හිමියන්, කර්මාන්තශාලා ව්‍යාප්ති නිළධාරින් |
| මාර්තු 9 හා 10 | 30 | තේ.ප.ආ, කු.තේ.ව.සං.ආ (ස.ප්‍රා.ක සහ තේ.ප) කුඩා තේ වතු සමිති සම්මේලනයේ සාමාජිකයන් (ගාල්ල ප්‍රදේශය හා රත්නපුරහි නිවිතිගල සහ කුරුවිට උප ප්‍රදේශ) |
| මාර්තු 12 හා 13 | 33 | තේ.ප.ආ, කු.තේ.ව.සං.ආ (ස.ප්‍රා.ක සහ තේ.ප), කුඩා තේ වතු සමිති සම්මේලනයේ සාමාජිකයන් (මාතර ප්‍රදේශය හා රත්නපුර රක්වාන උප ප්‍රදේශ) |
| මාර්තු 16 හා 17 | 24 | තේ.ප.ආ, කු.තේ.ව.සං.ආ (ස.ප්‍රා.ක සහ තේ.ප), කුඩා තේ වතු සමිති සම්මේලනයේ සාමාජිකයන් (මහනුවර සහ කෑගල්ල ප්‍රදේශ) |
| මාර්තු 19 හා 20 | 34 | තේ.ප.ආ, කු.තේ.ව.සං.ආ (ස.ප්‍රා.ක සහ තේ.ප), කුඩා තේ වතු සමිති සම්මේලනයේ සාමාජිකයන් (නුවරඑළිය සහ කලුතර ප්‍රදේශ) |
| මාර්තු 26 හා 27 | 36 | තේ.ප.ආ, කු.තේ.ව.සං.ආ(ස.ප්‍රා.ක සහ තේ.ප), කුඩා තේ වතු සමිති සම්මේලනයේ සාමාජිකයන් (ඌව ප්‍රදේශය සහ රත්නපුරෙහි බලංගොඩ උප ප්‍රදේශය) |

## 6. කෘෂි රසායන භාවිතය පිලිබඳ විගණනය

කොළඹ ටී ටැන් (පෞද්ගලික) සමාගම විසින් ඔවුන්ගේ සේවාදායක තේ වතු වල, කෘෂිරසායන භාවිතය පිළිබඳ සිදුකරන විගණනය සඳහා උපදෙස් නිළධාරි හිරෝමි නිශාන්ති මිය සහය ලබාදෙන ලදී. (සේවාදායක වතු වල කෘෂිරසායන භාවිතය) තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුකූලව සිදුවේද යන්න සහ ආහාර සඳහා වන ආරක්ෂණ අවශ්‍යතා පිළිවෙත් ක්‍රියාවට නංවා ඇතිද යන්න පිළිබඳ පරික්ෂා කිරීම මෙම විගණනයේ මූලික අරමුණ වේ. 2015 උඩරට සහ මැදරට ප්‍රදේශවල තේ වතු/කර්මාන්තශාලා 29ක විගණන කටයුතු සිදුකර ඇත.

## 7. වාණිජ තේ තවාන් පරික්ෂා

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත, නැවත වගාකිරීම සහ පාලු සිටුවීම සඳහා සුදුසු පැළ වලට අනුමැතිය ලබාදීමට, වාණිජ තේ තවාන් 283 ක් පරික්ෂා කරන ලදී. තවාන් මලූ වල ප්‍රමාණය, පැළයක ඇති පත්‍ර ගණන, සහ පැළවල උස යන සාධක වලට අනුව පරික්ෂාවට ලක් කරන ලද පැළ වලින් 61 - 69% ක ප්‍රමාණයක් නිර්දේශ කළහැකි සුදුසු ඒවා විය.
ප්‍රාදේශිය සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන වලින් තේ වගාකරුවන් වෙත නව ප්‍රභේදයන්ගේ අතු සීමා සහිත ප්‍රමාණයක් නිකුත් කර ඇත.

### විශ්ලේෂණ සේවාවන්

**පාංශු හා ශාක පෝෂක අංශය මගින් සේවාදායකයින්ට පහත සඳහන් සේවාවන් ලබාදෙන ලදී.**

අ) 2015 වසරේදී, තලවාකැලේ, වලහන්දුව සහ හන්තාන විශ්ලේෂණාගාර මගින් කරන ලද පස්, ශාක, රසායනික පොහොර සහ කාබනික පොහොර විශ්ලේෂණ සංඛ්‍යාව පිළිවෙලින් 13,012, 822, 1,048 සහ 196 වේ. මෙම සියළු විශ්ලේෂණ අතරින් වැඩිම විශ්ලේෂණ සංඛ්‍යාවක් සිදු කර ඇත්තේ පාංශු pH අගය (5,904) සහ කාබන් ප්‍රතිශතය (3,486) සෙවීම සඳහායී. 2015 වර්ෂයේ කරන ලද මුළු විශ්ලේෂණ සංඛ්‍යාව 15,078 ක් විය.

ආ) නිමි තේවල අඩංගු සෝඩියම් සහ යකඩ ප්‍රමාණය සඳහා උපරිම අගයන් පිහිටු වීම
පර්යේෂණයට භාජනය කරන ලද තේ සාම්පල වලින් 90% ක අන්තර්ගත වූ අයන් සහ සෝඩියම් ප්‍රමාණ පිළිවෙලින් 272 ppm (ආසන්න අගයට ගත්විට 280 ppm) සහ 0.68% (ආසන්න අගයට ගත්විට 0.70%) වේ. එම නිසා නිමි තේවල අයන් සහ සෝඩියම් සඳහා දියහැකි උපරිම සීමාවන් පිළිවෙලින් 280 ppm සහ 0.68% ලෙස යෝජනා කෙරිණි.

ඇ) වෙළඳපළෙහි ඇති පොහොරවල ප්‍රමිතිය නිර්ණය කිරීම
සමීක්ෂණයට භාජනය කරන ලද පොහොර සාම්පලවලින් 82%-91% ප්‍රමාණයක් (සාමාන්‍යය 85%) ප්‍රමිතියට අනුකූල වේ. මෙම මට්ටම සතුටුදායක තත්වයක් ලෙස ගත හැකිය.

ඈ) ප්‍රාදේශීය මට්ටමෙන් පිහිටුවා ඇති පොහොර පිළිබඳ පරීක්ෂණවල සාම්පල විශ්ලේෂණය

**සේවාලාභින් සඳහා වූ අනෙකුත් විශ්ලේෂණ සේවාවන්**

මහා පරිමාණයේ වතුවලට හා කුඩා තේ වතු හිමියන්ට වටපණු සහ කෘමි හානි හඳුනා ගැනීම සහ අදාළ උපදෙස් ලබාදීම තලවාකැලේ, රත්නපුර සහ හන්තාන යන මධ්‍යස්ථානවල පිහිටි කීට විද්‍යා සහ වටපණුවේදී අංශය මගින් සිදු කරනු ලැබිණි. මහා පරිමාණයේ වතු වලින් ලැබූ සාම්පල 86 ක් හා කුඩා තේ වතු හිමියන්ගේ සාම්පල 66 ක් සඳහා වටපණුවන්ට අදාල විශ්ලේෂණ සිදු කර වාර්තා සහ උපදෙස් ලබා දී ඇත. නිම් තේ සාම්පල 01 ක් සඳහාද කෘමි විශ්ලේෂණ වාර්තාව සහ උපදෙස් ලබා දී ඇත. ශාක කායික විද්‍යා අංශය මගින් මහ වතු අංශයෙන් ලබා දුන් 38 කට වඩා වැඩි ගණනක්වූ තේ මුල් නියදි සංඛ්‍යාවක් පිෂ්ඨ සංචිත සඳහා පරීක්ෂාකර එම ක්ෂේත්‍ර කප්පාදු කිරීමට සුදුසු තත්වයේ පවතීද යන වගට නිර්දේශ නිකුත් කරන ලදී. ශාක ව්‍යාධිවේදී අංශය විසින් කළු තේ නියැදි 08 ක්, හරිත තේ නියැදි 15 ක්, පානිය ජල නියැදි 12 ක් සහ ක්ෂේත්‍ර පිහින නියැදි 10 ක ක්ෂුද්‍ර ජීවි තත්වය නිර්ණය සඳහා විශ්ලේෂණ වාර්තා සපයන ලදී.

**අදාළ වර්ෂය තුල වටපණුවේදී අංශය මගින් සිදු කරනු ලැබූ පුහුණු කිරීම්**

- කැලණිවැලි වතු සමාගමේ කළමණාකාරවරුන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා තේ ට්‍රෝට්‍රික්ස් දළඹුවා පාලනය කිරීම සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලනය ක්‍රම යොදා ගැනීම පිළිබඳ වැඩමුළුව.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව වතුරව සහ කළවාන ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් 150 දෙනෙකු සඳහා වටපණු පාලනය පිළිබඳ වැඩමුළුව
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව දෙහෙන කන්ද, හපුගස්තැන්න ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් 100 දෙනෙකු සඳහා පැවති වටපණුවන් පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- කහවත්ත වැව්ලි සමාගමේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා පළිබෝධ පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- ගාල්ලේ පැවති රන් දලු මහිම ප්‍රදර්ශනයේ පළිබෝධ පාලනය පිළිබඳ ප්‍රදර්ශන කුටිය
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව කොලවෙනිගම, පල්ලෙගම, දෙනියාය ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් 30 දෙනෙකු සඳහා වටපණු පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- නාවලකන්ද තේ කර්මාන්තශාලාවේ සහ CIC සමාගමේ සහයෝගිත්වයෙන් නාහල්වතුර, මදලගම සහ කහවත්තේ කුඩා තේ වතු හිමියන් 50 දෙනෙකුට පමණ වටපණුවන් පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන

**ප්‍රකාශන අංශය**

ආයතනයේ සඟරා, වාර සඟරා, පොත්, උපදෙස් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම හා නිකුත් කිරීම ආයතනයේ ප්‍රකාශන අංශය මගින් සිදු කර ඇත. පහත සඳහන් ප්‍රකාශන මෙම වර්ෂය තුලදී නිකුත් කරන ලදී.

1. වාර්ෂික වාර්ථාව (ඉංග්‍රීසි, සිංහල, දෙමළ) 2013
2. තේ විවරණිකාව,22 වෙළුම, 1 සහ 2 කොටස, 2013
3. තේ විවරණිකාව,23 වෙළුම, 1 සහ 2 කොටස, 2014
4. භාවිතයේ ඇති තාප ජනක යන්ත්‍ර කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම් සහ නඩත්තු මාර්ගෝපදේශ

5. ශ්‍රී ලංකා තේ සඟරාව - වෙළුම.78,1 සහ 2 කොටස, 2013
6 ශ්‍රී ලංකා තේ සඟරාව - වෙළුම.79,1 සහ 2 කොටස, 2014
7 තේ අත්පොත (Hand Book on Tea) නැවත මුද්‍රණය
8 තේ තතු සඟරාව - වෙළුම. 11, 1
9 තේ තතු සඟරාව - වෙළුම. 11, 1
10 කුඩා තේ වතු ක්ෂේත්‍රයේ තේ දලු නෙලීම යාන්ත්‍රීකරණය පිළිබඳ පෝස්ටරය
11 තේ ඉඩම් වල පාංශු සංරක්ෂණය පිළිබඳ පුවත් සඟරාව
12 තේ ඉඩම් වල පාංශු සංරක්ෂණය පිළිබඳ පත්‍රිකාව

| ප්‍රකාශනය | | අලෙවි කල ප්‍රමාණය | මුළු මුදල |
|---|---|---|---|
| Handbook on Tea | (පළවෙනි මුද්‍රණය ) | 18 | 27,000 |
| | (දෙවෙනි මුද්‍රණය) | 91 | 159,250 |
| Twentieth Century Tea Research in Sri Lanka | | 06 | 12,000 |
| Monograph No. 4 | | Nil | Nil |
| Monograph No. 6 | | 18 | 1,800 |
| Monograph No. 7 | | 51 | 5,100 |
| දළු වර්ධනය සහ දළු නෙලීම | | 20 | 2000 |
| Field Guide Book (English) | | 01 | 125 |
| ක්ෂේත්‍ර අත් පොත (දෙමළ) | | 51 | 6,375 |
| රසායනික ක්‍රම මගින් තේ පළිබෝධපාලනය කිරීම (ඉංග්‍රීසි) | | 34 | 5,100 |
| රසායනික ක්‍රම මගින් තේ පළිබෝධපාලනය කිරීම (දෙමළ) | | 31 | 1,550 |
| Tea & Health | | 52 | 39,000 |
| Tea for Health | | 42 | 4,200 |
| තේ වගාවේ පිරිවැය තවානේ සිට ක්ෂේත්‍රය දක්වා | | 13 | 5200 |
| නුවරඑලිය දිස්ත්‍රික්කයේ තේ සංවර්ධන සැලැස්ම | | 03 | 450 |
| උපදෙස් චක්‍රලේඛ ෆොල්ඩර්(ඉංග්‍රීසි)(නව මිල) | | 58 | 34,800 |
| | (පැරණි මිල) | 03 | 1500 |
| උපදෙස් චක්‍රලේඛ ෆොල්ඩර්(සිංහල)(නව මිල) | | 05 | 2500 |
| | (පැරණි මිල) | 01 | 400 |
| උපදෙස් චක්‍රලේඛ ෆොල්ඩර්(දෙමළ) | | Nil | Nil |
| ශ්‍රී ලංකාවේ තේ ඉඩම් වල වල් පැලෑටි | | 25 | 5,000 |
| Canker Control | | 08 | 400 |
| පෝෂක ඌණතා ලක්ෂණ මඟ හරවා ගැනීම(ඉංග්‍රීසි) | | 21 | 315 |
| පෝෂක ඌණතා ලක්ෂණ මඟ හරවා ගැනීම(දෙමළ) | | 9 | 135 |
| Wall Chart on Major Pests of Tea in Sri Lanka | | 31 | 3100 |
| සැවැන්දරා මගින් පස සංරක්ෂණය කිරීම පෝස්ටරය (ඉංග්‍රීසි) | | 16 | 480 |
| සැවැන්දරා මගින් පස සංරක්ෂණය කිරීම පෝස්ටරය (දෙමළ) | | 05 | 150 |
| තේ සහ රබර් මිශ්‍ර භෝග වගා ක්‍රමය සඳහා අත්වැලක් | | Nil | Nil |
| සුව රැකුමට තේ | | 15 | 1875 |
| තේ දළු නෙලීම | | 06 | 120 |
| තේ පඳුරු කප්පාදු කිරීම | | 09 | 180 |

**Total** **Rs 320,105**

**පුස්තකාලය**

පුස්තකාලයේ ප්‍රධාන කාර්යභාරය වන පර්යේෂණ කාර්ය මණ්ඩලයට අවශ්‍ය තොරතුරු එක් රැස් කිරිම හා අවශ්‍ය විට ලබා දීමේ කටයුතු වර්ෂය තුළදි සිදූ කරනු ලැබීය. මීට අමතරව පුස්තකාලය මගින් සිය සේවාවන් තේ පර්යේෂණායතනයට අනුයුක්තව අධ්‍යයන ව්‍යාපෘති වල නියැලෙන උපාධි අපේක්ෂක සහ අනෙකුත් පාඨමාලා හදාරන සිසුන් වෙත ලබාදීම සිදූ කරනු ලැබීය. ලිඛිත ඉල්ලීම මත පිටස්තර විද්වතුන්ට හා පුස්තකාල වලට තොරතුරු ලබා දීමද සිදු කරනු ලැබිය. පොත්පත් ලබා ගැනීම, සූචිගත කිරිම, වර්ගීකරණය, පුස්තකාල පොත් බැහැරදීම, අන්තර් පුස්තකාල හුවමාරු කටයුතු, ඡායාපිටපත් සේවාව මෙන්ම පුවත්පත් ලිපි ගොණුව පවත්වාගෙන යාම යනාදි කටයුතු වර්ෂය තුළදි සිදූකරන ලදි.

**අත්කරගැනීම්**

**පුස්තකාලයට පොත්පත් සගරා 32 ක් ලබාගෙන ඇති අතර එමගින් විදේශීය සගරා 12ක් සඳහා දායකත්වය සපයා ඇත**

**සේවාවන්**

මෙම වසර තුළදී අධ්‍යක්ෂතුමා වෙත ලබා දෙන ලද පුවත්පත් ලිපි සංඛ්‍යාව 528 කි. අන්තර් පුස්තකාල හුවමාරු යටතේ ලැබීම් 04ක් සහ යැවීම් 02ක් වශයෙන් හුවමාරු ලිපි සංඛ්‍යාව 06 කි. පර්යේෂණ සහ අනෙකුත් කාර්ය මණ්ඩල වෙත පිටු 2060 ක ඡායා පිටපත් ප්‍රමාණයක් සඟරා සහ පොත්පත් වලින් වර්ෂය තුළදී ලබාදී ඇත.

මෙම වර්ෂය තුල සිසුන් 16 දෙනෙක් තම අධ්‍යාපන කටයුතු සඳහා පුස්තකාලය පරිහරණය කරන ලදී.

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය**

**සේවාවන්**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය මගින් ඊට අදාල පහත සහන සේවා අනෙකුත් අංශ, ඒකක, ප්‍රදේශීය සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන මෙන්ම අනුබද්ධ තේ වතු සඳහා ද ලබාදෙන ලදී.

- අන්තර්ජාල, ඉලෙක්ට්‍රොනික තැපැල් සහ දත්ත ගොනු ගබඩා යන සේවා සපයන සේවා පරිඝනක පරිපාලනය සහ නඩත්තු කිරීම.
- පරිඝනක, පරිඝනක උපාංග සහ ආයතනික පරිඝනක ජාලයේ ස්ථාපන සහ නඩත්තු කටයුතු සිදුකිරීම.
- ආයතනික නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- ප්‍රධාන කාර්යාලයේ සහ පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර සහ අදාල පරිඝනක මෘදුකාංගය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- පරිඝනක, උපාංග සහ මෘදුකාංග සහ වන ස්ථිර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

**යටිතල පහසුකම් සංවර්ධනය සහ පවත්වාගෙන යාම**

• සේවා පරිඝනක (1), මේසය මත තබන පරිඝනක (11), ජංගම පරිඝනක (2), පුවරු (tablet) පරිඝනක (1), පරිපූර්ණ ද්විපථ ලේසර් මුද්‍රණ යන්ත්‍ර (11), වර්ණ තීන්ත වදින (inkjet) මුද්‍රණ යන්ත්‍ර (3), 1200VA අඛන්ඩ විදුලි සැපයුම් (UPS) යන්ත්‍ර 2, 650 ඒ අඛන්ඩ විදුලි සැපයුම් (UPS) යන්ත්‍ර 23 සහ වර්ණ පරිලෝකන යන්ත්‍ර (3)ක් මිලදී ගෙන බෙදාහැරීම සහ පහසුකම් සැලසීම, ආයතනික ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව සහ අදාල අංශවල අවශ්‍යතාවයන්ට සරිලන පරිදි මෙය සිදුකරන ලදී.

• අමතර පරිඝනක 32ක් සහා ජාල සේවා සපයන සම්බන්ධක ස්ථාන ස්ථාපනය කරමින් ප්‍රධාන කාර්යාලයේ පරිඝනක ජාලය වැඩි දියුණු කිරීම.

• ප්‍රධාන කාර්යාලයේ පරිඝනක 111ක් සහ ප්‍රති වෛරස් මෘදුකාංගයක් මිලදීගෙන ස්ථාපනය කිරීම.

# TRI REGIONAL CENTRES













# පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය

එම්. ඒ. විජේරත්න
කෘෂි විද්‍යා උපාධි(රුහුණ, ශ්‍රී ලංකාව) පශ්චාත් උපාධි (ලන්ඩන්)
ස්ථානභාර නිලධාරී

**පරිපාලන කටයුතු හා කාර්ය මණ්ඩල වෙනස්වීම්**

අත්හදා බැලීමේ නිලධාරිනී එල්. ඒ. එස්. පී. ජයසිංහ මහත්මිය සහ පර්යේෂණ නිලධාරිනී ආර්. ඩී. පී. පී. සේනානායක මහත්මිය තේ පර්යේෂණ ආයතන තලවකැලේ ප්‍රධාන කාර්යාලයට පිලිවෙලින් 2015 ජනවාරි 1 වැනි දින හා මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථානමාරු ලැබීය. ප්‍රදීපා ලියනගේ මහත්මිය ප්‍රධාන කාර්යාලයේ සිට පහත රට මධ්‍යස්ථානයට තාවකාලික ස්ථාන මාරුවක් ලැබීය. 2015 ජූලි මස සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ පරීක්ෂක කේ . ගුණවර්ධන මහතාට මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට ස්ථාන මාරුවක් ලැබීම නිසා ඔහුගේ වැඩ ආවරණය කරන ලද්දේ ප්‍රධාන කාර්යාලයේ සිසිල් ප්‍රනාන්දු මහතා විසිනි. තාක්ෂණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ජී.එල්.සී. ගලහිටියාව මයා ඔක්තෝබර් මස 16 වන දින සේවයෙන් විශ්‍රාම ගියේය. ප්‍රධාන උපදෙස් නිලධාරී ජේ. සී. කේ. රාජසිංහ මයා ජූලි 1 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි මැදරට මධ්‍යස්ථානයට ස්ථාන මාරුවක් ලැබීය. ව්‍යාප්ති නිලධාරී එස්. පී. ඒ. පී. කේ. ජයරත්න මයා දෙසැම්බර් 3 වැනිදා සිට දෙනියාය මධ්‍යස්ථානයේ සිට පහත රට මධ්‍යස්ථානයට මාරුවීමක් ලැබීය. පරිපාලන නිලධාරී බී. එම්. බී. බස්නාගොඩ මහතා දෙසැම්බර් 28 වැනි දින සේවා අවශ්‍යතා මත ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවක් ලැබීය .

**පර්යේෂණ උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු**

පහත රට ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් පහත රට කලාපයේ තේ වගා කරන පාරිසරික තත්වයන් යටතේ ශෂ්‍ය විද්‍යාව, ශාක අභිජනන, කීට හා වටපණු විද්‍යා, සහ තේ සැකසුම් තාක්ෂණයන්ට අදාලව පර්යේෂණ සිදුකරනු ලැබේ. එම විෂයන් යටතේ 2015 වසරේදී සිදුකර ඇති පර්යේෂණ ගණන 74 ඉක්මවයි . එම පර්යේෂණ හා ඒවායේ ප්‍රථිපල පිලිබඳව පූර්ණ විස්තර විවිධ විෂය පථයන් ඔස්සේ මෙම වාර්තාවේ වෙනම දක්වා ඇත. පර්යේෂණ වලට අමතරව තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා 19 ක පමණ ගැටලු නිරාකරණය කිරීම සඳහාත් යන්ත්‍ර සූත්‍ර හා නිෂ්පාදන ක්‍රියාවලියට අදාලව උපදෙස් ලබාදීම සඳහාත් කටයුතු කර ඇත. ශාක අභිජනන අංශයේ සේවක මණ්ඩලය විසින් බීජ තේ උයන් 12 ක පමණ නඩත්තු කටයුතු සිදුකරමින් තේ වගා කරුවන්ට අවශ්‍ය තේ බීජ විශාල ප්‍රමාණයක් සපයාදීමට කටයුතු කර ඇත.

2015 වසර තුලදී උපදෙස් සහ ව්‍යාප්ති නිලධාරීන් විසින් උපදෙස් සහ ව්‍යාප්ති චාරිකා 119 ක්, පුහුණු වැඩ සටහන් 19 ක්, සම්මන්ත්‍රණ 4 ක් සහ වාණිජ තේ තවාන් පරීක්ෂණ 7 ක් රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල මහ වතු හා කුඩා තේ වතු ආවරණය වන පරිදි සිදු කර ඇත. 2015 වසර තුල පහත රට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට අමුත්තන් 1509 ක් පැමිණ සේවාවන් ලබාගෙන තිබේ. උපදෙස් සහ ව්‍යාප්ති අංශය මගින් පරීක්ෂා කර ඇති පාංශු සාම්පල සංඛ්‍යාව 691 කට අධිකය. තේ පර්යේෂණායතන නිර්දේශ ප්‍රචලිත කිරීමේ වසර වෙනුවෙන් තේ වතු සමාගම් උදෙසා ක්ෂේත්‍ර වැඩ සටහන් 7ක් පවත්වන ලදී . පාංශු හා ශාක පෝෂණ අංශයේ සහභාගිත්වයෙන් අරනායක, කිතුල්ගල, බලංගොඩ, පැල්මඩුල්ල, කලවාන හා කුරුවිට යන ප්‍රදේශවල තේ ඉඩම්වල පස සරු කිරීම හා පොහොර භාවිතය පිලිබඳව කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 6ක් සිදු කරන ලදී. පහත රට තේ වගා කරුවන්ගේ සංගමය, ලීඩ්ස් ආයතනය, අගුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය, වීරවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, යන ආයතන සඳහා තේ වගා කටයුතු පිලිබඳව උපදෙස් හා පුහුණු වැඩ සටහන් පවත්වා තිබේ. පිරිසැකසුම් තාක්ෂණ අංශය බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති "ටෙක්නෝ" 2015 ප්‍රදර්ශණයට සහභාගි වී ඔවුන් විසින් නිර්මාණය කරන ලද නවතම තේ හලන යන්ත්‍රය හඳුන්වාදෙන ලදී.

පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය (සිංහල), ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම් හා ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසද ආදිය නියමිත පරිදි පවත්වන ලදී. බලංගොඩ ප්‍රදේශයේ කුඩා තේ ඉඩම්වල තේ පඳුරු දුර්වලවීමට අදාලව රැස්වීම් හා පුහුණු සැසි ගණනාවක් පැවැත්විණ. 2015 අගෝස්තු මාසයේදී සබරගමුව පලාතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් වෙනුවෙන් Rainforest Alliance ආයතනයේ මෙහෙයවීමෙන් තේ නිෂ්පාදනය සඳහා තිරසාර කළමනාකරණය පිලිබද වැඩමුලු 2 ක් පවත්වන ලදී . පහතරට වැවිලිකරුවන්ගේ සංගමයේ සාමාජිකයින් වෙනුවෙන්ද දෙදින නේවාසික පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී .

කුඩා තේ වතු සමිති, තේ කර්මාන්තශාලා, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ මණ්ඩලය එක්ව යන්ත්‍ර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 2ක් පහත රට මධ්‍යස්ථානයේදී පැවැත්විණ. තේ සමිතිවල හා කර්මාන්තශාලාවල නියෝජිතයින් වෙනුවෙන් නිවැරදිව දලු නෙලන හා කප්පාදු කරන යන්ත්‍ර භාවිතය පිලිබද දෙදින නේවාසික පුහුණු සැසි 7ක් පවත්වන ලදී. ආචාර්ය එම්. ඒ. විජේරත්න, සමන් රත්නායක හා සම්පත් පතිරණගේ යන මහත්වරුන්ගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ මෙම වැඩ සටහන් පවත්වන ලද්දේ ශාන්ත ජෝකීම් වතු කේෂේත්‍ර වලය.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා කීට හා වටපණු විද්‍යා අංශයේ සහභාගිත්වය ඇතිව උපදෙස් හා ව්‍යාප්ති අංශය මගින් රත්නපුර දිස්ත්‍රික්කය තුල වටපණුවන් ව්‍යාප්ති වීම පිලිබඳව නිරීක්ෂණ සිදුකරන ලද අතර ඒ පිලිබඳව කුඩා තේ ඉඩම් හිමියන් දැනුවත් කිරීම පිණිස වැඩ සටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී .

**වෙනත් වැඩ සටහන්/ක්‍රියාකාරකම්**

මධ්‍යම පලාතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගිත්වයෙන් බලශක්ති සංරක්ෂණය පිලිබඳව සම්මන්ත්‍රණයක් පහත රට මධ්‍යස්ථානයේදී පවත්වන ලදී . මධ්‍යසාර භාවිතයේ අහිතකර බලපෑම් පිලිබඳව වතු සේවකයින් දැනුවත් කිරීමේ වැඩ සටහනක් කුරුවිට පොලිසියේ අනුග්‍රහය ඇතිව පවත්වන ලදී. පහත රට ස්ථානයේ ක්‍රීඩා සමාජයේ මෙහෙයවීමෙන් සිංහල හා හින්දු අලුත් අවුරුදු උලෙලක් පවත්වන ලදී .

**මානව සම්පත් සංවර්ධන හා පුහුණු කටයුතු**

ස්ථානභාර නිලධාරී, ආචාර්ය එම්. ජ්. විජේරත්න මහතා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තේ පිලිබඳ අන්තර් රැස්වීමට සහභාගිවීම පිණිස 2015 ඔක්තෝබර් මස 13 17 දිනවල ඉතාලියේ මිලාන් නගරයට පිටත්විය. සම්පත් පතිරණගේ සහ නොයෙල් පියසුන්දර යන පර්යේෂණ නිලධාරීන් පේරාදෙනිය කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ තම පශ්චාත් උපාධි පාඨමාලාවන් හදාරමින් සිටී. විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින් 6 දෙනෙකු සහ වෙනත් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත ආධුනික පුහුණුවන්නන් 17 දෙනෙකු පහත රට මධ්‍යස්ථානයේදී පුහුණු කටයුතු නිමා කර ඇත .

**යටිතල පහසුකම් සංවර්ධනය**

සේවක විවේක කාමරයේ සහ එහි වැසිකිලියේ තැනීම් කටයුතු නිමා කරන ලදී . D වර්ගයේ නිල නිවාස 5 ක (D1, D6, D7, D9, D10) තීන්ත ආලේප කිරීම සහ උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ අභ්‍යන්තර බිත්තිවල තීන්ත ආලේප කිරීම සිදු කරන ලදී. B1 සහ C1 නිල නිවාස වල මුලුතැන් ගේ සහ නාන කාමරවල තීන්ත ආලේප කරන ලදී. D5 නිල නිවසේ අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු නිමාකරන ලදී. පරිපාලන ගොඩනැගිල්ල, සංචාරක නිවාසය, සම්මන්ත්‍රණ ශාලාව සහ විද්‍යාගාරවල පිරිසිදුකිරීම් හා වෙනත් නඩත්තු කටයුතු සාර්ථකව සිදුකරන ලදී. සංචාරක නිවාසයේ සහ B3 නිවසේ නාන ටැංකි (Bath Tub) වල තීන්ත ආලේප කරන ලදී. නේවාසිකාගාර වහලයේ සහ එහි ගෘහ භාණ්ඩ වල අලුත්වැඩියාවන් සහ විදුලි සැපයුම් අංශයේ වැහි පීලිවල අලුත්වැඩියාවන් නිමා කරන ලදී. ශාක අභිජනන අංශය වෙනුවෙන් දැව වලින් නිමවූ ආධාරක දෙකක් සකස් කරන ලදී.

ජල හා විදුලි සැපයුම්, නිල නිවාස, කර්යාලය, සම්මන්ත්‍රණශාලා, සංචාරක නිවාසය, නේවාසිකාගාරය, විද්‍යාගාර හා අනෙක් ගොඩනැගිලි වල පැවති සාමාන්‍ය නඩත්තු හා අලුත්වැඩියා කටයුතු, කාර්යාල පරිශ්‍රයේ හා ගෙවතුවල පිරිසිදු කිරීම් හා නඩත්තු කටයුතු සහ වාහන සංචිතයේ අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සාර්ථකව සිදු කරන ලදී. ගස් කඩාවැටීම හේතුවෙන් හානිවූ කාර්යාලයට සහ විද්‍යාගාරවලට විදුලිය සපයන ප්‍රධාන විදුලි රැහැන අලුත්වැඩියා කරන ලදී.

## මැද රට ප්‍රාදේශීය මධ්‍යස්ථානය

එම්.එස්.ඩී.එල් ද සිල්වා
විද්‍යාවේදී (පේරාදෙණිය ශ්‍රී ලංකාව) දර්ශනපති (පේරාදෙණිය ශ්‍රී ලංකාව)
දර්ශන ශූරී (ජේ.සී.යූ ඔස්ට්‍රේලියාව)
වැඩ බලන ස්ථාන භාර නිලධාරී
(2015 සැප්තැම්බර් 30 දක්වා)
කේ.ආර්.ඩබ්ලිව්.බී. කහඳව
විද්‍යාවේදී කෘෂිකර්ම (පේරාදෙණිය ශ්‍රී ලංකාව), විද්‍යාපති (පේරාදෙණිය ශ්‍රී ලංකාව)
වැඩ බලන ස්ථාන භාර නිලධාරී
(2015 ඔක්තෝම්බර් 01 දින සිට)

මහනුවර හන්තාන, තේ පර්යේෂණ ආයතනයේ මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය පාංශු හා ශාක පෝෂක, සශ්‍ය විද්‍යා,කීට විද්‍යා හා වටපණු විද්‍යා සහ ශාක අභිජනන යන පර්යේෂණ අංශ හතරක් සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයකින් සමන්විතය. මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්ක වල තේ වගාවන් හි පර්යේෂණ අත්හදාබැලීම් සහ ව්‍යාප්ති වැඩසටහන් ගණනාවක් මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරන ලදී.

| **භූමි උපයෝගීතාව** | **ප්‍රමාණය (හෙක්)** |
|---|---|
| බීජ තේ | 2.00 |
| රිකිලි තේ | 4.5 |
| රිකිලි තේ නැවත වගාව | 1.00 |
| නොමේරූ තේ | 3.5 |
| මව් ශාක | 2.75 |
| තේ තවාන | 0.2 |
| මානා තෘණ වගාව | 0.5 |
| පලතුරු ශාක | 0.4 |
| වන වගාව | 1.2 |
| වගුරු බිම් | 0.62 |
| ගොඩනැගිලි ගෙවතු සහ මං මාවත | 5.77 |
| එකතුව | **22.44** |

ආයතනය විසින් 2015 වසර තේ ඉඩම් වල පස සුරැකීමේ සහ පස වැඩි දියුණු කිරීමේ වසර ලෙස ප්‍රකාශයට පත් කර තිබූ අතර එයට සමගාමීව මධ්‍යස්ථානය විසින් කුඩා තේ වතු හිමියන් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වතු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී.

රජයේ දින සියය වැඩපිලිවෙල යටතේ පාංශු හා ශාක පෝෂක අංශයේ නිලධාරීන් සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ නිලධාරීන් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්ක වල කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් වල නිරත විය. කහවත්ත, ඇල්පිටිය හා ඇල්කඩුව වතු සමාගම් වල වතු විධායක, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල සහ තෝරාගත් සේවකයින් සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් පසේ සරු බව වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩසටහන් හතරක් ඉතා සාර්ථකව පවත්වන ලදී. ඉහත තේමාව යටතේම මහනුවර වැවිලි කරුවන්ගේ සංගමයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ස්වභාවික සම්පත් කළමණාකරන මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරීන් සඳහා ප්‍රාදේශීය තාක්ෂණ කමිටු රැස්වීම් දෙකක් ද පවත්වන ලදී.

ශෂ්‍ය විද්‍යා අංශය විසින් බාකේපල් වත්තේ සිදු කල ජෛව පටල ජෛව පොහොර ක්ෂේත්‍ර අත්හදා බැලීම විවිධ පොහොර අනුපාත යටතේ සහ විවිධ පාංශු පරාමිතීන් යටතේ සිදු කර අවසන් කල අතර පුස්සැල්ලාව නිව්පීකොක් වත්තේ පුනරුත්ථාපන තෘණ සඳහා සිදු කල අත්හදා බැලීමක් අවසන් විය. ගෝල් 4 F වල් නාශකය පිළිබඳව තවත් අත්හදා බැලීමක් මාතලේ රත්වත්ත වතු යායේ දී ආරම්භ විය. ග්ලයිපොසේට් වල් නාශකයට විකල්පයක් ලෙස ග්ලුෆොසිනේට් ඇමෝනියම් වල් නාශකය ටැංකි මිශ්‍රණයක් ලෙස යොදා ගැනීමේ අත්හදා බැලීමක් මාතලේ රත්වත්ත වතු යායේ දී අරඹන ලදී.

කඳ ගුල්ලා මර්ධනය සඳහා අළුහුණු සහ ගෙන්දගම් යොදා ගැනීමේ අත්හදා බැලීම් කීට විද්‍යා අංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලදී. රොඩොපොලොස් සිමිලිස් සහ ප්‍රැටිලෙන්චස් ලුසී යන වට පණුවන්ට ඔරොත්තු දෙන ප්‍රභේද තෝරා ගැනීමේ අත්හදා බැලීම් වටපණු විද්‍යා අංශයේ නිලධාරීන් විසින් තවදුරටත් සිදුකල අතර ධාරක පරාස අධ්‍යයනයන් ද හන්තානේ පිහිටි පරීක්ෂණ ක්ෂේත්‍රයේ දී සිදු කරන ලදී.

තේ සඳහා ජෛව කාබනික ඛනිජ මූලද්‍රව්‍ය පොහොර නිපදවීමේ අධ්‍යයනයන් සහ නැනෝ පොහොර අත්හදා බැලීම් පාංශු සහ ශාක පෝෂණ අංශයේ කාර්ය මණ්ඩලය විසින් කරගෙන යනු ලැබීය. කම්හල් දර අළු ශාක පෝෂක ප්‍රභවයක් ලෙස මානා සහ මේරූ තේ සඳහා යොදා ගැනීම පිළිබඳ අත්හදා බැලීමක් කුරුගම වත්තේ දී ආරම්භ විය.

**යටිතල පහසුකම් සංවර්ධනය**

ක්ෂේත්‍ර අංක 03 හි තේ පඳුරු ගැලවීම සහ බිම් සැකසීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී. ශ්‍රවණාගාරය C2 සහ ARP - B2 නිල නිවාස වල වර්ණාලේපන කටයුතු සම්පූර්ණ කරන ලදී.

**කාර්ය මණ්ඩල වෙනස් වීම්**

1) ප්‍රධාන උපදේශක නිලධාරී ජේ.සී.කේ රාජසිංහ මයා, 02.07.2015 දින සිට පහත රට ස්ථානයේ සිට මෙම ස්ථානයට ස්ථාන මාරුවක් ලැබීය.
2) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ආචාර්ය ලක්ෂමී ද සිල්වා 01.10.2015 දින සිට ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවක් ලද අතර වැඩ බලන ස්ථාන භාර නිලධාරී ලෙස කේ.ආර්.ඩබ්ලිව්.බී.කහඳව මහතා 01.10.2015 සිට පත්වීය.
3) රියදුරු ඒ.ජයසිංහ මහතා සහ ජී.ජී.එම්.රණසිංහ මහතා 01.10.2015 සිට ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවක් ලැබීය.
4) පොදු සේවක එම්.කේ.බස්නායක මහතා 01.10.2015 තේ පර්යේෂණ ආයතනයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
5) පොදු සේවක (ක්ෂේත්‍ර) ජී.ගුණසේකර මහතා 21.10.2015 දින අභාවප්‍රාප්ත විය.
6) සහකාර ක්ෂේත්‍ර නිලධාරී ඒ.ඩබ්ලිව්.එස්. ඩබ්ලිව් පීරිස් මහතා ශාන්ත ජෝකිම් වත්තේ සිට මෙම මධ්‍යස්ථානයට 01.12.2015 දින සිට ස්ථාන මාරුවක් ලැබීය.

**මධ්‍යස්ථානය වෙත ආ අමුත්තන්.**

| | | |
|---|---|---|
| තේ වැවිලි කරුවන් | - | 525 |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යයින් | - | 22 |
| විදේශ සිසුන් | - | 07 |
| සාමාන්‍ය අමුත්තන් | - | 11 |
| එකතුව | - | 565 |

**ආදායම** (රුපියල්)

| | | |
|---|---|---|
| අමු දළු විකිණීම (කි.ග්‍රෑ 19726) | - | 1,066,977.01 |
| තේ රිකිලි (470625 ) | - | 376,500.00 |
| රිකිලි තේ පැල (21007 ) | - | 504,168.00 |
| ආගන්තුක නිවාස නවාතැන් ගාස්තු | - | 88,750.00 |
| පස් ආම්ලිකතා පරීක්ෂාවන් | - | 52,520.00 |
| තේ.ප.ආ ප්‍රකාශන අලෙවිය | - | 25,151.00 |
| තේ අලෙවිය | - | 88,912.50 |
| වෙනත් විවිධ ආදායම් | - | 37,871.00 |
| **එකතුව** | **-** | **2,240,849.51** |

**අස්වැන්න**

2015 වසර තුල නෙලූ අමු තේ දළු අස්වැන්න පහත දැක්වේ.

| මාසය | නෙලූ/ විකිණු අස්වැන්න (කි.ග්‍රෑ ) | ඒකක මිල | ලැබූ ආදායම |
|---|---|---|---|
| ජනවාරි | 1108 | 60.05 | 66,535.40 |
| පෙබරවාරි | 1342 | 57.61 | 77,312.62 |
| මාර්තු | 1109 | 57.66 | 63,944.94 |
| අප්‍රේල් | 157 | 51.05 | 9,546.35 |
| | 803 | 52.00 | 41,756.00 |
| මැයි | 237 | 52.14 | 12,357.18 |
| | 1132 | 54.00 | 61,128.00 |
| ජුනි | 2307 | 55.40 | 127,807.80 |
| ජූලි | 1961 | 51.60 | 101.187.60 |
| අගෝස්තු | 1848 | 51.05 | 94,340.40 |
| සැප්තැම්බර් | 1727 | 45.98 | 79,407.46 |
| ඔක්තෝම්බර් | 2001 | 51.08 | 102,211.08 |
| නොවැම්බර් | 2078 | 58.67 | 121,916.26 |
| දෙසැම්බර් | 1916 | 56.12 | 107,525.92 |
| **එකතුව** | **19,726** | | **1,066,977.01** |

## ව්‍යාප්ති මධ්‍යස්ථානය-ඌව

එ.එල්.රෝහිත යූ. කුමාර
කෘෂිකර්ම විද්‍යාවේදී (විශේෂ)-(පේරාදෙණිය, ශ්‍රී ලංකාව) විද්‍යාපති (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)
වැඩ බලන ස්ථානභාර නිලධාරි

**හැඳින්වීම**

තේ පර්යේෂණ ආයතනයේ ඌව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්‍යභාරයන් වන්නේ ඌව පලාතේ තිබෙන ප්‍රාදේශීය වැවිලි සමාගම් වලට අයත් මහා පරිමාණ තේ වතු, පෞද්ගලික තේ වතු සහ කුඩා තේ වතු හිමියන් සඳහා ව්‍යාප්ති කටයුතු, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාංශු විශ්ලෙෂන කටයුතු සහ රෝපන ද්‍රව්‍ය ලබා දීමයි.

ජාතික තේ නිෂ්පාදනයට ඌව පලාතෙන් ඇති දායකත්වය 10% පමණ වන අතර එහි හෙක්ටයාර් 37,676 භූමි ප්‍රමාණයක තේ ව්‍යාප්තව ඇත. මෙම තේ වගා භූමි ප්‍රමාණයෙන් 50% ක පමණ රිකිලි තේ වගාකර ඇත.

මෙම ව්‍යාප්ති මධ්‍යස්ථානය සතුව කුඩා පරිමාණ පරීක්ෂණාගාරයක් ඇති අතර එමගින් පසේ ආම්ලිකතාවය සහ කාබන් ප්‍රතිශතය විශ්ලේෂණය කරනු ලැබේ. හෙක්ටයාර 14.3 කින් යුත් භූමි භාගය ක්ෂේත්‍ර අත්හදා බැලීම්, මව් ශාක වගාව, මේරූ තේ වගාව ආදී වශයෙන් පහත ආකාරයට ස්ථාපිත වි ඇත.

**භූමි උපයෝගීතාවය**

| | | |
|---|---|---|
| මේරූ තේ වගාව | - | 3.80 ha |
| නොමේරූ තේ වගාව (අත්හදා බැලීම්) | - | 1.00 ha |
| මව් ශාක වගාව | - | 2.06 ha |
| ගොඩනැගිලි/ මාර්ග | - | 0.79 ha |
| කැලෑ /වන වගාව /තෘණ භූමි | - | 6.65 ha |
| සම්පූර්ණ එකතුව | - | 14.30 ha |

**උපදෙස් හා ව්‍යාප්ති සේවා**

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ අංශ ප්‍රධානීගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ඌව පලාතේ මහා පරිමාණ හා කුඩා තේ වතු හිමියන් සඳහා උපදෙස් හා ව්‍යාප්ති චාරිකා,පුහුණු වැඩසටහන් ,සම්මන්ත්‍රණ සහ ක්ෂේත්‍ර දින වැඩසටහන් පවත්වන ලදී.

**ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටුව-ඌව**

"තිරසාර ඵලදායීතාවය සඳහා පාංශු සංරක්ෂණය සහ පස වැඩි දියුණු කිරීම යන තේමාව මූලික කොටගෙන තේ වතු ක්ෂේත්‍රයේ පාංශු සංරක්ෂණ පනත ස්ථාපිත කිරීම, පස වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග සඳහා යන වියදම් සහ එහි ප්‍රයෝජන, කප්පාදු අතු වල දැමීම තුලින් ඇති ප්‍රයෝජන සහ ගල්යිෆෝසේට් වල් නාශකය සඳහා විකල්ප වල්නාශක යන මාතෘකා ඔස්සේ ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී 2016 ජූලි 28 දින ඌව ප්‍රදේශයේ විද්‍යාත්මක කමිටු රැස්වීම පවත්වන ලදී. මෙහිදී ජ්‍යෙෂ්ඨ වතු කළමනාකරුවන්, කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන් ආදි වශයෙන් වැවිලි කරුවන් 87 දෙනෙක් සහභාගී වූ අතර එහිදි පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් සමග ධනාත්මක සංවාදයක් ඇතිවුණි.

**ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදය- ඌව**

මෙහි පලමු රැස්විම 2015 අප්‍රේල් 9 දින පස්සර පිහිටි තේ පර්යේෂණ මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේ දී කුඩා තේ වතු සංවර්ධණ අධිකාරියේ නිලධාරින් සඳහා පවත්වන ලදී. මෙහිදී නිලධාරින් 17 දෙනෙක් සහභාගී වු අතර" තිරසාර තේ වගාවකට පාංශු සංරක්ෂණ ක්‍රම'' සහ "තේ වගාවේ කොල පොහොර සහ ගැඩිවිලි කොම්පෝස්ට් භාවිතය යන මාතෘකා සාකච්ඡා කරන ලදී.

දෙවන තාක්ෂණික හා ව්‍යාප්ති රැස්විම ක්ෂේත්‍ර දින වැඩමුළුවක් ලෙස 2015 දෙසැම්බර් 3 දින පස්සර තේ පර්යේෂණ ආයතනයේ ක්ෂේත්‍රය තුල ඉතාමත් සාර්ථක ලෙස පවත්වන ලදී .මෙහිදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නියෝජනය කරමින් 98 දෙනෙක් සහභාගී විය. මෙහිදී පාංශු සංරක්ෂණය සහ පස සරු කිරීමේ ක්‍රම ක්ෂේත්‍ර තුල ආදර්ශණය කරන ලදී.

**පුහුණු වැඩසටහන් /ක්ෂේත්‍ර දින වැඩසටහන්**

- ලුණුගල ප්‍රදේශයේ තෝරාගත් කුඩා තේ වතු හිමියන් සඳහා තේ අස්වන නෙලන යන්ත්‍රය (පෙට්‍රල් මගින් ක්‍රියාත්මක) සහ කප්පාදු යන්ත්‍රය පිලිබද පුහුණු වැඩ මුළුවක් තිලිනිවැලි පෞද්ගලික වතුයායෙදී 2015 පෙබරවාරි 19 දින පවත්වන ලදී.
- මල්වත්ත වැලි වැවිලි සමාගමේ විධායක නිලධාරින් සඳහා ආරක්ෂාකාරීව පලිබෝධනාශක පරිහරණය සහ නිමි තේ වල තිබිය හැකි උපරිම කෘෂි රසායන අවශේෂ සම්බන්දව දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015 අප්‍රේල් 01 දින තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන්ගේ සහභාගීත්වය ඇතුව අයිස්ලැබේ වතුයායේදී පවත්වන ලදී'
- රජයේ දින 100 වැඩසටහන යටතේ " විද්‍යාත්මක ලෙස පොහොර භාවිතය සහ පසේ සරුබව වැඩි දියුණු කිරීම් යන මාතෘකා ඔස්සේ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2015 අප්‍රේල් 6,7 සහ 20 යන දිනවල පිටමාරුව, දියතලාව සහ බොරලන්ද යන ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් සඳහා පවත්වන ලදී.
- රැකතැන්න වතුයායේ ක්ෂේත්‍ර නිලධාරින් සහ රසායන ද්‍රව්‍ය ඉසින්නන් සඳහා ආරක්ෂාකාරී පලිබෝධනාශක පරිහරණය පිලිබද පුහුණු වැටසටහනක් 2015 සැප්තැම්බර් 11 දින පවත්වන ලදී.
- පස්සර ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් සඳහා ඌව පලාතට උචිත නව ප්‍රභේද සහ ඒවායේ ලක්ෂණ පිලිබද දැනුවත් කිරීමේ වැඩසටහනක් පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2015 සැප්තැම්බර් 17 දින පවත්වන ලදී.
- අඩාවත්ත වතුයායේදී ක්ෂේත්‍ර නිලධාරින් සහ රසායන ද්‍රව්‍ය ඉසින්නන් සඳහා "නිවැරිදි සහ කාර්යක්ෂම ලෙස වල් පාලනය පිළිබද පුහුණු වැඩමුළුවක් 2015 නොවැම්බර් 11 දින පවත්වන ලදී.
- තොටලාගල තේ කර්මාන්ත ශාලාවට දළු සපයන්නන් සඳහා " නිවැරදිව දළු නෙලීම සහ කොම්පෝස්ට් සෑදීම" පිළිබදව පුහුණු වැඩමුලුවක් 2015 නොවැම්ර් 17 දින පවත්වන ලදී.

**වැවිලි සමාගම් සඳහා විශේෂ ව්‍යාප්ති වැඩමුළු**

"පස සංරක්ෂණය සහ ආරක්ෂා කිරීමේ වසර 2015□ යන තේමාව මූලික කරගෙන විශේෂ ව්‍යාප්ති වැඩමුළු ගණනාවක් 2015 වසර පුරා වැවිලි සමාගම් වතු ක්ෂේත්‍ර තුල වතු අධිකාරින් , සහකාර වතු අධිකාරින්, ක්ෂේත්‍ර නිලධාරින් සහ කම්කරුවන් සඳහා පහත ආකාරයට පවත්වන ලදී.

| දිනය | ස්ථානය | වතුයාය | සහභාගී වු ගණන |
|---|---|---|---|
| 28.05.2016 | තෙල්බැද්ද වතුයාය | බලංගොඩ වැවිලි සමාගම | 81 |
| 29.05.2016 | එල්ටැබ් වතුයාය | මඩොල්සිම වැවිලි සමාගම | 48 |
| 11.06.2016 | බටාවත්ත වතුයාය | මඩොල්සිම වැවිලි සමාගම | 57 |
| 12.06.2016 | පිං අරාව වතුයාය | නමුනුකුල වතුයාය | 91 |
| 28.08.2016 | අයිස්ලැබේ වතුයාය | මල්වත්ත වැවිලි සමාගම | 72 |
| 11.09.2016 | වැලිමඩ වතුයාය | මල්වත්ත වැවිලි සමාගම | 84 |

මෙම වසරේ පස්සර ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කල උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන් සහ වෙනත් සේවාවන් වල සාරාංශයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මහා වතු අංශයේ / කුඩා වතු අංශයේ නිරීක්ෂණ චාරිකා | - | 28 |
| උපදේශාත්මක ලිපි නිකුත් කිරීම | - | 120 |
| පැවැත්වුණු සම්මන්ත්‍රණ /ක්ෂේත්‍ර දින/පුහුණු වැඩසටහන් Estates / Small holders / Students | - | 18 |
| ප්‍රාදේශිය සම්මන්ත්‍රණ | - | 03 |
| කාර්යභාර නිලධාරි සහභාගීවූ රැස්වීම් /සම්මන්ත්‍රණ | - | 45 |
| පාංශු ආම්ලිකතා අගය විශ්ලේශණ | - | 871 |
| පාංශු කාබණික ප්‍රතිශත විශ්ලේශණ | - | 541 |
| අලෙවි කල තේ රිකිලි ප්‍රමාණය | - | 398,500 |
| අලෙවි කල රිකිලි තේ පැල ගණන | - | 7,831 |
| අලෙවි කල ප්‍රකාශන ගණන | - | 77 |
| වාණිජ තේ තවාන් පරීක්ෂණ සංඛ්‍යාව | - | 88 |

**අනුවර්තී පර්යේෂණ**

5000 කාණ්ඩයේ තේ ප්‍රභේද සඳහා වාණිජ වශයෙන් ඇගයීමේ අනුවර්තී පර්යේෂණ 2 ක් ඌව පලාතේ කන්දේගෙදර සහ වැලිමඩ ප්‍රදේශවල කුඩා තේ වතු වල පිහිටුවන ලද අතර, ඒවා ඇගයීමේ කටයුතු ශාක අභිජනන අංශය සමග එක්ව සිදුකරනු ලැබේ.

**ක්ෂේත්‍ර පර්යේෂණ**

පහත සඳහන් ක්ෂේත්‍ර පර්යේෂණ අදාළ අංශයන්ගේ සුපරීක්ෂණය යටතේ මෙම මධ්‍යස්ථානය තුල ක්‍රියාත්මක වේ.

- UVP 09, UVP 10 පර්යේෂණ ශාක අභිජනන අංශයේ අධීක්ෂණය යටතේ මෙම මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර අංක 04 හි ක්‍රියාත්මක වේ.
- ශාක අභිජනන අංශයේ අධීක්ෂණය යටතේ ක්ෂේත්‍ර අංක 02 හි 5000 කාණ්ඩයේ පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 03 හි ඇති ජනක ප්ලාස්ම එකතුව තව දුරටත් නඩත්තු වේ.
- ක්ෂේත්‍ර අංක 03 හි සහ 04 හි ඇති බීජ තේ වල ඇගයීම් කටයුතු තව දුරටත් සිදු කරන ලදී.
- වටපනු හා කීට විද්‍යා අංශයේ අධික්ෂණය යටතේ 5000 කාණ්ඩයේ ප්‍රභේද සඳහා වට පණුවනගේ ප්‍රතිරෝධිතාවය පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කෙරේ.
- ක්ෂේත්‍ර අංක 2 හි PPPB UVP 11 පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 3 හි PPPB UVP 12 සහ PPPB UVP 13 අත්හදා බැලීම් ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 3 හි 5000 කාණ්ඩයේ නව ප්‍රභේද සඳහා මුල්වල වර්ධනය පිලිබඳ ඇගයීම් කටයුතු ශාක කායික විද්‍යා අංශයේ අධික්ෂණය යටතේ සිදු කෙරෙමින් පවතී
- ක්ෂේත්‍ර අංක 2 හි ශාක අභිජනන අංශය මගින් PPPB UVP 14 පර්යේෂණ ආරම්භ කරන ලදී
- ශාක අභිජනන අංශයේද සහය ඇතිව බහු ක්ලෝන බීජ උයනක් මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලදී.

**ADB මව් ශාක ව්‍යාප්තිය**

වැඩි දියුණු කල නව ප්‍රභේද තේ ගොවියන්ට බෙදා හැරීම මෙම මධ්‍යස්ථානය සිදු කරන වැදගත් සේවාවන්ගෙන් ප්‍රධාන එකකි. මෙහිදී රිකිලි 400,000 ලබා දීමේ ඉලක්කයෙන් රිකිලි 398,500 ප්‍රමාණයක් තේ වගාකරුවන් සඳහා නිකුත් කරන ලදී .මෙය ගිය වසරට සාපේක්ෂව 8.3% වැඩි විමකි.

**විශේෂ ක්‍රියාකාරකම් /රැස්වීම්**

" B leaf 60'' වැඩසටහන යටතේ තේ මණ්ඩලය විසින් රෝබේරි තේ කර්මාන්ත ශාලාවට දළු සපයන කුඩා තේ වතු හිමියන් සඳහා සංවිධානය කරන ලද වැඩමුළුවේදි " අස්වැන්න වැඩි කර ගැනීම පිණිස දළු නෙලීමේ මූලධර්ම හා ක්‍රම□ පිලිබද ඉදිරිපත් කිරීමක් ස්ථානභාර නිලධාරි ඒ .එල් .රෝහිත යූ. කුමාර මහතා විසින් සිදුකරන ලදී.

බදුල්ල දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ස්ථානභාර නිලධාරි ක්‍රියාකාරී ලෙස සහභාගී වන අතර එහිදි ඌව පලාතේ තේ වගා කරුවන්ට තේ පර්යේෂණ ආයතනය මගින් සිදු කල ක්‍රියාකාරකම් පිලිබද විස්තරයක් ඉදිරිපත් කරන ලදී. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති "කුඩා තේ හිමියන්ගේ තේ ඉඩම් සංවර්ධනය කිරීම□ යන මැයෙන් දියතලාව සහ මහවෙලගම පැවති ජන හමුවීම් වලදී සම්පත් දායකයකු ලෙස ඒ.එල් .රෝහිත යූ .කුමාර මහතා සහභාගී විය. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පස්සර පැවති "තේ දළු සඳහා ස්ථාවර මිලක් වැඩසටහන සඳහා ඒ.එල්.රෝහිත යූ.කුමාර මහතා සහභාගී විය.

**අමුත්තන්ගේ පැමිණීම**

| | | |
|---|---|---|
| විදේශිකයින් | - | 05 |
| වැවිලි කරුවන් | - | 73 |
| කුඩා තේ වතු හිමියන් | - | 186 |
| පාසැල් සිසුන් | - | 27 |
| උපාධි අපේක්ෂකයින් | - | 05 |
| වෙනත් | - | 174 |
| තේ .ප .ආ .නිලධාරීන් | - | 160 |
| එකතුව | - | 630 |

**පුහුණු අවස්ථා ලබාදීම**

ස්ථානභාර නිලධාරි එ.එල්.රෝහිත යූ. කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයකු ඔහුගේ පර්යේෂණ පුහුණුව සහ හාඩි උසස් ඩිප්ලෝමා ආයතනයේ ශිෂ්‍යයකු ඔහුගේ නේවාසික පුහුණුව මෙම මධ්‍යස්ථානයේදී සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව**

මෙම මධ්‍යස්ථානයේ 32- 4382 දරණ පැජරෝ රථය තීන්ත ආලේප කර අලුත්වැඩියා කරන ලදී.
එදිනෙදා ආයතනික නඩත්තුව සාර්ථකව සිදුකරන ලදී.
මධ්‍යස්ථානයට පහත සදහන් ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගන්නා ලදී.
ෆැක්ස් යන්ත්‍රය - 01
ජල පිරිසිදු කරන (Water filter) - 04
ඩිජිටල් කැමරා - 01
ගිනි නිවන - 02
ඇඹරුම් යන්ත්‍රය (Mixture Grinder)- ආගන්තක නිවාසය සඳහා -01

**අස්වැන්න**

| **මාසය** | **අමු දළු කි.ග්‍රෑ.** | **ඒකක මිල (රු)** | **මුදල (රු)** |
|---|---|---|---|
| ජනවාරි | 1234 | 54.48 | 67228.32 |
| පෙබරවාරි | 1715 | 52.69 | 90363.35 |
| මාර්තු | 3069 | 56.06 | 172048.14 |
| අප්‍රේල් | 3445 | 56.11 | 193298.95 |
| මැයි | 3321 | 50.15 | 166548.15 |
| ජූනි | 4101 | 50.15 | 205665.15 |
| ජූලි | 3240 | 50.48 | 163555.20 |
| අගෝස්තු | 2922 | 43.96 | 128451.12 |
| සැප්තැම්බර් | 3588 | 40.53 | 145421.64 |
| ඔක්තොම්බර් | 3208 | 46.85 | 150294.80 |
| නොවැම්බර් | 3006 | 45.79 | 137644.74 |
| දෙසැම්බර් | 2108 | 48.80 | 102870.40 |

**ආදායම**

| | |
|---|---|
| අමු දළු අලෙවිය ( කි.ග්‍රෑ 35904 ) | Rs 1795361.96 |
| තේ රිකිලි අලෙවිය | Rs 318800.00 |
| තේ පැල අලෙවිය | Rs 187944.00 |
| පාංශු විශ්ලේශණ ගාස්තු | Rs 220700.00 |
| ප්‍රකාශන අලෙවිය | Rs 16570.00 |
| සංචාරක නිවාසයේ නැවතීමේ ගාස්තු | Rs 60300.00 |
| දර විකිණීම | Rs 31200.00 |
| වෙනත් ආදායම ආදායම් | Rs 2730.00 |
| මුළු ආදායම | Rs 2633605.96 |

# ව්‍යාප්ති මධ්‍යස්ථානය-ගාල්ල

ටී. ජී. එන්. මහින්ද
කෘෂි විද්‍යාවේදී (පේරාදෙණිය, ශ්‍රී ලංකාව), විද්‍යාපති (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)
ස්ථාන භාර නිලධාරී

**හැඳින්වීම**
ප්‍රාදේශීය පර්යේෂණ සහ ව්‍යාප්ති කටයුතු ප්‍රවර්ධනය හා ඊට අවශ්‍ය පහසුකම් සැලසීමේ අදහසින්, වර්ෂ 1961 දී කොට්ටව මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. මෙම මධ්‍යස්ථානයේ මූලික කාර්ය භාරය වනුයේ පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු සිදුකිරීම වන අතර, එය පාංශු පී. එච්. අගය පරීක්ෂා කිරීමේ කුඩා පරිමාණයේ විද්‍යාගාරයකින්ද සමන්විත වෙයි. පූර්ණ වපසරිය හෙක්ටයාර 33.92 ක් වන අතර එහි භූමි පරිහරණ රටාව පහත දැක්වේ.

| **භූමි පරිහරණය** | **වපසරිය (හෙක්ටයාර)** |
|---|---|
| පරිණත තේ වගාව | 7.50 |
| නැවත වගාව | 2.04 |
| මව් ශාක වගාව (අපරිණත වගාව ඇතුලත්ව) | 2.09 |
| තේ තවාන | 0.50 |
| නැවත වගාව සඳහා වෙන් කරන ලද කොටස් | 2.50 |
| පාංශු පුනරුත්ථාපනය යටතේ (මානා/ගෞතමාලා) | 1.40 |
| ග්ලිරිසිඩියා වගාව (බල ශක්ති ප්‍රභවයක් ලෙස) | 0.40 |
| තේ බීජ උයන | 0.33 |
| පොල් හා වෙනත් ගස් | 1.50 |
| වගුරු බිම් | 1.20 |
| වන ආවරණය | 5.56 |
| ගොඩනැගිලි, ගෙඋයන්, මාර්ග, කෘෂි කාලගුණ මධ්‍යස්ථානය ආදිය | 8.90 |

ගාල්ල දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති සමාගම් වතු, පෞද්ගලික මෙන්ම කුඩා තේ වතු ආශ්‍රිතව පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන්ගේ උපදේශකත්වය ඇතිව සිදුකරන ලදී. මතු සඳහන් වන ව්‍යාප්ති ක්‍රමවේදයන් මෙම මධ්‍යස්ථානය විසින් මෙම වසරේ ද ක්‍රියාවට නංවන ලදී. 2015 වසර "තේ ඉඩම් වල පාංශු පෝෂක කලමණාකරන පිළිවෙත් ක්‍රියාවට නැංවීමේ වසර" ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල සහයෝගිත්වයෙන් ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය එම තේමාව යටතේ සිය ව්‍යාප්ති කටයුතු දියත් කරන ලදී.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් මත නෙළුව ප්‍රදේශයේ අස්වැන්න අඩුවීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් කොට්ටව මධ්‍යස්ථානයේ උපදේශක කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. මේ සඳහා වලහන්දුව පාංශු හා ශාක පෝෂණ රසායනාගාරයේ නිලධාරීන්ගේද සහයෝගය ලැබුණි. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද "රන් දළු මහිමය" ප්‍රදර්ශණය හා වැඩමුළුවේ සම්බන්ධීකාරකවරයා ලෙස ස්ථාන භාර නිලධාරීවරයා කටයුතු කරන ලදී.
ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කය තුල සංවිධානය කරන ලද "බී ලීෆ් 60" වැඩසටහනට උපදෙස් අංශයේ කාර්ය මණ්ඩලය සහභාගී විය. කලාපයේ වාණිජ තේ තවාන්වල ගුණාත්මය ඉහල නැංවීමේ අරමුණින් සිදුකරනු ලබන, තවාන් පැල සහතික කිරීමේ වැඩසටහන යටතේ වාණිජ තේ තවාන් පරීක්ෂා කිරීම, උපදෙස් අංශයේ කාර්ය මණ්ඩලය විසින් කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ සහයෝගිත්වය ඇතිව, මෙම වසරේ ද ක්‍රියාත්මක කරන ලදී. මීට පෙර වසරේ වාර්තා වූ පරිදිම 2015 වසරේද පාළු සිටුවීමේ හා නැවත වගා කිරීමේ ප්‍රවනතාවයෙහි අඩුවක් දක්නට ලැබුනි. යක්කලමුල්ල තේ පරීක්ෂක කලාපයට අයත් කරාගොඩ ප්‍රදේශයෙන් "දෙනියාය කුහුඹුවා" (ඇක්රොපයිගා ඇකියුටිවෙන්ට්‍රිස්) ගේ හානිය වාර්තා විය.

| 2015 වසරේ උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| * මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් (වතු සමාගම් පාලකයින්/ කුඩා තේ වතු හිමියන්/ශිෂ්‍යයින්/විදේශිකයින්/වෙනත්) | 534 |
| * උපදේශන වාර්තා/ලිපි ලේඛණ (සමාගම් වතු/ කුඩා තේ වතු) | 188 |
| * උපදේශන සඳහා සිදුකරනු ලබන පරීක්ෂණ (දුරකථන මගින් ඉල්ලුම් කරන ලද සහ නිත්‍ය චාරිකා) සමාගම් වතු අංශය සහ කුඩා තේ වතු අංශය | 72 |
| * පුහුණු වැඩ සටහන්/ සම්මන්ත්‍රණ/සමූහ සාකච්ඡා/ ක්ෂේත්‍ර දින/පැහැදිලි කිරීම් | 25 |
| * අධ්‍යාපනික / දැනුම ලබාදීම සහ රැස්වීම් | 52 |
| * ප්‍රකාශන/ පත්‍රිකා/ පොත් පිංච නිකුත් කිරීම (නොමිලයේ නිකුත් කිරීම්ද ඇතුලත්ව) | 119 |
| * වානිජ තේ තවාන් පරීක්ෂණ | 21 |
| * තේ රිකිලි අලෙවි කිරීම | 392375 |
| * තේ පැල අලෙවි කිරීම | 4500 |
| * පී. එච්. අගය සඳහා පාංශු නියැදි පරීක්ෂා කිරීම | 396 |
| * ප්‍රදර්ශණ | 1 |

**අනුවර්තී පර්යේෂණ**

පර්යේෂණ මගින් ජනිත කරන ලද තාක්ෂණයන්හි යෝග්‍යතාවය වගාකරුවන්ගේ අදහස අනුව තක්සේරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් වන අතර, අදාල පර්යේෂණ අංශ වල සහයෝගිත්වයෙන් විවිධ කෘෂි පාරිසරික කලාප තුල අනුවර්තී පර්යේෂණ ස්ථාපනය කර, ක්‍රමාණුකූලව ඒවා අධීක්ෂණය කිරීම තව දුරටත් සිදුකරන ලදී. මේ යටතේ ටී. ආර්. අයි. 5000 කාණ්ඩයේ අනුවර්තී පර්යේෂණ හතරක් මාවනාන, කොට්ටව, ඇත්කඳුර සහ වඳුරඹ යන තේ පරීක්ෂක කලාප තුල ස්ථාපනය කරන ලද අතර ඒවායේ දළු නෙලීම ආරම්භ කරන ලදී. ඉඩම් හිමියන් විසින් තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන්ගේ අධීක්ෂණය මත අස්වනු වාර්තා එක්රැස් කරනු ලැබීය.

**ක්ෂේත්‍ර පර්යේෂණ**

ගාල්ල මධ්‍යස්ථානයේ සහයෝගිත්වයෙන්, අදාල පර්යේෂණ අංශ විසින් මතු සඳහන් පර්යේෂණ පවත්වාගෙන යනු ලබයි.

**ශාඛ අභිජනන අංශය**

ටී. ආර්. අයි. 5000 කාණ්ඩය නිරීක්ෂණ කොටු ක්ෂේත්‍ර අංක 2

ටී. ආර්. අයි. 5000 කාණ්ඩයට අයත් විය හැකි ප්‍රභේද 4 ක (අංක 11/12, 1/10, 107, 23/5) ප්‍රථම හරස් කැපීම සිදු කරන ලද අතර පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

**කීට විද්‍යා හා වටපණු ව්‍යාධි විද්‍යා අංශය**

පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධිත්වය/ග්‍රාහිත්වය පරීක්ෂා කිරීම.

කොට්ටව තේ පර්යේෂණ ආයතනයේ ක්ෂෙත්‍ර අංක 3 හි ස්ථාපිත, රත්නපුර හපුගස්තැන්න වතුයායේ හදාරගඟ ශ්‍රේණියෙන් තෝරාගත් ප්‍රභේද 20 ක, 2 වන කප්පාදුවේදී කරනු ලබන පහතරට සජීවී දැව වේයාගේ හානිය පිළිබඳ තක්සේරුව සිදු කරන ලද අතර පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

**ශෂ්‍ය විද්‍යා අංශය**
තේ වගාවේ පාංශු පුනරුත්ථාපනය සඳහා විවිධ තෘණ විශේෂ වල යෝග්‍යතාවය ඇගයීම. ක්ෂේත්‍ර පර්යේෂණය අවසන් කල අතර ඉන් ලද ප්‍රතිඵලවල වලංගු බව නිර්ණය කිරීමේ කටයුතු ඉදිරියටත් සිදු කෙරෙමින් පවතී. නව උස් සෙවන ශාකයක් වන ඩෙරිස් ශාක විශේෂ 2 ක යෝග්‍යතාවය පහතරට පාරිසරික තත්වයන් හිදී පරීක්ෂා කිරීමේ අරමුණෙන්, කොට්ටව මධ්‍යස්ථානයේ ක්ෂෙත්‍ර අංක 4 හි රෝපණය කරන ලදී.

**ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව ස්ථාපිත මව් ශාක ව්‍යාපෘතිය**
නව වැඩි දියුණු කරන ලද ප්‍රභේද වලට අයත් රිකිලි 392375 ක්, හෙක්ටයාර 2 ක් පමණ වූ මව් ශාක වගාවෙන් නිකුත් කරන ලදී. මෙය ගාල්ල මධ්‍යස්ථානය විසින් ප්‍රදේශයේ වගාකරුවන්හට සපයනු ලබන සේවාවන් අතරින් ප්‍රධාන තැනක් ගනී. මෙම වසරේ නිකුත් කරනු ලැබූ රිකිලි ප්‍රමාණය 2014 වසරට සාපේක්ෂව 38% ක පමණ වර්ධනයක් පෙන්වීය. තේ තවාන් පැල 22200 ක් ප්‍රචාරණය කල අතර ඉන් පැල 4822 ක් වගාකරුවන් හට අලෙවි කරන ලදී. පැල 5500 ක් පමණ මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර වල රෝපණය කරන ලදී.

**අමුත්තන්**
විවිධ අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන්ගේ සංඛ්‍යාව 534 ක් විය.

| **විස්තරය** | **සංඛ්‍යාව** |
|---|---|
| වතු සමාගම් පාලකයින්, පුද්ගලික වතු හිමියන් සහ කුඩා තේ වතු හිමියන් | 465 |
| විශ්ව විද්‍යාල/ඩිප්ලෝමා සිසුන් සහ වෙනත් | 69 |
| **එකතුව** | **534** |

**යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව**
කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීම සහ නවීකරණය කිරීමෙහි (දෙවන අදියර) වැඩ අවසන් කරන ලදී.
කොන්ක්‍රීට් කණු 135 ක් යොදා ගනිමින් මායිම් වැට ඉදිකරන ලදී. ආරක්ෂක නිලධාරීන් විසින් ප්‍රයෝජනයට ගැණුනු කාමර 2ක් නවීකරණය කිරීමෙන් අනතුරුව, ආයතනයේ ආරක්ෂක කටයුතු බාරගත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට සපයන ලදී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් කොට්ටව කෘෂි කාලගුණ මධ්‍යස්ථානයේ නව පාංශු උෂ්ණත්වමාන 4 ක් සවි කල අතර, පාංශු උෂ්ණත්ව සටහන් කිරීම ආරම්භ කරන ලදී.

**ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු**
ටී. ආර්. අයි. 4042 සහ ටී. ආර්. අයි. 4049 ප්‍රභේද වල පැල 5100 ක් පමණ ක්ෂේත්‍ර අංක 1, 2, 4, හා 6 හි රෝපණය කරන ලදී. ක්ෂේත්‍ර අංක 2 හි ස්ථාපිත ටී. ආර්. අයි. 5000 කාණ්ඩයේ මව් ශාක වගාවෙහි පාළු පැල 410 ක් පමණ රෝපණය කරන ලදී. ක්ෂේත්‍ර අංක 1 සහ 4 හි අක්කර 1 ක පමණ බිම් සකස් කර මානා වගා කිරීම අවසන් කරන ලදී.

**අස්වැන්න**
මාසික අස්වැන්න, සපයන ලද දළු වෙනුවෙන් කර්මාන්තශාලාවෙන් ලැබුනු මිල සහ ඉන් ලැබූ මාසික ආදායම පහත දැක්වේ.

| මාසය | අමු දළු(කිලෝ) | මිල(රු) | ආදායම (රු) |
|---|---|---|---|
| ජනවාරි | 3989 | 71.00 | 283219.00 |
| පෙබරවාරි | 3842 | 65.00 | 249730.00 |
| මාර්තු | 3828 | 73.00 | 279444.00 |
| අප්‍රේල් | 3385 | 73.00 | 247105.00 |
| මැයි | 4761 | 73.00 | 347553.00 |
| ජූනි | 3640 | 73.00 | 265720.00 |
| ජූලි | 3326 | 80.00 | 266080.00 |
| අගෝස්තු | 2782 | 73.50 | 204477.00 |
| සැප්තැම්බර් | 3045 | 57.87 | 176214.15 |
| ඔක්තෝබර් | 2490 | 60.20 | 149898.00 |
| නොවැම්බර් | 3439 | 66.07 | 227214.73 |
| දෙසැම්බර් | 3159 | 67.05 | 211785.95 |
| **එකතුව** | **41686** | | **2,908,440.83** |

**ආදායම**
එක් එක් ක්‍රියාකාරකම් වලින් මධ්‍යස්ථානය ලැබූ මුළු ආදායම සහ ඒ පිලිබඳ විස්තරය මතු දැක්වේ.

| **ක්‍රියාකාරකම** | **ආදායම රු.** |
|---|---|
| අමු දළු අලෙවි කිරීම | 2908440.83 |
| තේ රිකිලි අලෙවි කිරීම | 313900.00 |
| තේ පැල අලෙවි කිරීම | 108000.00 |
| පාංශු පී. එච්. අගය පරීක්ෂා කිරීමේ ගාස්තු | 14535.00 |
| ප්‍රකාශන අලෙවි කිරීම | 5840.00 |
| ආගන්තුක නිවාසයේ නවාතැන් සැපයීමේ ගාස්තු | 28600.00 |
| විවිධ ආදායම් | 4340.00 |
| **එකතුව** | **3383655.83** |

# ව්‍යාප්ති මධ්‍යස්ථානය-දෙනියාය

එස්. පී. රත්නායක
කෘෂිකර්ම විද්‍යාවේදී උපාධි (රුහුණ ශ්‍රී ලංකාව) පශ්චාත් උපාධි (චූට් චීනය)
ස්ථාන භාර නිළධාරී

**පොදු කරුණු**
දෙනියාය රත්නපුර මාර්ගයේ පිහිටි තේ පර්යේෂණායතන ව්‍යාප්ති මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු සිදුකරනු ලබයි. එය සතුව කුඩා ප්‍රමාණයේ විද්‍යාගාරයක්ද ඇති අතර එහි පසෙහි ආම්ලිකතාවය, කාබන් විශ්ලේෂණය සහ වට පණුවන් පිළිබද පරීක්ෂා සිදුකරයි. මෙහි භූමිය අක්කර 5 ක පමණ වපසරියකින් යුක්ත වන අතර භූමි පරිහරණ විස්තර පහත දක්වා ඇත.

| | බිම් ප්‍රමාණය අක්කර |
|---|---|
| අළුතින් තේ පැල සිටුවන ලද ක්ෂෙත්‍රය (දළු නෙළන) | 0.3 |
| අළුත් තේ වගාව | 0.4 |
| මව් පඳුරු සඳහා වෙන්කල කොටස | 1.0 |
| පුනරුත්ථාපනය කරන ලද ක්ෂෙත්‍රය ( මානා තෘණ ) | 1.0 |
| ගොඩනැගිලි , උද්‍යාන සහ පාරවල් | 2.3 |
| **මුළු බිම් ප්‍රමාණය** | **5.0** |

තේ පර්යේෂණායතනයේ ප්‍රධාන කාර්යාලයේ උපදේශනය මත පහතරට ප්‍රදේශයට අයත් මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පිහිටි විශාල තේ ඉඩම් ප්‍රමාණයක (කුඩා තේ ඉඩම්, විශාල වතු සහ සමාගම් වතු) ක්ෂෙත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර සමාගම් වතු සහ කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් පරීක්ෂාකර උපදෙස් ලබාදීම, පුහුණු වැඩ මුළු සහ සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීමෙන් සේවා සපයනු ලබයි. පවත්වන ලද බොහෝ පුහුණු පාඨමාලා ක්ෂෙත්‍ර වැඩසටහන් ලෙස ඉතා සාර්ථකව ආයතනය තුලදී සහ පිටස්තර ස්ථානවලදී පැවැත්වුනි. මෙම අවස්ථාවන් වලදී තවාන් කළමනාකරණය, පස සහ සෙවන කළමනාකරණය, දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දූර්වලවීම (රෝග සහ පළිබෝධ පාලනය), පස සංරක්ෂණය සහ පසේ සාරවත් බව කළමනාකරණය සම්බන්ධව විශේෂ අවධානය යොදවන ලද අතර නිසි කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කිරීම තුලින් තේ නිෂ්පාදනය වර්ධනය කිරීම සහ දෙනියාය මධ්‍යස්ථානය සතුව ඇති කාලගුණ මධ්‍යස්ථානය මගින් කාලගුණ දත්ත ලබාගැනීමත් ඒ සම්බන්ධව දැනුවත්කිරීමේ වැඩසටහන් වලත් ඉහල ප්‍රමුඛතාවයක් දෙනුලැබීය. අනෙකුත් සැලසුම් කල වැඩසටහන් ලෙස කුඩා තේ වතු අංශය සඳහා ප්‍රාදේශීය තාක්ෂණ සහ ව්‍යාප්ති සංසදයේ පළමු රැස්වීම, තේ පර්යේෂණායතනයේ නිළධාරීන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිළධාරීන් පිරිසකගේද සහභාගිත්වයෙන්, දෙනියාය තේ පර්යේෂණායතන සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එහි දෙවන රැස්වීම, තේ පර්යේෂණායතනයේ නිළධාරීන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නිලධාරීන් පිරිසකගේද සහභාගිත්වයෙන්, දියදාවේ පිහිටි පැරණි තේ පර්යේෂණායතන ක්ෂෙත්‍රයේදී පවත්වන ලදී. එහිදී "පසේ සාරවත් බව කළමනාකරණය කිරීමේ වසර 2015" වැඩසටහනට මූලිකත්වය දෙනලද අතර ක්ෂෙත්‍ර ආදර්ශනයක්ද පිළියෙල කරන ලදී.

**කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**
ව්‍යාප්ති නිළධාරී එස්.පී.ඒ.පී.කේ.ජයරත්න මහතා 2015 දෙසැම්බර් 03 දින සිට රත්නපුර මධ්‍යස්ථානයට ස්ථාන මාරුවක් ලැබීය. ව්‍යාප්ති නිළධාරී ආර්.ජේ.කේ.රාජපක්ෂ මහතා තලවකැලේ ප්‍රධාන කාර්යාලයේ උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ සිට දෙනියාය මධ්‍යස්ථානයට ස්ථාන මාරුවක් ලැබ 2015 දෙසැම්බර් 03 දින රාජකාරි සඳහා වාර්තාකරන ලදී.

උපදෙස් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් - 2015

| ක්‍රියාකාරකම් | ප්‍රමාණය |
|---|---|
| ආගන්තුකයින්ගේ පැමිණීම (වතු අංශය / කුඩා තේ වතු අංශය / ශිෂ්‍ය ශිෂ්‍යාවන් / විදේශිකයින් / වෙනත්) | 1,228 |
| සියළුම ලිපි (උපදෙස් වාර්ථා , ව්‍යාප්ති කටයුතු සහ පරිපාලන කටයුතු) | 604 |
| උපදෙස් චාරිකා ( ඉල්ලීම් සහ නිත්‍ය චාරිකා ) සමාගම් / පෞද්ගලික වතු සහ කුඩා තේ වතු අංශය සඳහා | 157 |
| පුහුණු පාඨමාලා / සම්මන්ත්‍රණ / කණ්ඩායම් සාකච්ඡා / ක්‍ෂෙත්‍ර දින / අධ්‍යාපන වැඩ සටහන් / ආදර්ශන / දැනුවත් කිරීම් සහ රැස්වීම් | 82 |
| ප්‍රකාශන / පත්‍රිකා / පොත් පිංච නිකුත්කිරීම | 434 |
| පසේ පී එච් අගය පරීක්‍ෂාව | 450 |
| පසේ කාබන් ප්‍රතිශතය පරීක්‍ෂාව | 18 |
| පසේ වට පණුවන් පරීක්‍ෂාව | 30 |
| අමු දළු අස්වැන්න කි.ග්‍රෑ. | 1,352 |
| වාණිජ තේ තවාන් පරීක්‍ෂාව | 93 |
| ප්‍රදර්ශන | - |
| අත්හදාබැලීම් සඳහා දායකත්වය | 11 |

**දින 100 වැඩටහන**

දෙනියාය මධ්‍යස්ථානයේ නිළධාරීන්, තේ පර්යේෂණායතනයේ පාංශු සහ ශාක පෝෂණ අංශයේ නිළධාරීන් සහ මාතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව අකුරැස්ස, කොටපොල සහ පස්ගොඩ ජ්‍යෙෂ්ඨ තේ පරීක්‍ෂක කොට්ඨාශ ආවරණය වන පරිදි අහඹු ලෙස තෝරාගත් ස්ථාන වලින් පොහොර නියැදි ලබාගැනීමත් එම කොට්ඨාශ අවරණය වන පරිදි පස සංරක්‍ෂණය, පසේ සාරවත් බව වර්ධනයකිරීම සහ පොහොර භාවිතයේ කාර්යක්‍ෂමතාවය සඳහා ක්‍රමෝපායන් සම්බන්ධයෙන් සම්මන්ත්‍රණද පවත්වන ලදී.

**පසේ සාරවත් බව කළමනාකරණය කිරීමේ වසර 2015**

දෙනියාය මධ්‍යස්ථානය විසින් සේවා සපයනු ලබන තලවකැලේ, නමුණුකුල සහ මතුරට වතු සමාගම් වලට අයත් වතු 12ක් ආවරණය වන පරිදි ඒවායේ වතු කළමනාකරුවන් සහ ක්‍ෂෙත්‍ර කටයුතුවල නියුතු සේවක පිරිස් දැනුවත් කිරීම පිණිස පස සංරක්‍ෂණය සහ පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳව මනාව පිළියෙල කරන ලද ක්‍ෂෙත්‍ර වැඩසටහන් 3 ක් තේ පර්යේෂණායතන විද්‍යාඥයින් සහ ව්‍යාප්ති නිලධාරීන් විසින් සාර්ථකව පවත්වන ලදී.

**කුඩා තේ වතු අංශයේ යාන්ත්‍රීකරණය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය : පියවර 11**

මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස කටයුතු කරනු ලබන උපදෙස් සහ ව්‍යාප්ති අංශයට අනුබද්ධිත උපදේශක නිළධාරී එස්. පී. රත්නායක මහතා විසින් රත්නපුර තේ පර්යේෂණායතන පරිශ්‍රයේදී සිදුකරන ලද පුහුණුවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් 7 ක් සාර්ථකව සම්බන්ධීකරණය කළ අතර එයට යන්ත්‍ර භාවිතයෙන් දළු නෙළීම, කප්පාදුව සහ වලවල් හෑරීම පිළිබඳව ක්‍ෂෙත්‍ර ආදර්ශනද ඇතුලත්විය. මෙහි සෑම සැසියකටම දින දෙකක නේවාසික පුහුණුවක් ඇතුලත් වූ අතර ඒ සඳහා තෝරාගත් 30 දෙනෙකුගෙන් පමණ සමන්විත කණ්ඩායමක් සහභාගී විය. රත්නපුර තේ පර්යේෂණායතනයේ ආචාර්ය එම්. ඒ. විජේරත්න මහතා ඇතුළු ශෂ්‍ය විද්‍යා අංශයේ සහ උපදෙස් සහ ව්‍යාප්ති අංශයේ නිළධාරීන්ගේ සම්පත් දායකත්වය ඇතිව වැඩසටහන් සාර්ථකව නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, සමස්ත ලංකා කුඩා තේ වතු හිමියන්ගේ සම්මේලනය සහ තේ කම්හල් හිමියන්ගේ සංගමය සමග ඒකාබද්ධව තේ පර්යේෂණායතනය විසින් ක්‍රියාවට නංවන ලද අතර එහි පළමු සහ දෙවන අදියරවල කටයුතු සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව සමාජ ආර්ථික අධ්‍යයනයක් සිදුකිරීමටද කටයුතු ආරම්භ කර ඇත.

**අනුවර්තී පර්යේෂණ**
1. තේ පර්යේෂණායතනයේ ශාක අභිජනන අංශයත්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියත් හා එක්ව මාතර දිස්ත්‍රික්කයේ මොරවක සහ අකුරැස්ස ප්‍රදේශවල කුඩා තේ වතු හිමියන් දෙදෙනකුගේ ඉඩම් වල 5000 වර්ගයේ තේ ප්‍රභේදවල යෝග්‍යතාවය සෙවීමේ අත්හදාබැලීම් 2 ක් ආරම්භ කර ඇත.

2. තේ පර්යේෂණායතනයේ ශාක අභිජනන අංශය හා එක්ව 5000 කාණ්ඩයේ තේ ප්‍රභේදවල යෝග්‍යතාවය සොයා බැලීම සඳහා අත්හදාබැලීම් 2ක් දෙනියාය තේ පර්යේෂණායතන ක්ෂෙත්‍රයේද ස්ථාපිත කර ඇත.

3. පසේ සංයුතිය අනුව ක්ෂෙත්‍රයට ගැලපෙන පොහොර වර්ගය නිර්ණය කිරීමේ (SSFR) අත්හදාබැලීමක්, පාංශු සහ ශාක පෝෂක අංශය හා එක්ව බටුවන්ගල තේ කර්මාන්තශාලාවට අනුබද්ධිත ඉඩමේ ස්ථාපිත කර වසරක් පුරා තොරතුරු එක් රැස්කිරීම සාර්ථකව නිමකර ඇත.

4. කුඩා තේ වතු අංශයේ යාන්ත්‍රීකරණය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ දෙනියාය මධ්‍යස්ථානයට ලැබී ඇති යන්ත්‍ර (බැටරි මගින් ක්‍රියාකරන සහ පෙට්‍රල් මගින් ක්‍රියාකරන දළු නෙළීමේ යන්ත්‍ර සහ තෝරා දළු නෙළීමේ කතුර) භාවිතය පිළිබඳව උපයෝගිතා අත්හදාබැලීමක් මොරවක ප්‍රදේශයේ පෞද්ගලික තේ ඉඩමක ආරම්භ කර ඇත.

**ක්ෂේත්‍ර පර්යේෂණ**
පහත සඳහන් අත්හදාබැලීම් අදාල පර්යේෂණ අංශ හා සහයෝගිත්වයෙන් පවත්වාගෙන යන ලදී.
**ශාක අභිජනන අංශය**
1) ටීආර්අයි 5000 වර්ගයේ තේ ප්‍රභේද - පහත රට වර්ධන ප්‍රචාරණ අදියර 111
ඉංදොල වත්ත, කිරුවානාගඟ වත්ත සහ දෙනියාය වත්තෙහි ස්ථාපිත කර ඇත .
11) වැඩි දියුණු කල ඇට තේ වගාවක් වරාපිටිය කුඩා තේ ඉඩම් හිමියකුගේ ඉඩමක ස්ථාපිතකර ඇත.
111) බීජ ලබාගැනීම සඳහා බීජ තේ පැල වගාවක් කිරුවානාගඟ වත්තේ ස්ථාපිත කර ඇත.

**කීටවිද්‍යා සහ වටපණු ව්‍යාධිවිද්‍යා අංශය**
1) ටීආර්අයි 5000 ප්‍රභේදවල තේ පැල වටපණුවන්ට දක්වන ප්‍රතිචාරය සොයාබැලීම සඳහා අත්හදාබැලීමක් දෙනියාය තේ පර්යේෂණායතන භූමියේ ස්ථාපිතකර ඇත.

**ආගන්තුකයින්**
පහත දැක්වෙන පරිදි ආගන්තුකයින් 1,228 දෙනෙක් සේවා ලබාගැනීම සඳහා දෙනියාය මධ්‍යස්ථානයට පැමිණ ඇත

| | | |
|---|---|---|
| වතු කළමණාකාරිත්වය සහ කුඩා තේ ඉඩම් හිමියන් | - | **504** |
| විශ්ව විද්‍යාල / කෘෂිකර්ම විද්‍යාල / පාසල් සිසුන් සහ වෙනත් අය | - | **724** |

**වෙනත් පුහුණු කටයුතු**
උපදේශක නිළධාරී එස්. පී. රත්නායක මහතාගේ සුපරීක්ෂණය යටතේ ලබුදූව උසස් තාක්ෂණ ආයතනයේ කෘෂිකර්ම ඩිප්ලෝමාධාරී ශිෂ්‍යාවක් විසින් මාස 6 ක පුහුණුවක් සමග පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකර නිබන්ධනයක් ලියා සම්පූර්ණ කරන ලදී.

**යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව**
ආගන්තුක නිවසේ සහ "බී" ශ්‍රේණියේ නිල නිවාසයේ දොර ජනෙල් පින්තාරු කිරීම සහ යකඩ ග්‍රිල් සවිකිරීමත් "ඩී" ශ්‍රේණියේ යුගල නිවාසයේ ජනෙල්වලට යකඩ ග්‍රිල් සවිකිමත් සම්පූර්ණ කරන ලදී. මෙම මධ්‍යස්ථානය සතු වාහන, නිලනිවාස, ආගන්තුක නිවසේ සහ කාර්යාලයේ නඩත්තුව සහ අළුත්වැඩියාවන් ද මාර්ග සහ පරිසරය පිරිසිදු කිරීම සහ නඩත්තුවද නිසි පරිදි සිදුකෙරිණි .

**මධ්‍යස්ථානයේ කටයුතුවලින් ලද සම්පූර්ණ ආදායම**

| **ක්‍රියාකාරකම** | | **ආදායම (රු)** |
|---|---|---|
| ප්‍රකාශන විකිණීම | - | 15,015.00 |
| පස්වල පීඑච් අගය පරීක්ෂාව | - | 39,805.00 |
| පස්වල කාබන් ප්‍රතිශතය පරීක්ෂාව | | 4,590.00 |
| අමු තේ දළු විකිණීම | | 89,970.53 |
| විවිධ ආදායම් | - | 28,540.47 |
| **එකතුව** | **-** | **177, 921.00** |

යටතේ කම්කරුවන් - 02

# ව්‍යාප්ති මධ්‍යස්ථානය- කළුතර


**හැරන් ජයවීර**

ස්ථානභාර නිලධාරි


**හැඳින්වීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම, නිවිතිගල කැලේ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතන පරිශ්‍රයේ පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය මගින් උපදෙස් හා ව්‍යාප්ති සේවා සිදුකරන අතර එහි පාංශු පී.එච්. විශ්ලේෂණය සඳහා කුඩා විද්‍යාගාරයක්ද ඇත. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ, අංශ ප්‍රධානීගේ උපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි තේ වගාකරුවන් සඳහා සේවාවන් සැපයීම සිදුකරයි.

ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගේ සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් හිමියන්ගේ තේ වගා පිළිබඳ දැනුම, කුසලතා වර්ධනය කිරීම සහ නව තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, තේ වගා වැඩමුළු ආදි වැඩසටහන් කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි. මේ යටතේ තේ වගාවේ පාංශු සංරක්ෂණය, සෙවණ කළමනාකරණය, රෝග හා පළිබෝධ පාලනය, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම මධ්‍යස්ථානය මඟින් සිදුකරන ව්‍යාප්ති වැඩසටහන් අතර කුඩා තේ වතු හිමියන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන 'ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදය' විශේෂ තැනක් ගන්නා අතර, එහිදී තේ වගාවට කොළ පොහොර යෙදීම, පාංශු පුණරුත්තාපනය, රෝග කළමනාකරණය, පසේ සාරවත් බව වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම තුළින් කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායීතාවය වැඩිකිරීම, විද්‍යාත්මක පොහොර භාවිතය සහ දේශගුණික බලපෑම් ප්‍රධාන මාතෘකා ලෙස සාකච්ඡා කරන ලදී. තවද මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහකාර කොමසාරිස් තුමා සහ ප්‍රදේශයේ සිටින වැවිලිකරුවන් ද සහභාගී විය.

කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කයන් තුළ ඇති ප්‍රාදේශිය වැවිලි සමාගම් වලට අයත් වතුඅධිකාරීන් සහ සහකාර වතුඅධිකාරීන් වෙනුවෙන් පවත්වන ප්‍රාදේශීය විද්‍යාත්මක සමුළුව රත්නපුර තේ පර්යේෂණ ආයතනය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. කළුතර දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටු රැස්වීම් හා කළුතර දිස්ත්‍රික්ක සංවර්ධන කමිටු රැස්වීම් සඳහා ස්ථානභාර නිලධාරීතුමා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙන ලදී. තවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ඒකාබද්ධව කර්මාන්තශාලා සහ දළු එකතු කරන්නන් සහ කුඩා තේ වතු හිමියන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. කළුතර දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටුවේදි ගරු දිසාපතිතුමාගේ ඉල්ලීම පරිදි සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අයත් ක්ෂේත්‍ර නිලධාරීන්ට තේ වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. මේ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් 1500ක් පමණ සහභාගී විය.

කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ නිලධාරින්, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ තලවකැලේ, රත්නපුර සහ කොට්ටව නිලධාරීන් සමඟ ඒකාබද්ධව කළුතර දිස්ත්‍රික්කය පුරා විහිදී පවතින සියළුම වතුවල ජ්‍යෙෂ්ඨ කළමණාකාරවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන්, සහකාර ක්ෂේත්‍ර නිලධාරීන්, වැඩ පරීක්ෂකවරුන් සඳහා පාංශු සංරක්ෂණ සහ පාංශු පෝෂණ කළමණාකරනය පිළිබඳ ඉතා සාර්ථක වැඩසටහනක් කොටගල වැවිලි සමාගමට අයත් රයිගම් වතුයායේදී සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට කොටගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීතුමා, සාමාන්‍යාධිකාරීතුමා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීතුමා සහ ප්‍රදේශය පුරා පවතින පුද්ගලික තේ කම්හල් හිමියන් කුඩා තේ වතු හිමියන් සහ දළු එකතු කරන්නන් ඇතුළුව 600 කට අධික පිරිසක් සහභාගී වෙන ලදී.

තවද කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ නිලධාරීන් රත්නපුර, දෙනියාය සහ පස්සර මධ්‍යස්ථාන මගින් සංවිධානය කරන ලද පාංශු කළමනාකරණය සහ වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන් මාලාව සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙන ලදී.

තවද කළුතර දිස්ත්‍රික්කය තුළ තේ වගාවේ යාන්ත්‍රීකරණය ප්‍රචලිත කිරීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක්, වැවිලි සමාගම්, කුඩා තේ වතු හිමියන් සහ ප්‍රදේශය පුරා විසිරී පවතින වැවිලි කරුවන් සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. එමෙන්ම කෘෂිකර්ම කමිටුවේදී ගරු දිසාපතිතුමාගේ ඉල්ලීම පරිදි කළුතර දිස්ත්‍රික්කය තුළ ප්‍රමිතියෙන් යුතු තේ පැළ නිෂ්පාදනය සඳහා දිස්ත්‍රික්කය පුරා පවතින තේ තවාන් හිමියන් දැනුවත් කිරීම සහ ඔවුන් හමුවී උපදෙස් ලබාදීමේ වැඩසටහනක්ද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

**කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**

2015 දෙසැම්බර් මස 03 වන දින ව්‍යාප්ති නිලධාරී අසන්ත අබේසූරිය මහතා තලවකැලේ ප්‍රධාන මධ්‍යස්ථානයට ස්ථාන මාරුවීමක් ලැබීය. එමෙන්ම කළමනාකරණ සහකාර ලෙස සේවය කළ ටී.පී. මධුමාලි මහත්මිය 2015 මාර්තු මස 20 වන දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී.

| ක්‍රියාකාරකම් | ගණන |
|---|---|
| උපදෙස් හා සමීක්ෂණ වාර්තා | 328 |
| ක්ෂේත්‍ර චාරිකා | 56 |
| පුහුණු වැඩසටහන් | 40 |
| ප්‍රකාශන විකුණුම් | 67 |
| පස් පරීක්ෂා කිරීම | 176 |
| වාණිජ තේ තවාන් පරීක්ෂණ | 23 |
| කර්මාන්තශාලා පරීක්ෂණ | 11 |
| අනුවර්තී පර්යේෂණ | 11 |
| සහභාගී වූ රැස්වීම් | 45 |

**අනුවර්තී පර්යේෂණ**

රත්නපුර තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහයෝගය ඇතිව කළුතර දිස්ත්‍රික්කය තුළ 5000 කාණ්ඩය සහ වැඩිදියුණු කළ බීජ ප්‍රභේද වල අනුවර්තී පර්යේෂණ තුනක් පැලවත්ත, හොරණ, මීගහතැන්න යන ප්‍රදේශ වලින් තෝරා ගත් කුඩා තේ හිමියන් තිදෙනෙකුගේ ක්ෂේත්‍ර තුළ ස්ථාපනය කරන ලදී.

**ක්ෂේත්‍ර පර්යේෂණ**

- යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ අත්හදා බැලීමක් රත්නපුර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහයෝගීත්වයෙන් මීගහතැන්න සොයිසා වතුයායේදී ස්ථාපනය කරන ලදී.
|---|---|
| එම්.ඒ.ජේ. කුමාර | ලොරි රියදුරු |
| ජේ. එච්.එස්. එන්.ජයමහ | රියදුරු |
| ඩබ්.පී.ඩී අමරසිංහ | රියදුරු |
| ඒ.එම්.ඒ. එච් දර්ශන | රියදුරු |
| ඩබ්. පී. සී පෙරේරා | රියදුරු |
| ඩී.වී.ඩී. ජගත් | රියදුරු |



**නිළධාරීන් පත්කිරීම**

- ඒ.පී.ඩී. හේමන්ත කුමාර මහතා 2015 මැයි මස සිට ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිළධාරී ලෙස බඳවා ගන්නා ලදී.
- සුපරීක්ෂක තනතුරෙහි සිටි රවීන්ද්‍ර විතාරන මහතා 2015 මැයි මස සිට කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිළධාරී ලෙස සේවයේ ස්ථිර කිරීම සිදුකරන ලදී.
- ඒ.ඩබ්.එස්. ඩබ්. පීරිස් සහ ජයන්ත සේනාධීර යන මහත්වරුන් 2015 මැයි මස සිට සහකාර ක්ෂේත්‍ර නිළධාරී තනතුරට උසස් කරන ලදී.
- ජනක පුෂ්පකුමාර සහ පී.පී. වික්‍රමරත්න යන මහත්වරුන් 2015 මැයි මස සිට සහකාර කර්මාන්තශාලා නිළධාරී තනතුරට උසස් කරන ලදී.
- ඒ.ඩබ්.එස්.ඩබ්. පීරිස් මහතා හට 2015 දෙසැම්බර් සිට ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ හන්තාන මධ්‍යස්ථානය වෙත ස්ථාන මාරුවක් ලබා දෙන ලදී.
- බී.සී.කේ. පෙරේරා මහත්මිය 2015 නොවැම්බර් මස සිට වතු වෛද්‍ය නිළධාරී තනතුරට පත්කරන ලදී.
- 2015 නොවැම්බර් මස සිට වතු වෛද්‍ය නිළධාරී එම්. කනගරත්නම් පුල්ලේ මහතා සේවයෙන් විශ්‍රාම යන ලදී.
- 2015 ජනවාරි මස සිට කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිළධාරී එච්.ටී.කේ නිහාල් මහතා සේවයෙන් විශ්‍රාම ගන්වන ලදී.

**සාමාන්‍ය සටහන්**

- ශාන්ත ජෝකීම් තේ කර්මාන්තශාලාවේ තැරුව්කාර වෙළඳ සමාගම ලෙස ෆෝබ්ස් සහ වෝකර් සමාගම අඛණ්ඩව කටයුතු කළේය.
- අංක 2 දළු අඹරන යන්ත්‍රයට අලුත් රෝල කෝනයක් සහ රෝල වලල්ලක් සවිකරන ලදී.
- අංක 4 දළු අඹරන යන්ත්‍රයට අලුත් පණ ගැන්වීමේ යතුරක් (ස්ටාර්ටර්) සවිකරන ලදී.
- අංක 1,02,08, සහ 09 දලු අඹරන යන්ත්‍ර අලුත්වැඩියා කරන ලදී.
- ඇඹරුම් යන්ත්‍රයේ වායු සම්පීඩක යන්ත්‍රය සහ වර්ණ විභේදක යන්ත්‍රය අලුත්වැඩියාකරන ලදී.

**සමාජ සුභසාධන ක්‍රියාකාරකම්**

- කම්කරු අමාත්‍යංශයේ සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ පූර්ණ අනුග්‍රහය ඇතිව අක්ෂි සායනයක් පවත්වන ලදී.
- වෙසක් පුන් පොහොය දින නිමිති කරගෙන දන්සල් ව්‍යාපාරයක් ශාන්ත ජෝකිම් කර්මාන්ත ශාලා පරිශ්‍රයේ දී සිදුකරන ලදී.
- ලෝක එඩ්ස් දිනය නිමිත්තෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ සායනයක් රත්නපුර මහ රෝහලේ සමාජ රෝග අංශයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ දායකත්වයෙන් සිදුකරන ලදී.
- ඩෙංගු මර්ධනය උදෙසා කර්මාන්තශාලා හා අවට ප්‍රදේශයේ ශ්‍රමදාන ව්‍යාපාරයක් පවත්වන ලදී.
- කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යංශයේ ආධාරයෙන් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ වහලයේ කොටසක් අළුත්වැඩියා කරන ලදී.

| **2014 දෙසැම්බර් 31 දිනට භූමි ප්‍රමාණය (හෙක්ටයාර)** | **භූමි ප්‍රමාණය (හෙක්ටයාර)** |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 50.15 |
| නොමේරූ තේ වගාව | 8.00 |
| පොල් වගා බිම් (තේ .ප.ආ) | 3.89 |
| වාණිජ පැල තවාන් බිම් | 1.58 |
| නොමේරූ රබර් වගාව | 3.20 |
| පරිණත රබර් වගා බිම් | 7.12 |
| පරිණත රබර් වගා බිම් (මිශ්‍ර වගාව) | 3.68 |
| කුඹුරු | 8.74 |
| මව් ශාඛ ව්‍යාපෘති ක්ෂේත්‍ර බිම් (ආසියානු සංවර්ධන බැංකු ආධාර) | 13.01 |
| යෝජිත නිවාස ව්‍යාපෘතිය ක්ෂේත්‍ර අංක 05 | 1.00 |
| ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ගොඩනැගිලි හා පර්යේෂණ ක්ෂේත්‍ර සහිත බිම් | 12.02 |
| ගොඩනැගිලි මං මාවත් ලඳු කැලෑ සහ පතන බිම් | 29.59 |
| **එකතුව** | **141.98** |

*2012 අප්‍රේල් මාසයේදී කරන ලද තේ පැල සංගණනයට අනුව ඵලදායී තේ වගාවන් සහිත භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)

| | |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | -13.54 |
| තේ නෙලීම් කටයුතු සඳහා නිදහස් කරන ලද මව් ශාඛ ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර බිම් | -10.98 |
| මුළු ඵලදායී තේ වගා භූමි ප්‍රමාණය | -24.52 |

**ඵලදාව හා අස්වැන්න (නිමි තේ කිලෝග්‍රෑම් ප්‍රමාණය)**

**පසුගිය වසරට සාපේක්ෂව 2015 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය**

**A).** තේ වගාව

| **වර්ෂය** | **ශාන්ත ජෝකීම් වත්තේ දළුවල නිෂ්පාදනය** | **මිලදී ගන්නා ලද දළුවල නිෂ්පාදනය** |
|---|---|---|
| 2015 | 31,060 | 172,213 |
| 2014 | 39,011 | 307,435 |
| Variance | -7,951 | -135,222 |

වසරෙන් වසර ඵලදායී තේ වගා බූමි ප්‍රමාණයේ අඩුවීම හේතුවෙන් දිගින් දිගටම වතුයායේ තේ අස්වැන්න පහත වැටි ඇත.

**B).** රබර් වගාව

| වර්ෂය | මුලු අස්වැන්න (කිලෝග්‍රෑම) | හෙක්ටාර් 1 ක අස්වැන්න |
|---|---|---|
| 2014 | 5,306 | 521 |
| 2015 | 43 | 4.22 |
| වෙනස | -5,263 | -516 |

රබර් වෙළඳපොළ අව ප්‍රමාණය විම හේතුවෙන් රබර් කිරි කැපීම නතර කිරීමට සිදුවිය.

**තේ වගා කටයුතු**
තේ ක්ෂේත්‍ර නගා සිටුවීම හා නැවත වගාව යටතේ තේ පැල 32,965 ක් ප්‍රමාණයක් සිටුවන ලදී.

| **ක්ෂේත්‍ර අංකය** | **තේ පැල ගණන** |
|---|---|
| 8 B | 100 |
| 2X | 640 |
| 3A | 300 |
| 3C | 8,550 |
| Factory Block | 365 |
| 2F | 500 |
| 8F | 21,230 |
| 01 | 1,280 |
| **Total** | **32,965** |

**ශාන්ත ජෝකිම් පැල තවාන**
2015 වර්ෂය තුල වත්තේ තවාන් කරන ලද පැල 91,010 ක් විකුණන ලදී.

**ආසියානු සංවර්ධන බැංකු මව් වගා ව්‍යාපෘති වැඩසටහන**
කුඩා තේ වතු හිමියන් හා වැවිලි සමාගම් සඳහා රිකිලි තේ අතු 91,200 ක ප්‍රමාණයක් 2015 වර්ෂයේදී නිකුත් කර ඇති අතර 2014 වර්ෂයේ නිකුත් කරන ලද අතු ප්‍රමාණය 235,250 ක් විය.

**කර්මාන්තශාලාවේ තේ නිෂ්පාදනය**
2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ කර්මාන්තශාලාවේ නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 143,173 කින් පහත වැටි ඇත. 2015 වර්ෂයේදී තේ කිලෝවක ශුද්ධ අලෙවි මිළ රු 393/09 ක් වූ අතර 2014 වර්ෂයේදී එය රු 432/85 විය.

**කාළගුණය හා වර්ෂාපතනය**
2015 වර්ෂයේදී වර්ෂාපතනය මි.මි 3727.85 ලෙසත් වැසි දින ගණන 160ක් ලෙසත් සටහන්වු අතර 2014 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මි 3700.10ක් වූ අතර වැසි දින ගණන 194ක් විය.

**වෙළඳ ප්‍රතිඵල**
2015 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන විට රු 16,352,741/- ක පාඩුවක් සටහන් විය.

**මානව සම්පත් සංවර්ධනය සහ ධාරිතා වර්ධනය**
**සේවක මණ්ඩලය ශක්තිමත් කිරීම සහ අභිප්‍රේරණය**

**සේවක බඳවා ගැනීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එන්.සී. වීරකෝන් | තාක්ෂණ නිලධාරි | 20.04.2015 |
| ආර්.සී. ජනනි | තාක්ෂණ නිලධාරි | 20.04.2015 |
| ජේ.ඒ.වයි.ආර්.ජයකොඩි | තාක්ෂණ නිලධාරි | 20.04.2015 |
| කේ.පී.රණසිංහ | අභ්‍යන්තර විගණක | 20.04.2015 |
| එස්.එම්.එන්.ආර්.ජයසිංහ | නේවාසික ඉංජිනේරු | 05.05.2015 |
| එස්.එන්.ටී.ෆර්නැන්ඩු | ඉංජිනේරු සහකාර (කාර්මික) | 06.07.2015 |

**ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ජී.ඒ.ඒ.ආර්.පෙරේරා | පර්යේෂණ නිලධාරි | 11.01.2015 |
| ටී.පී.මදුමාලි | කළමනාකරණ සහකාර | 20.03.2015 |
| එස්.කේ.ජයසිංහ | පර්යේෂණ නිලධාරි | 18.12.2015 |
| එස්.එම්.එන්.ආර්.ජයසිංහ | නේවාසික ඉංජිනේරු | 11.12.2015 |

**විශ්‍රාම ගැනීම්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| පී.සිවලිංගම් | රියදුරු | 27.01.2015 |
| කේ.ඒ.එෆ්.ධර්මදාස | සහකාර ජලනළ කාර්මික | 11.08.2015 |
| ජී.එල්.සී.ගලහිටියාව | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | 16.10.2015 |
| බී.එම්.එම්.කේ.බස්නායක | පොදු සේවක | 22.10.2015 |
| ඩී.ඩී.ලියනගෙ | පරීක්ෂණ නිළධාරි | 03.11.2015 |
| එම්.කාලියපෙරුමාල් | රියදුරු | 25.12.2015 |

**අභාවයන්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ජී.ගුණසේකර | පොදු සේවක | 21.10.2015 |
| සී.එස්.කේ.කිරිබත්ගොඩ | ලඝු/යතුරු ලේඛිකා (ඉංග්‍රීසි) | 16.12.2015 |

**විදෙස් පුහුණු /සැසි/සම්මන්ත්‍රණ**
2015 මැයි 15 සිට ජුනි 28 දක්වා චීනයේදී පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ තේ ආහාර නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන සඳහා ප්‍රධාන පර්යේෂණ නිලධාරි ආචාර්ය ඩබ්ලිව්. එස්.බොතේජු මහතා, පර්යේෂණ නිලධාරි එල්.ජයසිංහ මහතා සහ පර්යේෂණ නිලධාරිනී එස්.එච්.පී.වඩුගේ මහත්මිය සහභාගි විය.

2015 ජුනි 2 සිට 9 දක්වා චීනයේදි පැවති 25 වන ISO තාක්ෂණික කමිටු මණ්ඩල රැස්වීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂක ආචාර්ය අයි.එස්.බී.අබේසිංහ මහතා සහභාගි විය.

2015 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 03 දක්වා ඉන්දුනීසියාවේ පැවති ආහාර, කෘෂිකර්ම සහ ස්වභාවික සම්පත් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව සඳහා ජීව රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරි ආචාර්ය කේ.එම්.මෙවන් මහතා සහභාගි විය.

2015 ඔක්තෝබර් 8 සිට 9 දක්වා තායිවානයේදි පැවති තේ සංස්කෘතිය, නිර්මාණශීලිත්වය සහ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කතිකාව සඳහා ජීව රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරි ආචාර්ය කේ.එම්.මෙවන් මහතා සහභාගි වියග

2015 ඔක්තෝබර් 10 සිට 12 දක්වා ඉන්දියාවේ පැවති ජාත්‍යන්තර විද්‍යා සමුළුව සඳහා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂක ආචාර්ය අයි.එස්.බී.අබේසිංහ මහතා සහභාගි වියග

2015 ඔක්තෝබර් 14 සිට 16 දක්වා ඉතාලියේ පැවති FAO/IGG තේ පිළිබඳ අන්තර් සැසි වාර සමුළුව සඳහා ආචාර්ය අයි.එස්.බී.අබේසිංහ සහ ආචාර්ය එම්.ඒ.විජේරත්න යන මහත්වරුන් සහභාගි විය.

2015 සැප්තැම්බර් 8 සිට 28 දක්වා චීනයේ පැවතිල සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තේ සංස්කෘතිය සහ කර්මාන්තකරණය පිළිබඳ සැසිය සඳහා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිනී ආචාර්ය එච්.ඩබ්.ශ්‍යාමලී මහත්මිය සහභාගි විය.

2015 දෙසැම්බර් 7 සිට 17 දක්වා චීනයේ යුනාන් කෘෂිවිද්‍යා ඇකඩමිය මගින් සංවිධානයකල චාරිකාව සඳහා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී එම්.ඒ.බී.රණතුංග මහතා සහභාගි විය .

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව**

පහත පරිදි ගොඩනැගිලිවල වාර්ෂික තීන්ත ආලේප කිරීමේ වැඩසටහන සිදු කරන ලදී. පරිපාලන සහ විද්‍යාගාර ගොඩනැගිල්ල, A මාදිලියේ නිළ නිවාස අංක 04, B මාදිලියේ නිළ නිවාස අංක 05 සහ 06, C මාදිලියේ නිළ නිවාස අංක 02, 15, 22 සහ 52, D මාදිලියේ නිළ නිවාස අංක 09, 08, 06, 07, 14, 15, 46, සහ 32 ද, පරිපාලන හා විද්‍යාගාර ගොඩනැගිල්ලේ බාහිර තීන්ත ආලේපය සිදු කිරීම සහ සියළුම අළුත් වැඩියා කටයුතු සිදු කිරීමද නිම කරන ලදී.

අභ්‍යන්තර මාර්ග පද්ධතිය අළුත් වැඩියාවට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීම සහ කාර්යාලයේ සියළුම නාම පුවරු තීන්ත ආලේපනය අවසන් කරන ලදී. කොට්ටව කාර්යාල සංකීර්ණයේ වැඩිදියුණු කිරීම් (අදියර 2) සම්පූර්ණ කරන ලදී. ශ්‍රී ලංකා තේ පර්යෙෂණායතනයේ ජල පිරිපහදුවේ පිළිසකර කිරීම් සාර්ථකව කෙරෙමින් පවතින අතර මේ වන විට 90% ක පමණ වැඩ අවසන් කර ඇත.

**ජල සැපයුම**

2015 වර්ෂය පුරා වැඩ පත්‍ර 179 ක් යටතේ සේවාවන් මෙහෙයවන ලදී. අළුතින් ඉදි කරන ලද ළිද සඳහා ජල පොම්පයක් සහ ජල නළ සවිකිරීම සිදුකරනු ලැබීම සහ පිරිපහදු නොකරන ලද ජල නළ පද්ධතියේ අළුත්වැඩියාව සිදු කරන ලදී. පිරිපහදු පද්ධතිය සහ අවසාදිත ගබඩා ටැංකිය පිරිසිදු කරන ලදී.

**විදුලි කාර්මික ඒකකය**

විදුලි කාර්මික ඒකකය මගින් 2015 වර්ෂය පුරා වැඩ පත්‍ර 177 යටතේ සේවාවන් නිම කරන ලදී. සේවක නිළ නිවාස 58 ක නඩත්තු කටයුතු සිදු කරන ලදී. ( මාදිලිය - 09, ඊ මාදිලිය - 09, C මාදිලිය - 20 සහ D මාදිලිය - 20) තවද ජ්‍යෙෂ්ඨ නිලධාරි, කනිෂ්ඨ නිලධාරි කාන්තා නේවාසිකාගාර, සංචාරක නිවාසය, මෝටර් ගරාජය, යාන්ත්‍රික වැඩපළ සහ ශාන්ත කුම්බීස් වත්ත ආදියෙහි නඩත්තු කටයුතු සිදු කරන ලදී ලදී. තාක්ෂණ අංශයේ ගොඩනැගිලි හා විද්‍යාගාරවල නඩත්තු කටයුතුද සිදුකරන ලදී.

**දුරකථන හුවමාරුව**

2015 වර්ෂය පුරා පහත සඳහන් පරිදි නඩත්තු කටයුතු සිදු කරන ලදී.
දුරකථන ආම්පන්න අළුත්වැඩියාව හා ප්‍රතිස්ථාපනය, PABX පද්ධතියේ සාමාන්‍ය නඩත්තු කටයුතු සහ සේවාවන් සහ අනෙකුත් දුරකථන රැහැන් නඩත්තු කටයුතු සහ සේවාවන් (වැඩ පත්‍ර 75) ආයතනයේ MSAM රැහැන් පද්ධතිය ස්ථාපනය හා වයරින් කිරීම. නව UPS බල පද්ධතියක් සහ දුරකථන / ෆැක්ස් ග්‍රාහකයන් ස්ථාපනය කිරීම. හන්තාන ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ADSL පද්ධතිය සඳහා නව දුරකථන රැහැන් සවිකිරීම වයරින් කිරිම, අළුත්වැඩියා කිරීම සහ ආයතනයේ ස්ථාපනය කොට තිබූ CDM දුරකථන පද්ධතිය ඉවත් කොට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට භාර දීම සහ නව දුරකථන සම්බන්ධතා 10ක් සැපයීම.

**ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්**

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන සහ සුළු)**

විදේශීය සහ දේශිය භාණ්ඩ මිලදි ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (සුළු) රැස්වීම් 7ක් පවත්වන ලදී. එමගින් රසායන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ, යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර උපකරණ, තේ වගාව සඳහා කෘෂිකාර්මික යෙදවුම්, මුද්‍රිත පොත්පත් හා ප්‍රකාශන, යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස්, විද්‍යාගාර උපකරණ හා වාහන, කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය, ඉන්ධන හා ලිහිසි තෙල්, ගොඩනැගිලි දව්‍ය සහ පරිඝණක දඩාංග සහ විදුලි උපකරණ අමතර කොටස් දර සහ පොහොර ආදීය මිලදී ගන්නා ලදී.

Leaf Area meter, Fluorescense අන්වීක්ෂය, Real time PCR යන්ත්‍රයක්, ශාන්ත කුම්බිස්, ශාන්ත ජෝකිම් වතු සඳහා දර, ගොඩනැගිලි සහ වාහන සඳහා රක්ෂණාවරණ, වාහනයක් මිලදි ගැනිම (එක් ට්‍රැක්ටරයක් සහ ටේලරයක්) සහ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා ආරක්ෂක සේවාවන් සැපයීම ආදිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) රැස්වීම් 7 ක් පවත්වන ලදී.

**ප්‍රවාහන සහ යාන්ත්‍රික ගරාජය**

ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ සුභසාධන පහසුකම් සැපයීම සඳහා රු.517,736 පමණ වැය කොට එක් වාහනයක අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබීම සහ දෛනික ප්‍රවාහන ඉල්ලීම්, ප්‍රවාහන වැටසටහන සහ සති අන්ත ප්‍රවාහන සේවාවන් සතුටුදායක ලෙස සපයන ලදී. වාහන සංචිතයේ සාමාන්‍ය නඩත්තු කටයුතු සහ දෛනික අළුත්වැඩියාවන් ද සිදු කරන ලදී. තවද ඇංජින් වල සම්පූර්ණ පිරිවැඩියාවන්, සේවාවන් සහ ලිහිසි තෙල් යෙදීම්, ටයර් ටියුබ් නැවත සවිකිරීම් සහ භාවිතය නිසා සිදුවන විවිධ අළුත්වැඩියාවන් සිදුකරන ලදී. (අලුත්-වැඩියාවන් සඳහා ඇස්තමේන්තුගත මුදල - රු. 1,250, 000)

| | |
|---|---|
| වාහන සංචිතයේ ධාවන සැතපුම් ගණන | - 830289km |
| යතුරුපැදි සංචිතයේ ධාවන සැතපුම් ගණන | - 43944km |

| | |
|---|---|
| වාහන සේවා කිරීම් | - 91 |
| ටයර් හා ටියුබ් මාරු කිරීම් | - 88 |
| අනෙකුත් අළුත්වැඩියා | - 172 |
| අළුත්වැඩියා කරන ලද ගියර් පෙට්ටි | - 02 |
| අනෙකුත් අළුත්වැඩියා | - 353 |

**භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය**

ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි භාවිතා නොකරන සහ බැහැර කරන ලද භාණ්ඩ හඳුනා ගැනීම සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කරන ලදී. තේ පර්යේෂණ ආයතනයේ අංශයන් සහ ඒකකයන්හි පැරණි බැහැර කරන ලද භාණ්ඩ 2015 ඔක්තොම්බර් 30 දින ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණන ලදී.

**<u>ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය</u>**
**<u>2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය</u>**

| | | ස්ලිප්සාස් | ස්ලිප්සාස් | ස්ලිප්සාස් |
|---|---|---|---|---|
| | සටහන | 2015<br>රු. '000 | 2015<br>රු. '000 | 2014<br>රු. '000 |
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් සහ මුල්‍ය සමකයන් | 07 | | 88,223 | 97,574 |
| වෙළඳ සහ අනෙකුත් ණය ගැතියෝ | 08 | 67,310 | | 75,545 |
| අඩු කළා: අවිනිශ්චිත ලැබීම් සඳහා වෙන් කිරීම | | 110 | | 132 |
| | | | 67,200 | 75,413 |
| | | | 155,424 | 172,987 |
| පරිලේඛන / තොග | 09 | 26,967 | | 25,653 |
| පූර්ව ගෙවීම් | 10 | 8,426 | | 4,404 |
| අතිරික්තය හා හිඟය | 11 | 76 | | 75 |
| | | | 35,469 | 30,132 |
| **මුළු ජංගම වත්කම්** | | | 190,893 | **203,119** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 12 | | 13,172 | 9,863 |
| දේපළ, පිරියත හා උපකරණ | 13 | 1,175,842 | | 1,127,777 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | | 743,885 | | 714,558 |
| | | | 431,957 | 413,219 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | | 2,404 | 2,404 |
| | | | 434,361 | 415,623 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | | 447,532 | **425,486** |
| **මුළු වත්කම්** | | | **638,425** | **628,606** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ | 15 | 15,337 | | 14,836 |
| උපචිත වියදම් | 16 | 18,866 | | 21,626 |
| කෙටි කාලීන ණය | 17 | 31,159 | | 39,174 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 18 | 7,224 | | 7,501 |
| සේවක ප්‍රතිලාභ | 19 | 3,089 | | 3,114 |
| | | | 75,675 | 86,252 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| කෙරීගෙන යන ව්‍යාපෘති | 20 | 6,409 | | 3,114 |
| පාරිතෝෂිත ගෙවීම් වෙන් කිරීම් | 21 | 165,717 | | 155,764 |
| ඉන්ධන සඳහා තැන්පතු | 22 | 19 | | 20 |
| දිගු කාලීන ණය | 23 | 10,667 | | 21,000 |
| | | | 182,812 | 179,897 |
| **මුළු වගකීම්** | | | 258,487 | 266,149 |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **379,938** | **362,456** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | |
| ප්‍රදානයන් සහ සංචිත | 24 | | 214,304 | 182,845 |
| තේ පර්යේෂණ අරමුදල | | | 165,634 | 179,611 |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | | **379,938** | **362,456** |

.............................
**Chairman - TRB**

**Certified by:-** .............................
**Accountant**

.............................
**Director - TRI**

**For Senior Accountant**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය**
**2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | ස්ලිප්සාස් 2015 රු. '000 | ස්ලිප්සාස් 2014 රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | |
| රාජ්‍ය ලැබීම් (පුනරාවර්තන) | 25 | 341,321 | 299,726 |
| වෙනත් ආදායම් (ප්‍රාග්ධන) | | 47,732 | 43,737 |
| විලම්භිත ආදායම් | 26 | 23,048 | 26,097 |
| | | **412,100** | **369,560** |
| එකතු කළා: වතුවලින් ලැබූ ශුද්ධ ලාභය හො අලාභය | 27 | (10,056) | (8,911) |
| | | **402,044** | **360,650** |
| **මෙහෙයුම් වියදම්** | 28 | | |
| වැටුප් | | 258,618 | 214,185 |
| ගමන් වියදම් | | 7,745 | 9,976 |
| සැපයුම් හා පරිභෝජන | | 18,590 | 23,902 |
| අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු | | 24,240 | 25,347 |
| කොන්ත්‍රාත් සේවා - ආරක්‍ෂණ / රක්‍ෂණ | | 26,976 | 13,444 |
| විදුලි පරිභෝජන | | 16,644 | 20,552 |
| සන්නිවේදන | | 2,013 | 2,881 |
| පර්යේෂණ හා සංවර්ධන | | 32,395 | 34,635 |
| ක්ෂයවීම් | | 25,100 | 25,464 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 2,382 | 25,887 |
| මූල්‍ය පිරිවැය | | 645 | 628 |
| **මුළු මෙහෙයුම් පිරිවැය** | | **415,347** | **396,901** |
| අතිරේක අයිතමයන්ට පෙර මුළු අතිරික්තය / හිඟය | | (13,302) | (36,251) |
| පූර්ව වාර්ෂික ගැලපුම් | | (674) | (746) |
| **අදාළ කාලය තුළ මුළු අතිරික්තය / හිඟය** | | **(13,977)** | **(36,997)** |

**<u>තේ පර්යේෂණ මණ්ඩලය</u>**

**<u>2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>**

| | | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | | |
| ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ අතිරික්තය / හිඟය | | (13,977) | (36,997) |
| **ගැලපීම්** | | | |
| අලාභ සහ කපා හැරීම් / පෙර වර්ෂයේ ගැලපීම් | 674 | | 1,679 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 16,743 | | 15,360 |
| ක්ෂයවීම් | 30,527 | | 32,377 |
| ආයෝජන මත පොලී ආදායම් | (3,819) | | (5,457) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ගිණුම්කරණ ලාභ | (501) | | - |
| විලම්භිත ආදායම් (පුනරාවර්තන සහ ප්‍රාග්ධන) | (390,353) | | (382,630) |
| | | (346,729) | (338,671) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | **(360,706)** | **(375,668)** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| තොග අඩු වීම් / වැඩි වීම් | (1,314) | | (129) |
| වාණිජ, තැන්පතු හා වෙනත් ලැබීම්වල අඩු වීම් / වැඩි වීම් | 4,216 | | 13,843 |
| අතිරික්තය හා ඌණතාවයේ අඩු වීම් / වැඩි වීම් | (1) | | (44) |
| ණයහිමියන්ගේ හා අනෙකුත් ගෙවීම්වල අඩු වීම් / වැඩි වීම් | (2,599) | | 2,816 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු අඩු වීම් / වැඩි වීම් | (1) | | - |
| | | 301 | 16,486 |
| | | (360,405) | (359,182) |
| අඩු කළා: පාරිතෝෂිත ගෙවීම් | (6,790) | | (14,683) |
| | | (6,790) | (14,683) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | **(367,195)** | **(373,865)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | | |
| ස්ථාවර වත්කම් විකුණුම් උත්පාදන | 501 | | - |
| ආයෝජන ක්‍රියාකාරකම් මත පොලිය | 3,819 | | 5,457 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (49,926) | | (40,615) |
| කෙරෙමින් පවතින ව්‍යාපෘති වැඩිවීම් | (3,309) | | (990) |
| කෙරීගෙන යන ව්‍යාපෘති වැඩිවීම් | 3,295 | | 2,519 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / මුදල් ගලා යෑම් | | (45,620) | (33,629) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | **(412,815)** | **(407,494)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ලැබීම් / මුදල් ගලා යෑම්** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | 420,995 | | 385,731 |
| අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රදාන | 817 | | 678 |
| ලද ණය | 33,000 | | 65,174 |
| පියවූ ණය | (55,905) | | (20,000) |
| තැරැව්කරුවන්ගෙන් ලද අත්තිකාරම් | 59,794 | | 207,704 |
| තැරැව්කරුවන්ගෙන් ලද අත්තිකාරම් ආපසු ගෙවීම් | (55,237) | | (225,995) |
| | | 403,464 | 413,292 |
| **මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ අඩු වීම් / වැඩි වීම්** | | **(9,351)** | **5,798** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය** | | **97,574** | **91,776** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය** | | **88,223** | **97,574** |

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය**

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය**

රු. '000

| | තේ පර්යේෂණ අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රධාන හා සංචිත | මුළු හිමිකම් |
|---|---|---|---|---|
| 2015/01/01 දිනට ශේෂය | 179,610 | - | 182,845 | 362,455 |
| ගිණුම් තැබීමේ වෙනස්කම් නැවත ගලපන ලද ප්‍රතිපත්තීන් හා ප්‍රමිත වටිනාකම් | - | - | - | - |
| පූර්ව වාර්ෂික ගැලපුම් | (674) | - | - | (674) |
| ප්‍රධාන හා සංචිතයන්ට ලද ශේෂ | - | - | 421,812 | 421,812 |
| විලම්භිත ආදයම් වෙත මාරු කළ ශේෂ | - | - | (390,353) | (390,353) |
| වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය | (13,302) | - | - | (13,302) |
| 2015/12/31 දිනට ශේෂය | 165,634 | - | 214,304 | 379,938 |

**තේ පර්යේෂණ මණ්ඩලය**
**ශා. කුම්බිස් සහ ලැම්ලියර් වතු සඳහා 2015 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා කාරක ගිණුම**

| 2014 රු. ශත | 2014 කිලෝ ග්‍රෑම් | | 2015 කිලෝ ග්‍රෑම් | 2015 රු. ශත | 2015 රු. ශත |
|---|---|---|---|---|---|
| | | **ආදායම** | | | |
| | | **තේ විකුණුම් දළ ආදායම** | | | |
| 166,460,264.41 | 325,669.75 | තැරැව්කාර ආයතන හරහා විකුණුම් | 327,537.50 | 162,314,411.08 | (සටහන අංක 1) |
| 18,559,255.00 | 44,036.25 | දේශීය විකුණුම් සහ නොමිලේ බෙදා දීම් | 65,840.50 | 27,374,393.01 | |
| **185,019,519.41** | **369,706.00** | | **393,378.00** | | **189,688,804.09** |
| | | **එකතු කළා:** | | | |
| (104,828.05) | | ඒඩීබී ව්‍යාපෘති ලාභය (රිකිලි තේ ආදායම) | | (233,420.73) | |
| 2,066,969.44 | | විවිධ ආදායම් | | 2,382,829.15 | |
| 382,709.63 | | විලම්බිත ආදායම් | | 381,322.63 | |
| 2,344,851.02 | | **මුළු ආදායම** | | | 2,530,731.05 |
| **187,364,370.43** | | | | | **192,219,535.14** |
| | | **වියදම්** | | | |
| | | **අඩු කළා : වතු වියදම්** | | | |
| 49,595,168.35 | | පොදු ගාස්තු | | 48,137,532.93 | |
| 14,551,381.96 | | ක්ෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 14,193,268.85 | |
| 60,722,543.47 | | නිෂ්පාදනය | | 64,780,010.93 | |
| 39,600,789.89 | | දළු මිලදී ගැනීම් (ප්‍රවාහන වියදම්ද සහිතව) | | 40,360,727.81 | |
| 6,411,243.66 | | බාහිර තේ වගාකරුවන් | | 6,769,807.97 | |
| **170,881,127.33** | | | | | **174,241,348.49** |
| | | **පරිපාලන හා මූල්‍ය** | | | |
| 5,324,646.90 | | ප්‍රසාද දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 5,036,033.02 | |
| 2,216,947.83 | | ක්ෂය වීම් | | 2,253,900.90 | |
| **7,541,594.73** | | | | | **7,289,933.92** |
| | | **විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය** | | | |
| 2,397,319.38 | | බ්‍රෝකර් ගාස්තු, පැටවීමේ සහ විකුණුම් වියදම් | | 2,427,922.65 | |
| 2,397,319.39 | | | | | 2,427,922.65 |
| **180,820,041.44** | | **මුළු වියදම්** | | | **183,959,205.06** |
| 6,544,328.99 | | **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | | **8,260,330.08** |
| (1,185,580.90) | | **අඩු කළා:** නොවිකිණු තේ සඳහා වැඩිපුර අගය කිරීම - 2012 | | | (748,815.77) |
| (613,985.47) | | පූර්ව වාර්ෂික ගැලපුම් | | | 118,932.42 |
| **4,744,762.62** | | **තේ.ප.ආ මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය / (අලාභය)** | | | **7,630,446.73** |

**තේ පර්යේෂණ මණ්ඩලය**
**ශා. ජෝකීම් වත්ත සඳහා 2015 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා කාරක ගිණුම**

| 2014 රු. ශත | 2014 කිලෝ ග්‍රෑම් | | 2015 කිලෝ ග්‍රෑම් | 2015 රු. ශත | 2015 රු. ශත |
|---|---|---|---|---|---|
| | | **ආදායම** | | | |
| | | **තේ විකුණුම් දළ ආදායම** | | | |
| 148,258,808.01 | 336,180.00 | තැරැව්කාර ආයතන හරහා විකුණුම් | 188,510.00 | 75,546,753.07 | (සටහන අංක 1) |
| 4,224,982.32 | 10,266.00 | දේශීය විකුණුම් සහ නොමිලේ බෙදා දීම් | 14,763.00 | 5,735,310.03 | |
| **152,483,790.33** | **346,446.00** | | **203,273.00** | | **81,282,063.10** |
| | | **එකතු කළා:** | | | |
| 515,760.63 | | රිකිලි තේ පැල විකුණුම් ආදායම | | (1,116,172.39) | |
| 12,566,118.13 | | අමු තේ දළු විකුණුම් ආදායම | | 8,500,496.01 | |
| 1,266,426.58 | | විවිධ ආදායම් | | 420,111.32 | |
| 1,291,182.00 | | රබර්වලින් ලද ආදායම | | 10,105.00 | |
| (341,886.23) | | ඒඩීබී ව්‍යාපෘති ලාභය (රිකිලි තේ ආදායම) | | (639,384.45) | |
| 855,719.52 | | විලම්බිත ආදායම් | | 855,719.27 | |
| 16,153,320.63 | | **මුළු ආදායම** | | | 8,030,874.76 |
| **163,637,110.96** | | | | | **89,312,937.86** |
| | | **වියදම්** | | | |
| | | **අඩු කළා : වතු වියදම්** | | | |
| 2,833,946.29 | | පොදු ගාස්තු | | 3,137,658.69 | |
| 3,665,795.87 | | ක්ෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 3,039,835.85 | |
| 7,204,102.98 | | නිෂ්පාදනය | | 5,862,389.96 | |
| 1,301,362.67 | | රබර් සඳහා වියදම් | | 45,201.76 | |
| 155,960,502.40 | | දළු මිලදී ගැනීම් (ප්‍රවාහන වියදම්ද සහිතව) | | 87,601,846.82 | |
| **170,965,710.21** | | | | | **99,686,933.08** |
| | | **පරිපාලන හා මූල්‍ය** | | | |
| 2,525,065.00 | | ප්‍රසාද දීමනා සහ නිවාඩු දින ගෙවීම් | | 2,070,527.74 | |
| 4,696,420.13 | | ක්ෂය වීම් | | 3,173,404.10 | |
| **7,221,485.13** | | | | | **5,243,931.84** |
| | | **විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය** | | | |
| 2,525,598.96 | | බ්‍රෝකර් ගාස්තු, පැටවීමේ සහ විකුණුම් වියදම් | | 1,376,609.30 | |
| | | | | | **1,376,609.30** |
| **180,712,794.30** | | **මුළු වියදම්** | | | **106,307,474.22** |
| (12,075,683.34) | | **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | | | **(16,994,536.36)** |
| 1,260,441.37 | | අඩු කළා: නොවිකිණු තේ සඳහා වැඩිපුර අගය කිරීම - 2014 | | | (834,223.94) |
| 319,441.79 | | පූර්ව වාර්ෂික ගැලපුම් | | | 142,357.27 |
| **(13,655,566.50)** | | **තේ.ප.ආ මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය / (අලාභය)** | | | **(17,686,403.03)** |

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ජ්/බී/ටීආර්බී/15/1/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 දෙසැම්බර් 30 දින

සභාපති
තේ පර්යේෂණ මණ්ඩලය.

**තේ පර්යේෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

තේ පර්යේෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 13 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය රු.341,321,000 ක මුදල මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ක්‍රියාකාරකම් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය, දිරිදීමනා හා ක්‍රමක්ෂය ප්‍රතිපාදන එකතුව රු.7,214,280 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.49,983,824.03 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්වල දැක්විය යුතු වුවත් මණ්ඩලය ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iiii) ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන්කල හැකි වත්කම් වන අතර ඒවා වෙන් වෙන්ව වර්ගීකරණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන ශුද්ධ අගය රු. 202,749,711 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් එවැනි වර්ගීකරණයක් කර නොතිබුණි. ඒ අනුව ගොඩනැගිලි වෙනුවෙන් වූ ක්ෂය අගයෙහි නිවැරදිතාවය තහවුරුකර ගත නොහැකිවිය.

## 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

යම් නිශ්චිත ගිණුම් කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට (මනා පරිචය) කටයුතු කළයුතු අතර, ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, මණ්ඩලය විසින් පහත සඳහන් වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන වටිනාකම රු. 2,404,163 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන පිරිවැය රු.174,913,032 ක් වූ තේ වගාව මේරූ, නොමේරූ වශයෙන් වර්ග කර වෙන් වෙන්ව හඳුනා ගැනීම.

(ඇ) මණ්ඩලයට අයත් ඉඩම්වල වටිනාකමින් ඉහළ ශාඛ 5654 ක් හඳුනාගෙන ඇතත් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම.

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය හා කම්කරුවන් වෙනුවෙන් අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර ඒ මත දායකය ගණනය කලයුතු වුවත් 2006 ජනවාරි සිට 2012 මැයි 30 දක්වා එසේ කටයුතු නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු.36,986,901 ක් අරමුදලට ප්‍රේෂණය කලයුතු වුවත් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) තේ කම්හල්වල වර්ෂයේ නොවිකිණූ නිමි තේ අවසන් තොගය ගිණුම්වලින් අනාවරණය කරනු වෙනුවට විකුණුම් ආදායම ගණනය කිරීමේදී ණයට විකුණුම් ලෙස සලකා ගිණුම්ගත කර තිබූ බැවින් වර්ෂයේ තේ විකුණුම් ආදායම හා ණයගැති ශේෂය රු. 2,884,584 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තේ නිෂ්පාදිතයේ රොඩු තේ කිලෝග්‍රෑම් 12,592 ක් විකිණීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කර ගැණුම්කරුවන් වෙත ලබා දී තිබුණ ද එම විකුණුම් වටිනාකම වූ රු.273,667 ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් තබා නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ශාන්ත කුම්බස් කම්හලෙහි 2015 දෙසැම්බර් 31 දිනට නිමි තේ තොගයේ වටිනාකම රු.2,276,671 ක් වුවද ලෙජරයට අනුව එම ශේෂය රු.2,381,511 ක් වූ අතර රු.109,840 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගෙන ඒ ඒ පර්යේෂණ අංශයෙහි ගබඩාවල තැන්පත් කර තිබූ රසායනික ද්‍රව්‍ය තොග ශේෂයන් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛණ නඩත්තු කර නොතිබීම හේතුවෙන් එම තොග ශේෂයන්ගේ වටිනාකම තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.1 වගන්තිය | අධ්‍යාපන හෝ අභ්‍යාස සඳහා එක් මාසයකට වැඩි කාලයකට විදේශයන්ට යවනු ලබන රජයේ නිලධාරියකු දිවයිනෙන් බැහැරයාමට පෙර අවම සේවා කාල පරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට බැඳීමේ ගිවිසුමකට අත්සන් කළ යුතු නමුත් නිළධාරීන්ගේ විදේශ ගමන් සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (2) | සමාලෝචිත වර්ෂය තුලදී ආයතනය සතු වාහන 5 ක් අවස්ථා 6කදී අනතුරු වලට භාජනය වී ඇතත් මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි අංක 177 (1) | දෛනිකව එකතුවන මුදල් එදිනම හෝ හැකි ඉක්මනින් බැංකු ගත කිරීම සිදු කළ යුතු නමුත් ශාන්ත කුම්බස් කර්මාන්තශාලාවේ අලෙවි සැලේ තේ අලෙවි ආදායම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි අංක 316(2) | සුරක්ෂිත භාරයේ තැන්පත් කරනු ලබන හෝ එසේ තැබූ තැනකින් ඉවත්කරගනු ලබන හෝ ද්‍රව්‍ය පිළිබඳ වාර්තා වගකිවයුතු නිලධාරියකු විසින් පවත්වා ගතයුතු නමුත් ආයතනයේ සේප්පුවේ තැන්පත් කරනු ලබන මුදල් පිළිබඳ එවැනි ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි අංක 317 හා 318 | සුරක්ෂිතාගාර පෙට්ටිවල යතුරු හා අනුයතුරු වගකිවයුතු නිළධාරියෙකු භාරයේ හා අධීක්ෂණය යටතේ පැවතිය යුතු නමුත් ඊට පටහැනිව ආයතනයේ සේප්පුවේ යතුරු මුදල් අයකැමි භාරයේ පැවතුණි. |
| (v) | මුදල් රෙගුලාසි අංක 341 | කුවිතාන්සි පොත් සම්බන්ධව ජී.ඒ.ඇන් 20 ප්‍රකාරව ලේඛණයක් නඩත්තු කල යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | එක් අවස්ථාවකදී රු.100,000 කට නොවැඩි ලෙස අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව ආයතනය විසින් රු.101,880 සිට රු.1,100,000 දක්වා අත්තිකාරම් මුදල් අවස්ථා 13කදී ලබාදී තිබුණි. |

| | |
|---|---|
| (vii) මුදල් රෙගුලාසි අංක 397 | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවීම් කරන නිලධාරියා විසින් නිතරම සොයා බැලියයුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ ලංකා බැංකුවේ කෝපරේට් ශාඛාවේ අංක 1571 දරන බැංකු ගිණුමට අදාල රු.1,602,383 අයිරා ශේෂයක් විය. |
| (ඇ) 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර මණ්ඩලයට අයත් ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,302,192 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,251,018 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,948,826 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.41,595,000 ක් වැඩියෙන් ලැබී තිබීම සහ ශාන්ත කුම්බස් වතුයාය හා කම්හලෙහි ශුද්ධ ලාභය රු. 2,885,648 කින් එනම් සියයට 60 කින් වැඩිවීමත් ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ධන අගයක් ගෙන තිබූ අතර 2011 වර්ෂයේදී රු.මිලියන 58.53, ක් වූ ආයකත්වය 2013 වන විට රු.මිලියන 53.14 ක් දක්වා සුළු වශයෙන් අඩු වී තිබුණු නමුත් 2014 වර්ෂයේ සිට එය ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 157.1 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මණ්ඩලයට අයත් ශාන්ත ජෝකීම් වතුයායෙහි මෙහෙයුම් ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සෘණ අගයක් ගෙන තිබූ අතර එය පිළිවෙලින් සියයට 19.03 ක් හා සියයට 7.16 ක් විය. වතුයායේ තේ එලදාව අඩුවී තිබීම හා නිමි තේ විකුණුම් ආදායම සියයට 46 කින් පිරිහී තිබීම මෙහෙයුම් අලාභය වර්ධනය සඳහා සෘජුවම බලපා තිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත ජෝකීම් වතුයායට අයත් හෙක්ටයාර් 05 ක් පමණ වූ ඉඩම් වසර 25 කට අධික කාලයක සිට බාහිර පාර්ශවයන් විසින් බලෙන් අල්ලාගෙන තිබූ අතර ආයතනය විසින් එම ඉඩම් අත්පත් කරගැනීම සඳහා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ආ) සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා පිටරට ගොස් නැවත දිවයිනට නොපැමිණි නිලධාරීන් 06 දෙනෙකු මණ්ඩලය සමඟ එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රු.18,552,991 ක් වූ බැඳුම්කර මුදල් අයකර ගැනීම සඳහා අධිකරණවල වසර 5 කට පෙර සිට නඩු පවරා තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයක් විසින් ආයතනය තෙවන විත්තිකරු ලෙස සඳහන් කරමින් ඉඩම් කොටසක් අත්පත් කරගැනීම සඳහා නඩුවක් ගොනුකර තිබුණි.

(ඈ) ආයතනයේ සේවකයකු විසින් කලින් දැරූ තනතුරට නැවත සේවය ලබා ගැනීම සඳහා ආයතනයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 5 වන උප වගන්තිය හා 2003 අංක 30 දරන සංශෝධිත පනත අනුව තේ පර්යේෂණ මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

(i) තේ වගාවේ රෝග සහ පළිබෝධ වැලැක්වීම සහ මර්ධනය නිමි තේ වල ගුණත්වය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණ ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියළු ගැටළු සහ කරුණු පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම , සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම.

(ii) ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ අනාගත ආර්ථික ප්‍රවනතා ද ඇතුලුව එම කර්මාන්තයේ ආර්ථික ස්වශක්‍යතාව පිළිබඳව පර්යේෂණ පැවැත්වීම. එහි ලා සහය වීම සහ ඊට අනුබල දීම.

(iii) තලවාකැලේ පිහිටි තේ පර්යේෂණ ආයතන හා එහි උප ආයතන මණ්ඩලයේ රීතිවලට අනුකූලව පවත්වාගෙන යාම හා පරිපාලනය කිරීම.

(iv) ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම පවත්වාගෙන යාම .

(v) ස්වශක්ති කර්තව්‍ය ඉටු කිරීමේ දී, විදේශීය පර්යේෂණ ආයතන සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමඟ ඒකාබද්ධ අධ්‍යයන වැඩ පිළිවෙලවල් , සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

(vi) තේ පර්යේෂණ සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

(vii) තේ කර්මාන්තය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ඒවා බෙදා හැරීමට බාර ගැනීම සහ තේ කර්මාන්තයෙහි සංවර්ධන ශක්‍යතාව දැනගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

(viii) තේ කර්මාන්තයට අදාල උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෙනත් නියෝජ්‍යායතන සමහ සම්බන්ධීකරණය කිරීම.

උක්ත අරමුණු ඉටුකර ගැනීමේදී මණ්ඩලය ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් කාර්ය සාධන ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

(අ) මණ්ඩලයේ පර්යේෂණ ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් කෙරිගෙන යන දීර්ඝ කාලීන ව්‍යාපෘති වන අතර භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වූ ප්‍රදානයන්ගෙන් රු.6,718,075 ක් වැය කරමින් අරඹන ලද ව්‍යාපෘති 08 ක් අපේක්ෂිත අරමුණු කරා ලහා නොවී අතරමග නවතා දමා තිබූ බව නියදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) පර්යේෂණ උපදේශන කමිටුවේ නිර්දේශ මත අඩු බලපෑම් සහිත ව්‍යාපෘතියක් ලෙස සලකා ශෂ්‍ය විද්‍යා අංශයේ A10.4 ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දී නවතා දැමූ බව විගණනයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ අංශ වාර්තාවන්හි සඳහන් වුවද ඉන් අනතුරුව ඒ සඳහා රු.2,514,611 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 3.93 ක වියදම් දරා ආරම්භ කිරීමට සැලසුම් කල ව්‍යාපෘති 03 ක් වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව පහත පර්යේෂණ ව්‍යාපෘති වල මූල්‍ය කාර්ය සාධනය සියයට පනහකට වඩා අඩු මට්ටමක පැවතුණි.

| ව්‍යාපෘති කාණ්ඩය | ඇස්තමේන්තුගත පිරිවැය | තථ්‍ය පිරිවැය | වැය කළ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| A1.3 | 2,223,774 | 277,109 | 12.5 |
| A30.5 | 2,807,140 | 499,097 | 17.8 |
| A50.4 | 2,848,029 | 1,115,957 | 39.2 |
| A50.6 | 1,292,045, | 509,271 | 39.4 |
| A15.1 | 3,835,045 | 1,833,290 | 48 |

(ඉ) වෙනත් විශේෂ ව්‍යාපෘති යටතේ තේ වගාවේ ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රිකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කුඩා තේ වතු හිමියන්ට බෙදා දී තිබූ යන්ත්‍රෝපකරණ භාවිතය ක්ෂේත්‍රය තුල අවම මට්ටමක පවතින බැවින් ව්‍යාපෘතියේ අරමුණු ඵලදායී ලෙස ඉටු වී නොමැති බව නියදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) මණ්ඩලය විසින් හඳුන්වාදෙන ලද ක්‍රමවේදයන් සම්බන්ධව තාක්ෂණය පැවරීම සඳහා බාහිර ආයතන සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ නමුත් 2015 වර්ෂයේ කිසිදු පුරස්කාර ආදායමක් ලැබී නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ශාන්ත කුම්බ්ස් සහ ශාන්ත ජෝකිම් යන වතුයායන් දෙකෙහි සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) ශාන්ත කුම්බ්ස් හා ශාන්ත ජෝකිම් වතුයායන් දෙකෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව අමු තේ දළු මිලදී ගැනීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 528,000 ක් 1,915,347 ක් වූ අතර තථ්‍ය මිලදී ගැනීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 437,318 ක් හා 955,206 ක් වූයෙන් විචලනය සියයට 17.17 ක් හා සියයට 50.13 ක් විය.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව ශාන්ත ජෝකිම් වතුයායෙහි හෙක්ටයාරකට ඉපයීම කිලෝග්‍රෑම් 923 ක් වුවද කාර්ය සාධන වාර්තාවට අනුව එය කිලෝග්‍රෑම් 619 ක් විය.

(iii) ශාන්ත කුම්බ්ස් වතුයායෙහි ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කසල තේ ප්‍රතිශතය සියයට 8 ක් වූ අතර තථ්‍ය ප්‍රමාණය සියයට 10.09 ක් විය.

(iv) එක් එක් කම්හලේ තේ විකුණුම් ප්‍රමාණයන් හා නිෂ්පාදන පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පහත පරිදි විය.

| විස්තරය | ශාන්ත ජෝකිම් වතුයාය | | ශාන්ත කුම්බස් වතුයාය (ලැම්ලියර් කොටසද ඇතුළුව) | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| තේ විකුණුම් (කිලෝග්‍රෑම්) | 203,273 | 346,446 | 393,378 | 369,706 |
| නිෂ්පාදන පිරිවැය (කිලෝග්‍රෑමයකට රු.) | 436.15 | 457.61 | 481.10 | 500.04 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය මිල (කිලෝග්‍රෑමයකට රු.) | 393.09 | 432.85 | 475.93 | 493.97 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශාන්ත ජෝකිම් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 143,233 කින් අඩුවී තිබුණු අතර තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය සියයට 5 කින් අඩුවී පැවතියද ඊට සාපේක්ෂව ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල සියයට 9 කින් අඩුවී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බස් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 23,672 කින් වැඩිවී තිබුණද තේ කිලෝවක ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිලට වඩා වැඩි වටිනාකමක් පිරිවැය ලෙස දරා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ කටයුතු සඳහා මිලදීගෙන තිබූ රසායනික ද්‍රව්‍ය මධ්‍යගත ගබඩාවක රැස්කර අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිකුත් කිරීමේ පිළිවෙතක් අනුගමනය නොකර එක් එක් පර්යේෂණ අංශවල ගබඩා කර තිබීම හේතුවෙන් එකම වර්ගයේ රසායනික ද්‍රව්‍ය විවිධ ප්‍රමාණයන්ගෙන් ස්ථාන කිහිපයක ගබඩා කර තිබීමත්, ඇතැම් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වීමටත් සහ අනවශ්‍ය තොග පැවතීමත් සිදුවී තිබුණි.

(ආ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලයේ පොත් 1978 වර්ෂයේ සිට භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර පසුගිය වසර 20 ක කාලය තුල (1985 – 2016) බැහැර ගෙන යනු ලැබූ පොත් වලින් ආපසු භාර නොදුන් සංඛ්‍යාව 186 ක් වූ අතර ඒවා නැවත ගෙන්වා ගැනීමට හෝ වටිනාකම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ භාවිතයේ පවතින වාහන 5 ක අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට 2016 අගෝස්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් ජීවන මට්ටම ඉහල නැංවීමේ ව්‍යාපෘතිය සහ යාන්ත්‍රිකරණ ව්‍යාපෘතිය යන විශේෂ ව්‍යාපෘතීන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු. 5,699,717ක් හා රු. 3,300,989 ක් සමාලෝචිත වර්ෂයේ ද වැයකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ලැබී තිබුණු රු. 2,971,000 ක් වැය නොකර ඉදිරි වර්ෂය සඳහා ගෙන ගොස් තිබුණි.

**4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත කුම්බස් වතු වෛද්‍ය සහායක භාරයේ පැවති රු. 210,408 ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය තොගය වර්ෂ 03 ක සිට භාවිතයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) මණ්ඩලය සතු නිල නිවාස අතරින් ඒ කාණ්ඩයේ නිල නිවාසයක් ද සී කාණ්ඩයේ නිල නිවාස 4 ක් හා ඩී කාණ්ඩයේ නිල නිවාස 19 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ශාන්ත කුම්බස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය පිළිවෙලින් අමු තේ දළු දිනකට කිලෝ ග්‍රෑම් 8,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,810 ක් විය. කෙසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 5,000 (සියයට 62) ක් සහ කිලෝ ග්‍රෑම් 6253 (සියයට 17) ක් බව නිරීක්ෂණය විය.

(ඇ) ශාන්ත කුම්බස් කම්හලේ E.C.P.4 Drier යන්ත්‍රය වසර 15 ක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

(ඉ) කර්මාන්තශාලාව ආරම්භයේදී සවිකර තිබෙන රෝල යන්ත්‍ර 04 කින් නිෂ්පාදන ක්‍රියාකාරීත්වය සඳහා වරකට භාවිතයට ගනු ලබන්නේ යන්ත්‍ර 02 ක් පමණක් වන අතර අනෙක් යන්ත්‍ර 02 ක ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් ඉඩම්වල වී,තේ, රබර්, පොල් හා වෙනත් භෝග වගාකර තිබුණද හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු වලින් ලැබෙන ආදායම ආයතනයට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රබර් හා පොල් වතුවල ඇති ගස් ප්‍රමාණය ගණනය කර ලේඛනගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(උ) ආයතනය සතු අත්ට්‍රැක්ටර් 5ක් ධාවන තත්වයේ නොපවතින බව හඳුනාගෙන තිබුණද ඉවත්කිරීමට කටයුතු කර නොතිබූ අතර ධාවන තත්වයේ පවතින මෝටර් රථයක් අළුත්වැඩියා කිරීමෙන් තොරව වර්ෂ 5 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

### 4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

------------------

මණ්ඩලයේ ජල සම්පාදන පද්ධතියේ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය 2015 ජනවාරි 31 දින වන විට නිම කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2015 සැප්තැම්බර් 09 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද 2016 අගෝස්තු 25 දින වන විටත් අදාල කාර්යය නිමකර නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 443 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 241 ක් විය. ඒ අනුව තනතුරු 202 ක් පුරප්පාඩු වී පැවති අතර තනතුරු 91 ක අතිරික්තයක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක නොවන මට්ටමේ තනතුරු 107 ක් පුරප්පාඩුව පවතින අතර ඊට ඇතුළත් පර්යේෂණ හා සංවර්ධන තාක්ෂණ නිලධාරීන්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ අනුමත තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 50 ක් හා 24ක් වූ අතර ඉන් තනතුරු 43 ක් සහ 14 ක් එනම් සියයට 77 ක් පුරප්පාඩුව පවතින බැවින් මණ්ඩලයේ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සැලසුම් අනුව ඉලක්කගත කාලය තුල ඉටුනොවන බව විගණනයේදී නිරීක්ෂණය වේ.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර පුවත්පත් දැන්වීම පලකර අයදුම්පත් කැඳවා තිබුණද බඳවාගැනීම් පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු 31 දින වන විටත් තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් 112 දෙනෙකුට (ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 105 ක් හා කළමනාකරණ සහකාර තනතුරු 07ක් ) 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී තිබුණි. කෙසේවුවද 2015 දෙසැම්බර් 31 දිනට පී එල්-1 යටතේ අනුමත සාමාන්‍ය කම්කරු තනතුරු ගණන 65 ක් වුවත් මෙම බඳවා ගැනීම් හේතුවෙන් එම කාර්ය මණ්ඩලයේ 91 දෙනෙකුගේ අතිරික්තයක් විය.

## 4.7 දැශ්‍යා අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සියලුම තේ නිෂ්පාදිත බ්‍රෝකර් සමාගම හරහා තේ වෙන්දේසියට ඉදිරිපත් කර අලෙවිකල යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී බ්‍රෝකර් සමාගම නමින් නිකුත් කරන ලද ඉන්වොයිස් පත් දෙකකට අදාල තේ කිලෝග්‍රෑම් 224 ක් ඊට පටහැනිව කළමනාකරණය මගින් අවභාවිතයට ලක්කර තිබුණි.

(ආ) බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් මුදල නිදහස් කිරීමට පූර්වයෙන් අදාල කාර්යය ඉටුකිරීමට ශක්‍යතාවයක් පවතීද යන්න සනාථ කරගත යුතු වුවත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2011 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජල ආශ්‍රිත ඒකකයක් මිලදී ගැනීම සඳහා රු.110,124 ක් අත්තිකාරම් ලෙස පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණද එම ආයතනය වසා දමා ඇති බවට හඳුනාගෙන ඇතත් එම වටිනාකම පියවා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඑඩ්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2016 ජූලි 01 දිනදිය. තවද කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 ඔක්තෝබර් 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ආයතනය තුල ස්ථාපිත කර තිබුණද මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන පර්යේෂණ කටයුතු සම්බන්ධව මූල්‍ය හෝ භෞතික කාර්යසාධනය සම්බන්ධව කිසිඳු පරික්ෂාවක් සිදු කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 35 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.4 නොවිසඳී ඇති විගනණ ඡේද

(අ) අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාන භාර නිලධාරීන්ගේ නිල නිවාස නඩත්තු කිරීම සඳහා මාසික කම්කරු දීමනාවක් ප්‍රතිපූරණය කිරීමට 2007 මැයි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මෙම කම්කරු දීමනාව දෛනික කම්කරු වැටුපට නිෂ්පාදන ප්‍රසාද දීමනා, අතිකාල, පැමිණීමේ දීමනා යනාදිය එකතු කර ගණනය කර තිබුණු අතර 2015 වර්ෂයේදී නිලධාරීන් 13 දෙනෙකු සඳහා රු.2,540,470 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. අදාල රේඛීය අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ මේ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2014 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබා දෙන ලද උපදෙස් පරිදි 2016 ජුනි 30 දක්වාම කටයුතුකර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් ඒ ඒ විෂයයන්ට අදාල චක්‍රලේඛ නියමයන් හා අනෙකුත් සමාන ආයතන අභිබවා කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නිවාඩු, නිල නිවාස හා පරිභෝජනය කරනු ලබන ජලය, විදුලිය වෙනුවෙන් ගාස්තු අය නොකිරීම වැනි වරප්‍රසාද සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තේ සැකසුම් කිරීම සඳහා ආයතනය විසින් 1982 වර්ෂයේදී රු.4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාල ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය නොවූ බැවින් නිෂ්කාර්යව පැවතුණි. මෙම වටිනාකම භාණ්ඩාගාර අනුමැතිය මත පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බව දන්වා තිබුණද මේ දක්වා ගිණුම්වලින් ඉවත් කර නොතිබුණු අතර කෙරීගෙනයන වැඩ ලෙස තවදුරටත් දක්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම. |
| (ආ) කර්මාන්තශාලා මෙහෙයුම් පාලනය | ශාන්ත ජෝකිම් කම්හලේ නිෂ්පාදනය පහත වැටීම හා අඛණ්ඩව පාඩු ලබා තිබීම. |
| (ඇ) අයවැය පාලනය | අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වීම. |
| (ඈ) ගිණුම්කරණය | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.



ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව
ISSN : 1012 - 3954